ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

இலங்கை இராணுவம்

# SRI LANKA ARMY

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயல்திறன் அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2018

# වාර්ෂික කාර්ය සාධන වාර්තා 2018 (සිංහල පරිවර්තනය)



## ප්‍රස්ථාවනාව

'රට රකින ජාතිය' වශයෙන් විරුදාවලිය ලත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වසර 70 ක් පුරාවට තම මාතෘ භූමියේ ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හා ස්වෛරීත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් නිර්භීතව හා කැපවීමෙන් කටයුතු කළ අතර සෑම දෙනාගේම ගෞරවයටද පාත්‍ර වී ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සංග්‍රාමික සූදානම, එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරී, සංවර්ධන කටයුතු, සංහිඳියාව හා යුද්ධ හමුදාවේ පරිපාලන කටයුතු වැනි විවිධ කර්තව්‍යයන් සඳහා සියලු සුදුසුකම්වලින් සන්නද්ධ, වෘත්තිකයන්ගෙන් සමන්විත වූ හැකියා වලින් පරිපූර්ණ බලකායක් නිර්මාණය කිරීමේ දැවැන්ත ක්‍රියාවලියට පිවිසෙමින් සිටියි.

එමෙන්ම දේශයේ සංවර්ධන කටයුතු වේගවත් කිරීමේ ක්‍රියාවලියට සමගාමීව කාර්යක්ෂමතා වර්ෂය ලෙස නම්කරන ලද 2018 වර්ෂයෙහි ජාතික අරමුණු ළඟාකර ගැනීමේ දැවැන්ත වගකීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ප්‍රබල දායකත්වයක් ලබා දෙන ලදී. වෘත්තීමය, ආදර්ශමත් මෙන්ම ජව සම්පන්න බලකායක් ලෙස දේශයේ මෙන්ම ජගත් ප්‍රජාවගේද පැසසුමට ලක්ව ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, ව්‍යාපෘති හා කාර්යයන් ක්‍රියාත්මක කරමින් සිටියි.

තම මාතෘ භූමිය තුළ තිරසාර සංවර්ධන ඉලක්කයන් ළඟාකරගැනීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින සංහිඳියා ක්‍රියාවලින් කාර්යක්ෂමව ක්‍රියාත්මක කරන අතරතුරදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති, කෘෂිකර්මය, වාරිමාර්ග සංවර්ධනය හා ගොඩනැගිලි ඉදිකිරීම් වැනි ක්ෂේත්‍ර රැසක් සඳහාද ප්‍රමුඛත්වය ලබාදෙමින් කටයුතු කරයි.

එමෙන්ම රජය විසින් යුද්ධ හමුදාව වෙත ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන හා සම්පත් ප්‍රමුඛතා පිළිවෙළින් කාර්යක්ෂමව යොදවමින් තම මාතෘ භූමියේ පුරවැසියන්ට ආපදා අවස්ථාවන්හිදී ජීවිත මුදවා ගැනීමේ ක්‍රියාන්විත මගින් මහජනතාවට උපකාර කරන්නේ යුද්ධ හමුදාව **'රට රකින ජාතිය'** යන්න තව දුරටත් පසක් කරමිනි.

එපමණක් නොව 2018 වර්ෂය තුළ යුද්ධ හමුදාව පුහුණු කටයුතු වල සීඝ්‍ර දියුණුවක් ළඟාකරගත් අතර, ප්‍රතිව්‍යුහගත හා යථායෝග්‍ය ප්‍රමාණකරන ක්‍රියාවලින්ද දැනටමත් ක්‍රියාත්මක කරමින් පවතින අතර, ඉන් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ වෘත්තීමයභාවය, කාර්යක්ෂමතාව, නිපුණතා හා ශක්‍යතා වර්ධනයට මනා පිටුවහලක් ලබා ඇත.

මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා 2018 වර්ෂය තුළ ලද අත්දැකීම් 2019 වර්ෂයෙහි අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට මාහැඟි පිටුවහලක් වන බව මා තරයේ විශ්වාස කරමි.

**එන් යූ එම් එම් ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී**
ලුතිනන් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති

## පටුන


| අනු අංක | මාතෘකාව | පිටුව |
|---|---|---|
| | රූප සටහන් නාමාවලිය. | iii |
| | ප්‍රස්තාර නාමාවලිය. | iv |
| | වගු සටහන් නාමාවලිය. | v - vix |
| | කෙටි යෙදුම්. | x |
| | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආයතන ව්‍යුහය. | xi - xiv |
| | පෙරවදන. | xv |
| 1. | ස්වෙච්ඡා බළසේනා මූලස්ථානය. | 1 - 5 |
| 2. | යුධ සේවා ලේකම් ශාඛාව. | 6 - 9 |
| 3. | ප්‍රධාන මාණ්ඩලික ශාඛාව. | 10 - 54 |
| 4. | මූල්‍ය කලමනාකරණ ශාඛාව. | 55 - 77 |
| 5. | විධායක ජෙනරාල් ශාඛාව. | 78 - 103 |
| 6. | උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව. | 104 - 122 |
| 7. | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව. | 123 - 130 |
| 8. | අධ්‍යක්ෂ ජෙනරාල් පාබළ කාර්යාලය. | 131 - 132 |
| 9. | ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය). | 133 - 139 |
| 10. | ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි). | 140 - 146 |
| 11. | ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර). | 147 - 152 |
| 12. | ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චි). | 153 - 158 |
| 13. | ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්). | 159 - 165 |
| 14. | ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර). | 166 - 171 |
| 15. | ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම). | 172 - 177 |
| 16. | යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය. | 178 - 180 |
| 17. | මූලස්ථානය හඨකාර්ය සම්පාදන අණසක. | 181 - 182 |
| 18. | ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය. | 183 - 188 |
| 19. | ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය. | 189 - 192 |
| 20. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය. | 193 - 203 |
| 22. | විනිසුරු අධි නීතිඥ ජෙනරාල් කාර්යාලය. | 204 |

## රූප සටහන් නාමාවලිය

| අනු අංක | මාතෘකාව | පිටුව |
|---|---|---|
| රූප සටහන 2:1. | ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ පවතින සංස්ථා | 10 |
| රූප සටහන 4:1. | මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ ඇති ආයතන | 55 |
| රූප සටහන 5:1. | විධායක ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා. | 78 |
| රූප සටහන 6:1. | උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති ආයතන | 104 |
| රූප සටහන 7:1. | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා | 123 |
| රූප සටහන 12:1. | සහයෝගිතා කේන්ද්‍රය මගින් ක්‍රියාවට නංවා ඇඩි ව්‍යාපෘති | 154 |
| රූප සටහන 16:1. | ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු යටතේ ඇති ආයතන | 178 |
| රූප සටහන 16:2. | ප්‍රවර්ධන සැලැස්ම | 179 |
| රූප සටහන 19:1. | ප්‍රධාන සංඥා නිළධාරී මුලස්ථානය යටතේ ඇති ආයතන | 189 |
| රූප සටහන 20:1. | යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය යටතේ ඇති ආයතන | 193 |

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ප්‍රස්තාර නාමාවලිය


| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| ප්‍රස්ථාරය 1:1. | ආසන්න වර්ෂවලදී ලබාදුන් මූල්‍යාධාර සාරාංශය | 3 |
| ප්‍රස්ථාරය 3:1. | පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් නිලධාරී සංඛ්‍යාව | 31 |
| ප්‍රස්ථාරය 3:2. | පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් සෙසුනිල සංඛ්‍යාව | 31 |
| ප්‍රස්ථාරය 4:1. | වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය - 2018 වර්ෂය | 55 |
| ප්‍රස්ථාරය 4:2. | වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය | 56 |
| ප්‍රස්ථාරය 17:1. | වෘත්තිය පරීක්ෂණ | 182 |


නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## වගු සටහන් නාමාවලිය


| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| වගුව 1:1. | මූල්‍ය විස්තරය - ස්වේච්ඡා බළසේනා මූලස්ථානය | 1 |
| වගුව 2:1. | නිලධාරීන් නිල උසස් කිරීමේ මණ්ඩල පිළිබඳ විස්තරය | 6 |
| වගුව 2:2. | නිලධාරීන් නිල ස්ථිර කරන ලද මණ්ඩල පිළිබඳ විස්තරය | 6 |
| වගුව 2:3. | 2018 වර්ෂය තුළ විශ්‍රාමලත් නිලධාරීන්ගේ විස්තරය | 7 |
| වගුව 2:4. | මූලික පරීක්ෂණ උසාවි විමසීම් පිළිබඳ විස්තරය | 7 |
| වගුව 3:1. | මූල්‍ය විස්තරය (පුනරාවර්තන වියදම්) - ප්‍රධාන මාණ්ඩලික ශාඛාව | 11 |
| වගුව 3:2. | මූල්‍ය විස්තරය (ප්‍රාග්ධන වියදම්) - ප්‍රධාන මාණ්ඩලික ශාඛාව | 11 |
| වගුව 3:3. | මූල්‍ය විස්තරය - ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය | 11 |
| වගුව 3:4. | බිල්පත් නිරවුල් කිරීම සබැඳි විස්තරය - ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය | 12 |
| වගුව 3:5. | කඳවුරු ආරක්ෂිත, අශ්වයන් සහ සුනඛයින් මිලදී ගැනීම් සබැඳි විස්තරය | 12 |
| වගුව 3:6. | මූල්‍ය විස්තරය - විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය | 14 |
| වගුව 3:7. | 2018 වර්ෂයෙහි ප්‍රධාන උපකරණ හා ස්වයං ක්‍රියාකාරකම් පිළිබද විස්තරය | 16 |
| වගුව 3:8. | මූල්‍ය විස්තරය - පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය | 17 |
| වගුව 3:9. | බඳවාගත් හා අධිකාරියට පත්කළ කෙඩෙට් නිලධාරී සංඛ්‍යාව | 18 |
| වගුව 3:10. | පාඨමාලා සඳහා සහභාගී කරවන ලද හයපිරිස් ප්‍රමාණය | 18 |
| වගුව 3:11. | බහුපාර්ශවික යුධ අභ්‍යාසයන් පිළිබඳ විස්තරය | 19 |
| වගුව 3:12. | මාණ්ඩලික විද්‍යාලය වෙත තෝරාගැනීම් විභාගය පිළිබඳ විස්තරය | 19 |
| වගුව 3:13. | නිල උසස් කිරීමේ විභාගය පිළිබඳ විස්තරය | 20 |
| වගුව 3:14. | භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණ පිළිබඳ විස්තරය | 20 |
| වගුව 3:15. | විදේශීය පාඨමාලා/සංචාර/ සම්මන්ත්‍රණ/ දේශණ/ අභ්‍යාස පිළිබඳ සංක්ෂිප්ත විස්තරය | 20 |
| වගුව 3:16. | සංචාර වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම පිළිබඳ විස්තරය | 21 |
| වගුව 3:17. | විදේශීය යුධ අභ්‍යාස පිළිබඳ විස්තරය | 21 |
| වගුව 3:18. | විදේශීය තරඟ පිළිබද විස්තරය | 21 |
| වගුව 3:19. | සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය වෙතින් මේ දක්වා පවත්වා ඇති පුහුණුවීම් සඳහා රපෝර්තු කරවා ඇති විස්තරය | 21 |
| වගුව 3:20. | මූල්‍ය විස්තරය - සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය | 23 |
| වගුව 3:21. | මූල්‍ය විස්තරය - බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය | 25 |
| වගුව 3:22. | දමිළ හා චීන භෂා පුහුණු පාඨමාලාවන් විස්තරය - බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය | 25 |
| වගුව 3:23. | විශේෂ පුහුණු විස්තරය - බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය | 25 |
| වගුව 3:24. | බුද්ධි පාඨමාලා, ප්‍රශ්න කිරීමේ පාඨමාලා හා ආරක්ෂක පාඨමාලාවන් පිළිබඳ විස්තර - බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය | 26 |
| වගුව 3:25. | මූල්‍ය විස්තරය - මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය | 27 |
| වගුව 3:26. | මූල්‍ය විස්තරය - මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලය | 29 |
| වගුව 3:27. | පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් නිලධාරී හා සෙසුනිල ප්‍රමාණය | 30 |
| වගුව 3:28. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබාදීමට අනුමත සිවිල් සේවක මහතුන් ප්‍රමාණය | 31 |
| වගුව 3:29. | මූල්‍ය විස්තරය - ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය | 33 |
| වගුව 3:30. | මූල්‍ය විස්තරය - ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය | 34 |
| වගුව 3:31. | නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබද විස්තරය ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය | 34 |
| වගුව 3:32. | වර්ෂයෙහි කාර්ය සාධන සමාලෝචනය - තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය | 36 |
| වගුව 3:33. | වෙබ් අඩවි ව්‍යාපෘති වල ප්‍රගතිය | 38 |
| වගුව 3:34. | මූල්‍ය විස්තරය - සන්නද්ධ බළසේනා මූලස්ථානය | 39 |
| වගුව 3:35. | මූලධන/පුණරාවර්ථන වැය ශිර්ෂ යටතේ වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ විස්තරය - සන්නද්ධ බළසේනා මූලස්ථානය | 40 |
| වගුව 3:36. | මූල්‍ය විස්තරය - කාලතුවක්කු බළසේනා මූලස්ථානය | 42 |

| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| වගුව 3:37. | කාලතුවක්කු පුහුණුවීම් පිළිබඳ විස්තරය | 42 |
| වගුව 3:38. | මුදල් වෙන්කිරීම් විස්තරය - ඉංජිනේරු සේවා බළසේනා මූලස්ථානය | 44 |
| වගුව 3:39. | මුදල් අය කිරීමේ පදනම මත ක්‍රියාත්මක කල ව්‍යාපෘති පිළිබඳ විස්තරය | 45 |
| වගුව 3:40. | සිරිසර පිවිසුම අරමුදල් පිළිබඳ විස්තරය | 45 |
| වගුව 3:41. | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය අරමුදල් පිළිබඳ විස්තරය | 46 |
| වගුව 3:42. | සංවර්ධන ව්‍යාපෘතින් සඳහා ඉංජිනේරු දායකත්වය ලබාදීම පිළිබඳ විස්තරය | 46 |
| වගුව 3:43. | භූමි නිසැක කිරීම් විස්තරය | 48 |
| වගුව 3:44. | අවසන් කරන ලද මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකක වැඩබිම් විස්තරය | 49 |
| වගුව 3:45. | මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීම හා වෙඩිද්‍රව්‍ය හඳුනාගන්නා සුනඛ විස්තරය | 49 |
| වගුව 3:46. | පුහුණු පාඨමාලා විස්තරය - ඉංජිනේරු සේවා බළසේනා මූලස්ථානය | 50 |
| වගුව 3:47. | මූල්‍ය විස්තරය - යාන්ත්‍රික ඉංජිනේරු බළසේනා මූලස්ථානය | 51 |
| වගුව 3:48 | මූල්‍ය විස්තරය - සංඥා බළසේනා මූලස්ථානය | 53 |
| වගුව 4:1. | මූල්‍ය විස්තරය - මූල්‍ය කළමනාකරණ ශාඛාව | 56 |
| වගුව 4:2. | විදේශ පුහුණුවීම් සඳහා ගණක නිලධාරීන් සහභාගීකරවීම් පිළිබඳ විස්තරය | 57 |
| වගුව 4:3. | පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය | 57 |
| වගුව 4:4. | පුනරාවර්තන වියදම් - අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 58 |
| වගුව 4:5. | මූලධන වියදම් - අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 58 |
| වගුව 4:6. | විශේෂ ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ විස්තරය | 59 |
| වගුව 4:7. | ණය යෝජනා ක්‍රමය පිළිබඳ විස්තරය | 59 |
| වගුව 4:8. | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සහ 2018 වර්ෂයට අනුමත කරන ලද ප්‍රතිපාදන වටිනාකම් | 60 |
| වගුව 4:9. | අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම පිළිබඳ විස්තරය | 61 |
| වගුව 4:10. | විගණන නිරීක්ෂණ අවම කිරීම සඳහා දේශන පැවැත්වීම පිළිබඳ විස්තරය | 61 |
| වගුව 4:11. | ආයතනයේ මූල්‍ය ප්‍රගතිය - වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය | 62 |
| වගුව 4:12. | මුදල් වැයකල ආකාරය පිළිබඳ විස්තර සාරාංශය - වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය | 63 |
| වගුව 4:13. | සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම පිළිබඳ විස්තරය | 64 |
| වගුව 4:14. | මියගිය/ආබාධිතව අස්කරන ලද නිලධාරීන් සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම පිළිබඳ විස්තරය | 64 |
| වගුව 4:15. | ආපදා ණය ගෙවීම් හා රාජ්‍ය බැංකු මඟින් හිමිගන්වනු ලබන දේපල ණය අයදුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවන් පිළිබඳ විස්තරය | 64 |
| වගුව 4:16. | යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන් වෙනුවෙන් රු.750.00 බැගින්වූ විශේෂ දීමනාව හිමිගැන්වීම පිළිබඳ විස්තරය | 64 |
| වගුව 4:17. | පාරිතෝෂික සහ දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ විස්තරය | 65 |
| වගුව 4:18. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර යැපෙන්නන්ගේ දීමනා මරණ පාරිතෝෂික විශේෂ වන්දි හා වන්දි හිමිගැන්වීම පිළිබඳ විස්තරය | 65 |
| වගුව 4:19. | ආදායම් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීම් පිළිබඳ විස්තරය | 66 |
| වගුව 4:20. | වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පිළිබඳ සාරාංශ වාර්තාව | 67 |
| වගුව 4:21. | නැතිවීම් හා අලාභහානි සිදුවීම්වල සාරාංශගත වාර්තාව | 67 |
| වගුව 4:22. | ලිපිගොණු විශ්ලේෂණය පිළිබඳ විස්තරය | 68 |
| වගුව 4:23. | ලිපිගොණු විශ්ලේෂණය පිළිබඳ විස්තරය | 68 |
| වගුව 4:24. | මූල්‍ය විස්තරය - කෘෂිකර්ම හා පශුසම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය | 69 |
| වගුව 4:25. | අරමුදල තුළින් සාමාජිකයින් සඳහා ගෙවීම් සිදුකිරීම් පිළිබඳ විස්තරය | 73 |
| වගුව 4:26. | පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් අගයන් පිළිබඳ විස්තරය | 75 |
| වගුව 4:27. | අත්තිකාරම් ගිණුම පිළිබඳ විස්තරය | 76 |

| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| වගුව 4:28. | ද්‍රවශීල මුදල් කළමනාකරණයට අදාල සාරාංශය | 76 |
| වගුව 5:1. | මූල්‍ය විස්තරය - විධායක ජෙනරාල් ශාඛාව | 78 |
| වගුව 5:2. | මූල්‍ය විස්තරය - පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 80 |
| වගුව 5:3. | විදේශ දීමනා සාරාංශය - පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 80 |
| වගුව 5:4. | පදක්කම් ප්‍රධානය කිරීම් පිළිබඳ විස්තරය | 81 |
| වගුව 5:5. | අතිරේක රෙජිමේන්තු සේවා රාජකාරී සඳහා සෙසුනිලයින් පත්කිරීම/ ඇතුලත් කිරීම් | 82 |
| වගුව 5:6. | සේවය දීර්ඝ කිරීම් හා නැවත බඳවා ගැනීම් අනුමැතිය ලබාදීම | 82 |
| වගුව 5:7 | ක්‍රියාන්විතයේදී මියගිය/ආබාධිත අයවලුන් වෙනුවෙන් ලබාදෙන මරණ පාරිතෝෂික හා වන්දි මුදල් සබැඳිව ක්‍රියාකිරීම පිළිබඳ විස්තරය | 82 |
| වගුව 5:8. | බඳවාගැනීම් විස්තරය | 83 |
| වගුව 5:9. | පුනරාවර්තන වියදම් - යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය | 84 |
| වගුව 5:10. | ප්‍රාග්ධන වියදම් - යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය | 84 |
| වගුව 5:11. | පුනරාවර්ථන වියදම් පිළිබඳ විස්තරය - නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 87 |
| වගුව 5:12. | මූලික පරීක්ෂණ උසාවි / චෝදනාපත්/සිවිල් නඩු විස්තරය | 88 |
| වගුව 5:13. | මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වැය කිරීම් පිළිබඳ විස්තරය | 89 |
| වගුව 5:14. | රාජ්‍ය මුදල් ප්‍රතිපාදනයන් සබැඳි විස්තරය - සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය | 91 |
| වගුව 5:15. | සුභසාධක සංගම් ගිණුම් විස්තරය | 91 |
| වගුව 5:16. | මූල්‍ය විස්තරය - රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 92 |
| වගුව 5:17. | රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදෙන ලද සුභසාධක පහසුකම් පිළිබඳ විස්තරය | 93 |
| වගුව 5:18. | වැය ශීර්ෂ විස්තරය - පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය | 94 |
| වගුව 5:19. | මූල්‍ය විස්තරය - මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය | 96 |
| වගුව 5:20. | මානව හිමිකම් කමිටු විස්තරය | 96 |
| වගුව 5:21. | මූල්‍ය විස්තරය - ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය | 98 |
| වගුව 5:22. | මූල්‍ය විස්තරය - සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 99 |
| වගුව 5:23. | පුහුණු පාඨමාලා පැවැත්වීම පිළිබඳ විස්තරය | 100 |
| වගුව 5:24. | රාජකාරී වගකීම් සහ කාර්යන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් විස්තරය | 100 |
| වගුව 5:25. | සිවිල් සේවකයින් වෙත ණය ලබාදීම් පිළිබඳ විස්තරය | 100 |
| වගුව 5:26. | ප්‍රතිලාභ ලබාදීම් විස්තරය - සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 101 |
| වගුව 6:1. | මූල්‍ය විස්තරය - උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව | 104 |
| වගුව 6:2. | පුනරාවර්තන සහ ප්‍රාග්ධන අරමුදල් පිළිබඳ විස්තරය - ඉඩම්, දේපල සහ හඨ නිවාස අධ්‍යක්ෂ මණ්ඩලය | 105 |
| වගුව 6:3. | ඉඩම් පවරා ගැනීම් සහ නිදහස් කිරීම් පිළිබඳ විස්තරය | 106 |
| වගුව 6:4. | නිවාඩු බංගලා සඳහා ලැබී ඇති ප්‍රතිපාදන | 106 |
| වගුව 6:5. | විවාහක නිවාස නඩත්තු/අලුත්වැඩියා කටයුතු පිළිබඳ විස්තරය | 107 |
| වගුව 6:6. | ඉඩම්, දේපළ හා හඨ නිවාස අධ්‍යක්ෂ මණ්ඩල පාලන කටයුතු සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රතිපාදන පිළිබඳ විස්තරය | 107 |
| වගුව 6:7. | වැය ශීර්ෂයන්ට අදාල වියදම් විස්තරය - ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 108 |
| වගුව 6:8. | දුම්රිය ගැල් මඟින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වෙන්කරන ලද සහ භාවිතා කරන ලද ප්‍රතිපාදන සහ වියදම් විස්තරය | 109 |
| වගුව 6:9. | මුහුදු මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ වැය ශීර්ෂය සඳහා ප්‍රතිපාදන ලැබීම් සහ ඊට අදාල වැය විස්තරය | 110 |
| වගුව 6:10. | ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් නිකුත් ඇති ප්‍රතිපාදන | 110 |
| වගුව 6:11. | මූල්‍ය විස්තරය - සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය | 112 |
| වගුව 6:12. | නිරවුල් කිරීමට ඉතිරිව පවතින වවුචර්පත් වටිනාකම් විස්තරය | 113 |
| වගුව 6:13. | මූලධන ප්‍රතිපාදන හා වියදම් විස්තරය - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 114 |
| වගුව 6:14. | පුනරාවර්ථන වියදම් සඳහා ප්‍රතිපාදන හා වියදම් - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 115 |

| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| වගුව 6:15. | මූලධන සේවා සාරාංශය - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 116 |
| වගුව 6:16. | මූලධන සේවා විස්තරය (මිලියන 10 ට වැඩි) - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 117 |
| වගුව 6:17. | කොන්ත්‍රාත් සේවා සාරාංශය - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 118 |
| වගුව 6:18. | කොන්ත්‍රාත් සේවා විස්තරය (මිලියන 10 ට වැඩි) - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 118 |
| වගුව 6:19. | ව්‍යාපෘති සාරාංශය - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 119 |
| වගුව 6:20. | රු මී 50 ට වැඩි ව්‍යාපෘති විස්තරය - ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 119 |
| වගුව 6:21. | 2018 වර්ෂයේදී අවසන් කරන ලද ව්‍යාපෘති විස්තරය | 120 |
| වගුව 6:22. | පිබිදෙමු පොළොන්නරුව යටතේ ඇති ව්‍යාපෘති | 121 |
| වගුව 7:1. | මූල්‍ය විස්තරය - යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව | 124 |
| වගුව 7:2. | මූල්‍ය විස්තරය - යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 125 |
| වගුව 7:3. | මූල්‍ය විස්තරය - විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය | 127 |
| වගුව 8:1. | මූල්‍ය විස්තරය - අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා ශාඛාව | 131 |
| වගුව 8:2. | ටෙක්නෝ - 2018 ප්‍රදර්ශනයෙහි විස්තරය | 132 |
| වගුව 9:1. | 2017/2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 133 |
| වගුව 9:2. | පුහුණු වැය ශිර්ෂ යටතේ 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 133 |
| වගුව 9:3. | යුධෝපකරණ බළකා විෂයන් යටතේ වෙන් කරන වාර්ෂික ප්‍රතිපාදන විස්තරය යටතේ 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 134 |
| වගුව 9:4. | ඉංජිනේරු කාර්යන් සඳහා වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන යටතේ 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 134 |
| වගුව 9:5. | උතුරු නැගෙනහිර ප්‍රදේශයෙහි සංහිදියාව වර්ධනය කිරිම සඳහා රජයෙන් ගෙන ඇති ව්‍යාපෘති සඳහා 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය | 135 |
| වගුව 10:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) | 140 |
| වගුව 10:2. | මූල්‍ය වියදම් විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) | 140 |
| වගුව 10:3. | බෞද්ධ පුනරුද අරමුදල ප්‍රතිපාදන විස්තරය | 141 |
| වගුව 10:4. | පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) | 145 |
| වගුව 11:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | 147 |
| වගුව 11:2. | පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | 149 |
| වගුව 11:3. | බිම් වෙඩි නිසැක කිරීම් සාරාංශය - ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | 151 |
| වගුව 12:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි) | 153 |
| වගුව 12:2. | අභ්‍යාස දීමනා ගිණුමේ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) | 153 |
| වගුව 13:1. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය ශීර්ෂය විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 159 |
| වගුව 13:2. | පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 161 |
| වගුව 13:3. | බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලි පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 164 |
| වගුව 14:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) | 166 |
| වගුව 15:1. | වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | 172 |
| වගුව 15:2. | යුධෝපකරණ වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ විස්තරය ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | 173 |
| වගුව 15:3. | විදුලි හා යාන්ත්‍රික වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ විස්තරය ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | 173 |

| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| වගුව 15:4. | හමුදා හා සිවිල් සහයෝගිතා කටයුතු වල ප්‍රගතිය | 174 |
| වගුව 16:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු | 178 |
| වගුව 17:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - හකාස අණසක මූලස්ථානය | 181 |
| වගුව 17:2. | යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් විස්තරය - හකාස අණසක මූලස්ථානය | 181 |
| වගුව 17:3. | වෘත්තිය පරීක්ෂණ විස්තරය - හකාස අණසක මූලස්ථානය | 182 |
| වගුව 18:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය | 183 |
| වගුව 18:2. | මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘති වල ප්‍රගතිය - ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය | 183 |
| වගුව 18:3. | SLA-HDU මඟින් බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබද විස්තරය | 184 |
| වගුව 18:4. | සංවර්ධන ව්‍යාපෘති විස්තරය - ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය | 185 |
| වගුව 18:5. | සිරිසර පිවිසුම අරමුදල් පිළිබඳ විස්තරය | 186 |
| වගුව 18:6. | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය අරමුදල් පිළිබඳ විස්තරය | 186 |
| වගුව 18:7. | සංවර්ධන ව්‍යාපෘතින් සඳහා ඉංජිනේරු දායකත්වය ලබාදීම පිළිබඳ විස්තරය | 187 |
| වගුව 18:8. | පුහුණු පාඨමාලා පිළිබද විස්තරය - ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය | 188 |
| වගුව 19:1. | මූල්‍ය ප්‍රතිපාදන විස්තරය - ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය | 189 |
| වගුව 19:2. | පුහුණු පාඨමාලා විස්තරය - ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය | 191 |
| වගුව 20:1. | මූල්‍ය තොරතුරු - වෛද්‍ය උපර්ජන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 197 |
| වගුව 20:2. | ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදගත් ආකාරය - වෛද්‍ය උපර්ජන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 198 |
| වගුව 20:3. | මූල්‍ය තොරතුරු - කළමණාකරන හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලය | 199 |
| වගුව 20:4. | පුහුණු පාඨමාලා විස්තරය - නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 202 |
| වගුව 21:1. | යුද්ධාධිකරණය සබැඳිව විස්තරය | 204 |


නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## කෙටියෙදුම් නාමාවලිය

| | |
|---|---|
| ආරක්ෂක සේනා මුලස්ථානය (යාපනය) | ආසේමු (යා) |
| ආරක්ෂක සේනා මුලස්ථානය (වන්නි) | ආසේමු (ව) |
| ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) | ආසේමු (නැ) |
| ආරක්ෂක සේනා මුලස්ථානය (කිළිනොච්චි) | ආසේමු (කිළි) |
| ආරක්ෂක සේනා මුලස්ථානය (මුලතිව්) | ආසේමු (මුල) |
| ආරක්ෂක සේනා මුලස්ථානය (බටහිර) | ආසේමු (බ) |
| ආරක්ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | ආසේමු (ම) |
| ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය | ශ්‍රීලසසබ |
| ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | ශ්‍රීලකාහ |
| ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය | ශ්‍රීලංඉබ |
| ශ්‍රී ලංකා සංඥා බළකාය | ශ්‍රීලංසංබ |
| ශ්‍රී ලංකා පාබළ හමුදාව | ශ්‍රීලපාහ |
| ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | ශ්‍රීලංසිරෙ |
| ශ්‍රී ලංකා ගැමුණු හේවා බළකාය | ගැහේබ |
| ගජබා රෙජිමේන්තුව | ගරෙ |
| විජයබාහු පාබළ රෙජිමේන්තුව | විපාරෙ |
| යාන්ත්‍රික පාබළ රෙජිමේන්තුව | යාපාරෙ |
| කමාන්ඩෝ රෙජිමේන්තුව | කරෙ |
| විශේෂ බළකාය | විබ |
| සන්නද්ධ බුද්ධි බළකාය | සබුබ |
| ඉංජිනේරු සේවා බළකාය | ඉසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය | ශ්‍රීලයුසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය | ශ්‍රීලයුයුබ |
| ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | ශ්‍රීලවියාඉරෙ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය | ශ්‍රීලයුවෛබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය | ශ්‍රීලයුපොහේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය | ශ්‍රීලයුපොදුසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය | ශ්‍රීලයුකාබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකාය | ශ්‍රීලයුපුබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා රයිෆල් බළකාය | ශ්‍රීලංරබ |
| ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව | ශ්‍රීලංජාආබමු |

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථාන සංවිධාන ව්‍යුහය**



**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්ෂේත්‍ර සංවිධාන ව්‍යුහය**



## ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෙජිමේන්තු

**යුද්ධ හමුදා මූලස්ථානය**

- ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය (ශ්‍රීලසසබ)
- ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ශ්‍රීලකාහ)
- ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය (ශ්‍රීලංඉබ)
- ශ්‍රී ලංකා සංඥා බළකාය (ශ්‍රීලංසංබ)
- ශ්‍රී ලංකා පාබළ හමුදාව (ශ්‍රීලපාහ)
- ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ශ්‍රීලංසිරෙ)
- ගැමුණුහේවා බළකාය (ගැහේබ)
- ගජබා රෙජිමේන්තුව (ගරෙ)
- විජයබාහු පාබළ රෙජිමේන්තුව (විපාරෙ)
- යාන්ත්‍රික පාබළ රෙජිමේන්තුව (යාපාරෙ)
- කමාන්ඩෝ රෙජිමේන්තුව (කරෙ)
- විශේෂ බළකාය (විබ)
- සන්නද්ධ බුද්ධි බළකාය (සබුබ)
- ඉංජිනේරු සේවා බළකාය (ඉසේබ)
- ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය (ශ්‍රීලයුසේබ)
- ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය (ශ්‍රීලයුවෛබ)
- ශ්‍රී ලංකා යුද හමුදා යුද්ධෝපකරණ බළකාය (ශ්‍රීලයුයුබ)
- ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව (ශ්‍රීලවියාඉරෙ)
- ශ්‍රී ලංකා පොලිස්හේවා බළකාය (ශ්‍රීලයුපොහේබ)
- ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකාය (ශ්‍රීලයුපොදුසේබ)
- ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය (ශ්‍රීලයුකාබ)
- ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව (ශ්‍රීලංජාආබමු)
- ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බළකාය (ශ්‍රීලයුපුබ)
- ශ්‍රී ලංකා රයිෆල් බළකාය (ශ්‍රීලංරබ)

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු සංස්ථා

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති
  - ආඥාපති යුද හමුදා පුහුණු අණසක
    - ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය (දියතලාව)
    - නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය (බුත්තල)
    - යුද හමුදා පුහුණු පාසල (මාදුරුඔය)
    - පාබළ පුහුණු මධ්‍යස්ථානය (මින්නේරිය)
    - සටන් පුහුණු පාසල (අම්පාර)
    - යුද හමුදා ශාරීරික අධ්‍යන පුහුණු පාසල (පනාගොඩ)
    - ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල (දියතලාව)
    - ප්‍රගුණ හා සැගවුණු වෙඩිකරු පුහුණු පාසල (දියතලාව)
    - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය (කලාඔය)
    - ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනය (කුකුලේගග)
    - යුද හමුදා හට කාර්‍ය සම්පාදන විද්‍යාලය (කුකුලේගග)

**<u>පෙරවදන</u>**

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අයවැය මඟින් වෙන් කර ඇති මූල්‍යමය ප්‍රතිපාදන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කාර්යක්ෂමව භාවිත කළ ආකාරය, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමාජ, ආර්ථික සංවර්ධනයට, ජාතික අවශ්‍යතා, ආපදා සහන, මුදවා ගැනීමේ මෙහයුම් හා සංහිඳියා ක්‍රියාවලියට සක්‍රීයව දායක වූ ආකාරය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීම වාර්ෂික කාර්ය සාධන වාර්තාවෙහි ප්‍රධාන අරමුණයි.

එමනිසා මෙහි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි කිසිදු උපායමාර්ගික හෝ උපක්‍රමික ශක්‍යතා ඉගැන්වීම් පිළිබඳ විග්‍රහ නොවන අතර මෙම කාර්ය සාධන වාර්තාව පර්යේෂණ සිද්ධි අධ්‍යයන වාර්තා ප්‍රකාශයට පත් කිරීම හෝ ව්‍යාපෘති සැකසීම සඳහා වැදගත් මාර්ගෝපදේශයක් වනු ඇත.

මෙම සංක්ෂිත වාර්තාව සැකසීමේදී මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදා මූලස්ථානයට අයත් සියලුම ශාඛා, අධ්‍යක්ෂ මණ්ඩල හා ආරක්ෂක සේනා මූලස්ථාන සැලකිල්ලට ගන්නා ලදී.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය හංවැල්ල නගරයට ආසන්න සාලාව කොස්ගම යුද්ධ හමුදා කඳවුරේ ස්ථානගතව සිටිමින් ස්වේච්ඡා බළසේනාවට අයත් රෙජිමේන්තු, බළඇණි හා පුහුණු පාසල් හි ක්‍රියාන්විත පාලන සහ හඨ කාර්යය සම්පාදන අවශ්‍යතාවයන් ඉටුකිරීම මෙන්ම එම අවශ්‍යතා අදාළ ස්ථාන සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම හා අධීක්‍ෂණය කිරීම මූලික කාර්ය භාරයයි.

2. තවද ස්වේච්ඡා බළසේනා මූලස්ථානය මඟින් ස්වේච්ඡා බළසේනාවට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, නිලධාරී සහ සෙසුනිලයින්ගේ ඉදිරි ප්‍රගමනය සැලසුම් කිරීම හා යුද්ධ හමුදා මූලස්ථානයෙහි පනවනු ලබන නියෝග හා උපදෙස් ක්‍රියාවෙහි යෙදවීම මෙම මූලස්ථානය වෙතින් සිදුකරනු ලබයි.

### මූල්‍ය තොරතුරු

3. 2018 වර්ෂය සඳහා යුද්ධ හමුදාව වෙතින් ලද ප්‍රතිපාදනයන්ට අදාළ සත්‍ය වියදම් වැය ශීර්ෂයන්ට අනුව පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | අනුමත මුදල (රු.) | වැය දරා ඇති මුදල (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | රජක සේවා (222-01-4-1401(vii)) | 242,000.00 | 246,220.00 | - 4220.00 |
| 2. | භූමි නඩත්තු කටයුතු (222-01-2-1303(ii)) | 50,000.00 | 49,965.00 | 35.00 |
| 3. | නඩත්තු සේවා ගාස්තු (222-01-2-1205) | 1,000,000.00 | 1,000,000.00 | - |
| 4. | කසල ශෝධන කටයුතු (222-01-41-409(viii)) | 566,000.00 | 608,240.00 | 42,240.00 |
| 5. | නව මූලස්ථානය ඉදිකිරීම (222-01-1-2104) | 20,000,000.00 | 17,787,517.20 | 2,212,482.80 |
| 6. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියා කටයුතු (222-01-2-1302(iii)) | 100,000.00 | 956,00.00 | 4400.00 |
| 7. | පවිත්‍රතා, සනීපාරක්‍ෂක (222-01-5-140(xxiv)) | 70,000.00 | 69,996.00 | 4.00 |
| 8. | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා (222- 01-2-1201) | 567,000.00 | 566,480.00 | 520.00 |
| 9. | ශ්‍රීලංගම බස් රථ රියදුරන් සඳහා ගෙවීම (222-01-4-1401(vii)) | 975,000.00 | 1,046,214.00 | 71,214.00 |
| 10. | සිවිල් වාහන සඳහා කුලී ගෙවීම් (222-01-4-1401(vi)) | 449,025,000.00 | 481,253,344.00 | -32,228,344.00 |
| 11. | ප්‍රචාරණ කටයුතු (222- 01-4-1409(vi)) | 7,756,724.00 | 7,762,612.50 | 5,888.50 |
| 12. | පුහුණු වැය ශීර්ෂය (222-01-4-1409(xv) | 3,000,000.00 | 3,000,000.00 | - |
| 13. | පුවත්පත් (222-01-1-1205(xviii)) | 665,000.00 | 665,000.00 | - |

සටහන : ඉ තීරුවෙහි සඳහන් මුදල මේ දක්වා බිල්පත්/ ලියකියවිලි නිරවුල් වී ඇති පරිදි වේ.

වගුව 1:1. මූල්‍ය විස්තරය

**<u>ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය</u>**

4. ස්වේච්ඡා බළසේනා මූලස්ථානය ස්ථාපිත කිරීමට නියමිත නව භූමි ප්‍රදේශයෙහි වර්ෂය තුළ ලද ප්‍රතිපාදන යොදවා පහත මූලික අවශ්‍යතාවයන් / කාර්යන් නිමකර ඇත.

අ. සෙබලුන්ගේ භෞ‍ත නිවාස අවශ්‍යතා සම්පූර්ණ කර උසස් මානසිකත්වයෙන් යුතුව රාජකාරී ඉටුකිරීම සඳහා සෙසුනිල තෙමහල් නේවාසිකාගාර ගොඩනැගිලි 03 ක් සම්පූර්ණයෙන් ඉදිකර අවසන් කිරීම.




ආ. සම්පූර්ණයෙන්ම වායුසමනය කරන ලද නවීන උපකරණ වලින් යුත් සෙසුනිල භෝජනාගාරය ඉදිකිරීම.




ඇ. නවීන උපකරණ වලින් යුත් බේකරි පහසුකම් සහිත සෙසුනිල මුලුතැන්ගෙය ඉදිකිරීම.

ඈ. බුදු මැදුර ඉදිකිරීම.

ඉ. කඳවුර වෙත පිවිසෙන මාර්ගය තාර දමා කාපට් කර එහි මීටර් 900 ක වැඩ අවසන් කිරීම.




ඊ. දෙමහල් බළලත් නිළධාරී සහ සැරයන් නිවස්නයේ ඉදිකිරීම් කටයුතු 60% ක ප්‍රමාණයක වැඩ අවසන් කිරීම.

උ. විදුලි ජනක යන්ත්‍ර කාමරයේ ඉදිකිරීම් කටයුතු 90% ක ප්‍රමාණයක ඉදිකිරීම් අවසන් කිරීම.

ඌ. තෙමහල් සෙසුනිළ නේවාසිකාගාර ගොඩනැගිලි 02 ක ඉදිකිරීම් කටයුතු 15% ක ප්‍රමාණයක ඉදිකිරීම් අවසන් කිරීම.

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

5. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවට අයත් නිලධාරී/නිලධාරිණියන් 188 දෙනෙකු සඳහා සේවා කාලය හා සුදුසුකම් මත නිල උසස්වීම් යුද්ධ හමුදා මූලස්ථානය හා සම්බන්ධතාවයෙන් ලබාදෙන ලදි.

6. සාලාව කඳවුරෙහි ස්ථාපිතව තිබූ අවිගබඩාව පිපිරීමෙන් පසු අවට ප්‍රදේශවාසින්ගේ හානියට පත් දේපල වෙනුවෙන් ප්‍රදේශවාසින් විසින් අවිස්සාවේල්ල ගරු අධිකරණයෙහි පවරා ඇති උසාවි නඩු සඳහා ඇවැසි පූර්ණ සහයෝගය ලබාදෙන ලදි.

7. ජාතිය ගොඩනැගීමේ කාර්යන් සඳහා යුද්ධ හමුදාව යෙදවීමේදී වෘත්තිය නිපුණත්වයක් සහිත අයවලුන්ගේ හිඟතාවය මගහරවා ගැනීම සඳහා විවිධ ක්ෂේත්‍ර වලට අයත් වෘත්තිය නිලධාරීන් 35 දෙනෙකු අදියරයන් 05 ක් යටතේ බඳවාගන්නා ලද අතර, ඔවුන් සඳහා පුහුණු පාඨමාලාවන් 05 ක් පවත්වන ලදි.

8. ප්‍රදේශයේ ඇතිවන ජලගැලීමේ තත්ත්වයකදි සිවිල් ජනතාව හට සහයවීම සඳහා එන්ජිම සහිත බෝට්ටු 03 ක් ක්‍රියාකරුවන් සමඟ සුදානම් කර ඇත.

9. ස්වේච්ඡා බළසේනාවට අයත් නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ පවුලේ සමාජිකයින් වෙනුවෙන් යුද්ධ හමුදා මූලස්ථානය මඟින් ක්‍රියාත්මක රක්‍ෂණ යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන ක්ෂේත්‍ර ද ඇතුලත්කර රක්‍ෂණ යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව හා එක්ව ක්‍රියාත්මක කර නිලධාරී/සෙසුනිල හා සිවිල් සේවකයින් 54,774 ක් හට රක්‍ෂණාවරණයන් ලබාදී ඇති අතර, එමගින් රුපියල් 65,235,544.08 ක මුදලක් ප්‍රතිලාභ වශයෙන් අදාල සමාජිකයින්ට ලබාදී ඇත.

10. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙහි නිලධාරී/සෙසුනිල හා සිවිල් සේවක පාසල් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දිරිගැන්වීමක් හා අනුග්‍රහයක් ලෙස පහත පරිදි මූල්‍යාධාර ලබාදී ඇත.

අ. 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් 248 ක් සඳහා රුපියල් 3,720,000.00 ක මුදලක් ලබාදීම.

ආ. අපොස සාමාන්‍යපෙළ විභාගය විශිෂ්ඨ ලෙස සමත් වූ දරුවන් 418 දෙනෙකු සඳහා රුපියල් 8,725,000.00 ක මුදලක් ලබාදීම.

ඇ. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලත් වූ දරුවන් 35 දෙනෙකු සඳහා රුපියල් 14,195,000.00 ලබාදීම.

ඈ. පසුගිය ආසන්න වර්ෂයන්හිදී මූල්‍යාධාර ලබාදුන් සාරාංශය පහත පරිදි වේ.




සටහන: 2016 වර්ෂයේදී ලබාදුන් මූල්‍යාධාර මෙහි සඳහන් නොවේ

ප්‍රස්ථාරය 1:1. ආසන්න වර්ෂවලදී ලබාදුන් මූල්‍යාධාර සාරාංශය





11. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට අයත් නිලධාරී හා සෙසුනිලයින්ගේ කායික හා මානසික යෝග්‍යතාවය දියුණු කිරීම හා ක්‍රීඩා කෞශල්‍යන් වැඩිදියුණු කර ශ්‍රී ලංකා ක්‍රීඩා ක්ෂේත්‍රය වෙත ක්‍රීඩකයින් දයාද කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

අ. ස්වේච්ඡා බලසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිඩාංගනයේදී පවත්වන ලදී.

ආ. ස්වේච්ඡා බලසේනා අන්තර් රෙජිමේන්තු අත්පන්දු හා දැල්පන්දු ක්‍රිඩා තරඟාවලිය මහරගම යොවුන් රඟහල් ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී.

ඇ. අන්තර් රෙජිමේන්තු කඹ ඇදීමේ තරඟාවලිය දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිඩාංගනයේදී පවත්වන ලදී.





12. තවද ස්වේච්ඡා බලසේනාවට අයත් සෙසුනිලයින් විදේශීය ක්‍රීඩා තරඟාවලියන්හිදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම, දක්ෂතා දැක්වීම වෙනුවෙන් දිරිගැන්වීම් ලෙස සෙසුනිලයින් 18 දෙනෙකු සඳහා රුපියල් 1,275,000.00 මුදලක් ලබාදෙන ලදි.

13. කාන්තා බලකායට අයත් නොඃ 50, නාවිකවත්ත, රංපොකුණුගම, නිට්ටඹුව යන ලිපිනයේ පදිංචි ආබාධිත සෙබළ ආර්00885 කෝප්‍රල් ජයසිංහ ජේජ්එස්සි යන අය හට මෙම මුලස්ථාන සෙබලුන්ගේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් ස්ථිර නිවසක් ඉදිකර ලබා දෙන ලදි.





14. කඩුවෙල මානෙල් වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් සඳහා හයිපිරිස් ලබාදී ඇති අතර, එහි අක්කර 12 ක පමණ ප්‍රදේශයක භූමි අලංකරණ කටයුතු සිදුකරනු ලබයි.

15. යුද්ධ හමුදාවෙහි හයිපිරිස් අවශ්‍යතා සපුරාලීම සඳහා වෘත්තීය නිලධාරීන්/ කෙඩෙට් නිලධාරින් 129 දෙනෙකු හා සෙසුනිලයින් 3,622 දෙනෙකු බඳවා ගන්නා ලදි.

16. මෙම මූලස්ථාන නිලධාරින්ගේ හා සෙසුනිලයින්ගේ විෂය දැනුම, සමාජීය දැනුම වර්ධනය කිරීමෙහිලා විවිධ වැඩසටහන්, පුහුණුසැසි හා වැඩමුලු පිළිගත් ආයතන හා සම්පත් දායකයින්ගේ සම්බන්ධතාවයෙන් සංවිධානය කරන ලදී.

**ගැටලු හා අභියෝග**

17. සාලාව කඳවුරු පරිශ්‍රයෙහි 2016.06.05 දින ඇති වූ ව්‍යසනය හේතුවෙන් විනාශ වූ ගොඩනැගිලි කාර්යාලීය උපකරණ ඇතුලු අනෙකුත් භෞතික දෑ අත්පත් කර ගැනීම හා නැවත ගොඩනැංවීම.

18. කාර්යාල සඳහා අවශ්‍ය ඉඩපහසුකම් පුලුල් කිරීම හා නව තාක්ෂණයෙන් යුත් කාර්යක්ෂම කාර්යාලීය උපකරණ ලබාගැනීම.

19. ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය ස්ථාපිත කිරීමට නියමිත නව භූමි භාගයෙහි යෝජිත ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන හා පුහුණු හයිපිරිස් ලබාගැනීම.

**සාරාංශය**

20. ස්වේච්ඡා බලසේනාවේ සියලු දෙනාට සමාන අවස්ථා ලබාදීමටත් වඩාත් ශක්තිමත් ලෙස සතුටුදායක අන්දමින් රාජකාරී ඉටුකිරීම සඳහා පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් පහත යෝජනා ඉදිරිපත් කෙරේ:

අ. ස්වේච්ඡා බලසේනාවෙහි නිලධාරීන් සහ සෙසුනිලයින් හට විදේශීය පුහුණු අවස්ථා වැඩි කර ගැනීම.

ආ. ස්වේච්ඡා බලසේනාවට අයත් සෙසුනිලයින් වසර 22 ක් අවසානයේ විශ්‍රාම ගැන්වීම සඳහා ස්වේච්ඡා බලසේනා රෙගුලාසි මාලාව සංශෝධනය කිරීම.

ඇ. ස්වේච්ඡා බලසේනාවේ සමාජිකයන් හට රාජ්‍ය නිලධාරීන් සඳහා ලබාදෙනු ලබන ආපදා ණය පහසුකම් ලබා ගැනීම.

ඇ. ස්වේච්ඡා බලසේනාව වෙත බ්‍රිගේඩියර් තනතුරු (අනුමත සංඛ්‍යාව 04 කි) හා කර්නල් නිලයේ තනතුරු (අනුමත සංඛ්‍යාව 39 කි) ඇබෑර්තු ප්‍රමාණය වැඩිකර ගැනීම.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## යුද සේවා ලේකම් ශාඛාව

1. යුද සේවා ලේකම් ශාඛාව යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධානතම උප ආයතනයක් ලෙස ක්‍රියා කරන අතර, යුද සේවා ලේකම් මෙම ශාඛාවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. යුද සේවා ලේකම් මේජර් ජෙනරාල් නිලය දරණ යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී තනතුරක් දරණ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි. යුද්ධ හමුදා නිලධාරීන් හා අදාළ මානව සම්පත් කළමනාකරණය සබැඳි කටයුතු සිදුකිරීම මෙම ශාඛාවේ විෂය පථයට අයත් වේ.

**වර්ෂය තුළ ඉටුකරනු ලැබූ රාජකාරී පිළිබඳ සමාලෝචනය**

2. මෙම වර්ෂය තුළදී පහත පරිදි නිල උසස් කිරීමේ මණ්ඩල වල වැඩ කටයුතු අවසන් කර ඇත.

අ. නිලධාරී නිල උසස් කිරීමේ මණ්ඩල පිළිබඳ විස්තරය.

| අනු අංකය | විස්තරය | සලකා බැලූ නිලධාරී සංඛ්‍යාව | | උසස් කරන ලද නිලධාරී සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | නිත්‍ය | ස්වේච්ඡා | නිත්‍ය | ස්වේච්ඡා |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | 2/ලුතිතන් සිට ලුතිතන් (මණ්ඩල 7) | 269 | 23 | 179 | 13 |
| 2. | ලුතිතන් සිට තා/කපිතන් (මණ්ඩල 14) | 463 | 234 | 206 | 108 |
| 3. | කපිතන් සිට තා/මේජර් (මණ්ඩල 13) | 712 | 117 | 208 | 20 |
| 4. | මේජර් සිට තා/ලුතිතන් කර්නල් (මණ්ඩල 2) | 91 | 51 | 42 | 22 |
| 5. | ලුතිතන් කර්නල් සිට තා/කර්නල් (මණ්ඩල 3) | 156 | 53 | 49 | 13 |
| 6. | කර්නල් සිට තා/බ්‍රිගේඩියර් (මණ්ඩල 5) | 164 | 22 | 40 | 04 |
| 7. | බ්‍රිගේඩියර් සිට තා/මේජර් ජෙනරාල් (මණ්ඩල 3) | 66 | - | 31 | - |

වගුව 2:1. නිලධාරීන් නිල උසස් කිරිමේ මණ්ඩල පිළිබඳ විස්තරය

ආ. නිලධාරීන් නිල ස්ථිර කරන ලද මණ්ඩල පිළිබඳ විස්තරය.

| අනු අංකය | විස්තරය | සලකා බැලූ නිලධාරී සංඛ්‍යාව | | උසස් කරන ලද නිලධාරී සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | නිත්‍ය | ස්වේච්ඡා | නිත්‍ය | ස්වේච්ඡා |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | කපිතන් (මණ්ඩල 11) | 785 | - | 568 | - |
| 2. | මේජර් (මණ්ඩල 3) | 617 | 167 | 401 | 67 |
| 3. | ලුතිතන් කර්නල් (මණ්ඩල 4) | 182 | 33 | 113 | 09 |
| 4. | කර්නල් (මණ්ඩල 2) | 78 | 07 | 61 | 05 |
| 5. | බ්‍රිගේඩියර් (මණ්ඩල 1) | 35 | - | 35 | - |
| 6. | මේජර් ජෙනරාල් (මණ්ඩල 3) | 21 | 01 | 20 | 01 |
| 7. | බ්‍රිගේඩියර් සිට තා/මේජර් ජෙනරාල් (මණ්ඩල 3) | 66 | - | 31 | - |

වගුව 2:2. නිලධාරීන් නිල ස්ථිර කරන ලද මණ්ඩල පිළිබඳ විස්තරය

3. 2018 වර්ෂය තුළ විශ්‍රාමික නිලධාරීන්ගේ විස්තර.

| අනු අංකය | විස්තරය | නිලධාරී | |
|---|---|---|---|
| | | නිත්‍ය | ස්වේච්ඡා |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | 2 / ලුතිනන් | 05 | 06 |
| 2. | ලුතිනන් | 13 | 26 |
| 3. | ලුතිනන් (උපකරණ පාලක) | 25 | 09 |
| 4. | කපිතන් | 107 | 50 |
| 5. | කපිතන් (උපකරණ පාලක) | 20 | 10 |
| 6. | මේජර් | 59 | 40 |
| 7. | මේජර් (උපකරණ පාලක) | 08 | -- |
| 8. | ලුතිනන් කර්නල් | 21 | 08 |
| 9. | ලුතිනන් කර්නල් (උපකරණ පාලක) | 01 | -- |
| 10. | කර්නල් | 03 | 07 |
| 11. | බ්‍රිගේඩියර් | 09 | 03 |
| 12. | මේජර් ජෙනරාල් | 23 | -- |
| | **එකතුව** | **294** | **159** |

වගුව 2:3 2018 වර්ෂය තුළ විශ්‍රාමලත් නිලධාරීන්ගේ විස්තරය

4. යුද්ධ හමුදාවේ ප්‍රගමනික වර්ධනය සඳහා ඉවහල් වන කාරණා සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපති වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා යුද්ධ හමුදා පරිපාලන මණ්ඩල 21ක් යුධ සේවා ලේකම් ශාඛාව මඟින් පත්කරනු ලැබීය.

5. මූලික පරීක්ෂණ උසාවි 1488 කට අදාල වාර්තා විමර්ශණ අංශය මඟින් යාවත්කාලීන කරන ලද අතර, සම්පූර්ණ කරන ලද මූලික පරීක්ෂණ උසාවි වාර්තා 820 ක ප්‍රමාණයක ලේඛණගත කටයුතු අදාළ කාලය තුළදී නිම කරනු ලැබූ අතර රාජ්‍ය විමර්ශන ආයතන හා කමිටු වෙත පහත පරිදි විමර්ශන වාර්තා යොමු කරනු ලැබීය.

| අනු අංකය | | මූල්‍ය අපරාධ විමර්ෂණ කොට්ඨාශය | අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව | ජනාධිපති පරීක්ෂණ කොමිසම | අල්ලස් කොමිසම | සිවිල් කොමිසම | රිට් පෙත්සම් | GCM |
|---|---|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) | (එ) |
| 1. | නඩු | 1 | 7 | 5 | 9 | 8 | 21 | 2 |
| 2. | අදාළ නියෝජිතයින් වෙත ලබා දෙන ලද ලියකියවිලි | 2 | 12 | 2 | 14 | 2 | 21 | 2 |

වගුව 2:4. මූලික පරීක්ෂණ උසාවි විමසීම් පිළිබඳ විස්තරය

6. යුද්ධ හමුදාධිපති උපදෙස් ප්‍රකාරව යුධ සේවා ලේකම් ශාඛාව මගින් පහත දැක්වෙන ප්‍රතිපත්ති හා නිර්ණායක ප්‍රකාශයට පත්කරන ලදී:

අ. වාර්ෂික රහස්‍ය වාර්ථා සම්පූර්ණ කිරීම - නිලධාරී.

ආ. නිත්‍ය හා ස්වේච්ඡා බළඇණිවල අණදෙන නිලධාරී තනතුරු පත්කිරීමේ ප්‍රතිපත්තිය.

ඇ. නිලධාරීන්ගේ වෘත්තීය ප්‍රගමණය සබැඳිව උපදෙස් ලබාදීම- නිල ස්ථිර කිරීම් පිළිබඳ වන නිර්ණායකයන්.

ඈ. සමුගැනීමේ සාද සඳහා වන ක්‍රියා පිළිවෙත.

ඉ. අතිරේක රෙජිමේන්තු සේවා සබැඳි ප්‍රතිපත්ති (2 ශ්‍රේණිය සහ ඉන් පහළ).

7. යුධ සේවා ලේකම් ශාඛාව මගින් පහත පරිදි නිශ්කාෂණ ලබා දී ඇත:

අ. පාඨමාලා (පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත) - 476

ආ. එක්සත් ජාතීන්ගේ මාණ්ඩලික නිලධාරී හා යුධ නිරීක්ෂක

ඇ. එක්සත් ජාතීන්ගේ ද්විතීයක - 73 (නිෂ්කාශණ වාර්තා)

ඈ. එක්සත් ජාතීන්ගේ බළඇණි

8. **නිල උත්සව සංවිධානය.**

අ. **ආරක්ෂක මාණ්ඩලික සාකච්ඡා.** යුද්ධ සේවා ලේකම් ශාඛාව පහත සඳහන් කාර්ය මණ්ඩල සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සම්බන්ධීකරණය කරන ලදී:

(1) 7 වන ඉන්දීය - ශ්‍රී ලංකා හමුදා මාණ්ඩලික සාකච්ඡා වටය 2018 මාර්තු 20 සිට 22 දක්වා පැවැත්වීය.

(2) පැසිෆික් කලාපීය සාකච්ඡාවන්හි 2 වන වටය 2018 අප්‍රේල් 16 හා 17 යන දෙදින තුළ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විය.

(3) ශ්‍රී ලංකා හා පාකිස්ථාන සන්නද්ධ හමුදා අතර පැවැත්වෙන ආරක්ෂක සංවාද වල පළමු වටය 2018 ඔක්තෝබර් 03 සහ 04 දිනයන්හී පවත්වන ලදී.

ආ. **ආරක්ෂක විදේශ දූත සංචාර.** යුද්ධ හමුදා මූලස්ථාන ශාඛා / අධ්‍යක්ෂ මණ්ඩල සමඟ සම්බන්ධතාවයෙන් යුතුව යුධ සේවා ලේකම් ශාඛාව මගින් පහත විදේශ ආරක්ෂක දූත සංචාර සම්බන්ධීකරණය සිදුකරන ලදී:

(1) පාකිස්තාන හමුදාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් කටාර් ජාවඩ් බාජ්වා එන්අයි (එම්) ගේ ශ්‍රී ලංකා සංචාරය 2018 ජනවාරි 14 දින සිට 17 දක්වා පැවැත්විය.

(2) නේපාල හමුදාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් රාජේන්ද්‍ර චෙට්රිගේ ශ්‍රී ලංකා සංචාරය 2018 ජනවාරි 18 සිට 22 දක්වා පැවැත්විය.

(3) බංගලාදේශ හමුදා නියෝජිත පිරිසකගේ ශ්‍රී ලංකා සංචාරය 2018 මාර්තු මස 05 සිට 09 දක්වා පැවැත්විය.

(4) ශ්‍රී ලංකා හමුදාවට කාන්තා සෙබලියන් බඳවා ගැනීම හා රැකියාවේ යෙදවීම පිළිබඳව අධ්‍යනය කිරීමට ශ්‍රී ලංකාවට පැමිණි බංගලාදේශ හමුදා නියෝජිත පිරිසගේ සංචාරය 2018 මාර්තු මස 25 දින සිට 30 දක්වා පැවැත්විය.

(5) පාකිස්තානයේ NDU පාඨමාලාව හදාරණ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා අධ්‍යයන සංචාරය අප්‍රේල් මස 16 සිට 19 දක්වා පැවැත්විය.

(6) ඉන්දියානු හමුදාවේ අණ හා මාණ්ඩලික ප්‍රධාන ජෙනරාල් බිපින් රාවට් යුවයිඑස්එම් ගේ ශ්‍රී ලංකා සංචාරය 2018 මැයි මස 13 සිට 18 දක්වා පැවැත්වීම.

(7) චීනයේ NDU පාඨමාලාව හදාරණ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා අධ්‍යාපන සංචාරය ජුනි මස 19 සිට 21 දක්වා පැවැත්විය.

(8) පාකිස්තාන හමුදා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන සුහාර් මහමුද් හෙයට් එන්අයි (එම්) ගේ සහ එම නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරය 2018 ජුනි මස 27 දින සිට 30 දක්වා පැවැත්විය.

(9) සිම්බාබ්වේ NDU පාඨමාලාව හදාරණ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා අධ්‍යාපන සංචාරය ජුලි මස 01 සිට 17 දක්වා පැවැත්විය.

(10) එක්සත් ජනපද හමුදා පැසිෆික් කලාපීය (USALPAC) අණදෙන නිලධාරී ජෙනරාල් රොබට් බ්‍රවුන්ගේ ශ්‍රී ලංකා සංචාරය 2018 ජුලි මස 21 සිට 24 දක්වා පැවැත්විය.

(11) ඉන්දියානු NDU පාඨමාලාව හදාරණ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා අධ්‍යයන සංචාරය 2018 අගෝස්තු මස 26 සිට 29 දක්වා පැවැත්විය.

(12) බංගලාදේශ NDU පාඨමාලාව හදාරණ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා අධ්‍යයන සංචාරය 2018 සැප්තැම්බර් මස 16 සිට 21 දක්වා පැවැත්විය.

(13) අධ්‍යක්ෂක ජෙනරාල් පාබල පකිස්තාන හමුදා ජෙනරාල් අබීඩ් රෆීක්ස් එච් අයි සහ එම නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරය 2018 අගෝස්තු මස 31 සිට සැප්තැම්බර් මස 06 දක්වා පැවැත්විය.

(14) ඉන්දියානු හමුදාවේ උසස් අණදෙන පාඨමාලාව ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරය 2018 සැප්තැම්බර් 25 සිට 29 දක්වා පැවැත්විය.

(15) ආරක්ෂක ලේකම්ගේ යුද්ධ හමුදා මූලස්ථානයට සිදුකළ සංචාරය 2018 නොවැම්බර් මස 19 වන දින සිදු කරන ලදි.

(16) බංගලාදේශ හමුදාවේ 2018/2019 ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලාවේ අධ්‍යනය සංචාරය 2018 නොවැම්බර් 18 සිට දෙසැම්බර් 01 දක්වා පැවැත්විය.

(17) අධ්‍යක්ෂක ජෙනරාල් හමුදා පුහුණු පාකිස්තානු හමුදාව ශ්‍රී ලංකාවේ සිදුකල සංචාරය 2018 දෙසැම්බර් 11 දින සිට 15 දක්වා පැවැත්විය.

<u>**ගැටළු හා අභියෝග**</u>

9. යුද සේවා ලේකම් ශාඛාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සඳහා සරිලන තොරතුරු තාක්ෂණ නිලධාරියෙක්/ දත්ත සැකසුම් නිලධාරියෙක් / පද්ධති සැකසුම්කරුවෙක් පත්කිරීම.

10. අපේක්ෂිත ඉඩපහසුකම් සඳහා වූ කාර්යාල අවකාශය සොයාබැලීම.

11. ස්වයංක්‍රියාකරණයට පෙර ප්‍රතිපත්ති / නිර්ණායක අනුකූලනය.

12. සියලුම පුද්ගලික ලිපිගොනුවල මෘදු පිටපත් විමර්ශන පහසුව තකා සංරක්ෂණය කිරීම.

## ප්‍රධාන මාණ්ඩලික ශාඛාව

1. ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යුද්ධ හමුදා මුලස්ථානයේ මූලික ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වන අතර, එය ප්‍රධාන වශයෙන් යුද්ධ හමුදා මෙහෙයුම්, සැළසුම් කටයුතු, සන්නද්ධ බුද්ධි කර්තව්‍යන්, සන්නද්ධ අයවළුන් පුහුණුව සහ මාණ්ඩලික රාජකාරි කටයුතු නියාමනය හා අධීක්ෂණය සිදුකරනු ලබයි. ප්‍රධාන මාණ්ඩලික ශාඛාවේ ප්‍රධානියා ලෙස යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරින්ගෙන් එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස වගකීම් පැවැරී ඇති මේජර් ජෙනරාල් නිලයේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික (අජෙප්‍රමා) කටයුතු කරයි. මෙම ශාඛාව යටතේ උපදේශක මුලස්ථාන 02 ක් අධ්‍යක්ෂ මණ්ඩල 10 ක් හා බළසේනා මුලස්ථාන 05 ක් ක්‍රියාත්මක වේ.




රූප සටහන 2:1 ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ පවතින ආයතන

## 2017 වර්ෂය තුළ කාර්ය සාධනය

2. වර්ෂ 2017 තුළදී පහත අයිතමයන් බෙදාහැරීම වෙනුවෙන් ප්‍රධාන මාණ්ඩලික ශාඛාව අනුමැතිය ලබාදෙන ලදී.

| | | | |
|---|---|---|---|
| අ. | පරිගණක යන්ත්‍ර | - | 517 |
| ආ. | ඩොට්මෙට්‍රික්ස් මුද්‍රණ යන්ත්‍ර | - | 84 |
| ඇ. | ලේසර් මුද්‍රණ යන්ත්‍ර (කළු සුදු) | - | 18 |
| ඈ. | ෆැක්ස් යන්ත්‍ර | - | 02 |
| ඉ. | ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර | - | 65 |
| ඊ. | වීඩියෝ කැමරා | - | 02 |
| උ. | ඩිජිටල් වීඩියෝ කැමරා | - | 30 |
| ඌ. | ට්‍රෙඩ්මිල්ස් | - | 09 |

**වාර්ෂික කාර්ය ප්‍රගති සමාලෝචනය**

3. මූල්‍ය ප්‍රගතිය - පුනරාවර්තන වියදම්.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කල ප්‍රතිපාදන (රු.) | මුළු වියදම 2018.12.31 දිනට (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | පුහුණු ඉන්ධන වැය ශීර්ෂය | 184,578,415.00 | 184,236,859.00 |
| 2. | ආරක්ෂක ඉන්ධන වැය ශීර්ෂය | 62,727,650.00 | 62,608,285.00 |
| 3. | ව්‍යාපෘති ඉන්ධන වැය ශීර්ෂය | 97,392,200.00 | 96,754,915.00 |
| 4. | සුභ සාධන | 36,760.00 | - |
| 5. | ලිපි ද්‍රව්‍ය | 300,000.00 | 209.637.20 |
| 6. | සනීපාරක්ෂක කටයුතු | 16,000.00 | - |
| 7. | පුහුණු වියදම්/ප්‍රතිපාදන | 3,700.00 | - |
| | **එකතුව** | **345,054,725.00** | **343,600,059.00** |

වගුව 3:1. මූල්‍ය විස්තරය (පුනරාවර්තන වියදම්)

4. මූල්‍ය ප්‍රගතිය - ප්‍රාග්ධන වියදම්.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කල ප්‍රතිපාදන (රු.) | මුළු වියදම 2018.12.31 දිනට (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | යන්ත්‍ර සූත්‍ර | 20,226,000.00 | 19,519,512.50. |

වගුව 3:2. මූල්‍ය විස්තරය (ප්‍රාග්ධන වියදම්)

**ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය**

5. ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ පාලනය වන ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු කටයුතු කරනු ලබයි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදා නියෝග අංක 18/94 අනුව යුද්ධ හමුදා මෙහෙයුම් (යුධ උපක්‍රම), මෙහෙයුම් සංකල්ප, හදිසි අවස්ථා සැලසුම් නියෝග හා උපදෙස් නිකුත් කිරීම යන කාර්යන්හි ඉටුකිරීම සඳහා නිළධාරීන් 15 කින් හා සෙසු නිලයින් 89 කින් සමන්විත වේ.

**මූල්‍ය තොරතුරු**

6. මෙම අධ්‍යක්ෂ මණ්ඩල රාජකාරියෙහි නියුතු නිලධාරී/ සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා වාර සඟරා මිලදී ගැනීම හා දිනපතා පුවත්පත් මිලදී ගැනීම සිදුකරනු ලබන අතර, මෙම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රයෝජනය සඳහා අවැසි ලිපිද්‍රව්‍ය/ කාර්යාලීය උපකරණ හා සනීපාරක්ෂක කටයුතු සඳහා වැය ශීර්ෂය මඟින් වියදම් කරන ලද විස්තර වාර්තාව පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | 2018 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | ඉතිරි මුදල (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | සනීපාරක්ෂක ද්‍රව්‍ය (222-01-2-1205 (xxiv)) | 10,000.00 | 10,000.00 | නොමැත | - |
| 2. | සුභ සාධක පුවත් පත් මිලදී ගැනීම (222-01-02-1205 (xviii)) | 49,000.00 | 47,640.00 | 1,360.00 | - |
| 3. | ලිපිද්‍රව්‍ය (222-01-1201) | 675,000.00 | 589,557.00 | 85,443.00 | ඉතිරි මුදල් 2019.03.15 දින දක්වා ලිපිද්‍රව්‍ය ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇත |
| 4. | වාර සඟරා (222-01-1-1409 (xv)) | 8,760.00 | 8,760.00 | නොමැත | - |
| 5. | අභ්‍යාස දීමනා (222-01-1-1409 (XV)) | 30,000.00 | 30,000.00 | නොමැත | - |

වගුව 3:3. මූල්‍ය විස්තරය

7. යුද්ධ හමුදාවේ සියලු ස්ථාන වෙත රාජකාරී කටයුතු සඳහා ලබාදී ඇති දුරකථන / අන්තර්ජාල පහසුකම් සඳහා වන බිල්පත් නිරවුල් කිරීම සිදු කර ඇති ආකාරය පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | 2018 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | ඉතිරි ප්‍රතිපාදන/ප්‍රතිපාදන සීමාව ඉක්මවා වැය දැරීම (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| | **සංදේශ සේවා** | | | |
| 1. | 222-01-1-1402 (i) | 154,500,000.00 | 158,865,440.96 | ( 4,365,440.96) |
| 2. | 222-01-2-1402 (i) | 22,980,000.00 | 23,560,410.97 | (580,410.49) |
| 3. | 222-01-3-1402 (i) | 53,700,000.00 | 51,799,038.96 | (1,099,038.96) |
| | **එකතුව** | **231,180,000.00** | **234,224,890.89** | **(6,044,890.89)** |
| | **තැපැල් වියදම්** | | | |
| 4. | 222-01-1-1402 (ii) | 7,000,000.00 | 6,104,945.00 | 895,055.00 |
| 5. | 222-01-2-1402 (ii) | 1,020,000.00 | 1,103,620.00 | 16,380.00 |
| 6. | 222-01-3-1402 (ii) | 2,300,000.00 | 1,933,107.32 | 366,892.68 |
| | **එකතුව** | **10,320,000.00** | **9,041,672.32** | **1,278,327.68** |
| | **සැටලයිට්** | | | |
| 7. | 222-01-1-1402 (ii) | 1,500,000.00 | 1,497,456.99 | 2,543.01 |

වගුව 3:4. බිල්පත් නිරවුල් කිරීම සබැඳි විස්තරය

8. යුද්ධ හමුදාවේ සියලු ස්ථාන වෙත කඳවුරු ආරක්ෂිත භාණ්ඩ මිලදී ගැනීම, අශ්වයන් සහ සුනඛයින් මිලදී ගැනීම් කටයුතු සිදුකර ඇති ආකාරය පහත පරිදි වේ.

| අනු අංකය | විස්තරය | 2018 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අශ්වයන් සහ සුනඛයන් මිලදී ගැනීම (222-01-3-2013 (iv)) | 6,242,414.50 | 6,108,692.50 | 133,722.00 |
| 2. | කඳවුරු ආරක්ෂිත භාණ්ඩ මිලදී ගැනීම (222-01-2-1205 (xii)) | 182,185,736.00 | 99,353,803.79 | 82,831,932.21 |

වගුව 3:5. කඳවුරු ආරක්ෂිත, අශ්වයන් සහ සුනඛයින් මිලදී ගැනීම් සබැඳි විස්තරය

**<u>ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය</u>**

9. යුද්ධ හමුදාවේ සියලු ස්ථාන වෙත රාජකාරී කටයුතු සඳහා ලබාදී ඇති දුරකථන/ අන්තර්ජාල පහසුකම් සඳහා වන බිල්පත් නිරවුල් කිරීම සිදුකර ඇත.

10. යුද්ධ හමුදාවේ සියලුම ස්ථානයන්හි තැපැල් වියදම් බිල්පත් නිරවුල් කිරීම සඳහා රුපියල් 9,041,672.32 ක මුදලක් සහ සැටලයිට් රූපවාහිනී සම්බන්ධතාවයන් සඳහා රුපියල් 1,497,456.99 ක මුදලක් වියදම් කර ඇත.

11. යුද්ධ හමුදාවේ සියලු ස්ථාන වෙත කඳවුරු ආරක්ෂිත භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් 99,353,803.79 ක මුදලක් සහ අශ්වයන් සහ සුනඛයින් මිලදී ගැනීම් කටයුතු වෙනුවෙන් රුපියල් 6,108,692.50 ක මුදලක් වැය කර ඇත.

12. මෙම අධ්‍යක්ෂ මණ්ඩල රාජකාරියෙහි නියුතු නිලධාරී/ සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා සුබසාධක පුවත් පත් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් 56,400.00 ක මුදලක්ද කාර්යාලීය ලිපිද්‍රව්‍ය සහ උපකරණ වෙනුවෙන් රුපියල් 589,557.00 ක මුදලක්ද වැය කර ඇති අතර, වර්ෂ අවසානයේ ලිපිද්‍රව්‍ය සඳහා රුපියල් 85,443.00 ක ශේෂයක්ද සුභ සාධක පුවත් පත් මිලදී ගැනිමෙන් පසු රුපියල් 1360.00 ක ශේෂයක්ද ඉතිරිව ඇත.

**වර්ෂයේ කාර්ය සාධක සාරාංශය**

13. දීපව්‍යාප්ත ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා සහ මෙහෙයුම් මැදිරි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය හය්පිරිස් අවශ්‍යතාවයන් ලබාදිම.

14. වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් අත්‍යවශ්‍ය සේවා අඩපණ වු අවස්ථාවන් වලදී එම සේවා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදීම (දුම්රිය සේවක වැඩ වර්ජනය සිදුවු අවස්ථාවේදී).

15. පහත සඳහන් හදිසි ආපදා තත්ත්වයන්හිදී රජයේ/ සිවිල් ආයතනයන් සඳහා යුද්ධ හමුදා සහය ලබාදීම.

අ. කොළඹ, ගාල්ල, රත්නපුර, ගම්පහ, පුත්තලම, කෑගල්ල හා කළුතර දිස්ත්‍රික්කයන්හි ඇතිවූ ගංවතුර තත්වය.

ආ. විටින් විට ඇතිවූ අධික වැසි සහිත කාලගුණික තත්ත්වය හේතුවෙන් ඇති වූ ගංවතුර අවස්ථාවන් තුළදි.

ඇ. ලැව් ගිනි තත්වයන් පාලනය කිරිම හා සහයෝගය ලබාදීම.

ඈ. අධික සුළිසුලං හේතුවෙන් විපතට පත්වූවන්ට සහන සැලසීම.

ඉ. මුහුදේ සිට ඔරුගොඩවත්ත/ උස්වැටකෙයියාව ප්‍රදේශයට බොරතෙල් ප්‍රවාහනය කරන නලවල ඇතිවු කාන්දුවීම නිසා වෙරළ තිරයට සිදුවු හානිය වැලක්වීම සඳහා.

ඊ. නගරාසන්න ගොඩනැගිලි වල ඇතිවු ගිනි ගැනීම් පාලනය කිරීම හා සහන කටයුතු සඳහා අවශ්‍ය සහය සැලසීම.

උ. නගරාසන්න ගොඩනැගිලි කඩාවැටීම් සිදුවු අවස්ථාවන් වලදී අවශ්‍ය සහය සැලසීම.

**වසරේ ජයග්‍රහණයන්**

16. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය වෙමින් දිවයින වටා ස්ථානගත කර ඇති සුනාමි අනතුරු ඇඟවීමේ කුලුණු වල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා 2018 සැප්තැම්බර් මස 05 වන දින පෙරහුරු අභ්‍යාසයක් පැවැත්වීම සඳහා හය්පිරිස් යෙදවීම හා සම්බන්ධීකරණය කිරීම.

17. ආරක්ෂක සේනා මූලස්ථාන බළප්‍රදේශවල සිදුවන ආපදා තත්ත්වයන්ට ක්ෂණිකව මුහුණදීම සඳහා ස්ථාපිත හදිසි ප්‍රතිචාර දැක්වීමේ බණ්ඩ සුදානමින් තැබීම.

18. දිවයිනේ ඇතිවන හදිසි ආපදා තත්වයන්ට සංවිධානාත්මකව මුහුණදීම සඳහා ස්ථාපිත කර ඇති සෙවීමේ හා මුදවා ගැනීමේ බණ්ඩ 75 ක් සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම.

19. ගංවතුර තර්ජනයන්ට නිරතුරුවම මුහුණදෙන ස්ථාන හඳුනාගෙන විපතට පත්වූවන් ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා අවශ්‍ය බෝට්ටු/පාරු හා එන්ජින් ස්ථානගත කිරීම.

**ගැටළු සහ අභියෝග**

20. යුද්ධ හමුදාව වෙත ආපදා තත්ත්වයන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් දැනුම හා මිනිස් ශ්‍රමය තිබුණද අවශ්‍ය උපකරණ ප්‍රමාණවත් ලෙස නොමැතිවීම. මෙම තත්ත්වය දිවයිනටම බලපාන්නාවු ආපදා අවස්ථාවලදී යුද්ධ හමුදා සහය ලබාදීම කෙරෙහි අහිතකර අයුරින් බලපානු ලබයි.

21. අවි ආයුධ හා පතරොම් ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම තවත් ප්‍රබල ගැටළුවක් වන අතර, මේ වන විට දිවයිනේ විවිධ ප්‍රදේශන්හි මෙම පතරොම් ගබඩා ඉදිකරමින් පවතින අතර, අධියරයන් කිහිපයකින් නිමවන එම ක්‍රියාවලිය අවසන් වන තුරු අදාල ගැටළුව එලෙසම පවතියි.

**සාරාංශය**

22. සියළුම ආරක්ෂක සේනා මූලස්ථානයන් වෙතින් පාලනය කරනු ලබන බලප්‍රදේශයන් තුළ සිදුකරනු ලබන භූමිය නිසැක කිරීමේ ක්‍රියාන්විත හා රජය මඟින් සිදුකරනු ලබන ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම සිදුකර ඇත.

23. ආරක්ෂක අමාත්‍යාංශය හා සම්බන්ධතාවයෙන් ප්‍රභූ ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම හා විදේශීය නියෝජිත කණ්ඩායම් වල සංචාර සඳහා ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම මෙන්ම අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සිදුකිරීම.

24. මෙම වර්ෂය තුලදී යුධමය ක්‍රියාන්විත සමඟ සම්බන්ධ නොවුණද රට තුළ පැවති ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරම් මගින් ඇතිවූ ව්‍යසනයන් / අත්‍යවශ්‍ය සේවා අඩපණවීම් වැනි අවස්ථාවන් වලදී මෙන්ම ඩෙංගු මර්ධන ව්‍යාපාර වැනි ජාතික අවශ්‍යතාවයන්හිදී රාජ්‍ය හා සිවිල් ජන ජීවිතය වෙත උපකාර කිරීම හා විපතට පත්වූවන් ගලවා ගැනීමේ මෙහෙයුම් සිදුකර ඇත.

25. දිවයිනේ සියලුම පළාත්හි නිතීය හා සාමය ආරක්ෂා කර ගැනීම සඳහා රජයේ ආයතන වලට අවශ්‍ය සහය ලබාදීම හා රජය මගින් සිදුකරනු ලබන ව්‍යපෘති කඩිනමින් නිම කිරීම සඳහා අවැසි හයිපිරිස්හි සහය ලබාදීම සිදුකර ඇත.

26. ක්‍රියාන්විත හා පුහුණු කටයුතු සඳහා අවශ්‍ය වන අවි ආයුධ, පතරොම්, පාලන උපකරණ හා කඳවුරු ආරක්ෂක භාණ්ඩ පුරෝකථනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික හට සහය වීම සිදුකරනු ලබන අතර, අත්අඩංගුවට ගත් හෝ අත්පත් කරගත් අවි ආයුධ, පතරොම්, වෙඩිද්‍රව්‍ය, පාලන උපකරණ, බෝට්ටු සහ බෝට්ටු එන්ජින් වල වාර්ථාවන් පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදුකර ඇත.

## විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

27. ශ්‍රී ලංකා ජනරජය වර්ෂ 1955 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි සාමාජිකත්වය ලබාගන්නා ලද අතර වර්ෂ 1957 වර්ෂයෙහි නිමාවට පත්වූ සුවස් යුද්ධය (suc2) අවසන් කිරීමේ වස් නිලධාරීන් කිහිප දෙනෙකු එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරියෙහි නිරත වී ඇත.

28. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් සිදුකරනු ලබන එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වඩා විධිමත්ව සහ කාර්යක්ෂමව ඉටුකිරීමේ අරමුණ පෙරදැරි කරගෙන වර්ෂ 2018 ක් වූ අප්‍රේල් මස 12 වන දින යුද්ධ හමුදා විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපනය කරනු ලැබීය. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වශයෙන් දෙපාර්තමේන්තු හතරකට බෙදා වෙන්කරනු ලැබ ඇත. එනම් විදේශ මෙහෙයුම් අංශය, මානව හිමිකම් අංශය, පුහුණු අංශය සහ භකාස අංශය වශයෙනි. මෙයට අමතරව සාමසාක මෙහෙයුම් පුහුණු ආයතනය (කුකුලේගග) මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සෘජු අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන අතර, එමගින් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා කාර්යශූර භාවයෙන් යුතු සාමසාධක නිලධාරින්/සෙසුනිලයින් පුහුණුකිරීම සිදුකරනු ලබයි.

## මූල්‍යමය විස්තරය

29. 2018 වර්ෂය සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කරන ලද මූල්‍යමය ප්‍රතිපාදන පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශිර්ෂය | 2018 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඇ) | (ඉ) |
| 1. | ලෙබනන් (222-01-1-3-2509 (i)) | 1,610,000,000.00 | 16,458,738.68 | - |
| 2. | සුඩාන් (222-01-1-3-2509 (ii)) | | 86,216,160.40 | |
| 3. | මාලි (222-01-1-3-2509 (iii)) | | 1,450,913,730.23 | |
| 4. | මාලි හයිපිරිස් ආරක්ෂාව (222-01-1-3-2509 (iii)a) | | 2,178,545.00 | |
| 5. | මධ්‍යම අප්‍රිකා - කාන්තා 222-01-1-3-2509 (iii)b | | 4,028,828.41 | |
| 6. | මධ්‍යම අප්‍රිකා - කාන්තා (222-01-1-3-2509 (iii)c) | | 6,473,487.09 | |
| 7. | විවිධ වියදම් 222-01-1-3-2509 (iv) | | 43,730,510.19 | |

වගුව 3:6. මූල්‍ය විස්තරය

30. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කරදී ඇති වැය ශීෂයන් සඳහා පහත සඳහන් පරිදි සාම සාධක මෙහෙයුම් අවශ්‍යතා වෙනුවෙන් වැය දැරීම් සිදුකර ඇත:

**<u>වැය ශීර්ෂයන්හි උපයෝගිතාවය</u>**

31. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කරනු ලැබූ වැය ශිර්ෂයෙහි පහත සඳහන් විෂයන් වෙනුවෙන් උපයෝගී කරගනු ලැබීය:

අ. සාමසාධක කණ්ඩායම සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රධාන උපකරණ මිලදී ගැනීම.

ආ. සාමසාධක රාජකාරී සඳහා යොදවා ඇති උපකරණ වෙනුවෙන් අමතර කොටස් මිලදී ගැනීම.

**සටහන**: යුද්ධ හමුදා ක්‍රමවේදයට මණ්ඩල පත්කර එම නිර්දේශයකින් පසුව සාමසාධක රාජකාරී සඳහා ප්‍රමුඛත්වය හා අවශ්‍යතාවය මත උක්ත භාණ්ඩ/උපකරණ මිලදී ගනු ලබයි.

**<u>විෂය තුළ සිදුකරනු ලබන කාර්‍ය සාධන සමාලෝචනය</u>**

32. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් දැනට සාමසාධක රාජකාරි ඉටු කරනු ලබන රාජ්‍යයන් පහත පරිදි වේ.

අ. සාමසාධක බළඇණි

| | | |
|---|---|---|
| (1) | ලෙබනන් | - 149 |
| (2) | දකුණු සුඩානය | - 65 |
| (3) | මාලි රාජ්‍යය | - 197 |
| | **එකතුව** | **- 411** |

| | | |
|---|---|---|
| ආ. | නිරීක්ෂණ නිලධාරීන් | - 15 |
| ඇ | මාණ්ඩලික නිළධාරින් | - 20 |
| | **එකතුව** | **- 446** |

33. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධීක්ෂණය මත මේවන විට සැලකිය යුතු භටපිරිස් ප්‍රමාණයක් ඉදිරියේදී සාමසාධක රාජකාරින් සඳහා සහභාගිවීම වෙනුවෙන් සාමසාධක මෙහෙයුම් පුහුණු පාසල (කුකුලේගඟ) වෙතින් පුහුණුකිරීම් සිදුකරනු ලබයි.

අ භට කණ්ඩායම් ස්ථාපනය කිරීමට ප්‍රථම සිදුකරනු ලබන පෙර පුහුණුවීම් පාඨමාලාවන්

| | | |
|---|---|---|
| (1) | සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම (මාලි) | - 32 x 353 |
| (2) | දෙවන මට්ටමේ අරෝග්‍යශාලා (දකුණු සුඩාණය) | - 18 x 78 |
| (3) | කාන්තා විනයාරක්ෂක භට කණ්ඩායම් (මධ්‍යම අප්‍රිකාව) | - 04 x 105 |

ආ එක් එක් පුද්ගලයන් වෙනුවෙන් පුහුණුකරනු ලබන පුහුණු පාඨමාලාවන්

| | | | |
|---|---|---|---|
| (1) | එක්සත් ජාතීන්ගේ භට කාර්ය සම්පාදන සම්පාදන මණ්ඩලික නිලධාරී පාඨමාලාව | - | 20 x 00 |
| (2) | නිරීක්ෂණ නිලධාරී සහ මණ්ඩලික නිලධාරී පාඨමාලාව | - | 34 x 00 |
| (3) | එක්සත් ජාතින්ගේ මණ්ඩලික නිලධාරී පාඨමාලාව | - | 34 x 00 |
| (4) | එක්සත් ජාතින්ගේ වෛද්‍ය ප්‍රතිචාර දැක්වීමේ පාඨමාලාව | - | 07 x 14 |
| (5) | එක්සත් ජාතින්ගේ සිවිල් සහ යුධමය සම්බන්ධීකරණ පාඨමාලාව | - | 15 x 00 |
| (6) | යුද්ධ හමුදා සිවිල් පුද්ගලයින්ගේ අරක්ෂාව පිළිබඳ නිලධාරී පාඨමලාව | - | 13 x 00 |
| | **සම්පූර්ණ පුහුණු වූ සංඛ්‍යාව** | **-** | **177 x 550** |

34. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ යුද්ධ හමුදා නිලධාරී/නිලධාරිනියන් සහ සෙසුනිලයින් සාමසාධක රාජකාරීන්හි නිරත කරවීමේදී පිළිපැදිය යුතු ස්ථාවර නියෝග ක්‍රියා පිළිවෙත නිරන්තරයෙන් සාකච්ඡා පවත්වා එහි ප්‍රගතිය අධ්‍යයනය කරනු ලබයි.

**වර්ෂයෙහි ජයග්‍රහණයන්**

35. 2017 දෙසැම්බර් මස දක්වා මාලිහි (MINUSMA) හි රාජකාරියෙහි නියුතු සංග්‍රාමික ආරක්ෂිත රථ කණ්ඩායම මගින් රථ කණ්ඩායම් 15 ක් යෙදවීම මගින් ගාඔ සිට මොප්ටි දක්වා රැගෙන යමින් තිබූ කිලෝග්‍රෑම් 35 කට අධික බරැති බෝම්බයක් සොයාගන්නා ලදී.

36. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා සම්බන්ධ වන ශ්‍රී ලංකා හමුදා භටපිරිස් වෙනුවෙන් ප්‍රධාන උපකරණ හා ක්‍රියාකාරිත්වය වෙනුවෙන් ශ්‍රී ලංකාවට උත්පාදනය කරන ලද මුදල් ප්‍රතිපූර්ණ කිරීම් පහත පරිදි වේ

| අනු අංකය | වර්ෂය | UNIFIL (රු.) | UNMISS (රු.) | MINUSMA (රු.) | මාණ්ඩලික නිලධාරීන් (රු.) | නිරීක්ෂණ නිලධාරීන් (රු.) | සම්පූර්ණ වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| 1. | 2018 | 183,376,192.50 | 53,754,195.94 | 175,615,673.82 | 204,379,200.00 | 122,083,200.00 | 739,208,462.26 |

වගුව 3:7. 2018 වර්ෂයෙහි ප්‍රධාන උපකරණ හා ස්වයං ක්‍රියාකාරකම් පිළිබඳ විසතරය

37. මාලි (MINUSMA) මෙහෙයුම් හා සම්බන්ධ ආදායම් ප්‍රමාණය දක්වා ඇති ප්‍රමාණයට වඩා ඉහළ අගයක් විය යුතු අතර මාලි මෙහෙයුම් (MINUSMA) හි අවබෝධතා ගිවිසුම් තවමත් අත්සන් නොකිරීම එයට හේතුවයි. ප්‍රධාන උපකරණ හා ක්‍රියාකාරකම් වෙනුවෙන් ශ්‍රී ලංකාව වෙත නැවත ප්‍රතිපූර්ණය කිරීමට නියමිත මුදල් ප්‍රමාණයක් ඉදිරියේදී ගණනය කිරීමට නියමිතය.

**ගැටළු සහ අභියෝග**

38. සාමසාධක රාජකාරී සඳහා භටපිරිස්හි සංඛ්‍යාව ඉහළ නංවාදීමේදී ගනු ලබන ක්‍රියා මාර්ගයේදී පහත සඳහන් ගැටළු වලට ශ්‍රී ලංකා රාජ්‍ය මුහුණ පා ඇත.

අ. ලිංගික සූරාකෑම හා අපයෝජනය පිළිබඳව විමර්ෂණයක් සැබැදිව පසුගිය කාල සීමාවේදී එල්ලවී ඇති චෝදනා.

ආ. සාමසාධක මෙහෙයුම් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේදී සිදුකළයුතු දුෂ්කර හා දිර්ඝ කාලීන ක්‍රමවේදයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

ඇ. සාමසාධක මෙහෙයුම් සඳහා අවශ්‍ය උපකරන මිලදී ගැනීමේදී සිදුකලයුතු දුෂ්කර හා දිර්ඝ කාලීන ක්‍රමවේදයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

39. කෙසේ වෙතත් දැනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මුහුණදී ඇති ප්‍රබලතම අභියෝග වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් සිදුකරනු ලබන නිෂ්කාශණ ක්‍රියාවලියයි. මෙය නියමිත කාල සීමාව තුළ භටපිරිස් ස්ථානගත කිරීම හා මාරු කිරීම් සඳහා සෘජුවම බලපානු ඇත.

**සාරාංශය**

40. දැනට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සාමසාධක මෙහෙයුම් රාජකාරීන් රාජ්‍යයන් 14 ක් පුරා ක්‍රියාත්මක කරනු ලබන අතර 19,000 කට අධික පිරිසක් දැනට සාම සාධක රාජකාරීන්හි නිරතව ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලබන නිෂ්කාෂණ ක්‍රියාවලිය අවසන් වූ පසු ශ්‍රී ලංකා භටපිරිස් අදාල රාජ්‍යයන් සඳහා සාමසාධක මෙහෙයුම් රාජකාරීන්හි නිරත කරවීමට අවස්ථාවන් ඇත.

41. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්හි රාජකාරියෙහි නියුතු වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා භටපිරිස් හි මානව හිමිකම් උල්ලංඝණය නොකළ බවට වූ නිර්දේශ නිසි කලට ලබාදෙන්නේ නම් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සුරක්ෂිත වන බව දැක්විය හැක.

**පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය**

42. 2018 වසර වෙනුවෙන් සකස් කර ඇති පුහුණු සැලැස්මෙහි සඳහන් ආකාරයට යුද්ධ හමුදා පුහුණු මධ්‍යස්ථාන සියල්ල සම්පූර්ණයෙන්ම පුහුණු කටයුතු වෙනුවෙන් ක්‍රියාත්මකවී ඇත. යුධ හමුදා නොවන පාඨමාලා ලබාදීමේ ක්‍රමවේදය වඩාත් පුළුල් කරමින් තෝරාගත් මේජර් ලැයිස්තුවට ඇතුලත් වී නොමැති නිළධාරින් හට සහ නුදුරේදී විශ්‍රාම යාමට නියමිත සියලු නිලයින් වෙනුවෙන් පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව උදා කරදී ඇත. තවද, අනුමත ප්‍රතිපාදන සීමාව තුළ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා උපරිමයෙන් ක්‍රියාකර ඇති සියළුම ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන සහ අනෙකුත් ආයතන විසින් සැලසුම්කල පරිදි පුහුණුවීම් සහ පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් සෙබලුන් නිදහස් කිරීමට සහයෝගය ලබාදෙන ලදී.

43. ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති තුමාගේ පුහුණු ප්‍රතිපත්තීන්/මගපෙන්වීම් අනුව යුධ හමුදා සහ යුධ හමුදා නොවන සියළුම ආකාරයේ පාඨමාලා ක්‍රියාත්මක කිරීම පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වේ.

**<u>මූල්‍යමය විස්තර</u>**

44. 2018 වසරට අදාලව මුදල් ප්‍රතිපාදන පිළිබඳ සංක්ෂිප්ත විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | විස්තරය | සම්පූර්ණ වෙන් කිරීම් එකතුව (රු.) | වියදම් එකතුව (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | පුනරාවර්තන වියදම් | 102,604,803.00 | 100,067,276.58 | 2,537,526.42 |
| 2. | මූලධන වියදම් | 90,550,000.00 | 90,190,457.36 | 359,542.64 |

වගුව 3:8. මූල්‍ය විස්තරය

**<u>වැය ශීර්ෂ භාවිතය</u>**

45. කාර්යාල අවශ්‍යතා සමඟ ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා, පුහුණු ප්‍රතිපාදන ලෙස වෙන් කරන ලද සියලුම අරමුදල් ඵලදායි ලෙස උපයෝජනය (භාවිතා කර) කර ඇත. තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු සෙබළුන්ගේ අතිරේක හා සමාජ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් දිනපතා පුවත්පත් දෙක බැගින් මිලදී ගනු ලැබේ.

**<u>2018 වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය</u>**

46. පහත සඳහන් කාර්යන් සාර්ථකව නිම කරන ලදී:

අ. **<u>නිත්‍ය නිළධාරී ජ්‍යෙෂ්ඨතා ලේඛණය මුද්‍රණය කිරීම.</u>** මෙම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශන අංශය වෙත යුධ සේවා ලේකම් ශාඛාව වෙතින් ලබාදෙනු ලබන අතර නිළධාරී ජ්‍යෙෂ්ඨතා ලේඛණය වාර්ෂිකව මුද්‍රණය කිරීම.

ආ. **<u>පුහුණු සැලැස්ම මුද්‍රණය කිරීම.</u>** ප්‍රකාශන අංශය වෙතින් සියලුම යුද්ධ හමුදා පුහුණු කටයුතු සඳහා සකස් කරනු ලබන වාර්ෂිකව පුහුණු සැලැස්ම මුද්‍රණය කරනු ලබයි.

ඇ. **<u>දූරකථන නාමාවලිය මුද්‍රණය කිරීම.</u>** සියලුම යුධ හමුදා ආයතනයන්ට ලබාදීම සඳහා ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය වෙතින් සකස් කර ලබාදෙනු ලබන නාමාවලිය මෙම අංශය වෙතින් වාර්ෂිකව මුද්‍රණය කරනු ලබයි.

ඈ. **<u>ප්‍රධාන පාසල්හි සියලුම හමුදාමය මුද්‍රණ රාජකාරී ඉටුකර ලබාදීම.</u>** ප්‍රකාශන අංශය වෙතින් පුහුණු පාසල් හි සියලුම සහතිකපත් / පාඨමාලා වාර්තා හා පාඨමාලා සඳහා ඇවැසි සියලුම පොත්පත් අත්පත්‍රිකා ආරාධනාපත් මුද්‍රණය කර ලබාදීම වාර්ෂිකව සිදුකිරීම.

ඉ. අභ්‍යාස චිත්‍රපට හා ප්‍රකාශන වැය ශීර්ෂය වෙතින් ඉදිරි වර්ෂය සඳහා වාර්ෂිකව මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට පුනරාවර්තන වියදම ඇස්තුමේන්තු කෙටුම්පත් සකස්කර යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර මුද්‍රණයට අවැසි භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කිරීම.

ඊ. යුද හමුදාව තුළ සිදුකරනු ලබන සියලුම නිලධාරී/සෙසුනිල දැනුම වර්ධනය කර ගැනීම උදෙසා ලැමිනේටින් සහ ඡායාපිටපත් ලබාදීම.

උ. යුද්ධ හමුදා මුලස්ථානයෙහි කාර්යාල/ශාඛා/අධ්‍යක්ෂ මණ්ඩලය සහ පුහුණු පාසල්හි පවත්වනු ලබන දේශන/සම්මන්ත්‍රණ සඳහා මල්ටිමීඩියා සේවාවන් ලබාදීම හා යුද්ධ හමුදා සාමාජිකයින් හට වීඩියෝ කැමරා, නිශ්චල කැමරා සහ මල්ටිමීඩියා යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ දැනුමක් ලබාදීමේ පාඨමාලාවන් පැවැත්වීම.

**<u>2018 වර්ෂයෙහි ඉටුකරගත් අරමුණු</u>**

47. යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් පරිදි රාජ්‍ය භාෂා ආයතනය සමඟ ඒකාබද්ධව සියළුම ආරක්ෂක සේනා මූලස්ථානයන්හිදී ආරම්භ කරන ලද දමිළ භාෂා පුහුණු පාඨමාලාවන් සඳහා වැඩි ප්‍රමාණයක් සහභාගි කිරීමට හැකිවීම.

48. දේශිය හා විදේශිය යුද්ධ හමුදාවල සහභාගිත්වයෙන් පවත්වන ලද දියකාවා යුධ අභ්‍යාසය 2018 සඳහා පෙර වසර වලට වඩා වැඩි විදේශිය භටපිරිස් සහභාගිත්වයෙන් පවත්වන ලද දියකාවා යුධ අභ්‍යාසයන් සිංහ රෙජිමේන්තු සෙබලුන්ගේ සහභාගිත්වයෙන් පුල්මුඩේ ප්‍රදේශයේදී පැවැත්වීම.

49. ආධාරක සහ සේවා රෙජිමේන්තුවල නිලධාරී/සෙසුනිලයින්ගේ වෘත්තීය දැනුම හා සාමුහිකත්වය වැඩිදියුණු කිරීම සඳහා ආධාරක හා සේවා රෙජිමේන්තු සඳහා ආරම්භ කරන ලද සාමුහික පුහුණුව ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට හැකිවීම.

50. ත්‍රිවිධ හමුදා බළලත් නිලධාරී/ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී 2000 ක සහභාගීත්වයෙන් 2018.11.26 දින පැවති වැඩමුලුවේදි ඔවුන්ගේ හමුදා ජීවිතය හා සිවිල් ජීවිතය සාර්ථක කර ගැනිමට ඉවහල් වන උපදේශන රාශියක් ලබාදීමට හැකි විය.

51. යුද්ධ හමුදා පුහුණු සැලැස්මට අනුව වෙන් කර තිබූ පාඨමාලා යුද්ධ හමුදා පුහුණු පාසල්, රෙජිමේන්තු පුහුණු පාසල් හා අධුනික පුහුණු පාසල් වෙතින් ඉතා සාර්ථකව පවත්වා නිම කිරීමට හැකිවීම.

52. විශ්වවිද්‍යාල හා අනෙකුත් අධ්‍යාපන ආයතන වෙතින් 2018 වර්ෂය වෙනුවෙන් ඉල්ලුම් කරන ලද උපාධි ඩිප්ලෝමා හා සහතික පත් පාඨමාලා සඳහා නිලධාරීන්/සෙසුනිලයින් වැඩි ප්‍රමාණයක් සහභාගී කරවීමට අවස්ථාව උදාකර ගත හැකි වීම.

53. ත්‍රිවිධ හමුදා විශේෂ ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල වෙත සන්නද්ධ සේවා වෙතින් සිසුන් ඇතුලත් කර ගැනීමේදී යුද්ධ හමුදාව වෙතින් වැඩිපුර සිසුන් ප්‍රමාණයක් සහභාගී කරවීමට අවස්ථාව උදාකරගත හැකිවිම.

54. නායකත්ව හැකියාව හා පෞරුෂ සංවර්ධනය කිරීමේ වැඩමුළු, අයුර්වේද වෛද්‍ය නිලධාරී/ නිලධාරිනියන්, බස්නාහිර පළාත් සභා ධූරධාරීන්/ ධූරධාරිනියන් සහ ලංකා බැංකු නිලධාරී/නිලධාරිනියන් සඳහා පැවැත්වීම.

55. වෘත්තීය කැමරා ශිල්පීන් 23 දෙනෙකු පුහුණු කර රෙජිමේන්තු වෙත මුදවා හැරීම.

56. ආරක්ෂක සම්මන්ත්‍රණය, කාන්තා නිලධාරින් සඳහා පැවැත්වූ සම්මන්ත්‍රණය සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා පැවැත්වූ සම්මන්ත්‍රණ වැනි විශේෂ උත්සව අවස්ථා සජීවී දර්ශන ලබාදෙමින් උසස් අන්දමේ මාධ්‍ය ආවරණයකට දායකවීම.

**<u>දේශීය පාඨමාලා</u>**

57. යුද්ධ හමුදා විද්‍යා පීඨය මඟින් බඳවාගත් හා අධිකාරියට පත්කළ කෙඩෙට් නිලධාරී සංඛ්‍යාව පහත පරිදි වේ:

| අනු අංකය | විස්තර | නිත්‍ය කෙඩෙට් නිලධාරී සංඛ්‍යාව | ස්වෙච්ඡා කෙඩෙට් නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | බඳවාගත් | 197 | 65 |
| 2. | අධිකාරියට පත්කළ | 259 | 65 |

වගුව 3:9. බඳවාගත් හා අධිකාරියට පත්කළ කෙඩෙට් නිලධාරී සංඛ්‍යාව

58. යුද්ධ හමුදාව වෙත බඳවාගැනීමෙන් අනතුරුව මුලික යුද්ධ හමුදා පුහුණුව සාර්ථකව නිමකළ ආධුනික සෙබල සෙබලියන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ

අ. ආධුනික සෙබලුන් සංඛ්‍යාව - 7,398
ආ. ආධුනික සෙබලියන් සංඛ්‍යාව - 271

59. 2018 වර්ෂය තුළදී යුද්ධ හමුදා පුහුණු පාසල් හා රෙජිමේන්තු පුහුණු පාසල් වෙතින් සිදුකරන ලද පුහුණුවීම් පාඨමාලා සඳහා වෙන්කරන ලද ඇබෑර්තු ප්‍රමාණයන් හා රෙජිමේන්තු විසින් ඒ සඳහා සහභාගී කරවන ලද හයිපිරිස් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | පුහුණු පාසල | ඇබෑර්තු සංඛ්‍යාව | රපෝර්තු කල සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | යුද්ධ හමුදා පුහුණු පාසල් | 8,520 | 3,028 |
| 2. | රෙජිමේන්තු පුහුණු පාසල් | 4,864 | 5,720 |
| | **එකතුව** | **13,084** | **8,748** |

වගුව 3:10. පාඨමාලා සඳහා සහභාගී කරවන ලද හයිපිරිස් ප්‍රමාණය

60. පහත සඳහන් බහුපාර්ශවික යුධ අභ්‍යාසයන් 2018 වර්ෂය තුළදී සිදුකරන ලදී:

| අනු අංකය | විස්තරය | ස්ථානය | කාලසීමාව | සහභාගිවන ලද භටපිරිස් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | දියකාවා යුධ අභ්‍යාසය | කුච්චවේලි පුල්මුඩේ | 06.09.2018 26.09.2018 | 293 x 2395 | 23 x 37 |

වගුව 3:11. බහුපාර්ශවික යුධ අභ්‍යාසයන් පිළිබඳ විස්තරය

61. **<u>යුද්ධ හමුදා නොවන පාඨමාලා.</u>** යුධ හුමුදා නොවන පාඨමාලා හැදෑරීම සඳහා දේශණ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී වීමට අවස්ථාවන් ලබාදීම වඩාත් පුළුල් කරන ලදී.

අ. **<u>යුධ හමුදා නොවන පාඨමාලා.</u>** 2018 වසර තුළ විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වෙතින් යුධ හමුදා නොවන පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් 887 දෙනෙකු සහ සෙසුනිලයින් 1,706 දෙනෙකු හට අවස්ථාව උදාකර දී තිබේ.

ආ. **<u>දේශන සම්මන්ත්‍රණ හා වැඩමුළු.</u>** රජයේ පිළිගත් සහ ලියාපදිංචි අධ්‍යාපන ආයතන වෙතින් පවත්වන ලද විවිධ දේශණ සම්මන්ත්‍රණ වැඩමුළු සඳහා නිළධාරීන් 511 දෙනෙකු සහ සෙසුනිලයින් 171 දෙනෙකු සහභාගී කරවීම සඳහා පහසුකම් සලසා ඇත.

62. **<u>විෂය බාහිර පුහුණුවීම්.</u>** නායකත්ව හැකියාව හා පෞරුෂ සංවර්ධනය කිරීමේ වැඩමුළු අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ පුහුණු අධ්‍යක්ෂකගේ අනුමැතිය මත රාජ්‍ය ආයතන සහ පුද්ගලික අංශයන් සඳහා වැඩසටහන් පැවැත්වීම.

**<u>තෝරාගැනීම් විභාග/ උසස් කිරීම් විභාග</u>**

63. 2018 වසර තුළදී පහත දැක්වෙන විභාග පවත්වා ඇති අතර, සාරාංශගත විස්තරය පහත පරිදි වේ:

අ. <u>තෝරාගැනීමේ විභාග නිලධාරී</u>.

(1) <u>මාණ්ඩලික විද්‍යාලය වෙත තෝරාගැනීමේ විභාගය</u>.

| අනු අංකය | සමත්/ අසමත් සංඛ්‍යාව | සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | සියලුම විෂයන් සමත් නිලධාරී සංඛ්‍යාව | 11 |
| 2. | විෂයන් 4 ක් සමත් නිලධාරී සංඛ්‍යාව | 18 |
| 3. | විෂයන් 3 ක් සමත් නිලධාරී සංඛ්‍යාව | 25 |
| 4. | විෂයන් 2 ක් සමත් නිලධාරී සංඛ්‍යාව | 13 |
| 5. | විෂයන් 1 ක් සමත් නිලධාරී සංඛ්‍යාව | 25 |
| 6. | විෂයන් සියල්ල අසමත් නිලධාරී සංඛ්‍යාව | 07 |
| | **එකතුව** | **99** |

වගුව 3:12. මාණ්ඩලික විද්‍යාලය වෙත තෝරාගැනීම් විභාගය පිළිබඳ විස්තරය

ආ. <u>නිල උසස් කිරීමේ විභාග - 2018</u>.

| අනු අංකය | උසස් කිරීමේ විභාගය (නිත්‍ය/ස්වේච්ඡා) | පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | අසමත් / නැවත පෙනී සිටීම | සමත් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | කපිතන් සිට මේජර් දක්වා නිලධාරී උසස් කිරීමේ විභාගය (නිත්‍ය) | 1,464 | 357 | 1,107 | 24% |
| 2. | ලුතිතන් සිට කපිතන් දක්වා නිලධාරී උසස් කිරීමේ විභාගය (නිත්‍ය) | 533 | 195 | 338 | 37% |
| 3. | කපිතන් සිට මේජර් දක්වා නිලධාරී උසස් කිරීමේ විභාගය (ස්වේච්ඡා) | 337 | 44 | 293 | 13% |
| 4. | ලුතිතන් සිට කපිතන් දක්වා නිලධාරී උසස් කිරීමේ විභාගය (ස්වේච්ඡා) | 106 | 45 | 61 | 42% |
| | **එකතුව** | **2,440** | **641** | **1,799** | |

වගුව 3:13. නිල උසස් කිරීමේ විභාගය පිළිබඳ විස්තරය

ඇ. <u>භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණය - 2018</u>.

| අනු අංකය | ආරක්ෂක සේනා මූල්සථානය | පෙනී සිටි සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | අධියර I | අධියර II | අධියර III |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 439 | 268 | 268 |
| 2. | ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) | 727 | 498 | 465 |
| 3. | ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | 861 | 538 | 537 |
| 4. | ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චි) | 252 | 220 | 266 |
| 5. | ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 179 | 225 | 225 |
| 6. | ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) | 1,033 | 984 | 1,056 |
| 7. | ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | 202 | 205 | 280 |
| | **එකතුව** | **3,491** | **2,733** | **2,817** |

වගුව 3:14. භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණ පිළිබඳ විස්තරය

**<u>විදේශීය පුහුණුවීම්</u>**

64. යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් ලබාදෙන ලද විදේශීය පාඨමාලා/සංචාර/ සම්මන්ත්‍රණ/ දේශන/ අභ්‍යාස පිළිබඳ සංක්ෂිප්ත විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | විස්තරය | නිලධාරී | සෙසුනිළ |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | විදේශීය සංචාර/ සම්මන්ත්‍රණ/දේශන/අභ්‍යාස | 224 | 110 |
| 2. | විදේශීය පාඨමාලා | 772 | 529 |
| 3. | සාම සාධක පාඨමාලා/ සම්මන්ත්‍රණ/ වැඩමුළු | 57 | 09 |
| | **එකතුව** | **1,053** | **648** |

වගුව 3:15. විදේශීය පාඨමාලා/සංචාර/ සම්මන්ත්‍රණ/ දේශණ/ අභ්‍යාස පිළිබඳ සංක්ෂිප්ත විස්තරය

**<u>විදේශීය නියෝජිත මණ්ඩල මඟින් සිදුකරන ලද සංචාර සම්බන්ධීකරණය</u>**

65. 2018 වසර තුළදි විදේශීය නියෝජිත මණ්ඩල වෙතින් සිදුකරන ලද සංචාර වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරන ලදි:

| අනු අංකය | රට | විදේශ සංචාර ගණන |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | බංගලාදේශය | 04 |
| 2. | නයිජීරියාව | 01 |
| 3. | ඇමරිකාව | 01 |
| 4. | පාකිස්තානය | 02 |
| 5. | ඉන්දියාව | 02 |

වගුව 3:16. සංචාර වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම පිළිබඳ විස්තරය

66. 2018 වසර තුළදී යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනියින් වෙනුවෙන් ලබාදෙන ලද විදේශීය යුධ අභ්‍යාස පිළිබඳ විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | විස්තරය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | ප්‍රථම බහුජාතික බිම්ස්ටෙක් යුධ අභ්‍යාසය (MILEX - 2018) | ඉන්දියාව | 10.09.2018 | 16.09.2018 | 08 x 25 |

වගුව 3:17. විදේශීය යුධ අභ්‍යාස පිළිබඳ විස්තරය

67. 2018 වසර තුළදි යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් ලබාදෙන ලද විදේශීය තරඟ පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

| අනු අංකය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | පාකිස්තානය | 08.10.2018 | 16.10.2018 | 05 x 64 |
| 2. | චීනය | 08.10.2018 | 15.08.2018 | 03 |
| 3. | චීනය | 18.10.2018 | 22.10.2018 | 02 x 02 |

වගුව 3:18. විදේශීය තරඟ පිළිබද විස්තරය

68. සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය කුකුලේගඟ (පුහුණු පාසල) වෙතින් 2018 වර්ෂයේ මේ දක්වා පවත්වා ඇති පුහුණුවීම් සඳහා රපෝර්තු කරවා ඇති විස්තරය පහත සඳහන් පරිදි වේ፡

| අනු අංකය | පුහුණු පාසල | ඇබෑර්තු සංඛ්‍යාව | රපොර්තු කල සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය (කුකුලේගඟ) | 1,738 | 1,548 |

වගුව 3:19. සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය වෙතින් මේ දක්වා පවත්වා ඇති පුහුණුවීම් සඳහා රපෝර්තු කරවා ඇති විස්තරය

**<u>ගැටලු සහ අභියෝග</u>**

69. සීමිත මුදල් ප්‍රමාණයක් දේශීය පුහුණු වැය ශීර්ෂය වෙත වෙන්කර තිබූ බැවින් පාඨමාලා සඳහා ඉල්ලුම් කරන ලද සියලු දෙනා වෙත අවස්ථාව ලබාදීමට නොහැකිවීම.

70. වර්ථමානයේ මි.මී. 81 මෝටාර් හා ඉන් පහළ ආධාරක අවි වෙඩිතැබීම ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයිති කල්පිටිය වෙඩිපිටියේදී සිදුකරනු ලබන අතර, ආධාරක අවි ජීව වෙඩිතැබීම් සඳහා යුද්ධ හමුදාව සතුව වෙඩිපිටියක් නොමැතිවීම මහත් ගැටලුවක්ව පවතියි.

**<u>සාරාංශ</u>**

71. පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන් දේශීය හා විදේශීය පුහුණු අංශ වලින් සමන්විත වන අතර, ඊට අමතරව විභාග අංශය, යුධ හමුදා නොවන පුහුණු අංශය, පුහුණු ආධාරක අංශය, ප්‍රකාශන අංශය හා වීඩියෝ අංශය යන අංශ වලින් සමන්විත වේ. සමස්තයක් ලෙස ගත් කල යුද්ධ හමුදා පුහුණු පාසල් සමඟ රෙජිමේන්තු පුහුණු පාසල් වල පවත්වන ලද පාඨමාලා සඳහා සහභාගිවීමේදී සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර, විදේශ යුද්ධ හමුදා අතර, පැවති මාණ්ඩලික සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස යුධ අභ්‍යාස, විදේශ පාඨමාලා, සංචාර අවස්ථා වැඩි වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිලධාරීන්ට හා සෙසුනිලයින් හට හිමිවී ඇත. තවද, දේශීය පුහුණු වැය ශිර්ෂය යටතේ වැඩි ප්‍රමාණයක් නිලධාරීන්ට හා සෙසුනිලයින් හට යුද්ධ හමුදා නොවන පාඨමාලා සඳහා සහභාගිවීමේ අවස්ථාද උදා වී ඇත. දේශීය පාඨමාලාවට විදේශ නිලධාරීන්/ සෙනීන්ගේ සහභාගිත්වය වැඩිකිරීම. පුහුණු පාසල් වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැඩිපුර මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම මෙන්ම සියලුම පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය වැඩිකිරීමේ වැඩසටහන්ද ක්‍රියාත්මක කරන ලදි.

## <u>සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය</u>

72. යුද්ධ හමුදාවෙහි සංග්‍රාමික කාර්යක්ෂමතාව නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කරන අවි/පතරොම් යුධෝපකරණ/ විශේෂ උපකරණ ලබාදී ඊට අදාල කාර්යයන් පහසු කිරීම උදෙසා, යුද්ධ හමුදා මූලස්ථානයෙහි අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික යටතේ 1994 අප්‍රේල් 30 දින සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපනය කරන ලදී.

73. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය කරන සංග්‍රාමික උපකරණ මිලදීගැනීම, සැලසුම් කිරීම සහ සහාය ලබාදීම යන අවශ්‍යතාවයන් සඳහා යුද්ධ හමුදාධිපති වෙත සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. යුද්ධ හමුදාවෙහි සංග්‍රාමික බලය සබැඳිව ඉඳුරාම බලපෑමක් කළ හැකි වැය ශීර්ෂයන්හි ක්‍රියාකාරී පාලක වශයෙන් යුද්ධ හමුදාවෙහි සංග්‍රාමික උපකරණ සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සහ සංග්‍රාමික උපකරණයන්හි අතිරික්තයන් සබැඳිව ක්‍රියාකිරීම යන කරුණු සඳහා සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටියි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

<u>මූල්‍ය තොරතුරු</u>

74. 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සාරාංශ පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | මුලු පතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| | **ප්‍රාග්ධන** | | |
| 1. | 'A' වාහන මෙවලම් (222-01-3-2003 (i)) | 24,000,000.00 | 12,564,132.72 |
| 2. | යුධෝපකරණ මෙවලම් (222-01-3-2103 (ii)) | 204,366,583.18 | 75,339,376.42 |
| | **පුනරාවර්තන** | | |
| 1. | 'A' වාහන අමතර කොටස් (222-01-2-1205 (iv)) | 28,295,737.00 | 6,282,365.96 |
| 2. | කාලතුවක්කු අමතර කොටස් (222-01-2-1205 (v)) | 22,587,878.00 | 6,523,535.01 |
| 3. | සුළු අවි අමතර කොටස් (222-01-2-1205 (vii)) | 400,000.00 | - |
| 4. | ක්ෂය ද්‍රව්‍ය (222-01-2-1205 (viii)c) | 10,412,122.00 | 6,290,782.44 |
| 5. | වෙඩි ද්‍රව්‍ය (222-01-2-1205 (xiii)) | 100,000,000.00 | 21,153,820.00 |

වගුව 3:20. මූල්‍ය විස්තරය

<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>

75. 2018 වර්ෂයට අදාළ සංග්‍රාමික උපකරණ උපදේශක කමිටුව 2017 වර්ෂය අවසාන කාර්තුවෙහිදී පවත්වන ලදී. සංග්‍රාමික උපකරණ උපදේශක කමිටු අනුමැතිය මත වැය ශීර්ෂයන් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදාගැනීමට කටයුතු කළ අතර, පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදී:

අ. මිලදී ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සෑම මාස දෙකකටම වරක් අවසන් පාවිච්චි කරන්නන් හා අදාල වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයන්හි කාර්ය මණ්ඩල සමග සාකච්ඡා පැවැත්වීම.

ආ. අවශ්‍ය උපකරණ හා සේවාවන් සඳහා දැනුවත් කිරීමේ ඉදිරිපත්කිරීම් අදාල සැපයුම්කරුවන් හරහා පවත්වන ලදී.

ඇ. මිලදී ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස ඉටුකරවා ගැනීම සඳහා අදාල මිලදී ගැනීමේ හා ගිණුම් අංශයන් සමග නිරන්තර සම්බන්ධවීම් හා අධීක්ෂණය සිදුකිරීම.

76. සංග්‍රාමික උපකරණ උපදේශක කමිටුව වෙතින් අනුමත කරන ලද භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාදාමය ආරම්භ කළත් විවිධ හේතූන් මත නිසි වේලාවට ඉටුකරගත නොහැක. අදාළ වැය ශීර්ෂයෙහි පාවිච්චියට නොගත් ප්‍රතිපාදන කල්වේලා ඇතිව වෙනත් කර්තව්‍යයක් සඳහා යෙදවීමට හැකිවන පරිදි අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මාරුකිරීමට කටයුතු කිරීම.

77. ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම බලාත්මක නොවීම හේතුවෙන් ත්‍රිවිධ හමුදාව සඳහා මිලදී ගැනීමේ සම්බන්ධීකරණ කටයුතු ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් සිදුකිරීමට සිදුවන ලදී. මෙම පරිවර්තනය නියමිත පරිදි සිදුවුවත් කාලය දීර්ඝ විය. මිලදී ගැනීමෙහි ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉෂ්ට කරගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී:

අ. තවත් සාමාජිකයින් එකතු කර සංවිධානය ශක්තිමත් කිරීමට අදාළ යෝජනා ආරක්ෂක අමාත්‍යාංශයෙහි මිලදී ගැනීම්වලට අදාලව ඉදිරිපත් කරන ලදී.

ආ. ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගෙන් සමන්විත ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීම.

**ජයග්‍රහණ**

78. විදේශීය සැපයුම්කරුවන්ගේ මිලදී ගැනීමේ ක්‍රියාදාමයෙහි ප්‍රගතිය සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය බැවින් මිලදී ගැනීමේ හැකියාව ඉහළ නැංවීම හා ඉහත සඳහන් කර ඇති වැය ශීර්ෂයන්හි ප්‍රතිපාදන තුළින් අඩු ප්‍රගතියක් ලබාදීම හේතුවෙන් අවුරුදු දෙකක මිලදී ගැනීමේ සැලසුමක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි. තවදුරටත් එවැනි දුෂ්කරතාවයන් කල්තියා හඳුනාගෙන අදාල ප්‍රතිපාදන ප්‍රතිඵලදායි ක්‍රියාකරකම් සඳහා යොදා ගැනීමට අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය සමග කටයුතු කරන ලදි.

79. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි අනාගත අවශ්‍යතාවයන් පෙරදැරි කරගෙන පහත සඳහන් රටින් පිටත හා ඇතුලත සංචාරයන් සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරන ලදි:

අ. පාකිස්තානයේ කාර්මික ප්‍රවීණයන් කණ්ඩායමක් සන්නාහ සන්නද්ධ රථවල අලුත් වැඩියා කටයුතු පරීක්ෂා කිරීමට දින හතක සංචාරයක් සඳහා මෙරටට 2018.08.04 දින පැමිණෙන ලදි.

ආ. ආරක්ෂක අමාත්‍යාංශයෙහි අනුමැතිය මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිලධාරී කණ්ඩායමක් පතුරොම් නිෂ්පාදන කම්හලට අදාළ දැනුම ලබාගැනීමට හා එය රට තුළ ස්ථාපනය කිරීමට පාකිස්තානු යුද්ධ උපකරණ කම්හලක් වෙත 2018.07.31 වන දින සංචාරයක් සිදුකර ලදි.

ඇ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු අතිරික්ත පතුරොම් නැවත විකිණීමෙහි වගකීමට සම්බන්ධීකරණ කටයුතු ආරක්ෂක අමාත්‍යාංශය සමග සම්බන්ධතාවයෙන් සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලදි. එහි දෙවන අදියර සම්පූර්ණ කිරීමට නියමිත අතර විනාශ කිරීම් වෙනුවට විදේශීය විනිමයක් උපයා ගැනීමට ක්‍රමවේදය සැකසුණි.

**ගැටළු සහ අභියෝග**

80. සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කරණු ලබන ප්‍රතිපාදන තළින් ඉහළ ඵලදායි ප්‍රසම්පාදන ක්‍රියාවලි තත්ත්වයක් උදාකර ගැනීම සඳහා පහත කරුණු ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි:

අ. ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම ත්‍රිවිධ හමුදාවට සේවා සපයන්නන්ගේ ලැයිස්තුවෙන් ඉවත් කර ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා පළපුරුදු හා කැපවීමෙන් කටයුතු කළ හැකි කාර්ය මණ්ඩලයක් සමග ආරක්ෂක අමාත්‍යාංශයෙහි ප්‍රසම්පාදන අංශය වැඩිදියුණු කිරීම සඳහා සේවයක් සැපයීම කටයුතු කිරීම.

ආ. කුඩා අවි පතරොම් නිෂ්පාදන කම්හලක් ස්ථාපිත කිරීමට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සඳහා පුහුණු පතුරොම් ලබාදීම සඳහා ස්වයං පෝෂිත කිරීම සඳහා ප්‍රධාන වේ. මෙම යෝජනාව යතාර්ථයක් වීම තුළින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි තත්ත්වය පිළිගැනීම හා කාර්යක්ෂම පුහුණුවක් උදාකර ගැනීමට හැකිවේ.

ඇ. එක්සත් ජාතීන්ගේ මාලි රාජ්‍යයෙහි මෙහෙයුම් සඳහා ස්ථාපිත යුද්ධ හමුදා රථ පෙළපාලි කණ්ඩායමේ ප්‍රයෝජනය සඳහා සන්නාහ සන්ද්ධ රථ හතරක් මිලදී ගැනීමෙහි යෝජනාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත භාරදී මිලදී ගැනීම සඳහා අපේක්ෂාවෙන් සිටියි.

**සාරාංශය**

81. ඉහත සඳහන්කර ඇති ගැටලු සඳහා සුදුසු මෙන්ම ප්‍රායෝගික විසඳුම් නිර්දේශ කරනු ලැබේ. එක් ස්ථානයක යුද්ධ හමුදා මූලස්ථානය නැවත ස්ථාපිත කිරීම, මානව පැය සහ කාලය ඉතිරි කිරීම, පරිපාලනමය අක්‍රමිකතා අවමකර ගත හැකි වීම, කාර්යක්ෂම පුහුණුවක් සමගින් දේශිය හා විදේශීය රැකියා අවස්ථා පිළිබඳව පුරෝකථනය කිරීම හා අනාවැකි පළකිරීම, ඵලදායි ලෙස සංග්‍රාමික උපකරණ ලබාගැනීමෙන් සතුරාට එරෙහිව අති නවීන හැකියාවන් වැඩිදියුණු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

## බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය

82. ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වත්මන් තත්ත්වයන් (පවතින හෝ පැවතිය හැකි සතුරු තර්ජන) පිළිබඳව කාලීන හා යාවත්කාලීන තොරතුරු මෙන්ම, සියලු මට්ටම්වල අණ දෙන්නන් හට තම යුධෝපායන් සැකසීමට අවශ්‍ය භූමිය හා දේශගුණික තත්වයන් පිළිබඳව තොරතුරු සම්පාදනය හා ඒ හා සබැඳි තොරතුරු වෙත සතුරන් ළඟාවීම වැලැක්වීම සඳහා අවැසි වන බුද්ධි තොරතුරු සම්පාදනය සිදුකරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයකි.

83. බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි මූලික වගකීම වන්නේ සියළු ආකාරයේ ජාතික ආරක්ෂක තර්ජනයන් කාලීනව විශ්ලේෂණය කිරීමයි. මෙම සමස්ථ මෙහෙයුම බුද්ධි චක්‍රය හා බුද්ධි මූලධර්ම වලට අනුකූලව වඩා කාර්යක්ෂම ක්‍රමවේදයක් හරහා සිදුකරනු ලබයි.

### මූල්‍ය විස්තර

84. 2018 වර්ෂය සඳහා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි පාලන අවශ්‍යතාවන් සඳහා වෙන් කරන ලද මූල්‍ය විස්තර පහත පරිදි වේ:

| අනු අංකය | අරමුදල් වෙන් කිරීමේ අංකය | ලද මුදල (රු.) | වියදම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222-01-1-1101 (ii) | 420,000.00 | 418,250.00 | 1,750.00 |
| 2. | 222-01-1-1003 (v) | 167,140.00 | 132,127.00 | 35,013.00 |
| 3. | 222-01-2-12011 | 125,000.00 | 29,035.60 | 95,964.40 |
| 4. | 222-01-1-1409 (xv) | 10,000.00 | 10,000.00 | - |

වගුව 3:21. මූල්‍ය විස්තරය

### අරමුදල් උපයෝගීතාවය

85. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 වසර සඳහා ලද අරමුදල් සේවා නියුක්තිය, පරිපාලන, නඩත්තු, පුහුණු යන ක්ෂේත්‍රයන්හි මෙන්ම ලේඛන හා මිලදී ගැනීම් වෙනුවෙන් කාර්යක්ෂමව වැයකර ඇත.

### පුද්ගල සංවර්ධන ක්‍රියාකාරකම්

86. නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසා පහත සඳහන් පරිදි දමිළ හා චීන භාෂා පුහුණු පාඨමාලාවන් පවත්වන ලදී:

| අනු අංකය | පාඨමාලාවේ නම | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවූ ප්‍රමාණය |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | දෙමළ භාෂා පාඨමාලාව | 28 | 840 |
| 2. | චීන භාෂා පාඨමලාව | 02 | 24 |

වගුව 3:22. දමිළ හා චීන භෂා පුහුණු පාඨමාලාවන් විස්තරය

87. විදේශීය රාජ්‍ය/බුද්ධි/ආරක්ෂක ආයතන හා එක්ව සන්නද්ධ බුද්ධි බළකා නිලධාරීන් හා සෙනීන්ගේ බුද්ධි දැණුම සංවර්ධනය සඳහා පහත සඳහන් විශේෂ පුහුණුවන් පවත්වන ලදී:

| අනු අංකය | පඨමාලාවේ නම | ආයතනය | සහභාගීවූ ප්‍රමණය |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | බුද්ධි මෙහෙයුම් සැළසුම් කිරීමේ පාඨමාලාව | ඇමරිකා තානාපති කාර්යාලය | 10 |
| 2. | බුද්ධි විශ්ලේෂණ පාඨමාලාව | ඇමරිකා තානාපති කාර්යාලය | 12 |
| 3. | බුද්ධි සංකල්පය හඳුන්වාදීමේ පාඨමාලාව | ඇමරිකා තානාපති කාර්යාලය | 01 |

වගුව 3:23. විශේෂ පුහුණු විස්තරය

88. සන්නද්ධ බුද්ධි බළකා ඒකකයන් හා අධ්‍යක්‍ෂ මණ්ඩලය අතර වඩාත් කාර්යක්‍ෂම, ආරක්‍ෂිත හා වේගවත් දත්ත හුවමාරු ක්‍රමවේදයක් සැකසීම සඳහා ස්වාධීන දත්ත හුවමාරු ජාලයක් ස්ථාපනය කරන ලදී.

89. එසේම මූලික බුද්ධි පාඨමාලා, ප්‍රශ්න කිරීමේ පාඨමාලා හා ආරක්‍ෂක පාඨමාලාවන් සියලු රෙජිමේන්තු, පොලිස්, ගුවන් නාවික හා විශේෂ කාර්යය බළකා නිලධාරීන් වෙනුවෙන් සන්නද්ධ බුද්ධි බළකා පුහුණු පාසල්හිදී පවත්වන ලදී. අදාළ පාඨමාලා විස්තර පහත පරිදි වේ:

| අනු අංකය | පාඨමාලාවේ නම | සහභාගි වූ ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|---|---|
| | | යුධ | නාවික | ගුවන් | පොලිස් | එකතුව |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |
| 1. | ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී බුද්ධි පාඨමාලාව (අංක 12) (සියළු රෙජිමේන්තු) | 8 | 2 | 2 | 2 | **14** |
| 2. | ආරක්‍ෂක නිලධාරී පාඨමාලාව (අංක 15) | 7 | 3 | 1 | 1 | **12** |
| 3. | මාණ්ඩලික බුද්ධි නිලධාරී පාඨමාලාව (අංක 18) | 14 | 3 | 1 | 1 | **19** |
| 4. | ප්‍රශ්න කිරීමේ පාඨමාලාව (සෙසුනිල) | 4 | 3 | 2 | 4 | **13** |
| 5. | මාණ්ඩලික බුද්ධි නිලධාරී පාඨමාලාව (අංක 19) | 14 | 3 | 2 | 2 | **21** |
| 6. | ප්‍රශ්න කිරීමේ නිලධාරී පාඨමාලාව (අංක 07) | 4 | 3 | 1 | 4 | **12** |
| 7. | ආරක්‍ෂක නිලධාරී පාඨමාලාව (අංක 16) | 7 | 2 | - | 2 | **11** |

වගුව 3:24. බුද්ධි පාඨමාලා, ප්‍රශ්න කිරීමේ පාඨමාලා හා ආරක්‍ෂක පාඨමාලාවන් පිළබඳ විස්තර

**<u>අභියෝග හා ගැටළු</u>**

90. ශ්‍රී ලංකාවෙහි ජාතික බුද්ධි පනතක් නොමැති වීම හේතුවෙන් බුද්ධි කටයුතු සඳහා යම් යම් බලපෑම් එල්ලවන බැවින් බුද්ධි ආයතනයකට නෛතික ආරක්‍ෂාවක් තුළ තම රාජ්‍ය බුද්ධි වගකීම ඉටු කිරීම වස් බුද්ධි පනතක අවශ්‍යතාව පවතියි.

**<u>සාරාංශය</u>**

91. වත්මන් ශ්‍රී ලංකාව තුළ පශ්චාත් යුධ සමයෙහි පවතින ආරක්‍ෂක අවශ්‍යතාවයන් හා සාමය පවත්වාගෙන යනු වස් බුද්ධි අවශ්‍යතාවය ඉතා වැදගත් තැනක් උසුලයි. ජාතික ආරක්‍ෂාවට බලපානු ලබන අභ්‍යන්තර හා බාහිර ආරක්‍ෂක තර්ජන වලට මුහුණදීම සඳහා බුද්ධි අධ්‍යක්‍ෂ මණ්ඩලය බුද්ධි පනතක් මගින් ශක්තිමත් කොට වඩා උසස් තත්වයෙන් පවත්වාගත යුතුවේ.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

92. මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ මනෝ විද්‍යා මෙහෙයුම් සිදුකරගෙන යාම සහ සැලසුම් කිරීමයි. මනෝවිද්‍යාත්මක අධ්‍යක්ෂ මණ්ඩලය ආරක්ෂක සේනා මුලස්ථාන/ සේනාංක මුලස්ථානයෙහි පිහිටා ඇති මනෝවිද්‍යා මෙහෙයුම් ආයතන හා සම්බන්ධව තෝරා ගත් පිරිසක් වෙනුවෙන් එහි කාර්යභාර්යන් ඉටුකරමින් පවතියි. මුද්‍රිත හා දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම් වැඩසටහන් මෙහෙයුම් සිදුකරයි. මීට අමතරව මෙම අධක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදාව තුල ඉහළ මට්ටමේ සදාචාරාත්මක හා විනය ගරුකභාවය පවත්වාගෙන යාම සඳහා මනෝවිද්‍යාත්මක කටයුතු මෙහෙයවනු ලබයි.

**මූල්‍ය තොරතුරු**

93. 2018 වසර තුළදී මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාගත් මූල්‍ය ප්‍රතිපාදන ක්‍රමවත්ව මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අරමුණු සහ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යොදා ගන්නා ලදී. ප්‍රයෝජනය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන විස්තර පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන් කල ප්‍රතිපාදන මුදල (රු.) | වැය කිරීම් (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | පොදු වියදම් 222-01-3-1409 (xvii) | 11,500,000.00 | 11,346,518.90 | 153,418,10 |
| 2. | සුලු මුදල් | 10,000.00 | 10,000.00 | - |
| 3. | අභ්‍යාස දීමනා ගිණුම | 30,000.00 | 30,000.00 | - |
| 4. | වාර සඟරා | 4470.00 | 4470.00 | - |
| 5. | ලිපිද්‍රව්‍ය ශීර්ෂය 222-01-2-1201 | 424,878.21 | 216,596.83 | 208,281.38 |
| 6. | පවිත්‍රතා ගිණුම | 10,000.00 | 3,825.41 | 6,174.59 |

වගුව 3:25. මූල්‍ය විස්තරය

**2017 වර්ෂය තුළ අත්පත් කර ගැනීම්**

94. **මනෝවිද්‍යාත්මක මෙහෙයුම්.** මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඒ හා බැඳුණු ආයතන මුද්‍රිත හා දෘෂ්‍ය මාධ්‍ය හරහා නිලධාරීන්ගේ සහ සෙසුනිලයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් ඵලදායීව මනෝවිද්‍යා මෙහෙයුම් කටයුතු දියත් කිරීමට හැකි විය. අවස්ථානුකූලව විවිධ ඉලක්ක පෙරදැරි කරගනිමින් සිංහල භාෂාවෙන් පෝස්ටර්/ අත්පත්‍රිකා මුද්‍රණය කර යුද්ධ හමුදා සහ උනන්දුවක් දක්වන ඉලක්කගත කණ්ඩායම් අතර බෙදා දී ඇත.

95. **රණවිරුවා සහ අසල්වැසියා සඟරාව මුද්‍රණය කිරීම සහ බෙදාහැරීම**

අ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මසකම රණවිරුවා සඟරාව සැලසුම් කිරීම, සංස්කරණය කිරීම, මුද්‍රණය කිරීම සහ බෙදාහැරීම සඳහා ප්‍රධාන වශයෙන් වගකීම දරයි. මෙම සඟරාව වර්ණ පිටු 40 කින් යුක්තව පිටපත් 10,000 ක් මුද්‍රණය කරනු ලබයි.

ආ. අසල්වැසියා සඟරාව යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන සිවිල් කටයුතු සම්බන්ධයෙන් දෙමළ ජනතාව දැනුවත් කිරීම සඳහා මුද්‍රණය කරයි. මෙම සඟරාවෙහි වර්ණ පිටු 20 කින් යුක්තව පිටපත් 6,000 ක් මුද්‍රණය කරනු ලබයි.

ඇ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ විවිධ දැනුවත් වීම් සඳහා යුද්ධ හමුදාව තුළ පෝස්ටර්, පත්‍රිකා සහ අත්පත්‍රිකා බෙදාහරිනු ලබයි.

96. **<u>භාවනා වැඩසටහන්</u>**

අ. ත්‍රිවිධ හමුදා සාමාජිකයන් විසින් දශක ගණනාවක් තිස්සේ අප රටෙහි තිබූ කුරිරු ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සඳහා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් සමඟ තම ආධ්‍යාත්මික සේවය හා නොයෙකුත් කැප කිරීම් සිදුකරන ලදී. මෙම විජයග්‍රහණයෙන් සාමය උදාවීම සෑම ජාතියක් විසින් භුක්ති විඳින අතර, මෙම විශිෂ්ඨ ජයග්‍රහණය වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් සේවා සැපයුම්කරුවන් ඇගයීමට ලක්වී තිබේ. කෙසේ වෙතත්, ජාතිය වෙනුවෙන් සිය උපරිමයෙන් ලබාදුන් ඇතැම් සොල්දාදුවන් රට තුළ විවිධ නීතිවිරෝධී කටයුතු වල යෙදී සිටින බව වාර්තා වේ. යුද්ධ හමුදා පුද්ගලයින් විසින් සිදුකරන ලද නීතිවිරෝධී කටයුතු සම්බන්ධව චෝදනා සෙබළුන්ගේ ගෞරවය සහ සමස්ත හමුදාවේම ප්‍රතිරූපයට හානි සිදුකරයි. ඉහත සඳහන් කළ තත්වයට ප්‍රායෝගික විසඳුමක් ලෙස සටන් කිරීමට මුලුමනින්ම කැප වූ සොල්දාදුවන්ගේ යුද මානසිකත්වය සදාචාරාත්මක ලෙස වර්ධනය විය යුතු බව හඳුනාගන්නා ලදී. ඉහත සඳහන් ගැටළුවට විසඳුමක් ලෙස භාවනා කිරීම යොදාගත හැකි බවත් එමගින් සොල්දාදුවන්ගේ මානසික තත්ත්වය ස්ථාවර කරගත හැකි බවට විශ්වාස කෙරේ.

ආ. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත පහත සඳහන් ස්ථාන වල භාවනා වැඩසටහන් එක් දිනක් හා දින 10 ක් තුළ පැවැත්විය.

(1) ධම්ම අනුරාධ භාවනා මධ්‍යස්ථානය - අනුරාධපුර
(2) ධම්ම සෝභා භාවනා මධ්‍යස්ථානය - කොස්ගම
(3) බවුන්සෙත් මානසික සුවසෙවන භාවනා මධ්‍යස්ථානය - දෙකටන

97. **<u>මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.</u>** මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනේ අරමුණ වන්නේ මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) හි සහය ඇතිව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම පාලනය සහ වැලැක්වීමයි. පසුගිය වර්ෂයෙහි විවිධ ස්ථාන වල සිදුකරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නිලධාරීන් 513 ක් හා සෙසුනිලයින් 6,470 ක් සහභාගි වී ඇත.

98. **<u>කාන්තා සෙබලියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් - 2018.</u>** යුද්ධ හමුදාපතිගේ උපදෙස් මත නිවාරණ වෛද්‍ය මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය ඇතිව තවත් විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. මෙමගින් නීතිමය ගැටළු/ කාන්තා කාන්තා අයිතිවාසිකම්, කාන්තා සබළියන්ගේ ජීවන තත්ත්වය හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම.

99. **<u>නීතිවිරෝධී හැසිරීම් වැලැක්වීමේ වැඩසටහන - 2018.</u>** යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය මත නීතිවිරෝධී හැසිරීම වැලැක්වීමේ වැඩසටහන නිවාරණ වෛද්‍ය මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය ඇතිව රණවිරුවන්ගේ එදිනෙදා කටයුතු සහ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම සඳහා නීතිමය පසුබිම සහ මනෝවිද්‍යාව පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම සිදුකරයි.

**<u>නිර්දේශයන්</u>**

100. මනෝවිද්‍යා මෙහෙයුම් වල ඇති වැදගත්කම තවමත් නිසි අයුරින් ප්‍රයෝජනයට ගෙන නොමැති අතර යුද්ධ හමුදාවට හා රටට එහි පූර්ණ හැකියාව භාවිතා කර නොමැත. හමුදාවෙහි සහ ඉන් පිටතදී මනෝවිද්‍යාත්මක මෙහෙයුම් නිසි ලෙස යෙදවීම මගින් හමුදාවට මෙන්ම රටටත් යහපැවැත්මේ දැවැන්ත ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය. මනෝවිද්‍යා මෙහෙයුම් යනු හමුදාවෙහි සේවය කරන සාමාජිකයන්ගේ ස්ථාවර මානසික තත්ත්වය වැඩි දියුණු කිරීම සහ යුද්ධයෙන් පීඩාවට පත් වූ සිවිල් ජනතාවගේ හදවත් හා සිත් දිනාගැනීම සඳහා ප්‍රායෝගිකව, ක්‍රමවත්ව සහ ක්‍රමානුකූලව යොදාගත හැකි උපකරණයකි. එබැවින් රටෙහි විශාලතම යුධ බළකාය ලෙස සැලකිය හැකි හමුදාවෙහි නිලධාරීන් හා සොල්දාදුවන් සහිත ඵලදායී මානසික මෙහෙයුම් ආයතන ස්ථාපිත කිරීමට ප්‍රයත්නයන් දැරිය යුතුය. ඒවායෙහි අභ්‍යන්තර හා බාහිර ගැටළු සඳහා අවශ්‍යවන සම්බන්ධීකරණය මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය තුළින් ලබාගෙන එමගින් විවිධ මූලස්ථාන යටතේ ක්‍රියාකාරකම් සිදුකරගෙන යාමට හැකියාව ඇත.

අ. ආරක්ෂක සේනා මූලස්ථාන 04 ක් යටතේ මනෝවිද්‍යා මෙහෙයුම් අංශ පවත්වාගෙන යන අතර මනෝවිද්‍යා මෙහෙයුම් අංශ ආරක්ෂක සේනා සහ සියළුම සේනාංක මූලස්ථාන යටතේ ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර ඇත.

ආ. මනෝවිද්‍යා මෙහෙයුම් සිදුකිරීමේ අරමුණ ඇතිව මෙම ක්ෂේත්‍රය පිළිබදව නිලධාරීන් පුහුණු කිරීම උදෙසා දේශීය/විදේශීය පාඨමාලා වැඩි ප්‍රමාණයක් නිර්දේශ කරනු ලැබේ.

## මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය

101. මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය භාරදූර කාර්යභාරයක් ඉටුකරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ හඳුන්වා දිය හැක්කේ එය සමස්ත යුද්ධ හමුදාවෙහිම කාලීන අවශ්‍යතා උදෙසා ක්‍රියාකාරී වන බැවිනි. මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යභාරය ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරී සහ සෙසුනිලයින් බඳවා ගැනීමේ අනුමැතිය ලබාගැනීම, යුද්ධ හමුදාව තුළ ආයතනයන්හි සංස්ථා අනුමත කිරීම, සංශෝධනය හා පවත්වාගෙන යාම මගින් නිත්‍ය ස්වේච්ඡා බලසේනාවන්හි සංයුතිය නිසි පරිදි පවත්වාගෙන යාම, ආරක්ෂක අමාත්‍යංශයෙහි ඉල්ලීම පරිදි එම අමාත්‍යංශයට අවශ්‍ය මාසික යුද්ධ හමුදා සාමාජික වාර්තා ඉදිරිපත් කිරීම හා යුද්ධ හමුදාවට අවශ්‍ය සිවිල් සේවකයින් සඳහා අනුමැතිය ලබාදීම හැඳින්විය හැක. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත යුද්ධ හමුදාවෙහිම කාර්ය පරිවිතරයන් සහ කාර්ය විශේෂීකරණයන් සැකසීම සහ අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි.

102. එමෙන්ම සෑම වසරකම ආරක්ෂක අමාත්‍යංශයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමටත් එම කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවෙහි කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මෙන්ම ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමද සිදුවන්නේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මඟිනි. තවද ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය සේවකයින්ගේ සංගණනයෙහි දත්ත ආරක්ෂක අමාත්‍යංශය වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනට සිදුකරගෙන යමින් පවතියි.

### මූල්‍යමය විස්තර

103. අභ්‍යන්තර පාලන කටයුතු සඳහා පමණක් මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | මුදල් ලැබීම් (රු.) | මුදල් වියදම් (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222-01-1-1409(xv) | 30,000.00 | 30,000.00 | - |
| 2. | 222-01-1-1409(xv) | 5,000.00 | 4,680.00 | 320.00 |
| 3. | 222-01-2-1303(xvi) | 10,000.00 | 10,000.00 | - |

වගුව 3:26. මූල්‍ය විස්තරය

### ප්‍රතිපාදන භාවිතය

104. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ලබාදී ඇති සියලුම මූල්‍ය ප්‍රතිපාදන ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා මිලදී ගැනීම සඳහා කාර්යක්ෂම ලෙස භාවිත කර ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රාජකාරී කිරීමට ඉතා සුදුසු පරිසරයක් නිර්මාණය කොට ඇති අතර, එහි සේවය කරන නිලධාරී, සෙසුනිල, සිවිල් සේවක මහතුන්ගේ අතිරේක හා සමාජයීය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් දිනපතා හා සති අන්ත සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් 02 බැගින් මිලදී ගෙන තිබේ.

### වාර්ෂික කාර්ය ප්‍රගති සමාලෝචනය

105. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සංයුතිය පිළිබඳ නිරීක්ෂණයකින් හා නිසි අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අතැම් සංස්ථා අවශ්‍ය පරිදි වෙනස් කොට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි වත්මන් සංයුතිය පවත්වාගෙන යෑමට මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි වී තිබේ. මෙහිදී යතායෝග්‍ය ප්‍රමාණකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට ඇතැම් සංස්ථා සංශෝධනය කිරීමටත් මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය මූලිකත්වය ගෙන ඇත.

106. **<u>යතායෝග්‍ය ප්‍රමාණකරණ ක්‍රියාවලිය.</u>** යතායෝග්‍ය ප්‍රමාණකරණ ක්‍රියාවලිය මගින් ආරක්ෂක අමාත්‍යංශය මඟින් අනුමත කරන ලද සංස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි භටපිරිස් ප්‍රමාණය තුලනය කිරීම සිදු වේ. මෙම ක්‍රියාවලිය මගින් කිසිදු නිලධාරියෙකුට හෝ සෙසුනිලයකුට අසාධාරණයක් සිදු නොවන අතර, විසුරුවා හරින ලද ඒකකයන්ට අයත් භටපිරිස් කණ්ඩායම් අදාල රෙජිමේන්තු වෙත යා කෙරෙනු ඇත. එසේ යා කෙරෙන්නේ රෙජිමේන්තුවකට යා කළ හැකි උපරිම භටපිරිස් ප්‍රමාණයක් පමණක් බැවින් එමගින් රෙජිමේන්තු වල සංවර්ධනයට කිසිදු අහිතකර බලපෑමක් සිදු නොවේ.

107. ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ත්‍රිවිධ හමුදාව විසින් පවත්වාගත යුතු භටපිරිස් සංඛ්‍යාව අනුමත කර තිබුණද, පැවති යුදමය වාතාවරණයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අනුමත ගණන් ඉක්මවා බඳවාගෙන ඇත්තේ පැවැති කාලීන අවශ්‍යතාවන්ට අනුකූල වන සේය. වර්තමානය වන විට මෙම සංඛ්‍යා දත්ත ලේඛන වාර්තා වලට පමණක් සීමා වී ඇත. එබැවින් යතායෝග්‍ය ප්‍රමාණකරණ ක්‍රියාවලිය මඟින් සිදු කෙරෙන්නේ එම අනුමත සංඛ්‍යාවට වඩා අතිරික්තව ඇති භටපිරිස් තුලනය කිරීමක් පමණි.

108. පහත ආයතන තවතමයෙන් නගා සිටුවීම සඳහා මාණ්ඩලික රාජකාරී අධ්‍යක්‍ෂ මණ්ඩලය මඟින් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි කාලීන අවශ්‍යතා සලකා බලමින් එම ආයතන නවතමයෙන් නගාසිටුවීම, සංශෝධනය කිරීම සහ විසුරුවා හැරීම සිදුකරන ලදී.

අ. පහත සදහන් සංස්ථා / ආයතන නවතමයෙන් ස්ථාපනය කරන ලදී.

(1) විදේශ මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය
(2) යාන්ත්‍රික ඉංජිනේරු බලසේනාව
(3) පහත සදහන් ආධුනික පුහුණු මධ්‍යස්ථාන 8 නවතමයෙන් ස්ථාපනය කරන ලදී
(අ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (පුත්තලම)
(ආ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (හේනානිගල)
(ඇ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (වෙඩිතලතිව්)
(ඈ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (තලාව)
(ඉ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (ඉපලෝගම)
(ඊ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (සඳුන්පුර)
(උ) ආධුනික පුහුණු මධ්‍යස්ථානය (දියතලාව)
(ඌ) ආධුනික පුහුණු කාන්තා මධ්‍යස්ථානය (සඳුන්පුර)

ආ. **සංස්ථා/ සංවිධාන සංශෝධනය කිරීම.** පහත සඳහන් සංස්ථා / සංවිධාන යතායෝග්‍ය ප්‍රමාණකරණ ක්‍රියාවලිය මඟින් සංශෝධනය කර ඇත:

(1) **භට නිවාස සම්පාදන අධ්‍යක්‍ෂ මණ්ඩලය.** 1994 අප්‍රේල් 30 වන දින හවනි 18/1994 මඟින් භට නිවාස සම්පාදන අධ්‍යක්‍ෂ මණ්ඩලය නගා සිටවූ අතර, එය ඉඩම් හා භට නිවාස සම්පාදන අධ්‍යක්‍ෂ මණ්ඩලය ලෙස 2018 අප්‍රේල් 11 වන දින සිට සංශෝධනය විය.

(2) **ශ්‍රී ලංකා රයිෆල් බලකාය.** 2018 අගෝස්තු 10 වන දින සිට බල පැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රයිෆල් බලකායෙහි පළමු හා දෙවන බළඇණි ඒකාබද්ධ කොට පළමු රයිෆල් බලකාය ලෙස නාම සංශෝධනය කරන ලදී.

(3) **ශ්‍රී ලංකා පුරෝගාමී බලකාය.** 2018 අගෝස්තු මස 10 වන දින සිට බල පැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා පුරෝගාමී බළකායෙහි පළමු හා දෙවන බලඇණි ශ්‍රී ලංකා පුරෝගාමී බළකාය ලෙස ඒකාබද්ධ කර ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකාය ලෙස නාම සංශෝධනය කරන ලදී.

ඇ. **විසුරුවා හරින ලද ආයතන.** පහත ආයතනය යතායෝග්‍ය ප්‍රමාණකරණය ක්‍රියාවලිය යටතේ විසුරුවා හරින ලදි.

(1) **ආයුර්වේද වෛද්‍ය අධ්‍යක්‍ෂ මණ්ඩලය.** 2018.09.21 සිට බලපැවැත්වෙන පරිදි විසුරුවා හරින ලදී.

109. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වත්මන් සංයුතිය හා එහි අනාගත අවශ්‍යතා පිළිබඳ පුළුල් අධ්‍යයනයකින් අනතුරුව, කෙඩෙට් නිලධාරී හා සොල්දාදුවන් බඳවාගැනීමට ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලබා ගන්නා ලදී. පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් නිලධාරී හා සෙසුනිල ප්‍රමාණය පහත පරිදි වේ:

| අනු අංකය | | | අනුමත සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2015 | 2016 | 2017 | 2018 |
| (අ) | (ආ) | | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | නිලධාරි | නිත්‍ය | 360 | 558 | 422 | 213 |
| | | ස්වේච්ඡා | 111 | 25 | 142 | 97 |
| 2. | සෙසුනිල | නිත්‍ය | 6,173 | 14,320 | 11,069 | 8,631 |
| | | ස්වේච්ඡා | 3,891 | 3,134 | 2,134 | 4,252 |

වගුව 3:27. පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් නිලධාරී හා සෙසුනිල ප්‍රමාණය




ප්‍රස්ථාරය 3:1. පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් නිලධාරී සංඛ්‍යාව




ප්‍රස්ථාරය 3:2. පසුගිය වසර කිහිපයක බඳවාගැනීමට අනුමැතිය ලබාදුන් සෙසුනිල සංඛ්‍යාව

110. මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබාදීමට අනුමත සිවිල් සේවක මහතුන් ප්‍රමාණය නොඉක්මවමින් (11,146) සිවිල් සේවක මහතුන් 10,201 දෙනෙකු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සේවයෙහි යෙදවීමට අනුමැතිය ලබාදී ඇත.

| අනු අංකය | වෘත්තිය | අනුමත සිවිල් සේවක සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | අරක්කැමි | 2,654 |
| 2. | භෝ/සේවක | 2,966 |
| 3. | 111 කම්කරු | 2,388 |
| 4. | සනි/කම්කරු | 1,727 |
| 5. | වෙනත් | 466 |
| | **එකතුව** | **10,201** |

වගුව 3:28. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබාදීමට අනුමත සිවිල් සේවක මහතුන් ප්‍රමාණය

**ජයග්‍රණ**

111. යතායෝග්‍ය ප්‍රමානකරණ ක්‍රියාවලියෙහි පළමු අදියර සාර්ථක නිමාවෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි අනුමත සංයුතිය හා පවත්නා සංයුතිය අතර, පවත්නා වෙනස අවම කිරීමට මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි විය.

112. පහත තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනීමට මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයට හැකිවිය.

අ. දකුණු සුඩානයෙහි සාමසාධක මෙහෙයුම් සඳහා විශේෂඥ වෛද්‍යවරු 04 දෙනෙකු බඳවාගැනීම.

ආ. වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයට විශේෂඥ වෛද්‍යවරු 03 දෙනෙකු බඳවාගැනීම.

113. පුහුණු, ක්‍රියාශීලි, කාර්ක්ෂමව හා පළපුරුදු වෘත්තිකයන් මෙරට ආර්ථිකයට දායක කරවීමට සමත් වන පරිදි නවතමයෙන් ඉදි කළ කලාඔය වෘත්තීය පුහුණු පාසැල තවත් ජයග්‍රහණයකි.

114. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මෙරට ආර්ථිකයෙහි නිෂ්පාදන ක්ෂේත්‍රයට කාර්යක්ෂම හා පළපුරුදු ලත් වෘත්තිකයන් ලබාදීම මඟින් ප්‍රබල දායකත්වයක් සපයන්නෙකු බවට පත් කරමින් අභිනවයෙන් ස්ථාපනය කරන ලද කලාඔය වෘත්තීය පුහුණු පාසලද තවත් එක් ජයග්‍රහණයකි. එම ක්ෂේත්‍ර පහත පරිදි වේ.

අ. වඩු කර්මාන්ත ශාලාව
ආ. යුධෝපකරණ කර්මාන්ත ශාලාව
ඇ. විදුලි හා යාන්ත්‍රික නිෂ්පාදන

**ගැටළු සහ අභියෝග**

115. සිවිල් සමාජයෙහි රැකියා සඳහා පවතින තරගකාරීත්වය සමඟ මනා පළපුරුද්ද සහිත නිපුණතාවයෙන් යුතු පිරිසක් යුද්ධ හමුදාවට බඳවා ගැනීම මඟින් එහි අනුමත නිලධාරි හා සෙසුනිලයින් සංඛ්‍යාව පවත්වාගෙන යාම අභියෝගයක්ව පවතියි.

116. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ පවත්නා සිවිල් සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අතර, සිවිල් සේවක මහතුන් පවත්නා ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් බඳවාගැනීමට සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අපේක්ෂිතය.

117. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් දේශය ගොඩනැංවීමේ ව්‍යාපෘතිය හා එම වැඩසටහන් සඳහා භටපිරිස් කණ්ඩායම් යොදවා ඇති අතර, එමගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ශ්‍රමය, තාක්ෂණික, ප්‍රායෝගික දැනුම එම ව්‍යාපෘති සඳහා ලබාදෙමින් සිටියි. සිරිසර පිවිසුම හා පිබිදෙමු පොළොන්නරුව උදාහරණ කිහිපයකි.

118. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සම්බන්ධයෙන් මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් බාහිර පාර්ශව වලින් එල්ල වන විවේචන මතවාද හා අදහස්.

**සාරාංශය**

119. වර්තමානය වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පශ්චාත් යුද සමය තුළ යුද්ධ හමුදාව තුළ මෙන්ම ඉන් බාහිරින්ද මතුවන විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් සිටියි. ජාතියේ ආරක්ෂකයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වර්තමානය වන විට යුද්ධයෙන් පසුව ජාතියේ අවශ්‍යතා හඳුනාගෙන ක්‍රියාවට නංවමින් සිටියි. එහි ප්‍රතිඵලයක් ලෙස යුද්ධයෙන් පසුව රට ගොඩනැංවීමේ ක්‍රියාවලිය තුල සාමය හා ආරක්ෂාව ස්ථාවර කිරීම ස්ථිරසාර සමාජ ආර්ථික සංවර්ධනයක් රට තුල ඇති කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් සිටියි. මෙම ක්‍රියාවලිය විවිධ පැතිකඩ කරා යොමු වූ පුළුල් විෂයක් වන අතර, යුධමය (නීතිය හා සාමය යලි පිහිටුවීම), දේශපාලනය (ආණ්ඩුව), ආර්ථිකය (පුනරුත්ථාපනය හා සංවර්ධනය) හා සමාජයීය සාධාරණත්වය හා සංහිඳියාව වැනි ක්ෂේත්‍ර වල සමාන වර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරයි. මෙහිදී යුද්ධ හමුදාව ප්‍රමුඛත්වය ගෙන මෙරට ආර්ථික සංවර්ධනයට දැවැන්ත දායකත්වයක් සපයන අතර, සහන සේවා සැපයීම්, යටිතල පහසුකම් නගා සිටුවීම, සමාජ සේවා යළි ස්ථාපනය, පෞද්ගලික අංශ සංවර්ධනය සුදුසු ක්‍රියාමාර්ග ගැනීම, ආර්ථික ස්ථාවරත්වය හා තිරසාර සංවර්ධනය ඇති කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණය සිදුකිරීම මෙහිලා දැක්විය හැක.

120. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ඉතා දක්ෂ ලෙස රාජකාරී ඉටු කිරීමේ ශක්‍යතා වලින් පිරිපුන් කාර්යක්ෂම මානව සම්පතින් යුත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවක් පවත්වාගැනීම ඉතා වැදගත් වන අතර, ඒ සඳහා නිසි පරිදි බඳවාගැනීම් සිදු කරමින් අවශ්‍ය ප්‍රචාරණය ලබා දීම අනිවාර්ය වේ.

## ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

121. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදාව පිළිබඳව ජනමාධ්‍ය විසින් සිදුකරනු ලබන සියලු ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලබයි. ජනමාධ්‍යයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සොයා බැලීම, එම විෂයට අදාළ දේශන සහ පුහුණුවීම් කටයුතු සිදුකිරීම, යුද්ධ හමුදා වෙබ් අඩවි භාෂා ත්‍රිත්වයෙන් යාවත්කාලීන කිරීම, යුද්ධ හමුදා සමාජ ජාල සහ මුහුණු පොත (Face Book) පවත්වා ගෙන යෑම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සෙසු කාර්යයන් වේ.

### මූල්‍ය විස්තරය

122. ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයෙහි මූල්‍ය වියදම් පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | වෙන් කිරීම් (රු.) | වැය කිරීම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ලිපිද්‍රව්‍ය | 225,000.00 | 97,822.00 | 127,178.00 |
| 2. | පුවත්පත් | 300,000.00 | 300,000.00 | - |
| 3. | අභ්‍යාස දීමනා | 30,000.00 | 30,000.00 | - |
| 4. | සනීපාරක්ෂක ද්‍රව්‍ය | 10,000.00 | 10,000.00 | - |
| 5. | සඟරා | 5,000.00 | 4,992.00 | 08.00 |
| 6. | මාධ්‍ය හා වෙනත් වියදම් | 2,050,000.00 | 1,784,874.88 | 265,125.12 |
| 7. | බස් ගමන් අවසරපත් | 56,000.00 | 52,413.00 | 3,987.00 |
| | **එකතුව** | **2,676,000.00** | **2,277,101.68** | **396,290.18** |

වගුව 3:29. මූල්‍ය විස්තරය

### ප්‍රතිපාදන භාවිතය

123. ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අවශ්‍යතාවයන් සපුරාලීමට වෙන්කර ඇති මුදල් අතුරින් මාධ්‍ය හා වෙනත් වියදම් සඳහා වෙන්කර ඇති මුදල් මගින් ජනමාධ්‍ය අවශ්‍යතාවයන් සහ උපකරණ මිලදී ගැනීම සිදුකරනු ලබන අතර, යුද්ධ හමුදාව පිළිබඳව පුවත්පත් හි පළවී ඇති ලිපි පිළිබඳව සොයා බැලීම සඳහා පුවත්පත් මිලදී ගැනීම සිදුකරනු ලබයි. කාර්යාලීය අවශ්‍යතාවයන්, පුහුණුවීම් කටයුතු සඳහා මෙන්ම නිලධාරී සෙසුනිලයන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය සඟරා මිලදී ගැනීම සඳහා වන ලිපි ද්‍රව්‍ය වියදම්, සඟරා සහ පුහුණු වැය ශීර්ෂයන් මගින් වියදම් කර ඇති අතර, රාජකාරී බස් ගමන් බලපත් සඳහා වෙන්කර දී ඇති මුදල් දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පැවැත්වෙන උත්සව/නිවේදන රාජකාරි සඳහා ගමන් ගන්නා නිලධාරි/සෙනින්ගේ ප්‍රවාහන අවශ්‍යතාවයන් සඳහා වැය කරනු ලබයි. සනීපාරක්ෂක ප්‍රතිපාදන භාවිතයට ගනු ලබන්නේ ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නිලධාරින් සහ සෙනින්ගේ සනීපාරක්ෂක කටයුතු ඉහළ තත්වයකට ගෙන ඒම සඳහාය.

### වාර්ෂික කාර්ය සාධන විස්තරය

124. 2018 වර්ෂය තුළ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ප්‍රධාන උත්සව 82 කට හා සෙසු උත්සව 72 ක් සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආවරණයන් ලබා දී ඇති අතර ඡායාරූප ඇල්බම් 02 ක්, ඊ ඇල්බම් 06 ක්, සජීවි පටිගත කිරීම් 26 ක් සහ උත්සව අවස්ථාවන් සඳහා කැමරා ශිල්පී සේවාවන් 528 ක් ද, සිංහල නිවේදක රාජකාරි අවස්ථා 136 ක් සහ දමිළ නිවේදක රාජකාරීන් අවස්ථා 15 ක් සඳහා නිවේදකයින් ද ලබාදී ඇති අතර, යුද්ධ හමුදා පුහුණු පාසල් මඟින් පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා ජනමාධ්‍ය විෂය පිළිබඳ දේශන 15ක් සඳහා දේශක සහයද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදී ඇත.

### සාරාංශය

125. 2019 වර්ෂයෙහි සෙසුනිලයින් සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධතාවයෙන් යුතුව වීඩියෝ/නිශ්චල කැමරා පිළිබඳ පුහුණු පාඨමාලාවන් පැවැත්වීම.

126. යුද්ධ හමුදාවෙහි විශේෂ උත්සව සජීවීව ආවරණය කිරීම සඳහා යොදවනු ලබන කැමරා කණ්ඩායම් නිසි පරිදි මෙහෙයවීම සඳහා සන්නිවේදන සම්බන්ධතාවය පවත්වා ගැනීමට සීමිත ප්‍රදේශයක භාවිත කළ හැකි සන්නිවේදන පද්ධතියක් (Inter com) ලබාගැනීම සඳහා සැලසුම් කිරීම.

127. වීඑච්එස් පටවල (VHS) පටිගත කොට ඇති යුද්ධ හමුදාවෙහි විශේෂ වීඩියෝ/ඡායාරූප සංරක්ෂණය කිරීමේ කටයුතු නිමාවෙමින් පවතින අතර, ඉදිරියේදී සියලුම දත්ත ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා පරිගණක පුස්තකාලයක් ස්ථාපිත කිරීම හා ස්ථිර දත්ත ගබඩාවක තැන්පත් කිරීම.

128. පසුගිය දශක තුනක කාලයක් තුළ පැවති යුද්ධයෙන් පසු උතුරු නැගෙනහිර පළාත්වල බිඳ වැටුණු ජනජීවිත නැවත ගොඩනැගීමේදී ආරක්ෂාව සහ නිදහස පිළිබඳ විවිධ වු අභියෝගයන්ට සමස්ත යුද්ධ හමුදාවට මුහුණ පැමට සිදුවිය. එහිදි ජාතිය ගොඩනැගිමට විවිධ ව්‍යාපෘති සිදුකිරීමේදි ඒ සඳහා වු මාධ්‍ය ප්‍රචාරණ ලබාදීම සිදුකෙරිණි.

## ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය

129. ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය යනු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු තවත් වැදගත් අධ්‍යක්ෂ මණ්ඩලයක් වන අතර, එය හුදෙක් ක්‍රීඩා සංවර්ධනය සඳහාම පිහිටුවන ලද්දකි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාවෙහි ක්‍රීඩාවන් ඉහළ නැංවීම සඳහා කැපවීමෙන් ක්‍රියාකරනු ලබන අතර, එමගින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යන් හා දක්ෂතාවයන් දියුණු කිරීම තුළින් ජාතික/ජාත්‍යන්තර තරඟබිම ජයග්‍රහණය කිරීම තුළින් යුද්ධ හමුදාව සහ මාතෘභූමිය වෙත කීර්තිය ලඟාකරදීම මෙහි ප්‍රධාන අරමුණයි. එසේම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා ක්‍රීඩා පාලක මණ්ඩලය හා අනුබද්ධ ආයතනවල පනවා ඇති නීතිරීති වලට අනුකූලව යුද්ධ හමුදාව තුළ විවිධ ඉසව් වලට අයත් ක්‍රීඩා සහ තරඟාවලියන් සඳහා දිරිමත් කිරීම, අනුබලය, සහය ලබාදීම, මඟපෙන්වීම, සම්බන්ධීකරණය සහ පාලනය සිදු කරයි. තවද, මෙම අධ්‍යක්ෂ මණ්ඩලය පහත සදහන් වගකීම් ඉටුකිරීමෙහිලා කටයුතු කරනු ලබයි:

අ. යුද්ධ හමුදාව තුළ සියලු ක්‍රීඩා කමිටු සභාපතිවරුන් හා යුද්ධ හමුදා ක්‍රීඩා කමිටු සභාපති අතර සියලු ක්‍රීඩා කටයුතු අධීක්ෂණය, අනුබලය හා පාලනය සම්බන්ධීකරණය සබැඳිව සාකච්ඡා පැවැත්වීම.

ආ. යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යන් හා දියුණු කල හැකි ශක්ති විභවයන් සංවර්ධනය කිරීම තුළින් ජාතික/ජාත්‍යන්තර තලයෙහි ක්‍රීඩා ඉසව් සඳහා සහභාගිවීමට අවැසි කටයුතු සම්පාදනය කිරීම.

ඇ. ආරක්ෂක සේවා තරඟාවලි සහ අනෙකුත් ක්‍රීඩා තරඟාවලීන් සම්බන්ධීකරණය කිරීම.

ඈ. එතෙර ක්‍රීඩා තරඟාවලි සඳහා සහභාගිවන යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් හට ක්‍රීඩා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම.

## මූල්‍ය තොරතුරු

130. මූල්‍ය ප්‍රතිපාදන විස්තර පහත සදහන් පරිදි වේ:

අ. 2018 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනයන් සබැදි විස්තර

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන් කිරීම් (රු.) | වැය කිරීම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222-01-1-1508 (VI) | 4,375,018.00 | 3,774,058.50 | 10,687.50 |
| 2. | 222-01-2-1205(XVI) | 95,000,000.00 | 67,045,342.57 | 350,521.86 |
| 3. | 222-01-2-1204 (XI) | 2,700,000.00 | 1,658,035.50 | 44,258.44 |
| 4. | 222-01-2-1205 (XXI) | 2,316,594.00 | 1,290,593.25 | 0.75 |
| 5. | 222-01-2-1401 (III) | 4,000,000.00 | 1,537,186.73 | 72,140.01 |
| 6. | 222-01-2-1302 (XII) | 500,000.00 | 196,700.00 | 130.00 |

වගුව 3:30. මූල්‍ය විස්තරය

ආ. අභ්‍යන්තර නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන් කිරීම් (රු.) | වැය කිරීම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අභ්‍යාස දීමනා ගිණුම | 30,000.00 | 30,000.00 | - |
| 2. | භූමි නඩත්තු | 20,000.00 | 20,000.00 | - |
| 3. | යුද්ධ හමුදාධිපති ගිණුම | 50,000.00 | 50,000.00 | - |

වගුව 3:31. අභ්‍යන්තර නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබඳ විස්තරය

**<u>ප්‍රතිප්‍රදාන භාවිතා කිරීම</u>**

131. ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කරනු ලබන ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගනිමින් ක්‍රීඩා තරග සංවිධානය, පුහුණුවීම්, ක්‍රීඩා භාණ්ඩ/ උපකරණ මිලදී ගැනීම හා ක්‍රීඩා පහසුකම් ඉදිකිරීම යනාදිය ඊට අදාළ මූල්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව සියලු පොත්පත් නඩත්තු කරමින් සිදුකරනු ලබයි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය අභ්‍යාස දීමනා ගිණුම වෙතින් ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා මිලදී ගනු ලබන අතර, කාර්යක්ෂමව රාජකාරීන් ඉටුකිරීම සඳහා සුදුසු පරිසරයක් පවත්වාගෙන යනු ලබයි. තවද, මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නිලධාරී/සෙසුනිලයින්ගේ දැනුම හා සමාජීය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රිත දෛනික පුවත්පත් හා සතිඅන්ත පුවත්පත් මිලදී ගනු ලබයි.

**<u>වාර්ෂික කාර්ය සාධනය</u>**

132. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් ජාතික/ජාත්‍යන්තර තලයෙහි ජයග්‍රහණ රාශියක් හිමිකර ගන්නා ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් රැසක් ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්වන ලදි.

**<u>ලබාගන්නා ලද ජයග්‍රහණ</u>**

133. හිමිකරගන්නා ලද ජයග්‍රහණ පහත පරිදි වේ:

අ. <u>ජාතික මට්ටම</u>.

(1) දුනු විදීම
(2) මලල ක්‍රීඩා
(3) බේස්බෝල්
(4) ක්‍රිකට් (කාන්තා)
(5) ජූඩෝ
(6) කබඩි
(7) ඔරුපැදීම
(8) පාපන්දු
(9) පිහිණුම්
(10) වොලිබෝල් ශූරතාවය දිනාගන්නා ලදි.

ආ. <u>ජාත්‍යන්තර තරග ජයග්‍රහණයන්</u>.

(1) 13 වන IMSSU වෙඩිතැබීම් ලෝක ශූරතාවලියේදී රන් පදක්කම් 01 ක්, රිදී පදක්කම් 04 ක්, ලෝකඩ පදක්කම් 02 ක් දිනාගැනීම.

(2) පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී මුෂ්ටි ප්‍රහාර හා බර ඉසිලීමේ ඉසව් තුළින් ලෝකඩ පදක්කම් 02 ක් දිනාගැනීම.

(3) ආසියානු යෞවන ක්‍රීඩා උළලෙහි බර ඉසිලීමේ ඉසව්වෙන් රිදී පදක්කම් 01 ක් දිනා ගැනීම.

(4) 3 වන දකුණු ආසියාතික සෙපැටැක්රෝ තරගාවලියේදී ලෝකඩ පදක්කම් 04 ක් දිනාගැනීම.

(5) 4 වන ආසියානු වුෂු තරගාවලියේදී රන් පදක්කම් 03 ක් සහ ලෝකඩ පදක්කම් 01 ක් දිනාගැනීම.

(6) පිලිපීන මලල ක්‍රීඩා තරගාවලියේදී රන් පදක්කම් 01 ක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.

(7) කොරියානු විවෘත මලල ක්‍රීඩා තරගාවලියේදී ලෝකඩ පදක්කමක් දිනාගැනීම.

(8) තායිලන්ත ජූඩෝ තරගාවලියේදී රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 01 ක් දිනාගැනීම.

<u>ගැටලු හා අභියෝග</u>

134. ජාත්‍යන්තර තරඟාවලි සඳහා සහභාගිවීමේදී ක්‍රීඩක/ක්‍රීඩිකාවන් වෙත අඩු මුදල් ප්‍රතිපාදන ලබාදීම තුළින් ක්‍රීඩකයින්ගේ චිත්ත ධෛර්යය හා ක්‍රීඩාව සඳහා පෙළඹවීමට අහිතකර බලපෑම් ඇතිවීම. එසේම, ක්‍රීඩකයින් සඳහා ගුවන් ටිකට්පත්, නවාතැන් පහසුකම්, ආහාර හා ප්‍රවාහන පහසුකම් සඳහා ප්‍රතිපාදන ඇතැම් ජාතික ක්‍රීඩා සම්මේලන මගින් ලබානොදීම හේතුවෙන් ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි නියෝජනය සඳහා සහභාගි වනු ලබන ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ගේ සම්මත තත්වයන් රඳවා ගැනීම හා ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීම සඳහා අවශ්‍යවන අතිරේක මූල්‍යමය සහාය ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ක්‍රීඩා පාලක අරමුදල විසින් දැරීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිදුවී තිබේ.

135. යටිතල පහසුකම් නොමැතිවීම සහ යටිතල පහසුකම් සීමාසහිත බව.

අ. සියලු පහසුකම් සහිත ක්‍රීඩාංගණයන්හි ඇති හිඟතාවය.
ආ. ක්‍රීඩක අවශ්‍යතා සඳහා වන වෛද්‍ය රසායනාගාර පහසුකම් නොමැතිවීම.

136. ක්‍රීඩා වෛද්‍යවරුන්ගේ හිඟතාවය.

<u>සාරාංශය</u>

137. යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර වශයෙන් ජයග්‍රහණ හිමිකර ගැනීම තුළින් මාතෘභූමිය වෙත අභිමානයක් හා කීර්තියක් ලබාදීමට සමත්වී ඇති අතර, ඒ සඳහා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 250 කට වැඩි පිරිසක් සමත්වී ඇති බැවින්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ක්‍රීඩා පහසුකම් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

## <u>තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය</u>

138. යුද්ධ හමුදාධිපතිතුමාගේ අනුමැතියෙන් යුතුව 2010 මාර්තු මස 1 වන දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලද අතර, මෙහි සමස්ත අණ හා මෙහෙයුම් කාර්යයන් අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික (අජෙප්‍රමා) හා ප්‍රධාන සංඥා නිලධාරී (ප්‍රසංනි) ගේ මගපෙන්වීම යටතේ සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් 6 වන සංඥා රෙජිමේන්තුව, 11 වන සංඥා රෙජිමේන්තුව, 12 වන සංඥා රෙජිමේන්තුව සහ මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු අංශය යන සියලුම උප ආයතන ඉඳුරාම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වේ. නිලධාරී 15ක් සහ සෙසුනිල 47 දෙනෙකුගෙන් යුතු අනුමත සංස්ථාවක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි රාජකාරී ඉටු කිරීම සඳහා යොදවා ඇති අතර යුද්ධ හමුදා මූලස්ථානයේ පටන් ආරක්ෂක සේනා මූලස්ථාන සහ අනෙකුත් සියලු ස්වාධීන මූලස්ථානයන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධව කටයුතු ක්‍රියාත්මක කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම වේ.

<u>2018 වසරෙහි කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණය</u>

139. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ 2018 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය පහත දැක්වේ:

අ. **<u>මෘදුකාංග ව්‍යාපෘති.</u>** 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා මෙම වසරට අදාළ වූ කාලය තුළ නවතමයෙන්ම සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද මෘදුකාංග ව්‍යාපෘතීන්හි විස්තර පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති හිමිකරු | වත්මන් තත්වය |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | රණවිරු සේවා මාපිය රැකවරණ අරමුදල් කළමණාකරණ පද්ධතිය | රණවිරුසේවා අධිකාරිය | අදියර I සම්පූර්ණයි |
| 2. | ප්‍රසම්පාදන කළමනාකරණ තොරතුරු පද්ධතිය | නිවාරණ වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | අදියර I සම්පූර්ණයි |
| 3. | රණවිරු සේවා අධිකාරි කළමණාකරණ පද්ධතිය | රණවිරුසේවා අධිකාරිය/රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය/ සියළු රෙජිමේන්තුව | අදියර I සම්පූර්ණයි |
| 4. | වැඩසටහන් කළමනාකරණ පද්ධතිය | ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | අදියර I සම්පූර්ණයි |
| 5. | අන්තර් රෙජිමේන්තු සේවා කළමනාකරණ පද්ධතිය | පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය | අදියර I සම්පූර්ණයි |
| 6. | නිලධාරී ප්‍රගමන කළමනාකරණ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය | අදියර I සම්පූර්ණයි |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
|---|---|---|---|
| 7. | LDAP හා අනන්‍යතා කළමනාකරණ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | අදියර II සම්පූර්ණයි |
| 8. | සලාක කළමනාකරණ පද්ධතිය | විධායක ජෙනරාල් ශාඛාව /සැපයුම් හා ප්‍රවාහණ අධ්‍යක්‍ෂ මණ්ඩලය | අදියර II සම්පූර්ණයි |
| 9. | ප්‍රසම්පාදන කළමනාකරණ තොරතුරු පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | අදියර III සම්පූර්ණයි |
| 10. | රෝහල් තොරතුරු කළමනාකරණ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | අදියර V සම්පූර්ණයි |
| 11. | සුබසාධක වෙළඳසැල් වෙතින් අනතර්ජාලය හරහා බඩු මිලදී ගැනීම | සුබසාධක අධ්‍යක්‍ෂ මණ්ඩලය | පරීක්‍ෂණ ධාවනය |
| 12. | අවි අංකගත කිරීමේ කළමනාකරණ පද්ධතිය | මධ්‍යම අවි හා පතොරොම් ගබඩාව/ ඒකක | පරීක්‍ෂණ ධාවනය |
| 13. | වත්කම් කළමනාකරණ පද්ධතිය | වත්කම් කළමනාකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලය | පරීක්‍ෂණ ධාවනය |
| 14. | ජනඅවන්හල් සහ සුබසාධක වෙළඳසැල් වල ගිණුම්කරණ කටයුතු සිදුකිරීමේ පද්ධතිය | ඒකක | පරීක්‍ෂණ ධාවනය |
| 15. | නිලධාරී නිවස්න බිල්පත් සැකසීමේ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | පරීක්‍ෂණ ධාවනය |
| 16. | සලාක කළමනාකරණය කිරිමේ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | පරීක්‍ෂණ ධාවනය |
| 17. | නිලධාරී/සෙසුනිල නිවාඩු ලබාදීමේ ක්‍රියා පිළිවෙත | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | පරීක්‍ෂණ ධාවනය |
| 18. | හමුදා හැඳුනුම්පත් කළමනාකරණ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | අදියර III සම්පූර්ණයි |
| 19. | ප්‍රසම්පාදන කළමනාකරණ තොරතුරු පද්ධතිය | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව | අදියර I සම්පූර්ණයි |
| 20. | යුද්ධ හමුදාව සඳහා වූ පිවිසුම් පාලන හා අනන්‍යතා කළමනාකරණ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 21. | නව වැටුප් කළමනාකරණ ක්‍රමවේදය | වැටුප් හා ලේඛන අධ්‍යක්‍ෂ මණ්ඩලය | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 23. | සුබසාධක කළමනාකරණ පද්ධතිය | විධායක ජෙනරාල් ශාඛාව /වැටුප් හා ලේඛන අධ්‍යක්‍ෂ මණ්ඩලය/ රණවිරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය/ පුනරුත්ථාපන අධ්‍යක්‍ෂ මණ්ඩලය/ සුභසාධක අධ්‍යක්‍ෂ මණ්ඩලය/ සියලු රෙජිමේන්තු | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 24. | භාණ්ඩ ලේඛන කළමනාකරණ පද්ධතිය | ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 25. | වැඩසටහන් කළමනාකරණ පද්ධතිය | තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය /මෘදුකාංග ඉංජිනේරු සහ සංවර්ධන අංශය | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 26. | යහසාධක අරමුදලේ නියාමක ව්‍යාපෘතිය | මූල්‍ය කළමනාකරණ ශාඛාව /මුදල් අධ්‍යක්‍ෂ මණ්ඩලය/අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය/සංණකාධිකාරී කර්යාලය | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 27. | වාහන ගමනාගමනය සෙවීම සඳහා වූ පද්ධතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 28. | Smart Sentry | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 29. | ආරක්‍ෂක සමුළුවෙහි ඇතුල්වීම සහ ප්‍රශ්න විචාරාත්මක යන කටයුතු (RFID) සඳහා වූ ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | සම්පූර්ණයි |

වගුව 3:32. වර්ෂයෙහි කාර්යසාධන සමාලෝචනය

ආ. **වෙබ් අඩවි ව්‍යාපෘති.** වෙබ් අඩවි ව්‍යාපෘති වල ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වෙබ් අඩවිය/ස්ථානය | වත්මන් තත්ත්වය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | යුද්ධ හමුදා ශාරිරික පුහුණු පාසල (APTS) | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 2. | ලායා හොටෙල් | සංවර්ධනය කෙරෙමින් පවතී |
| 3. | යුද්ධ හමුදා රෝහල් වෙබ් අඩවිය | සංවර්ධනය කෙරෙමින් පවතී |

වගුව 3:33. වෙබ් අඩවි ව්‍යාපෘති වල ප්‍රගතිය

**<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි වැඩිදියුණු කිරීම සඳහා වූ සයිබර් ආරක්ෂණ පියවර</u>**

140. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි වැඩිදියුණු කිරීම සඳහා වූ සයිබර් ආරක්ෂණ පියවර.

අ. ශ්‍රී ලංකා යුධ හමුදා දත්ත ජාලයට එරෙහිව අනාගත සයිබර් තර්ජන අවම කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරන ලදී:

(1) යුද්ධ හමුදා ඊමේල් පද්ධතිය වෙත යුද්ධ හමුදා දත්ත ජාලයෙන් හැර අන්තර්ජාලය හරහා පිවිසීම අවහිර කිරීම.

(2) සෑම යුද්ධ හමුදා පද්ධතියකටම ආවරණය වන පරිදි වාර්ෂිකව පද්ධති අනාරක්ෂිතතාවය පිළිබඳ පරිලෝකනය කර වාර්තාවක් ලබාදීම.

(3) ඉහත පරිලෝකන වාර්තාවට අනුව අනාරක්ෂිත පද්ධති වෙනස් කර එම අවදානම් තත්ත්වයන් නිර්ණය කිරීම.

ආ. අතිරේක ආරක්ෂක පියවරක් ලෙස පද්ධති සඳහා වෙබ්යෙදුම් ගිනිපවුර (WAF) ක්‍රියාත්මක කිරිම.

ඇ. යුධ හමුදා පද්ධති පහත ලෙස වර්ග කිරිම:

(1) යුධ හමුදා දත්ත ජාලය (Intranet) හරහා පමණක් ප්‍රවේශ වීම.
(2) යුධ හමුදා දත්ත ජාලයට හා අන්තර්ජාලය හරහා ප්‍රවේශ වීම.
(3) අන්තර්ජාලය හා VPN මෘදුකාංගය හරහා ප්‍රවේශ වීම.

ඈ. අන්තර්ජාලය හරහා ප්‍රවේශ වීමට අවශ්‍ය වන පද්ධති සඳහා නව VPN තාක්ෂණය හඳුන්වාදීම.

ඉ. ජාල අවදානම තක්සේරු කිරීම සහ ස්ථාවරව පවත්වා ගැනිමට අනාරක්ෂිතතාවය පිළිබඳව පරිලෝකනය කිරිම.

ඊ. පද්ධතියේ මුරපද ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව පද්ධතියේ රහස් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලදී.

උ. සංවේදී දත්ත ඇතුළත් Infoarmy.lk වැනි පද්ධති යුද්ධ හමුදා දත්ත ජාලයට පමණක් සීමාවූ IPVPN තාක්ෂණයට පමණක් සීමා කිරීම.

ඌ. පද්ධතියන්හි නුසුදුසු පරිශිලකයින් පිළිබඳ ගැඹුරු විශ්ලේශණයක් කර පද්ධතියන් තුළ අනවශ්‍ය පරිශීලකයින් ඉවත් කිරිම.

එ. සියලු පද්ධති වල දත්ත සමුදාය උපස්ථානය කිරීමේ ක්‍රමවේදය සවිමත් කිරිම.

ඒ. හමුදා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකුලව සේවාදායක විගණනය සිදුකිරීම.

ඔ. සමාජ මාධ්‍ය දැනුවත් කිරීම් දේශන/ වැඩමුළු පැවැත්වීම.

**ගැටළු සහ අභියෝග**

141. තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය සම්බන්ධ ගැටළු පහත පරිදි වේ:

අ. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
ආ. ඉතා සීමිත සම්පත් (මිනිස් බලය සහ උපකරණ).
ඇ. තොරතුරු තාක්‍ෂණ ඒකකය වෙත සුදුසුකම් ලත් සෙසුනිලයින් බඳවා ගැනීම.

**සාරාංශය**

142. වර්තමානයේ තොරතුරු තාක්‍ෂණය දැනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අත්‍යවශ්‍ය සාධකයන් වන අතර යුද්ධ හමුදා දත්ත ජාලය ආරක්‍ෂාව සඳහා සයිබර් ආරක්‍ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය පියවර ගෙන ඇත. තවද 2018-2019 වර්ෂයන් තුළ නව මෘදුකාංග ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම, හමුදා මාර්ගෝපදේශ පරිපාලනය වඩා සංඛ්‍යාගතව හා ක්‍රමවත්ව සිදුවිය.

**සන්නද්ධ බළසේනා මූලස්ථානය**

143. යුද්ධ හමුදාවෙහි ක්‍රියාන්විත අවශ්‍යතාව හා සන්නාහ සන්නද්ධ බළකායේ ව්‍යාප්තවීම මත සන්නද්ධ ඒකකයන් ක්‍රියාන්විත අවශ්‍යතා අනුව ප්‍රතිඵලදායි ලෙස අණදීම සහ හැසිරවීම සඳහා සන්නද්ධ බළසේනා මූලස්ථානය 1988 ජුනි 01 වන දින නගාසිටුවා ඇත. සන්නද්ධ බළසේනාව සන්නද්ධ රෙජිමේන්තු 02 කින් හා විමර්ශන රෙජිමේන්තු 02 කින් සමන්විත වන අතර, බළකායේ පුහුණුවීම් සන්නද්ධ බළකා පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි. සන්නද්ධ හා විමර්ශන රෙජිමේන්තු සහ එම සෙබලුන් වර්තමානයට හා අනාගතයට සරිලන අයුරින් ස්ථානගත කිරීම හා පුහුණු කිරීම වෙනුවෙන් මෙම සන්නද්ධ බළසේනාව රොක්හවුස් කඳවුර මෝදරහි ස්ථාපිත කර ඇත.

**සන්නද්ධ බලසේනා මූලස්ථානයේ කාර්යභාරය**

144. මව්බිමෙහි ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාව ආරක්‍ෂා කිරීම සඳහා මෙම බළකායට ආවේණික ඒකකයන් වෙත ලබාදී ඇති සන්නද්ධ රථ නඩත්තු කිරීම්/අලුත්වැඩියා කිරීම් කටයුතු සිදුකරනු ලබන අතර, සන්නද්ධ රථ මගින් සිදුකරනු ලබන රාජකාරීන් සහ විවිධ ස්ථානයන් වෙතින් පවත්වනු ලබන උත්සවයන් සඳහා අවශ්‍ය සන්නද්ධ රථ/සන්නද්ධ රථ ප්‍රදර්ශන කුටි සහ සන්නද්ධ රථ ප්‍රවාහන රථ පහසුකම් ලබාදීම.

**මූල්‍ය විස්තර**

145. 2018 වර්ෂය සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන පහත පරිදි වේ:

| අනු අංකය | ගිණුමේ නම | ලද ප්‍රතිපාදන මුදල (රු.) | 2018/12/31 වන දිනට ඇති ශේෂය (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | අභ්‍යාස දීමනා ගිණුම | 19,500.00 | - |
| 2. | භූමි නඩත්තු | 25,000.00 | - |
| 3. | පවිත්‍රතා | 15,000.00 | - |
| 4. | ලිපි ද්‍රව්‍ය | 150,000.00 | - |
| 5. | ක්‍රීඩා | 55,000.00 | - |
| 6. | බැරැක්ක | 20,000.00 | - |
| 7. | පුවත්පත් | 17,300.00 | - |

වගුව 3:34. මූල්‍ය විස්තරය

**<u>මූලධන/පුනරාවර්ථන වැය ශීර්ෂය</u>**

146. 2018 වර්ෂය තුළ මූලධන/පුනරාවර්ථන වැය ශීර්ෂ යටතේ වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන.

| අනු අංකය | ගිණුමේ නම | ලද ප්‍රපිපාදන මුදල (රු.) |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | සන්නදධ රථ පුණරාවර්ථන හා වැඩි දියුණු කිරීම | 30,000,000.00 |
| 2. | ආයුධ ආම්පන්න මෙවලම් සඳහා | 14,000,000.00 |
| 3. | සන්නද්ධ රථ අමතර කොටස් මිලදී ගැනීම | 11,000,000.00 |
| 4. | සන්නද්ධ රථ සඳහා තින්ත/ක්‍ෂය ද්‍රව්‍ය මිලදී ගැනීම | 1,250,732.00 |

වගුව 3:35. මූලධන/පුනරාවර්ථන වැය ශීර්ෂ යටතේ වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ විස්තරය

**<u>ප්‍රගතිය</u>**

147. යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් මත බලසේනාව විසින් පහත සඳහන් අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා සහාය ලබාදෙන ලදී:

අ. දෙහිඹිවිට ජාතික පාසලේ 2018/02/21 දින සිට 2018/02/25 දින දක්වා කාලසීමාව තුළ පැවති අධ්‍යාපන සහ වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුළත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

ආ. පබ/කළු/ශ්‍රී මාලේවාන ඥාණිස්සර ද්විතියික මහා විද්‍යාලයේ 2018/02/22 දින සිට 2018/02/23 දින දක්වා පැවැති අධ්‍යාපන සහ වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුළත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

ඇ. අ/මිහින්තලේ මහා විද්‍යාලයේ 70 වන සංවත්සරය නිමිත්තෙන් 2018/03/12 දින සිට 2018/03/14 දින දක්වා පැවැති අධ්‍යාපන සහ වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුළත් ප්‍රදර්ශණ කුටියක් ලබාදීම.

ඈ. බණ්ඩාරගම - වල්ගම ශ්‍රී සද්ධාතිස්ස මහා විද්‍යාලයේ 2018/03/28 දින සිට 2018/04/01 දින දක්වා පැවැති අධ්‍යාපන සහ වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුළත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

ඉ. 2018/03/28 දින සිට 2018/04/01 දින දක්වා කාලය තුළදී නිකවැරටියහිදී පවත්වන ලද යොවුන් පුරය ජාතික වැඩ සටහන සඳහා ටී 55 යුධ ටැංකි 01 ක්, බීටීආර් සන්නද්ධ රථ 01 ක් සහ බීඑම්පී සන්නද්ධ රථ 01 ක් ලබාදීම.

ඊ. 2018/04/06 දින සිට 07 දින දක්වා කාලය තුළදි වරකාපොලදි පවත්වන ලද සිංහ මේලා අධ්‍යාපනික වෙළද ප්‍රදර්ශනය සඳහා ටී 55 යුධ ටැංකි 01 ක්, බීටීආර් සන්නද්ධ රථ 01 ක් සහ බීඑම්පී සන්නද්ධ රථ 01 ක් ලබාදීම.

උ. සීදූව නිර්දෝෂ දේවමාතා දේවස්ථානයේ ශ්‍රී ජුසේවාස් සමිතිය වෙතින් 2018/04/06 දින සිට 2018/04/08 දින දක්වා පැවැති වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුළත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

ඌ. ගාල්ල ශාන්ත ඇලෝෂියස් විද්‍යාලයේ 2018/06/20 දින සිට 2018/06/24 දින දක්වා පැවැති අධ්‍යාපන සහ වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුලත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

එ. ගාල්ල මල්හරුස් ජාතික පාසලේ 2018/09/12 දින සිට 2018/09/16 දින දක්වා පැවැති අධ්‍යාපන සහ වෙළද ප්‍රදර්ශනය සඳහා සන්නද්ධ රථ විස්තර ඇතුලත් ප්‍රදර්ශණ කුටියක් ලබාදීම.

ඒ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වෙතින් පවත්වනු ලබන TECHNO – 2018 වෙළද ප්‍රදර්ශනය සඳහා 2018/10/12 දින සිට 2018/10/14 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති වෙළද ප්‍රදර්ශනය සඳහා බීටීආර් සන්නද්ධ රථ 01 ක් සහ බීඑම්පී සන්නද්ධ රථ 01 ක් සහ සන්නද්ධ රථ විස්තර ඇතුලත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

ඔ. මාවතගම සාමෝදය ක්‍රීඩාංගනයේ පැවැති ගාඩියන්ස් සංගීත ප්‍රසංගය සහ වෙළඳ ප්‍රදර්ශනය 2018/10/12 දින සිට 2018/10/13 දින දක්වා පැවැති වෙළඳ ප්‍රදර්ශනය සඳහා ටී 55 යුධ ටැංකි 01 ක්, බීටිආර් සන්නද්ධ රථ 01 ක් සහ බීඑම්පී සන්නද්ධ රථ 01 ක් ලබාදීම.

ඕ. මිණිපුර ගැමුණු නද - 2018 වෙළඳ ප්‍රදර්ශනය සඳහා 2018/10/28 දින සිට 2018/10/29 දින දක්වා ටී 55 යුධ ටැංකි 01 ක් ලබාදීම.

ක. ශ්‍රී ලංකා සංඥා බළකා 75 වන සංවත්සරයට සමගාමීව බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2018/11/26 දින සිට 2018/11/28 දින දක්වා පැවැති වෙළඳ ප්‍රදර්ශනය සඳහා බීටීආර් සන්නද්ධ රථ 01 ක්, බීඑම්පී සන්නද්ධ රථ 01 ක් සහ සන්නද්ධ රථ විස්තර ඇතුළත් ප්‍රදර්ශන කුටියක් ලබාදීම.

ග. පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2018/12/28 දින සිට 2018/12/29 දින දක්වා පැවැති වෙළඳ ප්‍රදර්ශනය සඳහා බීටීආර් සන්නද්ධ රථ 02 ක් ලබාදීම.

**<u>ගැටළු සහ අභියෝගයන්</u>**

148. 2018 වර්ෂය තුළ සන්නද්ධ බළසේනාව මුහුණදෙන ලද ගැටළු සහ අභියෝගයන් පහත සඳහන් පරිදි වේ:

අ. සන්නද්ධ රථ/යුධ ටැංකි ජීව වෙඩිතැබීම් සිදුකිරීම සඳහා වෙඩිපිටියක් නොමැතිකම හේතුවෙන් වෙඩිතැබීම් සිදුකිරීමට නොහැකි වූ අතර, එය ක්‍රියාන්විත රාජකාරී සඳහා ඉදිරියේදී බලපානු ඇත.

ආ. යුධ ටැංකි/සන්නද්ධ රථ සඳහා අමතර කොටස් ලබාගැනිම සඳහා මෙම වර්ෂය තුළදි අවශ්‍ය පරිදි ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් යුධ ටැංකි/සන්නද්ධ රථ නඩත්තු කිරීම අඩාලවී ඇති අතර, එය සංග්‍රාමික කාර්‍යක්‍ෂමතාවයට බලපානු ඇත.

**<u>ඉදිරි අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යන්</u>**

149. සන්නද්ධ බළසේනාව ඉදිරි අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පහත සඳහන් පරිදි වේ:

අ. සන්නද්ධ රථ මඟින් වෙඩිතැබීම් සඳහා ක්‍ෂේත්‍ර වෙඩි පිටියක් ලබාගැනීම.

ආ. සන්නද්ධ රථවල ජීව වෙඩිතැබීම් වලට ප්‍රථම පෙර පුහුණුවීම් සඳහා සන්නද්ධ රථ 01 ක් සමාකෘති (Simulator) ඉල්ලුම්කර ඇති අතර, ආරක්‍ෂක අමාත්‍යංශය යටතේ පාලනය වන පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත බීටීආර් රථයක් යොමුකර දේශීය වශයෙන් සමාකෘතියක් ලබාගැනීමට අදහස් කරනු ලැබේ.

ඇ. එක්සත් ජාතින්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ආසන්න වශයෙන් සන්නද්ධ රථ 12 කින් සමන්විත නිලධාරී 04 ක් සහ සෙසුනිල 26 ක හඅපිරිස් ප්‍රමාණයක් ස්ථානගත කර ඇති අතර බලසේනා මූලස්ථානයේ අරමුණ වනුයේ දැනට පවත්නා සන්නද්ධ රථ නවීකරණය කර ඉදිරියේදී එක්සත් ජාතින්ගේ සාමසාධක රාජකාරීන් සඳහා සන්නද්ධ රථ වැඩි ප්‍රමාණයක් සූදානම් කර තැබීම වේ.

**<u>සාරාංශය</u>**

150. වර්තමානයෙහි පවතින සාමකාමී තත්ත්වය මත ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා ඒකකයන් හි රාජකාරී කරනු ලබන නිලධාරී/සෙසුනිලයින්ගේ මානසිකත්වය, චිත්ත ධෛර්ය හා හමුදා දැනුම වර්ධනය කර ගැනිම මූලික කරගෙන පුහුණුවීම් සහ සුභසාධක කටයුතු සඳහා වැඩි දායකත්වයක් ලබාදෙනු ලබන අතර, බළසේනාවේ යුධ ටැංකි සහ සන්නද්ධ රථ නිසියාකාරව නඩත්තු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඇති අතර, ඉදිරියේදී සාමසාධක රාජකාරී සඳහා රපෝර්තු කරවීමට නියමිත හඅපිරිස් හා සන්නද්ධ රථ වැඩි ප්‍රමාණයක් රපෝර්තු කිරීම සඳහා සූදානම් කර ඇත.

## කාලතුවක්කු බලසේනා මූලස්ථාන

151. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති තුමාගේ අනුමැතිය මත යුධ හමුදා චර්යා නියෝග යටතේ 1988 නොවැම්බර් මස 24 දින කාලතුවක්කු බලසේනා මූලස්ථානය නගා සිටුවා ඇත. කාලතුවක්කු රෙජිමේන්තු සතු කාලතුවක්කු, නිලධාරින් සහ සෙසු නිලධාරින්ගේ අණදීම, පාලනය හා විනය කාලතුවක්කු බලසේනාධිපති විසින් සිදුකරනු ලබන අතර, යුධ හමුදාපති වෙත කාලතුවක්කු වෙඩි බලය සැපයීම පිළිබඳ උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලබයි.

### මූල්‍ය තොරතුරු

152. යුධ හමුදාව වෙතින් ලද මූල්‍යමය ප්‍රතිපාදනයන් පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශිර්ෂය | ලැබූ මුදල් (රු.) | වැය කිරීම් (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | අභ්‍යාස දීමනා | 12,000.00 | 12,000.00 |
| 2. | වාර සඟරා | 7,440.00 | 7,440.00 |
| 3. | ක්‍රීඩා භාණ්ඩ සඳහා | 55,000.00 | 55,000.00 |
| 4. | පවිත්‍රතා භාණ්ඩ සඳහා | 15,000.00 | 15,000.00 |
| 5. | බැරක්ක භාණ්ඩ සඳහා | 20,000.00 | 20,000.00 |
| 6. | භූමි නඩත්තු සඳහා | 25,000.00 | 25,000.00 |

වගුව 3:36. මූල්‍ය විස්තරය

153. කාලතුවක්කු බලසේනා මූලස්ථානය නවතමයෙන් ස්ථාපන කිරීම සඳහා රු.2,000,265.00 ක මුදලක් 2018 වර්ෂයේ ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් අනුමත වී ඇත.

### කාර්ය සාධන සාරාංශය

154. **කාලතුවක්කු පුහුණුවීම්.** 2018 පුහුණු සැලැස්මට අනුව මෙම බලසේනා මූලස්ථාන අධීක්ෂණය යටතේ ඇති කාලතුවක්කු හමුදා පුහුණු පාසල (මින්නේරිය) වෙතින් කාලතුවක්කු රෙජිමේන්තුවට ආවේණික පාඨමාලාවන් හා සියලු ඒකක සඳහා පාඨමාලාවන් 21 ක් පවත්වා සාර්ථකව නිම කරන ලද අතර, එම පාඨමාලාවන් සඳහා පහත සඳහන් පරිදි නිලධාරින් සහ සෙසුනිලයින් සහභාගිවී ඇත:

| අනු අංකය | පාඨමාලා විස්තරය | සහභාගි වූ සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | නිලධාරී | සෙසුනිළ |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | කාලතුවක්කු රෙජිමේන්තුවට අවේණික පාඨමාලාවන් සඳහා | 57 | 926 |
| 2. | වෙනත් ඒකක (කාලතුවක්ක රෙජිමේන්තුව හැර අනෙකුත් ඒකක) සඳහා | 56 | 1,179 |
| | **එකතුව** | **113** | **2,105** |

වගුව 3:37. කාලතුවක්කු පුහුණුවීම් පිළිබඳ විස්තරය




155. **කුඩා පිරික්සුම් සංදර්ශන පැවැත්වීම.** 2018 වර්ෂයේ දිවයිනේ නොයෙකුත් ප්‍රදේශයන්හිදී පැවැත් වූ කාලතුවක්කු ප්‍රදර්ශන සහ සැණකෙළි වෙනුවෙන් මෙම බළසේනා මුලස්ථානය වෙතින් මිමී 76 කාලතුවක්කු නැවත ගලවා සවි කිරීමේ සංදර්ශන ඉදිරිපත් කරන ලදි.




156. **කාලතුවක්කු ආචාර වෙඩි මුර පැවැත්වීම.** රාජ්‍ය උත්සව/විදේශ රාජ්‍ය නායකයින්/ප්‍රභූවරුන් වෙනුවෙන් සහ අවමංගල්‍ය උත්සව සඳහා මෙම බළසේනා මුලස්ථාන අධීක්ෂණය යටතේ 6 වන ශ්‍රී ලංකා කාල තුවක්කු හමුදාව වෙතින් 25 පවුන්ඩර් කාලතුවක්කු ආචාර වෙඩි මුර පවත්වන ලදි.




157. **සිවිල් සමාජය සඳහා දායකත්වය සැපයිම.** වර්ෂය තුළ ඇති වූ හදිසි තත්වයන් සඳහා මෙම බළසේනා මුලස්ථානය වෙතින් හයිපිරිස් හා අයන්හෝස් රථ යොමු කරවන ලද අතර කාලතුවක්කු බළසේනා මුලස්ථානය වෙතින් සිවිල් සමාජයේ යහපත, අභිවෘද්ධිය උදෙසා මින්නේරිය හි පිහිටි දේවාලය, ආයුර්වේද රෝහල වැනි ස්ථාන පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.




**වසරේ ජයග්‍රහණ**

158. යුද්ධ හමුදා මුලස්ථානය වෙතින් පවරන ලද සියලුම වගකීම් හා කාර්යයන් ඉතාමත් කාර්‍යක්ෂමව ඉටු කරලීමටත්, රටෙහි ස්වභාවික ව්‍යසන ඇති වූ අවස්ථාවලදී රාජ්‍ය ආයතන වෙත උපරිම සහයෝගය ලබාදීමටත් කාලතුවක්කු බළසේනා මුලස්ථානය හට පසුගිය වසරේදී හැකියාව ලැබිණි.

**ගැටලු සහ අභියෝග**

159. පහත සඳහන් කරුණු වර්ෂය තුළදී මුහුණදීමට සිදු වූ ගැටලු හා අභියෝග ලෙස සටහන් කළ හැකිය:

අ. කාලතුවක්කු යනු යුද්ධ හමුදාව සතු වටිනා සම්පතක් වන අතර අනාගත ප්‍රයෝජනය සඳහා සුදුසු පරිදි නිවැරදි නඩත්තුව සහ අලුත්වැඩියාවන් නිසි පරිදි සිදුකිරීමට අවශ්‍ය අමතර කොටස් සහ ප්‍රතිපාදන නිසි වේලාවට ලබාගැනීම.

ආ. කාලතුවක්කු ආචාර වෙඩිමුර පැවැත්වීම සහ ප්‍රදර්ශන කටයුතු සඳහා කාලතුවක්කු සහභාගී කරවීම යුද්ධ හමුදා මූලස්ථානය පූර්ණ අවසරය මත පමණක් සිදුකරනු ලබන අතර, ඉතා කෙටි දැනුම්දීමකින් කාලතුවක්කු ප්‍රවාහනය කිරීමට සිදුවන අවස්ථාවලදී අවසර ලබාගැනීමේදී මෙම මූලස්ථානය හට අපහසුතාවය ලක්වීමට සිදු වේ.

**සාරාංශය**

160. යුද්ධ හමුදා සතු කාලතුවක්කු සහ තුවක්කු සෙබලුන්ගේ සියලුම අණදීම සහ පාලනය සඳහාත්, යුද්ධ හමුදා ක්‍රියාන්විත සඳහා උචිත පරිදි යෙදවීමටත්, කාලතුවක්කු බලසේනා මූලස්ථානය ස්ථාපනය කර ඇති අතර, මේ දක්වා කාලතුවක්කු බලසේනා මූලස්ථානය වෙත උසස් මූලස්ථානයන් වෙතින් පවරා ඇති සියලුම වගකීම් සහ කාර්යයන් ඉතාමත් සාර්ථකව ඉටු කරලීමට හැකි වී ඇති අතර, ඉදිරියේදීත් කාලතුවක්කු බලසේනා මූලස්ථානය වෙත පැවරෙන සියලුම වගකීම් සහ කාර්යභාරයන් සහ පැමිණෙන සියලුම අභියෝග යන් වලට සාර්ථකව මුහුණදීමට සඳහා සූදානම් ව සිටියි.

## ඉංජිනේරු සේවා බලසේනා මූලස්ථානය

162. ශ්‍රී ලංකාව තුළ සිදුකරන ක්ෂේත්‍ර, යාන්ත්‍රික හා මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කරනු ලබන එකම ආයතනය ඉංජිනේරු බලසේනාව වේ. මෑතකදී ආරම්භ කරන ලද යාන්ත්‍රික ඉංජිනේරු බලසේනාව වෙත රාජකාරීන් පැවරීමත් සමගම ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) හා (මධ්‍යම) ඉංජිනේරු රාජකාරීන් එම මූලය වෙත පවරා ඇති අතර, මෙම මූලය යටතේ නිත්‍ය ඒකක 6ක් හා ස්වේච්ඡා ඒකකයක් පාලනය වේ. තවද, බලසේනාව යටතේ වන භඨපිරිස් ප්‍රමාණය නිලධාරී 197 ක් හා සෙසුනිලයින් 4676 ක් දක්වා අඩුවිය. ඉංජිනේරු බලසේනාව දිවයිනේ ඕනෑම ස්ථානයක පැවරෙන ක්ෂේත්‍ර හා යාන්ත්‍රික ඉංජිනේරු රාජකාරීන් විශ්වසනීයව හා සාර්ථකව සිදුකිරීමට බළකායෙහි මානව හා භෞතික සම්පත් මෙහෙයවීම සිදුකරන අතර එවැනි රාජකාරීන් සාර්ථකව ඉටුකිරීමට අවශ්‍ය නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වන අඛණ්ඩ පුහුණුව සිදුකරනු ලැබේ. එපමණක් නොව, ජාතික මට්ටමේ අවශ්‍යතාවයක් වන මානුෂවාදී බිම්වෙඩි ඉවත්කිරීමේ කාර්යයෙහි ද අඛණ්ඩව නිරත වේ.

**මූල්‍ය ප්‍රගතිය**

162. **මුදල් වෙන්කිරීම් විස්තරය පහත සඳහන් පරිදි වේ:**

| අනු අංකය | වැය ශිර්ෂය | ලැබූ මුදල් (රු.) | වැය කිරීම් (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | සනීපාරක්ෂක සහ පවිත්‍රතා (222-01-2-1205(XXIV)) | 15,000.00 | 15,000.00 |
| 2. | භූමි නඩත්තු (222-01-2-1303(II)) | 25,000.00 | 25,000.00 |
| 3. | පුවත්පත් (222-01-2-1205 (XVIII) | 21,000.00 | 21,000.00 |
| 4. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියා (1222-01-2-1302(III)) | 20,000.00 | 20,000.00 |
| 5. | අභ්‍යාස දීමනා (222-01-1-1409(XV)) | 27,000.00 | 19,660.00 |
| 6. | ලිපිද්‍රව්‍ය (222-01-2-1201) | 150,000.00 | 21,348.98 |
| 7. | දුම්රිය ගමන් බලපත්‍ර (222-01-1-1101(I)) | 65,000.00 | 38,260.00 |
| 8. | බස් ගමන් බලපත්‍ර (222-01-1-1101(II)) | 38,000.00 | 32,641.00 |

වගුව 3:38. මුදල් වෙන්කිරීම් විස්තරය

**වාර්ෂික කාර්ය සාධනය**

163. සංවර්ධන ව්‍යාපෘති විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම (රු.) | වෙනත් |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | කිලිනොච්චිය | යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයට අයත් පරිශ්‍රයේ පරණ ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීම | 744,966.05 | නිමකර ඇත |
| 2. | කොළඹ | ආනන්ද විද්‍යාලයේ රගර් පිටිය ඉදිකිරීම | 461,070.70 | නිමකර ඇත |
| 3. | අම්පාර | වැරැන්කැටගොඩ විද්‍යාලයේ ක්‍රීඩාපිටිය ඉදි කිරීම | 2,500,000.70 | නිමකර ඇත |
| 4. | කුරුණෑගල | ආරක්ෂක සේවා විද්‍යාල භූමියේ යන්ත්‍රෝපකරණ ඉංජිනේරු රාජකාරි | 1,564,609.52 | ක්‍රියාත්මකයි |
| 5. | මත්තල | මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ වටා ඇති පඳුරු එළිපෙහෙළි කිරීම | 6,361,009.41 | ක්‍රියාත්මකයි |
| 6. | මීතොටමුල්ල | කසල දමා ඇති ප්‍රදේශය සංවර්ධනය කිරීම | 11,965,852.00 | ක්‍රියාත්මකයි |
| 7. | කැලණිය | එගොඩ කැළණිය විහාර පරිශ්‍රයේ පොකුණ ඉදිකිරීම | 1,675,432.65 | ක්‍රියාත්මකයි |
| 8. | පුත්තලම | තබ්බෝව ප්‍රදේශයේ කලපු අන්දර ඉවත් කිරීම | 5,392,114.82 | ක්‍රියාත්මකයි |
| 9. | මඩු | මඩු පූජා භූමියේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය | 6,012,577.75 | ක්‍රියාත්මකයි |
| 10. | කිලිනොච්චිය | යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයට අයත් භූමි ප්‍රදේශයේ යන්ත්‍ර රාජකාරී | 4,056,348.00 | නිමකර ඇත |
| 11. | යාපනය | කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය (වඩමාරච්චි ප්‍රදේශීය සභාව) | 4,056,348.00 | තාවකාලිකව අත්හිටුවන විට 12.51% සම්පූර්ණ කර ඇත |
| | **සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදල (රු)** | | **41,151,814.29** | |

වගුව 3:39. මුදල් අය කිරීමේ පදනම මත ක්‍රියාත්මක කල ව්‍යාපෘති පිළිබඳ විස්තරය

164. **සිරසර පිවිසුම ව්‍යාපෘති**. 2018 වසර මැද සිට මෙම ව්‍යාපෘතිය යටතේ වන රාජකාරීන්හි වගකීම සිරිසර පිවිසුම ව්‍යාපෘති කාර්යාලය වෙත පවරා ඇත.

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | ඇස්තමේන්තුගත වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ගෝමරන්කඩවල | බක්මීගම වැව ප්‍රතිසංස්කරණය කිරීම | 21,566,634.43 |
| 2. | ගෝමරන්කඩවල | බක්මීගම කුඩා තිඹිරිවැව ප්‍රතිසංස්කරණය කිරීම | 2,616,758.29 |
| 3. | ගෝමරන්කඩවල | ඉහළ කාලි වැව ප්‍රතිසංස්කරණය කිරීම | 3,217,039.26 |
| 4. | කන්තලේ | දුටුවැව ප්‍රතිසංස්කරණය කිරීම | 22,566,162.01 |
| | **ඇස්තමේන්තුගත මුළු මුදල** | | **49,966,593.99** |

වගුව 3:40. සිරිසර පිවිසුම අරමුදල් පිළිබඳ විස්තරය

165. **පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය**. 2018 වසර මැද සිට මෙම ව්‍යාපෘතිය යටතේ වන රාජකාරීන්හි වගකීම පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘති කාර්යාලය වෙත පවරා ඇත.

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | ඇස්තමේන්තුගත වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ඇලිකිඹුලාව | ඇලිකිඹුලාව ක්‍රීඩාපිටිය සකස් කිරීම | 986,528.35 |
| 2. | කදුරුවෙල | අල් - අමීනා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සකස් කිරීම | 506,708.78 |
| 3. | අරුණවැව | අරුණවැව ප්‍රතිසංස්කරණය කිරීම | 2,609,763.73 |
| 4. | කිරිමැටිපිටිය | කිරිමැටියවැව ප්‍රතිසංස්කරණය කිරීම | 2,338,565.78 |
| 5. | චන්දන පොකුණ | චන්දන පොකුණ ප්‍රතිසංස්කරණය කිරීම | 2,665,521.97 |
| | **ඇස්තමේන්තුගත මුළු මුදල** | | **9,107,088.61** |

වගුව 3:41. පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය අරමුදල් පිළිබඳ විස්තරය

166. **සංවර්ධන ව්‍යාපෘති සඳහා මිනිස් හා යාන්ත්‍රික ශ්‍රමය ලබාදීම**. පහත දක්වා ඇති ව්‍යාපෘතිය සඳහා මෙම බළසේනා මුලස්ථානය සතු මිනිස් ශ්‍රමය හා යාන්ත්‍රික සම්පත් යොදවන ලදි.

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | යන්ත්‍ර කාර්ය සඳහා ඇස්තමේන්තුගත වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ත්‍රිකුණාමලය | සිරිසර පිවිසුම ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රිකයේ වාරි පද්ධතිය ප්‍රතිසංස්කරණය | යන්ත්‍ර සහය |
| 2. | පොළොන්නරුව | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ පොළොන්නරු දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබාදීම | යන්ත්‍ර සහය |
| 3. | මහනුවර | මහනුවර ශික්ෂණ රෝහල යටතේ ඉදිකරනු ලබන පිළිකා ප්‍රතිකාර ඒකක ඉදිකිරීම් භූමියෙහි යන්ත්‍ර රාජකාරි | යන්ත්‍ර සහය |
| 4. | බුත්තල | වසවිස නැති රටක් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහය ලබාදීම | යන්ත්‍ර සහය |
| 5. | කොළඹ | කැළණි රජමහා විහාරයේ ඉදිකිරීම් කටයුතු | යන්ත්‍ර සහය |
| 6. | අකුරේගොඩ | ආරක්ෂක සේවා මුලස්ථාන ඉදිකිරීම් සඳහා යාන්ත්‍රික හා විශේෂඥ සහය ලබාදීම | ශ්‍රම දායකත්වය හා යන්ත්‍ර සහය |
| 7. | වැලිවේරිය | විවිධ ආබාධ සහිත දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | ශ්‍රම දායකත්වය |
| 8. | කුරුණෑගල | වයඹ පළාත් සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සිදුකිරීම | ශ්‍රම දායකත්වය |
| 9. | කොළඹ | සිරිමාවෝ බණ්ඩාරණායක බාලිකා විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම | ශ්‍රම දායකත්වය |
| 10. | ඇඹිලිපිටිය | බෝධිරාජාරාම විහාරස්ථානයේ සිව් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | ශ්‍රම දායකත්වය |
| 11. | තෙල්දෙණිය | රංගල භාවනා මධ්‍යස්ථානයේ කලුගල් මුවා බුද්ධ ප්‍රතිමා ස්ථාන ගත කිරීම | යන්ත්‍ර සහය |
| 12. | කඳාන | කඳාන මැසනෝද් විද්‍යාල ක්‍රීඩාපිටිය නවීකරණය කිරීම | යන්ත්‍ර සහය |
| 13. | පානදුර | පානදුර ගොරකාන විහාරයේ යන්ත්‍ර රාජකාරි | යන්ත්‍ර සහය |
| 14. | ඉබ්බාගමුව | තැඹිලි කුඹුර ගල් විහාර භූමියේ ඉදිකල වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය සඳහා බිම් සැකසීම | යන්ත්‍ර සහය |
| 15 | දැරණියගල | නක්කාවිට ප්‍රාථමික විදුහලේ ක්‍රීඩාපිටිය ඉදිකිරීම | යන්ත්‍ර සහය |

වගුව 3:42. සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ඉංජිනේරු දායකත්වය ලබාදීම පිළිබඳ විස්තරය

167. සිරිසර පිවිසුම හා පිබිදෙමු පොළොන්නරුව වාරි ව්‍යාපෘතින්.




168. මීතොටමුල්ල කසල ආයතනයේ යාන්ත්‍රික මෙහෙයුම්.




169. ඇඹිලිපිටිය බෝධිරාජාරාම විහාරයේ ඉදිකිරීම්.




170. අම්පාර වැරැන්කැටගොඩ විද්‍යාල ක්‍රීඩාංගනය නවීකරණය.





171. තබ්බෝව කළපුඅන්දර ඉවත්කිරීම.

 

**<u>මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ප්‍රගතිය</u>**

172. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකකය මගින් පහත දක්වා ඇති සාර්ථකත්වය 2018 වසර තුළදී ලබා ගන්නා ලදී:

| අනු අංකය | භූමිය පරීක්ෂාකර නිසැක කිරීම මගින් (වැමී) | භයපිරිස් මඟින් (වැමී) | යන්ත්‍ර මඟින් (වැමී) | සුනඛයින් මඟින් (වැමී) | එකතුව (වැමී) | පුද්ගල නාශක බිම්වෙඩි | පුපුරා නොගිය යුධ උපකරණ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| 1. | 1,095,654 | 216,913 | 6,553 | 75,327 | 1,394,447 | 6,104 | 461 |

වගුව 3:43. භූමි නිසැක කිරීම් විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

173. 2018.01.01 දින සිට 2018.12.31 වන දින කාලය තුළ ඉංජිනේරු බළකා මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකක වෙතින් පහත සඳහන් වැඩබිම් නිසැක කිරීම කටයුතු අවසන් කර ඇත.:

| අනු අංකය | වැඩබිම් අංකය | ග්‍රාම නිළධාරි වසම | දිස්ත්‍රික්කය | ආරම්භක දිනය | අවසන් දිනය | නිසැක කර ඇති ප්‍රමාණය (ව:මී) |
|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |
| 1. | MF-KI-759 | කේඑන් 95 - කිළාලි | කිලිනොච්චි | 30/09/2017 | 16/01/2018 | 21,635 |
| 2. | MF-KI-759 | කේඑන් 95 - කිළාලි | කිලිනොච්චි | 17/01/2018 | 09/05/2018 | 41,312 |
| 3. | MF-KI-759 | කේඑන් 95 - කිළාලි | කිලිනොච්චි | 10/05/2018 | 24/06/2018 | 27,437 |
| 4. | N-DA-VA-1243 | පහළ පුලියන්කුලම | පුත්තලම් | 11/11/2017 | 30/06/2018 | 18,233 |
| 5. | N-DA-TR-194 | උණුවතුර බුබුල | අම්පාර | 06/11/2017 | 10/04/2018 | 13,530 |
| 6. | N-DA-TR-198 | සිංහපුර | පොලොන්නරුව | 23/04/2018 | 31/05/2018 | 5,825 |
| 7. | N-DA-VA-1145 | නෙළුම්විල | කිලිනොච්චි | 01/08/2016 | 05/04/2018 | 71,062 |
| 8. | N-DA-KI-1069 | පොන්නගර් | කිලිනොච්චි | 27/02/2018 | 27/02/2018 | 10,446 |
| 9. | N-DA-KI-1070 | පොන්නගර් | කිලිනොච්චි | 12/03/2018 | 17/03/2018 | 186,354 |
| 10. | N-DA-KI-1071 | පොන්නගර් | කිලිනොච්චි | 12/06/2018 | 19/12/2018 | 169,766 |
| 11. | N-DA-KI-1095 | පොන්නගර් | මුලතිව් | 12/06/2018 | 19/12/2018 | 2,601 |
| 12. | N-DA-VA-1253 | වන්නිවිලාන්කුලම් | මුලතිව් | 02/01/2018 | 07/04/2018 | 72,223 |
| 13. | N-DA-VA-1253 | වන්නිවිලාන්කුලම් | යාපනය | 09/04/2018 | 06/06/2018 | 71,771 |
| 14. | N-DA-JA-325 | මයිලඩි උතුර | යාපනය | 20/02/2017 | 30/03/2018 | 45,558 |
| 15. | N-DA-JA-329 | මයිලඩි උතුර | මුලතිව් | 02/05/2018 | 09/05/2018 | 381,302 |
| 16. | DA-VA-587 | කුමලමුනෙයි නැගෙනහිර | ත්‍රිකුණාමලය | 28/05/2014 | 16/06/2018 | 96,902 |
| 17. | N-DA-TR-1007 | ගලම්ටියාව උතුර - 228 එල් | මුලතිව් | 07/04/2017 | 15/07/2018 | 29,903 |
| 18. | N-DA-VA-1195 | කොක්කුතුඩුවායි උතුර | මුලතිව් | 08/08/2017 | 19/03/2018 | 13,991 |
| 19. | N-DA-VA-1195 | කොක්කුතුඩුවායි උතුර | මුලතිව් | 30/03/2017 | 14/06/2018 | 40,858 |
| | **එකතුව** | | | | | **1,320,709** |

වගුව 3:44. අවසන් කරන ලද මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකක වැඩබිම් විස්තරය

174. දැනට රාජකාරියේ යෙදවිය හැකි බිම්වෙඩි හඳුනාගන්නා සුනඛයින් 12 ක් සහ වෙඩිද්‍රව්‍ය හඳුනාගන්නා සුනඛයින් 12 ද සමඟ සුනඛයින් 24 දෙනෙකු රාජකාරීන්හි යොදවා ඇත.

| අනු අංකය | 2018 ජනවාරි 1 දිනට සංඛ්‍යාව | | අලුත් සුනඛයින් | | අන්තර් හුවමාරු කිරීම් (අඩු කිරීමකි) | | විශ්‍රාම ගැන්වීම් | | මියයෑම් | | දැනට සිටින ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | MDD | EDD | MDD | EDD | MDD | EDD | MDD | EDD | MDD | EDD | MDD | EDD |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) | (එ) | (ඒ) | (ඔ) | (ඕ) | (ක) |
| 1. | 12 | 14 | 2 | 1 | 1 | 2 | 1 | 0 | 0 | 1 | 12 | 12 |

වගුව 3:45. මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීම හා වෙඩිද්‍රව්‍ය හඳුනාගන්නා සුනඛ විස්තරය

**<u>බළසේනාව අධීක්ෂණය යටතේ පවත්වන ලද පාඨමාලා</u>**

175. සලකා බලන ලද කාලසීමාව තුළ පහත සඳහන් පාඨමාලාවන් පවත්වන ලදි.:

| අනු අංකය | පාඨමාලාව | | සිට | දක්වා | සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | නිලධාරී | සෙසුනිල |
| (අ) | (ආ) | | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | මූලික මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත්කිරීමේ පාඨමාලාව | | 21.03.2018 | 10.05.2018 | 07 | 43 |
| 2. | පුපුරා නොගිය යුධෝපකරණ විනාශ කිරීමේ පාඨමාලාව අදියර III | | 06.02.2018 | 02.03.2018 | 07 | 01 |
| 3. | ඉංජිනේරු නිලධාරි තරුණ නිලධාරි පාඨමාලාව - අංක 09 පාඨමාලාවේ භූමි කණිත යන්ත්‍ර විෂයට අදාළ න්‍යායාත්මක සහ ප්‍රායෝගික අභ්‍යාසයන් සිදුකිරීම | | 22.04.2018 | 10.06.2018 | 08 | - |
| 4. | රසායනික, ජීව විද්‍යාත්මක, න්‍යෂ්ටික, විකිරණශීලී ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම හා පුපුරණද්‍රව්‍ය/යුධෝපකරණ නිෂ්ක්‍රීය/සෙවීම සහ මුදවා ගැනීම පිළිබඳ හඳුන්වාදීමේ පාඨමාලාව | ශ්‍රීලයුඉපා | 15.02.2018 | 28.02.2018 | 04 | 34 |
| 5. | | ශ්‍රීලයුඉපා | 24.05.2018 | 08.06.2018 | 10 | 22 |
| 6. | | 14 රනජීවිප්‍ර -මත්තේගොඩ | 09.07.2018 | 20.07.2018 | 00 | 19 |
| 7. | | ඉබසේමු | 08.10.2018 | 20.10.2018 | 04 | 26 |
| 8. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු පාසලෙහි වෘත්තීය පුහුණු අංශය මගින් පවත්වනු ලබන පාඨමාලා | විදුලි කාර්මික | 01.01.2018 | 30.06.2018 | 00 | 13 |
| 9. | | වඩු කාර්මික | 01.01.2018 | 30.06.2018 | 00 | 13 |
| 10. | | ඉදිකිරීම් ශිල්පය | 01.01.2018 | 30.06.2018 | 00 | 11 |
| | **එකතුව** | | | | **40** | **182** |

වගුව 3:46. පුහුණු පාඨමාලා විස්තරය

**<u>අනාගත අපේක්ෂා හා සංවර්ධන කටයුතු</u>**

176. **<u>ඇතිවිය හැකි තර්ජන.</u>** ශ්‍රී ලංකාව තුළ ඇතිවිය හැකි න්‍යෂ්ටික, ජීවවිද්‍යාත්මක, විකිරණ හෝ රසායනික ආපදා වර්තමාන තර්ජන ලෙස සලකන අතර ඇතිවිය හැකි ඕනෑම ස්වභාවික හෝ ස්වභාවික නොවන ආපදා සඳහා මුහුණදීමට අවැසි හැකියාවක් බළසේනාව සතුව පවතියි. එසේ වුවද තත් ප්‍රතිචාර දැක්වීම් සඳහා වර්තමානයේ ලොව අනෙකුත් රටවල් භාවිතා කරන නවීන තාක්ෂණය හා විශේෂී වූ දැනුම ලබාගැනීම තුළින් මෙම තර්ජන සඳහා ඉතා සාර්ථකව මුහුණදීමේ හැකියාව ලබාගත හැක. තවද, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මානුෂවාදී බිම්වෙඩි ඉවත්කිරීමේ කටයුතු සඳහා වන විදෙස් ආධාරයන්හි අඩුවීමක් ඉදිරියේදී සිදුවිය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාන්විතය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අඩුවීම මගින් එම ක්‍රියාන්විතයේ ප්‍රගතියට බලපෑමක් විය හැක. එමෙන්ම දැනට භාවිතා කරන ඉංජිනේරු යන්ත්‍ර බොහෝමයක් වසර දහයකට වැඩි කලක් සේවයෙහි යොදවා ඇති අතර ඒවායේ කාර්යක්ෂමතාව ඉතා පහළ අගයක පවතියි. එබැවින් ඉදිරියේදී නව යන්ත්‍ර බළසේනාව වෙත නොලැබුනහොත් යන්ත්‍ර මගින් සිදුකරන කාර්යන්හි කාර්යක්ෂමතාවය ගැටලුකාරී විය හැක.

177. **<u>තාක්ෂණික සංවර්ධනය.</u>** ඉහත සඳහන් තර්ජන වලට සාර්ථකව මුහුණදීම සඳහා අවැසි උපක්‍රම පිළිබඳ අවධානය යොමුකරමින් තාක්ෂණික සංවර්ධනයද සිදුකරනු ලබයි. භූලක්ෂණ විශ්ලේෂණ කණ්ඩායම (GIS Section) සංවර්ධනය කර නිවැරදි භූ විද්‍යාත්මක තොරතුරු භාවිතා කරමින් භූමිය විශ්ලේෂණය තුළින් මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරිමට මෙන්ම ආපදා සහන සැලසීම වැනි කටයුතු ද කාර්යක්ෂමව කිරීමට සැලසුම් කර ඇත. ඉංජිනේරු සෙබලාගේ කාර්ය නව මානයකට යොමු කරමින් රසායනික, ජීවවිද්‍යාත්මක, විකිරණශීලී හා න්‍යෂ්ටික ආපදාවන් සඳහා මුහුණ දීම සඳහා ඊට ආවේණික තාක්ෂණික උපකරණ සමගින් පුහුණුවීම් සිදුකරනු ලබයි. තවද වෙඩි ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා සුනඛයන් මිලදී ගැනීම සහ පුහුණු කිරීම වියදම් අධික කාර්යක් බැවින් විකල්පයක් ලෙස මුගටියන් යොදා වෙඩි ද්‍රව්‍ය හඳුනා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාර්ථක පර්යේෂණ සිදුකරනු ලබයි.

178. **<u>විදේශ/සාමසාධක රාජකාරී සඳහා ස්ථානගත වීම.</u>** එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සහ විදෙස් රටවල ඇතිවන අපදාවන් හිදී සහන සැලසීම් කටයුතු සඳහා ඉංජිනේරු සෙබළා යෙදවීමේ හැකියාවන් පවතින සෑම අවස්ථාවකම ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට මෙම බළසේනාවට හැකියාව පවතියි.

**<u>සාරාංශය</u>**

179. ශ්‍රී ලංකාව පුරා සිදුකරන සියලුම ඉදිකිරීම් රාජකාරී සඳහා මෙම බළසේනා මූලස්ථානය සහාය දක්වන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ක්‍රියාවලියේද ප්‍රමුඛයා ලෙස ක්‍රියාකරන ලදී. මෙවැනි ජයග්‍රහණ තවදුරටත් රඳවා ගනිමින් මෙම බළසේනාව මනා දැනුමෙන්, වෘත්තීය නිපුණත්වයෙන් පරිපූර්ණව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සහ තම දේශය තුළ ඇතිවන සියලු ක්ෂේත්‍ර, යාන්ත්‍රික ඉංජිනේරු අවශ්‍යතා සපුරාලීම සඳහා කැපවී සිටියි.

## යාන්ත්‍රික ඉංජිනේරු බළසේනා මුලස්ථානය

180. 2018 වර්ෂයෙහි ජුනි මස 09 වන දින යුද්ධ හමුදා මුලස්ථානය වෙතින් නිකුත් කරන ලද G/SD/ 51/04 දරන හමුදා චර්යා නියෝගයට අනුව යාන්ත්‍රික ඉංජිනේරු බළසේනා මුලස්ථානය ස්ථාපිත කර ඇත. මෙම බළසේනාවෙහි ප්‍රධාන කාර්යය වනුයේ යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් අනුව ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති මගින් තිරසර සංවර්ධනය වෙනුවෙන් දායකත්වය ලබාදීමයි. මෙම බළසේනාව ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරුගේ මගපෙන්වීම මත ක්‍රියාත්මක වන අතර, පරිපාලනමය වශයෙන් ඉංජිනේරු බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ පාලනය වනු ලැබේ.

181. යාන්ත්‍රික ඉංජිනේරු බළකායෙහි කාර්යයන් පහත පරිදි වේ:

අ. යුද්ධ හමුදා මුලස්ථානය/ආරක්ෂක අමාත්‍යාංශයෙහි උපදෙස් මත සිදුකරන සියලු ඉදිකිරීම් සහ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සහ එම කාර්යයන් සැලසුම් කිරීම.

ආ. නව ඉදිකිරීම්/අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය යාන්ත්‍රික සහාය හා තාක්ෂණික සහාය ලබාදීම.

ඇ. අදාළ පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමෙන් පසු විශේෂ ජාතික ව්‍යාපෘති (යාන්ත්‍රික සහ ක්ෂේත්‍ර ව්‍යාපෘති ඇතුළුව) සිදුකිරීම.

ඈ. අමාත්‍යංශ/ප්‍රාදේශීය ආයතන සහ බටහිර සහ මධ්‍යම ආරක්ෂක සේනා මුලස්ථානයන් සමඟ සම්බන්ධීකරණයෙන් යුද්ධ හමුදා මුලස්ථානය වෙතින් අනුමත කරන සිවිල් හා යුද්ධ හමුදා වැඩසටහන් කටයුතු ඉටුකිරීම.

ඉ. නියමිත කාලසීමාවක් තුළදී අවසන් කිරීමට පැවරී ඇති ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු සිදුකර එම කාර්යයන් අධීක්ෂණය කිරීම.

### මූල්‍යමය විස්තර

182. යාන්ත්‍රික ඉංජිනේරු බළසේනාවෙහි 2018 වර්ෂයට අදාළ මූල්‍යමය විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | ප්‍රතිපාදන වෙන් කිරීම් අංකය | ලද ප්‍රතිපාදන මුදල (රු.) | වියදම් සාරාංශය (රු.) | 2018.12.31 වන දිනට ඇති ශේෂය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | භූමි නඩත්තු (222-01-2-1303(11)) | 20,000.00 | 20,000.00 | - |
| 2. | පවිත්‍රතා (222-01-2-1205(xxiv)) | 5,000.00 | 5,000.00 | - |
| 3. | අභ්‍යාස දීමනා (222-01-1-1409(xv)) | 12,000.00 | 12,000.00 | - |
| 4. | කාර්යාල ලිපිද්‍රව්‍ය (222-01-02-1201) | 50,000.00 | 50,000.00 | - |

වගුව 3:47. මූල්‍ය විස්තරය

### ප්‍රතිපාදන භාවිතා කිරීම

183. යාන්ත්‍රික ඉංජිනේරු බළසේනාව වෙත ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලබාදෙන අභ්‍යාස දීමනාව ලිපිද්‍රව්‍ය ලබාගැනීම සඳහා ඵලදායි ලෙස යොදා ගෙන ඇති අතර, භූමි නඩත්තු අරමුදල හරහා ලබාදෙන මුදල් තෘණ උද්‍යානයෙහි නඩත්තු කටයුතු සඳහා යොදාගෙන ඇත.

**<u>වර්ෂයෙහි කාර්යසාධනය පිළිබද විශ්ලේෂණය</u>**

184. ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය යටතේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි වාරිමාර්ග ප්‍රතිසංස්කරණය ආරම්භ කරන ලදී.

185. ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කණුකැටිය මුඩුත්තාව වැව ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී.

186. ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයෙහි මීයකෙටුආර වැව සහ කොස්ගස්අරාව වැව ප්‍රතිසංස්කරණ අධීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

187. වව්නියාව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මෙට්කුලම් වැව, එයිපැන්රිතායිකුලම් වැව, සින්නපුලියම්කුලම් වැව සහ කඩ්ඩයිරකුලම් වැව් වල ප්‍රතිසංස්කරණ කාර්යයන් ආරම්භ කරන ලදී.

188. **<u>තබ්බෝව ප්‍රදේශයෙහි දල වශයෙන් අක්කර 100 ක පමණ කලපු අන්දර කපා ඉවත් කිරීමේ ව්‍යාපෘතිය.</u>** මූලික ලෙස හෙක්ටයාර 50 ක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කර දැනට හෙක්ටයාර් 33.8 ක ප්‍රමාණයක් අවසන්කර ඇති අතර, එහි දැව සඳහිරුසෑයෙහි ගඩොල් ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබයි.

189. කැළණි රජ මහා විහාරයෙහි අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.

190. එගොඩ කැළණිය විහාරයෙහි පොකුණ අළුත්වැඩියා කිරීම.

191. මත්තේගොඩ කැමිලා විද්‍යාලයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.

192. **<u>මීතොටමුල්ල කසල කන්ද සංවර්ධන ව්‍යාපෘතිය.</u>** ඝණ අපද්‍රව්‍ය මීටර් 30 x මීටර් 50 ක ප්‍රමාණයක් භාවිතා කරමින් ක්‍රියාත්මක ඉදිකිරීම් කටයුතු දැනට සිදුකරමින් පවතියි.

193. ආරක්ෂක සේනා මුලස්ථානය (බටහිර) සහ ආරක්ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) යටතේ ඇති යාන්ත්‍රික හා ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යයන් සිදුකිරීම.

**<u>මෙම බළසේනාව වෙතින් අවසන් කරන ලද ව්‍යාපෘති</u>**

194. කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි මුඩුත්තාව වැව ප්‍රතිසංස්කරණය කටයුතු අවසන් කර ඇත.

195. වව්නියාව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මෙට්කුලම් වැව, එයිපැන්රිතායිකුලම් වැව, සින්නපුලියම්කුලම් වැව සහ කඩ්ඩයිරකුලම් වැව් වල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන්කර ඇත.

196. මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දුනුමඩලාව එල්ලංගා පද්ධතියෙහි ඉහළ මිල්ලගොල්ලෑව සහ මහ මිල්ලගොල්ලෑව වැව් වල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත.

**<u>ගැටළු සහ අභියෝග</u>**

197. මෙම බළසේනාව වෙත පැවරෙන රජයෙහි සහ යුධ හමුදා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ඉංජිනේරු යන්ත්‍රෝපකරණ නොතිබීම.

**<u>සාරාංශය</u>**

198. ජාතිය ගොඩනැගීම සම්බන්ධ සියළු කටයුතු පරිපාලනය කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු කිරීම යාන්ත්‍රික ඉංජිනේරු බළසේනාව වෙතින් සිදුකරන අතර, යාන්ත්‍රික ඉංජිනේරු බළකායට පැවරෙනු ලබන රාජකාරි සබැඳව යුද්ධ හමුදාධිපති සහ ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු දැනුවත් කිරීමේ වගකීම මෙම බළසේනාව වෙත පැවරී ඇත.

## සංඥා බළසේනා මූලස්ථානය

199. යුද්ධ හමුදාධිපතිතුමා විසින් හමුදා චර්යා නියෝග (ARO 18/94) යටතේ සංඥා බළසේනා මූලස්ථානය පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර, මෙම මූලස්ථානය සංඥා රෙජිමේන්තු සංකීර්ණයේ යුද්ධ හමුදා ජනපදය පනාගොඩහි ස්ථාපිත කර ඇත. සෑම කාලයේදීම ක්ෂේත්‍රයේ සංඥා සම්බන්ධතාවයන් සැපයීමද ඇතුළුව යුධ/සාම කාලය තුළ යුධ හමුදාවේ අණ හා පාලන කටයුතු සිදුකිරීම සහ අවශ්‍ය සංඥා සම්බන්ධතා ලබාදීම.

200. සංඥා බළසේනා මූලස්ථානයෙහි වගකීම්.

අ. ක්ෂේත්‍ර සංඥා ඒකකයන්හි සහ අනෙකුත් ක්ෂේත්‍ර සංඥා අනුබණ්ඩයන්හි සංඥා සම්බන්ධතා පැවැත්වීම සබැඳිව අණ හා පාලනය සිදුකිරීම.

ආ. සංඥා හයිපිරිස් සහ සංඥා උපකරණ ක්ෂේත්‍රයේ ඵලදායි ලෙස බෙදාදීම හා නිවැරදිව ස්ථානගත කිරීම.

ඇ. සංඥා ඒකක වෙත ලබාදී ඇති සංඥා උපකරණ ඵලදායි ලෙස උපයෝගී කරන බවට අධීක්ෂණය හා සුපරීක්ෂාකාරී වීම.

ඈ. යුධ හමුදා පුහුණු සැලැස්මට අනුව ප්‍රධාන සංඥා නිළධාරීගේ උපදෙස් මත විශේෂිත පුහුණුවීම් සිදුකිරීම.

ඉ. යුධ හමුදා මූලස්ථානයේ මගපෙන්වීම යටතේ විශේෂ මෙහෙයුම් සඳහා සංඥා හයි කණ්ඩායම් යෙදවීම.

ඊ. යුධ හමුදාව තුළ සංඥා හයිපිරිස් හා උපකරණ ස්ථානගත කිරීම පිළිබඳව දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.

### මූල්‍ය විස්තරය

201. 2018 වර්ෂය සඳහා වෙන්කර දී ඇති මූල්‍ය ප්‍රතිපාදන.

| අනු අංකය | ප්‍රතිපාදන වෙන් කිරීම් අංකය | ලද ප්‍රතිපාදන මුදල (රු.) | වියදම් සාරාංශය (රු.) | 2018.12.31 වන දිනට ඇති ශේෂය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222-01-2-1303(II) | 25,000.00 | 25,000.00 | - |
| 2. | 222-01-2-1205(XXIV) | 15,000.00 | 15,000.00 | - |
| 3. | 222-01-2-1205(XVIII) | 13,300.00 | 12,550.00 | 750.00 |
| 4. | 222-01-1-1409(XV) | 15,000.00 | 15,000.00 | - |

වගුව 3:48. මූල්‍ය විස්තරය

### ප්‍රතිපාදන භාවිතා කිරීම

202. මෙම සංඥා බළසේනා මූලස්ථාන පුහුණු අභ්‍යාස ගිණුමට ලැබුණු මුදල් ක්‍රමාණුකූලව සහ විධිමත්ව ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ලබාගෙන ඇති අතර, මෙම බළසේනා මූලස්ථානය අවට ඇති වටපිටාව සහ තණකොළ තීරු අප විසින් නඩත්තු කටයුතු සිදුකරන අතර, ඒ සඳහා භූමි නඩත්තු මුදල් උපයෝගී කරගනු ලැබේ. තවද, මෙම මූලස්ථානයෙහි රාජකාරී කරනු ලබන කාර්යය මණ්ඩලයෙහි දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා සති අන්ත පුවත්පත් එකක් සහ දිනපතා නිකුත්වන සිංහල පුවත්පතක් දිනපතා මිළදී ගනු ලැබේ.

**<u>2018 වර්ෂයේ සංඥා බළසේනා මූලස්ථාන ප්‍රගතිය</u>**

203. ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව සංඥා රාජකාරී ඉටුකිරීම සඳහා ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය වෙතින් ලබාදෙනු ලබන සියලු සංඥා කාර්යන් සිදුකිරීම.

204. 2018 ආරක්ෂක සමුළුව හා නිදහස් දින පෙළපාලිය සඳහා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් ක්ෂේත්‍රයෙහි සංඥා අවශ්‍යතා ලබාදීම.

205. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය හා යුද්ධ හමුදා විද්‍යා පීඨය වෙතින් සිදුකරනු ලබන ක්ෂේත්‍ර අභ්‍යාසයන් සඳහා අවශ්‍ය සංඥා අවශ්‍යතා ලබාදීම.

206. පාකිස්ථාන යුද්ධ හමුදා ප්‍රධානි පැමිණීම වෙනුවෙන් 2018.01.15 වන දින සම්මාන පෙළපාලිය සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය සංඥා අවශ්‍යතා ලබාදීම.

207. තායිලන්ත අගමැති ශ්‍රී ලංකාවට පැමිණීම වෙනුවෙන් 2018.07.12 වන දින සම්මාන පෙළපාලිය සඳහා සම්බන්ධීකරණ කටයුතු ඉටුකර ගැනීමට සංඥා අවශ්‍යතා ලබාදීම.

208. 2018.05.14 දින සිට 2018.06.13 දින දක්වා 4 වන ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත බළඇණි පුහුණු පාඨමාලාව සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

209. මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වාර්ෂික ඇසළ මහා පෙරහැර සඳහා 2018.08.16 වන දින සිට 2018.08.25 දින දක්වා ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය වෙනුවෙන් සංඥා අවශ්‍යතා ලබාදීම.

210. 2018.09.06 දින සිට 2018.09.28 දින දක්වා අරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බළප්‍රදේශයෙහි පැවති දියකාවා ඒකාබද්ධ යුධ අභ්‍යාසය සඳහා අවශ්‍ය සංඥා සම්බන්ධතාව ලබාදීම සහ එහි සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

211. මාර්තු මාසයේ තෙල්දෙණිය ප්‍රදේශයෙහි ඇති වූ කලහකාරී තත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා භටපිරිස් වෙත සංඥා අවශ්‍යතා ලබාදීම.

212. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකා රාජකාරීන් ක්‍රමවත්ව පවත්වා ගැනීමට සංඥා අවශ්‍යතා ලබාදීම.

213. ෆොක්ස්හිල් සුපර් ක්‍රොස්, ගනර් සුපර් ක්‍රොස්, ගජබා සුපර් ක්‍රොස්, විජයබා සුපර් ක්‍රොස්, වලවේ සුපර් ක්‍රොස්, ජිම්පෝ සුපර් ක්‍රොස් හා කැවල්රි සුපර් ක්‍රොස් සඳහා අවශ්‍ය සංඥා සම්බන්ධතාවය පවත්වා ගැනීමට සංඥා අවශ්‍යතා ලබාදීම.

**<u>ජයග්‍රහණයන්</u>**

214. ලෙබනනයේ, සුඩානයේ සහ මාලිහි පිහිටි ශ්‍රී ලංකා සාම සාධක හමුදා වල සියලු සන්නිවේදන අවශ්‍යතා මෙම බළසේනා මූලස්ථානය වෙතින් ලබා දීමට හැකිවීම.

215. ඉතා පැරණි ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගි කර ගනිමින් 58 වන සේනාංකයෙහි රේඩියෝ ජාල පද්ධතියක් ස්ථාපිත කිරිමට හැකිවීම.

**<u>ගැටලු සහ අභියෝග</u>**

216. ප්‍රමාණවත් ගුවන් විදුලි ප්‍රමාණයක් නොමැති වීම සහ අමතර කොටස් නොලැබීම මඟින් ඵලදායි ලෙස ක්ෂේත්‍ර රේඩියෝ සන්නිවේදනය පවත්වාගෙන යාම දැනට පවතින ප්‍රධාන අභියෝගය වේ.

217. දැනට සිටින වෘත්තියමය සෙබළුන් සංඛ්‍යාව ඉහළ මූලස්ථාන වල අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ප්‍රමාණවත් නොවීම.

218. දැනට වැඩි වශයෙන් ඉල්ලුම් කරන ජන ඇමතුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ජන ඇමතුම් උපකරණ වැඩිදියුණු කළ යුතුය.

**<u>සාරාංශය</u>**

219. සංඥා බළසේනාව යනු සමස්ත යුද්ධ හමුදාවේ අණදීම් පාලනය සහ පරිපාලනය මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සංඥා සම්බන්ධතා ස්ථාපනය කරන ආයතනය වේ. ගුවන් විදුලි යන්ත්‍ර හිඟතාවය, කාර්යක්ෂම ගුවන් විදුලි සන්නිවේදනය පවත්වාගෙන යාම දැනට පවතින ප්‍රධාන අභියෝගය වේ. එහෙත් සංඥා බළකායේ ප්‍රධාන සංඥා නිලධාරීගේ සහාය ඇතිව මෙම අභියෝගයට මෙතෙක් සාර්ථකව මුහුණදී ඇති අතර, නව ගුවන් විදුලි යන්ත්‍ර කොටස් අත්පත් කර ගැනිම හා නුදුරේදී එය සිදුකිරීමට නියමිතව ඇත.

## මූල්‍ය කළමනාකරණ ශාඛාව

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියළුම මූල්‍ය ආශ්‍රිත කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ශාඛාවක් වශයෙන් මූල්‍ය කළමනාකරණ ශාඛාව ක්‍රියාකරනු ලැබේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය කළමනාකරණයට අදාළ පුරෝකථනය, සැලසුම්කරණය, පාලනය, සමාලෝචනය සම්බන්ධව ගණන්දීමේ නිලධාරී වන යුද්ධ හමුදාධිපති වෙත අධ්‍යක්‍ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ වගකිව යුතුවේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත බඳවාගෙන ඇති සියලුම හමුදා ගණක නිලධාරීන්ගේ විනය, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සහ විගණන/ගිණුම් ලිපිකරුවන් බඳවාගැනීම සඳහා නිර්දේශ කිරීම හා අතිරේක රෙජිමේන්තු සේවා පත්කිරීම් ඇතුළු සියලුම පරිපාලන කටයුතු මෙන්ම වෘත්තීය කළමනාකරණය සම්බන්ධයෙන්ද වගකීම අධ්‍යක්‍ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ වෙත පැවරී ඇත.

2. මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පාලනය සිදුවන යුද්ධ හමුදා මූලස්ථානය යටතේ ස්ථාපිත පහත සඳහන් සියළුම අධ්‍යක්‍ෂ මණ්ඩලයන්හි නිසි කළමනාකරණය, සුපරීක්‍ෂණය, නායකත්වය ලබාදීම සහ කාර්යභාරයන් සම්බන්ධීකරණය කිරීම සම්බන්ධව වගකීමද අධ්‍යක්‍ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සතුවේ.




රූප සටහන 4:1. මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ ඇති ආයතන

## මූල්‍ය තොරතුරු

3. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත 2018 වසර වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස පහත දක්වා ඇත.




ප්‍රස්ථාරය 4:1. වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය - 2018 වර්ෂය

4. 2018 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සහ 2018.12.31 දිනට වියදම් අගයන් පහත පරිදි වේ.

| අනු අංකය | විස්තරය | මුළු ප්‍රතිපාදන වටිනාකම 2018 (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | 2018.12.31 දිනට ප්‍රතිපාදන ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | පුනරාවර්ථන වියදම් | 149,135,195,725.00 | 142,057,952,955.47 | 7,077,242,769.53 |
| 2. | මූලධන වියදම් | 9,037,699,275.00 | 5,810,369,798.85 | 3,227,329,476.15 |
| | **එකතුව** | **158,172,895,000.00** | **147,868,322,754.32** | **10,304,572,245.68** |

වගුව 4:1. මුල්‍ය විස්තරය




ප්‍රස්ථාරය 4:2. වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය

**<u>වසරේ කාර්යසාධන සාරාංශය</u>**

5. පහත සඳහන් ස්ථාන වෙතින් නම්කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත හඳුන්වාදීමේ වැඩමුළුව 2018.08.08 දින පැවැත්වීමට කටයුතු කිරීම.

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව මූලස්ථානය සහ ආරක්ෂක සේනා මූලස්ථාන - කර්නල් (හකාස).

ආ. රෙජිමේන්තු මධ්‍යස්ථාන - නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක.

ඇ. යුද්ධ හමුදා පුහුණු මධ්‍යස්ථාන - ප්‍රධාන උපදේශක.

ඈ. රෙජිමේන්තු වෘත්තීය පුහුණු පාසල් - සේනාවිධායක.

6. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ තාක්ෂණික ඇගයීම් කමිටු රාජකාරීන් සඳහා ඉඳුරාම සම්බන්ධ වන සියලුම කාර්ය මණ්ඩල සඳහා නිවැරදි ප්‍රසම්පාදන පිළිවෙත පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2018.11.27 සහ 2018.11.28 දෙදින තුළ පැවැත්වීමට කටයුතු කිරීම.

7. විෂය දැණුම වර්ධනය හා වෘත්තීය ප්‍රගමනය සඳහා ඉවහල්වනු පිණිස පහත සඳහන් පරිදි විදේශ පුහුණුවීම් සඳහා ගණක නිලධාරීන් සහභාගීකරවීමට ක්‍රියාකරන ලදී:

| අනු අංකය | සහභාගීකරවන ලද රට | නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | තායිලන්තය | 8 |
| 2. | ඉන්දුනීසියාව | 5 |
| 3. | නෙදර්ලන්තය | 2 |
| | **එකතුව** | **15** |

වගුව 4:2. විදේශ පුහුණුවීම් සඳහා ගණක නිලධාරීන් සහභාගීකරවී පිළිබඳ විස්තරය

**ගැටළු සහ අභියෝග**

8. සුදුසුකම් සහිත ගණක නිලධාරීන්ගේ හිඟය සහ ඉඳුරාම බඳවා ගැනීමේ පදනම මත ගණකාධිකාරී වෘත්තියේ අයවළුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත බඳවා ගැනීමේ දුෂ්කරතාවය හේතුවෙන් අනුමත සංස්ථාවන්ට අනුව ගණක නිලධාරීන් හමුදා ආයතන සඳහා ඇතුලත්කිරීම අපහසුවී තිබේ.

**අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**

9. අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදා මූලස්ථානයේ මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පාලනය වේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය කළමනාකරණ, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හා වැය ශීර්ෂ වෙන්කිරීම, මූල්‍ය කළමනාකරණ තොරතුරු අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට අවශ්‍යතා අනුව සැපයීම හා යුද්ධ හමුදාවේ රාජ්‍ය මුදල් සහ රාජ්‍ය නොවන මුදල් කළමනාකරණය කිරීම යන කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදුකිරීම අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**මූල්‍ය තොරතුරු**

10. 2018 වර්ෂය සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය පහත පරිදි වේ.:

| අනු අංකය | විස්තරය | 2018 වර්ෂය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි) |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | පුනරාවර්තන වියදම් | 149,135.19 |
| 2. | මූලධන වියදම් | 9,037.69 |
| | **එකතුව** | **158,172.88** |

වගුව 4:3. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදාගත් ආකාරය**

11. 2018.12.31 දිනට වැය ශීර්ෂයන්ගේ තත්ත්වය පහත සඳහන් පරිදිවේ.

අ. පුනරාවර්තන වියදම්

| අනු අංකය | වැය ශීර්ෂය | 2018.12.31 දිනට මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | 2018.12.31 දිනට මුළු වියදම (බැදීම් සමග) (රු.) | ප්‍රතිපාදන භාවිතා කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | පුද්ගල වැටුප/වේතන | 119,985,095,000 | 117,493,017,981 | 98% |
| 2. | ගමන් වියදම් | 215,000,000 | 215,548,493 | 100% |
| 3. | වෙනත් සැපයීම් | 21,386,800,725 | 21,400,000,980 | 100% |
| 4. | නඩත්තු වියදම් | 578,000,000 | 580,815,405 | 100% |
| 5. | වෙනත් සේවා | 6,559,000,000 | 6,575,087,285 | 100% |
| 6. | වෙනත් පුනරාවර්තන වියදම් | 411,277,250 | 371,475,532 | 90% |
| 7. | නැතිවීම් හා අලාභහානි | 22,750 | 22,750 | 100% |
| | **මුළු වටිනාකම** | **149,135,195,725** | **146,635,968,426** | **98%** |

වගුව 4:4. පුනරාවර්තන වියදම්

ආ. මූලධන වියදම්

| අනු අංකය | වැය ශීර්ෂය | 2018.12.31 දිනට මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | 2018.12.31 දිනට මුළු වියදම (බැදීම් සමග) (රු.) | 2018.12.31 දිනට ප්‍රතිපාදන භාවිතා කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | 770,000,000 | 770,000,000 | 100% |
| 2. | මූලධන වත්කම් අත්පත් කරගැනීම | 3,200,527,275 | 3,200,527,275 | 100% |
| 3. | පුහුණුකිරීම් හා හැකියා වර්ධනය | 1,400,000,000 | 1,354,569,168 | 97% |
| | **එකතුව** | **5,370,527,275** | **5,325,096,443** | **99%** |
| **අනෙකුත් මූලධන වියදම්** | | | | |
| 4. | වෙනත් ආයෝජන | 1,614,000,000 | 1,614,000,000 | 100% |
| 5. | ණය යෝජනා ක්‍රම | 2,053,172,000 | 223,327,199 | 11% |
| | **එකතුව** | **3,667,172,000** | **1,837,327,199** | **50%** |
| | **මුළු එකතුව** | **9,037,699,275** | **7,162,423,642** | **79%** |

වගුව 4:5. මූලධන වියදම්

**වසරේ කාර්යසාධන සාරාංශය**

12. 2018 වර්ෂය සඳහා යුද්ධ හමුදාව වෙත රු. මිලියන 158,173 ක් වෙන්වූ අතර ඉන් රු. මිලියන 153,798 ප්‍රමාණයක් භාවිතා කර ඇත. ප්‍රතිශතයක් ලෙස 97.23% ප්‍රගතියක් පෙන්නුම්කර ඇත.

13. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලසීමාව තුල එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී සඳහා ලෙබනන් හා සුඩාන් රාජ්‍යයන්හි යොදවා ඇති භට්පිරිස්වල රාජකාරී අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා උපාංග මිලදී ගැනීම සඳහා රු.මි. 274.23 (ඇ.ඩො.මි. 1.52) ක වියදමක් දරා ඇති අතර එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී ඉටුකිරීමෙන් රු.මි. 330.61 (ඇ.ඩො.මි. 1.83) ක ආදායමක් උපයා ඇත. අමතරව රු.මිලියන 1,193.74 මුදලක් ලෙබනන්, සුඩාන් හා මාලි රටවල ස්ථාපිත කණ්ඩායම් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස ලැබී ඇත.

**වසරේ ජයග්‍රහණයන්**

14. 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කරදී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයට අමතරව පහත පරිදි ප්‍රාග්ධන වැය ශීර්ෂය වෙත හා පාකිස්තානු ණය යෝජනා ක්‍රමය යටතේ අමතර ප්‍රතිපාදන ලබාගැනීමට හැකිවී ඇත.

අ. මූලධන වියදම්.

(1) විශේෂ ඉදිකිරීම් ව්‍යාපෘති.

| අනු අංකය | වැය විස්තරය | (රු.) |
|---|---|---|
| **(අ)** | **(ආ)** | **(ඇ)** |
| 1. | උතුරු හා නැගෙනහිර පළාත්වල යුද්ධ හමුදා කඳවුරු ප්‍රතිස්ථාපනය | 100,000,000.00 |
| | **එකතුව** | **100,000,000.00** |

වගුව 4:6. විශේෂ ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ විස්තරය

(2) ණය යෝජනා ක්‍රමය.

| අනු අංකය | වැය විස්තරය | (රු.) |
|---|---|---|
| **(අ)** | **(ආ)** | **(ඇ)** |
| 1. | පාකිස්තානු ණය යෝජනා ක්‍රමය | 39,172,000.00 |
| | **එකතුව** | **39,172,000.00** |

වගුව 4:7. ණය යෝජනා ක්‍රමය පිළිබඳ විස්තරය

15. කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය අරමුදල් භාවිතය.

16. විදේශ රටවල ස්ථාපිත කර ඇති සාමසාධක රාජකාරී නියුතු භට්පිරිස් තුළින් ශ්‍රී ලංකාව වෙත විදේශ විනිමය ඉපයීමට හැකිවීම.

17. යුද්ධ හමුදාව යටතේ පවතින රාජ්‍ය නොවන අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය.

**කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය අරමුදල් භාවිතය**

18. 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සහ එම වර්ෂයට අනුමත කරන ලද ප්‍රතිපාදන වටිනාකම් පහත පරිදි වේ:

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන - 2018 (රු. බිලියන) | අනුමත වාර්ෂික ප්‍රතිපාදන - 2018 (රු. බිලියන) | වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | (රු. බිලියන) | % |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | පුනරාවර්තන | 160.48 | 149.54 | 10.95 | 7% |
| 2. | මූලධන | 40.99 | 6.99 | 34.00 | 83% |
| | **එකතුව** | **201.47** | **156.52** | **44.95** | **22%** |

වගුව 4:8. ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සහ 2018 වර්ෂයට අනුමත කරන ලද ප්‍රතිපාදන වටිනාකම්

19. 2018 වර්ෂය සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය රු.බිලියන 156.52 ක් වන අතර එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය හා සැසඳීමේදී රු.බිලියන 44.95 කින් අඩුවී ඇත.

20. පහත සඳහන් වැය ශීර්ෂයන්ගේ ප්‍රතිපාදන අඩුවීම යුද්ධ හමුදාවේ මූලික කාර්යයන් ඉටුකිරීමේදී අභියෝගාත්මකව බලපෑමක්වී ඇත.

අ. **මූලධන වැයශීර්ෂ**. උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි යුද්ධ හමුදා කඳවුරු වෙනත් ස්ථානවල ස්ථාපනය කිරීම (222-01-1-4-2104).

**සාරාංශය**

21. අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඵලදායී ලෙස ප්‍රතිපාදන බෙදා වෙන්කිරීම හා විමධ්‍යගත කිරීම, වියදම් පාලනය කිරීම තුළින් රාජ්‍ය මුදල් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතා ඉටුවන පරිදි උපරිම ඵලදායිතාවයක් ඇතිවනසේ කාර්යක්ෂමව හා විනිවිදභාවය ආරක්ෂා කරමින් හා උසස් මූල්‍ය විනයක් පවත්වා ගනිමින් මූල්‍ය කළමනාකරණ තොරතුරු සකස්කර අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට උපයෝගීවන අයුරින් ලබාදීම සඳහා සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය උපරිම වශයෙන් දායකත්වය ලබාදී ඇත.

අ. යුද්ධ හමුදාවෙහි මූල්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් අවශ්‍ය මූල්‍ය තොරතුරු නිසි අයුරින් පිළියෙල කර ඉදිරිපත්කිරීම තුළින් මනා මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාම.

ආ. රාජ්‍ය නොවන අරමුදල් සම්බන්ධයෙන් පාලනයන් හා සුපරීක්ෂණයන් සිදුකිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රතිපත්ති නිකුත්කිරීම.

ඇ. මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය සමඟ නිරන්තර ඍජු සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.

**අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය**

22. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම විගණන කාර්යයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ වෙතින් යුද්ධ හමුදාධිපති වෙත වාර්තා කිරීම සහ යුද්ධ හමුදා අභ්‍යන්තර විගණන උපායමාර්ග, විධි ක්‍රම සහ ක්ෂේත්‍රයේ පවතින හොඳම භාවිතයන් ක්‍රියාත්මක කිරීම, නීතිමය අවශ්‍යතාවයන්ට උචිත වන පරිදි සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් සියලුම අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අවසාන වශයෙන් වගකීම අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන සතුවේ. කාලීන සහ වාර්ෂික අවදානම් තක්සේරු කිරීම, සැලසුම් ක්‍රියාවලිය සහ විගණන මතයන් සහ තොරතුරු සැපයීමේදි අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක සුවිශේෂි කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

23. අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක විසින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුව සඳහා අවශ්‍ය අරමුණු සහතික කිරීම තුළින් පාලනයන්ගේ සඵලදායීත්වය, නිරවද්‍යතාව, වගවීම, කාලානුරූප මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනියත්වය, නෛතිකමය සහ යහපාලන අවශ්‍යතාවයන්ට අනුගත බව ස්වාධීනව තහවුරු කරනු ලබයි. අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක විසින් වාර්ෂික විගණන සැලසුම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් මනා අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කිරීම, යුද්ධ හමුදාව තුළ සංවිධානාත්මක අරමුණු මුදුන්පත් කරගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ක්‍රියාත්මක කරනු ලබයි.

<u>**වර්ෂයේ කාර්යසාධන සාරාංශය**</u>

24. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා වන කාලසීමාව තුළ ජාතික විගණන කාර්යාලය විසින් පිළිතුරු අපේක්ෂා කරන ලද විගණන නිරීක්ෂණයන් සඳහා පිළිතුරු සැපයීම හා සම්බන්ධීකරණය.

අ. පිළිතුරු කැඳවන ලද විගණන විමසුම් සංඛ්‍යාව - 12
ආ. පිළිතුරු ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සංඛ්‍යාව - 12

25. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලය තුළ සමස්ථ යුද්ධ හමුදාවම ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයන් සිදුකිරිම.

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව | (%) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලසුමට අනුව සැලසුම්කළ විගණන සංඛ්‍යාව | 503 | 100% |
| **සිදුකරනු ලැබූ විගණන සංඛ්‍යාව** | | | |
| 2. | සාමාන්‍ය විගණන | 340 | 67.6% |
| 3. | අඛණ්ඩ විගණන | 23 | 4.5% |
| 4. | ප්‍රසම්පාදන විගණන | 44 | 8.7% |
| 5. | විශේෂ විගණන | 46 | 9.1% |
| | **සමස්ත විගණන සංඛ්‍යාව** | **453** | **90%** |

වගුව 4:9. අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම පිළිබඳ විස්තරය

26. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ජාතික විගණන කාර්යාලය විසින් නගන ලද විගණන නිරීක්ෂණයන් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම.

27. 05/2003 හමුදා චර්යා නියෝග, 29/2006 හමුදා චර්යා නියෝග, 26/2015 හමුදා චර්යා නියෝගය හා 24/2017 හමුදා චර්යා නියෝග අනුව 2018.04.09 හා 2018.11.13 දිනයන්හි මාණ්ඩලික ප්‍රධානිගේ ප්‍රධානත්වයෙන් දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

28. 2018.05.30 හා 2018.12.14 දිනයන්හි පැවති ආරක්ෂක අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා යුද්ධ හමුදාව නියෝජනය කරමින් යුද්ධ හමුදාධිපති සමග සහභාගිවීම සහ යුද්ධ හමුදාවේ කර්යසාධනය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම.

29. <u>විගණන නිරීක්ෂණ අවම කිරීම සඳහා දේශන පැවැත්වීම</u>.

| අනු අංකය | දේශනය | සහභාගී වූ සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | නිලධාරී | සෙසුනිල |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | දැනුවත් කිරීම මගින් අවමකරගැනීම | 308 | 1,819 |
| 2. | ප්‍රසම්පාදනය පිළිබඳ දැනුවත් කිරීම | 294 | 246 |
| | **එකතුව** | **602** | **2,065** |

වගුව 4:10. විගණන නිරීක්ෂණ අවම කිරීම සඳහා දේශන පැවැත්වීම පිළිබඳ විස්තරය

**වසරේ ජයග්‍රහණ**

30. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කාර්යසාධන ප්‍රගතිය වරින්වර පවත්වන ලද දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී කමිටු සභාපතිතුමාගේ සහ සාමාජිකයින්ගේ ඇගයීමට ලක්වී ඇත.

31. 2018 වර්ෂයේ විගණන වැඩසටහන යුද්ධ හමුදා ආයතනයන්ගේ අභ්‍යන්තර පාලන පද්ධතීන් සඳහා අගය එකතු කිරීමක් වශයෙන් ක්‍රියාත්මක කරන ලද අතර හුදු වැඩසටහනේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සිදු නොකළ අතර එබැවින් විගණන කටයුතුවලදී ඉහළ ප්‍රමිතියෙන් යුතු විගණන ක්‍රමවේදයන්, මූලධර්ම හා ආචාර ධර්ම පවත්වා ගැනීමට හැකිවිය.

32. අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන කණ්ඩායම් විසින් ඉහළ වටිනාකමක් සහිත විගණන නිරීක්ෂණ අනාවරණය කරගැනීම නිසා රජයට අහිමිවීමට තිබූ විශාල මුදලක් ඉතිරිකර ගැනීමට හැකිවීම හේතුවෙන් මෙම වසර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉතා වැදගත් වසරක් විය.

33. දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් ගිණුම් හා ප්‍රසම්පාදන කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමට හැකිවීම නිසා නොදැනුවත්භාවය සහ නොසැලකිලිමත්කම හේතුවෙන් සිදුවන බොහෝ වැරදි අවමකර ගැනීමට හැකිවිය.

34. විගණකාධිපති විගණන විමසුම් සඳහා නිසි වේලාවට ඉතා සාර්ථකව පිළිතුරු ලබාදීමට හැකිවිය.

35. පසුගිය වසරට සාපේක්ෂව විගණන නිරීක්ෂණ අවමකර ගැනීමට හැකිවිය.

**ගැටළු සහ අභියෝග**

36. සැලසුම් කරන ලද වාර්ෂික විගණන වැඩසටහනෙන් බාහිර විශේෂ විගණන කටයුතු සිදුකිරීමට සිදුවීම සඳහා අවශ්‍යතා පරිදි විශාල කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට සිදුවීම හේතුවෙන් සැලසුම් කරන ලද විගණන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපහසු වීම.

**සාරාංශය**

37. විගණන සැලැස්මෙන් අපේක්ෂාකළ විගණන සිදුකර එම සැලැස්මේ අපේක්ෂිත අරමුණකරා ළඟාවීම, පිළිතුරු කැඳවනු ලැබූ විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම සහ හමුදා චර්යා නියෝගයන්ට අනුව මාණ්ඩලික ප්‍රධානගේ ප්‍රධානත්වයෙන් දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.

38. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය වඩාත් ශක්තිමත් කිරීම තුළින් දූෂණ, අක්‍රමිකතා හා නාස්තිය අවමකර යහපාලනයක් යුද්ධ හමුදාව තුළ ඇති කිරීම.

39. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සිදුවන මූල්‍ය ගණුදෙනුවල විනිවිදභාවය හා වගවීම සහතික කිරීම.

## යුද්ධ හමුදා වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය

40. නිලධාරීන්/සෙසුනිලයන් යුද්ධ හමුදාවට බඳවා ගැනීමේ සිට විශ්‍රාම/අස්වයන තෙක් ඔවුන්ගේ වැටුපට හා සේවයට අදාළව සියලු වැටුප් හා ලේඛණ කටයුතු සහ සේවයේ නියුතු නිත්‍ය/ස්වේච්ඡා බළසේනාවන්ට අයත් නිලධාරීන්/සෙසුනිලයන් හට මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම, වැටුප් වැය ශීර්ෂ පාලනය කිරීම, නිත්‍ය/ස්වේච්ඡා බළසේනාවන්ට අවශ්‍ය වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම, අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම නිවැරදිව හා කාර්යක්ෂමව ඉටුකිරීම තුළින් වඩාත් ඵලදායී සේවාවක් ලබාදීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම වේ.

**මූල්‍ය තොරතුරු**

41. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා) පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | වැය ශීර්ෂය | වටිනාකම (රු. මි) |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | පුනරාවර්ථන වියදම් | 141,261.10 |
| 2. | ප්‍රාග්ධන වියදම් | 1,126.55 |

වගුව 4:11. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

<u>ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදාගත් ආකාරය</u>

42. 2018 වර්ෂය තුළ ප්‍රතිපාදන මඟින් විවිධ විෂයන් සඳහා මුදල් වැයකළ ආකාරය පිළිබඳ විස්තර සාරාංශය.

| අනු අංකය | වැය විෂය | හැඳින්වීම | 2018.12.31 දිනට ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222 - 01 - 1 - 1001( 1 ) | වැටුප් හා දීමනා | 22,696,875,300.00 | 21,357,856,964.37 |
| 2. | 222 - 01 - 2 - 1001( 1 ) | | 718,108,000.00 | 703,366,032.50 |
| 3. | 222 - 01 - 3 - 1001( 1 ) | | 16,217,320,000.00 | 15,847,653,702.36 |
| 4. | 222 - 01 - 4 - 1001( 1 ) | | 20,640,230,000.00 | 20,245,817,367.34 |
| 5. | 222 - 01 - 1 - 1003( 1 ) | | 19,381,221,000.00 | 19,504,888,811.54 |
| 6. | 222 - 01 - 2 - 1003(1 ) | | 589,523,000.00 | 634,726,307.57 |
| 7.. | 222 - 01 - 3 - 1003( 1 ) | | 14,776,463,000.00 | 14,620,836,049.62 |
| 8. | 222 - 01 - 4 - 1003( 1 ) | | 19,179,725,000.00 | 19,233,175,093.59 |
| 9. | 222 - 01 - 1 - 1102( 1 ) | විදේශ සංචාර | 109,000,000.00 | 109,992,384.60 |
| 10. | 222 - 01 - 1 - 1506(1) | දේපල ණය පොලිය | 206,300,000.00 | 202,981,479.74 |
| 11. | 222 - 01 - 1 - 1101(1V) | සංයුක්ත දීමනා | 700,000.00 | 109,518.00 |
| 12. | 222 - 01 - 1 - 1409(XV111) | සම්මුඛ පරීක්ෂණ (නිත්‍ය) | 1,200,000.00 | 1,571,345.00 |
| 13. | 222 - 01 - 1 - 1501 | ආපදා ණය පොලිය | 106,300,000.00 | 88,062,214.46 |
| 14. | 222 - 01 - 1 - 1508 (1) | වන්දි | 86,129,253.00 | 46,542,857.50 |
| 15. | 222 - 01 - 1 - 1409(XV) | අභ්‍යාස දීමනා (නිත්‍ය) | 35,604,555.00 | 34,659,139.93 |
| 16. | 222 - 01 - 1 - 1402(1) | සන්නිවේදන දීමනා | 68,600,000.00 | 68,258,916.47 |
| 17. | 222 - 01 - 2 - 1409(XX) | කාර්මික ඇගයීම් | 2,359,680.00 | 1,797,930.00 |
| 18. | 222 - 01 - 2 - 1203(11) | සලාක (නිත්‍ය) | 367,208,767.00 | 343,673,949.58 |
| 19. | 222 - 01 - 4 - 1409(XV111) | සම්මුඛ පරීක්ෂණ (ස්වේච්ඡා) | 500,000.00 | 156,040.00 |
| 20. | 222 - 01 - 4 - 1409(XV) | අභ්‍යාස දීමනා (ස්වේච්ඡා) | 3,000,000.00 | 3,000,000.00 |
| 21. | 222 - 01 - 4 - 1203(11) | සලාක (ස්වේච්ඡා) | 306,582,620.00 | (146,777,102.21) |
| 22. | 253 - 01 - 2 - 1501 - 1 | සමාජ සේවා වැටුප් හා දීමනා | 26,962,140,000.00 | 26,958,203,956.72 |
| 23. | 103 - 01 - 2 - 1 -1501 | රණවිරු මාපිය දීමනා | 1,371,213,000.00 | 1,360,763,938.51 |
| 24. | 222-01-1-3-2509(11) | සුඩාන් වැටුප් හා දීමනා | 40,000,000.00 | 38,133,333.33 |
| 25. | 222-01-1-3-2509(111) | එතෙර සංචාර | 1,244,040.00 | 39,052.00 |
| 26. | 222-01-1-3-2509(1V) | එතෙර සංචාර | 1,500,000.00 | 1,524,188.00 |
| 27. | 222-01-3-2-2509(17) | එතෙර සංචාර | 94,000.00 | 92,341.00 |
| | **එකතුව** | | **143,869,141,215.00** | **141,261,105,811.52** |

වගුව 4:12. මුදල් වැයකළ ආකාරය පිළිබඳ විස්තර සාරාංශය

**වසරේ කාර්යසාධන සාරාංශය**

43. ආයතනයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ.

අ. 2018 ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් මස 31 දින දක්වා මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම සබැඳි විස්තර පහත සඳහන් පරිදි වේ:

(1) සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම.

| අනු අංකය | විස්තරය | නිත්‍ය (රු.) | ස්වේච්ඡා (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | නිලධාරී | 7,044,199,919.38 | 2,275,074,657.86 | 9,319,274,577.24 |
| 2. | සෙසුනිල | 65,879,146,465.10 | 37,339,992,591.67 | 103,219,139,056.76 |
| | **එකතුව** | **72,923,346,384.48** | **39,615,067,249.53** | **112,538,413,634.00** |

වගුව 4:13. සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම පිළිබඳ විස්තරය

(2) මියගිය/ආබාධිතව අස්කරන ලද නිලධාරීන් සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම.

| අනු අංකය | විස්තරය | නිත්‍ය (රු.) | ස්වේච්ඡා (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | නිලධාරී | 1,482,911,296.87 | 141,380,144.65 | 1,624,291,441.51 |
| 2. | සෙසුනිල | 21,101,442,062.42 | 4,283,670,560.77 | 25,385,112,623.19 |
| | **එකතුව** | **22,584,353,359.29** | **4,425,050,705.42** | **27,009,404,064.70** |

වගුව 4:14. මියගිය/ආබාධිතව අස්කරන ලද නිලධාරීන් සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම පිළිබඳ විස්තරය

ආ. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම යටතේ ආපදා ණය ගෙවීම් හා රාජ්‍ය බැංකු මඟින් හිමිගන්වනු ලබන දේපල ණය අයදුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවන්.

| අනු අංකය | විස්තරය | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවීම් කරන ලද සංඛ්‍යාව | හිමිගන්වන ලද මුදල (රු.මි) | 2018.12.31 වන දිනට ගෙවීමට ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | ආපදා ණය | 11,259 | 7,530 | 1,697.5 | 3,144 |
| 2. | දේපල ණය | 359 | - | - | - |
| | **එකතුව** | **11,618** | **7,530** | **1,697,5** | **3,144** |

වගුව 4:15. ආපදා ණය ගෙවීම් හා රාජ්‍ය බැංකු මඟින් හිමිගන්වනු ලබන දේපල ණය අයදුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවන් පිළිබඳ විස්තරය

ඇ. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන් වෙනුවෙන් රු.750.00 බැගින් වූ විශේෂ දීමනාව හිමිගැන්වීම.

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව | මුදල (රු.මි) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | දෙමව්පියන් | 150,807 | 1,364.65 |

වගුව 4:16. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන් වෙනුවෙන් රු.750.00 බැගින්වූ විශේෂ දීමනාව හිමිගැන්වීම පිළිබඳ විස්තරය

ඇ. පාරිතෝෂික සහ දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම.

| අනු අංකය | විස්තරය | අයදුම්පත් සංඛ්‍යාව | මුදල (රු. මි) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | පරිවර්තිත පාරිතෝෂිකය | 5,088 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ගෙවීම් කෙරේ |
| 2. | සේවා පාරිතෝෂිකය | 101 | |
| 3. | දුබලතා විශ්‍රාම වැටුප් | 1,859 | |
| | **එකතුව** | **7,048** | |

වගුව 4:17. පාරිතෝෂික සහ දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ විස්තරය

ඉ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රධාන පත, යැපෙන්නන්ගේ දීමනා, මරණ පාරිතෝෂික, විශේෂ වන්දි හා වන්දි හිමිගැන්වීම.

| අනු අංකය | විස්තරය | අයදුම්පත් සංඛ්‍යාව | හිමිගන්වනු ලබන මුදල (රු. මි) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | 355 | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් ගෙවීම් කෙරේ |
| 2. | යැපෙන්නන්ගේ දීමනා | 114 | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් ගෙවීම් කෙරේ |
| 3. | මරණ පාරිතෝෂිකය | 134 | 72.42 |
| 4. | වැන්දඹු බිරිඳ විවාහවීමේදී වන්දි | 29 | 101.42 |
| 5. | වන්දි - හමුදා චර්යා නියෝග 12/86 | 1,223 | 44.86 |
| 6. | රණවිරු සුරකුම් දීමනාව (15%) | 110 | 0.78 |
| | **එකතුව** | **1,965** | **219.48** |

වගුව 4:18. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර, යැපෙන්නන්ගේ දීමනා, මරණ පාරිතෝෂික, විශේෂ වන්දි හා වන්දි හිමිගැන්වීම පිළිබඳ විස්තරය

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

44. ක්‍රියාන්විත/ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල රාජකාරීන්හි යෙදී සිටියදී ඉඳුරාම ත්‍රස්තවාදී ක්‍රියා නොවන හේතුන්මත මියගිය සහ ආබාධිත නිලධාරීන්/සෙසුනිලයන් සඳහා 2018.03.20 දින සිට මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

45. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා වෛද්‍ය හේතුන් මත අස්වී ඇති රණවිරුවන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණවීමෙන් පසු විශ්‍රාම වැටුප 85% ප්‍රතිශතය මත සංශෝධනයවීමේදී අහිමිවී තිබූ දුබලතා විශ්‍රාම වැටුප නැවත ලබාදීම.

46. වසර 22 ක සක්‍රීය යුද හමුදා සේවා කාලයක් සම්පූර්ණකර තම ඉල්ලීම පරිදි විශ්‍රාමගිය සහ විශ්‍රාමයාමට නියමිත නිලධාරීන් සඳහා පූර්ණ විශ්‍රාම වැටුප (85%) හිමිකම ලබාදීම.

47. 2015.12.31 දිනට පෙර වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත බඳවාගෙන 2016 වසරෙන් පසුවද සේවයෙහි යෙදී සිටි/සිටින අයවළුන්ගේ වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව සංශෝධනය කිරීම.

48. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වී වෛද්‍ය හේතුන්මත අස්වයන රණවිරුවන්ට සහ මියගිය රණවිරුවන්ගේ යැපෙන්නන් හට රණවිරුවාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් ගෙවනු ලබන වැටුප් හා දීමනා ජීවිතාන්තය දක්වා හිමිගැන්වීම.

**ගැටළු සහ අභියෝග**

49. ස්වේච්ඡා බළසේනාවෙහි සේවයකර මේ වන විට විශ්‍රාම/මියගොස් ඇති වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීමට මනාපය පළකිරීමට නොහැකිවූ විශ්‍රාමිකයන්ට හා මියගිය අයවළුන්ගේ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන්ට ඒ සඳහා නැවත අවස්ථාවක් ලබාදීම සහ අවැසි මූල්‍ය ප්‍රතිපාදන අයවැය ලේඛණයට ඇතුළත් කර ගැනීම.

50. යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් හට හිමිගන්වනු ලබන දීමනා වසර 20 කට වඩා අධික කාලයක් තුළ සංශෝධනය කර නොතිබීම හේතුවෙන් වර්තමානයේ පවතින ජීවන වියදමට සාපේක්ෂව එම දීමනා සංශෝධනය කර ගැනීම.

**සාරාංශය**

51. දශක තුනක් පුරා පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දමා රටට සාමකාමී නිදහස් වාතාවරණයක් උදාකරදීමේ උතුම් කාර්යයට දායකවී ආබාධිත තත්වයට පත්වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ යැපෙන්නන් හට මාසික වැටුප් හා දීමනා ඇතුළු අනෙකුත් හිමිකම් ප්‍රමාදයකින් තොරව හිමිගැන්වීමට ක්‍රියාකිරීම.

52. රෙජිමේන්තු /ඒකක සහ ආයතනයන්හි සේවයේ නියුතු නිලධාරීන්/සෙසුනිලයන් හට වැටුප් හා දීමනා ඉල්ලුම් කිරීමට අදාල ලියකියවිලි අන්තර්ජාලය (Internet) මඟින් ආරක්ෂිත ක්‍රමවේදයකට අනුව මාර්ග ගතව (Online) සම්ප්‍රේෂණය කිරීම තුළින් මානව සම්පත් හා ලිපිද්‍රව්‍ය භාවිතය අවමකර ගැනීමේ ක්‍රමවේදයකට අනුගතවීම.

## වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය

53. වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පාලනය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු කාර්යයන් සම්බන්ධව වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ වෙත වගකීමට බැඳී සිටියි.

54. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත මහජන අරමුදලින් මිලදීගෙන ඇති වත්කම්වල පැවැත්ම හා නඩත්තු කිරීම සබැඳි දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, උපදෙස් නිකුත් කිරීම සහ මුදල් රෙගුලාසි අනුව ක්‍රියාකිරීම මඟින් යුද්ධ හමුදා වත්කම් ආර්ථික පිරිමැසුම්දායකව, කාර්යක්ෂමව හා සඵලදායී ලෙස කළමනාකරණය කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**මූල්‍ය තොරතුරු**

55. වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2018 වර්ෂයේ වැය ශීර්ෂ වෙතින් මූල්‍ය ප්‍රතිපාදන ලැබී නොමැත. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පවත්වන ලද යුද්ධ හමුදාවේ අයෝග්‍ය වාහන සහ පොදු භාණ්ඩ අපහරණ ක්‍රියාවලින් මගින් 2018 වර්ෂය තුළ ලද පහත සඳහන් ආදායම් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැරකර ඇත.

| අනු අංකය | විස්තරය | බැරකරන ලද ආදායම (රු.) | | |
|---|---|---|---|---|
| | | 2017 11 අඩවසර | 1 අඩවසර 2018 | එකතුව |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අයෝග්‍ය වාහන අලෙවි ආදායම | 38,579,696.94 | 40,362,746.99 | 78,942,443.93 |
| 2. | අයෝග්‍ය පොදුභාණ්ඩ අලෙවි ආදායම | 20,204,448.46 | 13,211,709.00 | 33,416,157.46 |
| | **එකතුව** | **58,784,145.40** | **53,574,455.99** | **112,358,601.39** |

වගුව 4:19. ආදායම් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීම් පිළිබඳ විස්තරය

**ආදායම් සඳහා ගත් ක්‍රියාමාර්ග**

56. 2018 වර්ෂයේදී යුද්ධ හමුදාවෙහි පාවිච්චියෙන් පසු අයෝග්‍ය කරන ලද වාහන/පොදු භාණ්ඩ ටෙන්ඩර් ක්‍රියාවලිය මඟින් අලෙවි කිරීමෙන් ලබාගත් රුපියල් මිලියන 112.36 ක මුදල රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කරන ලදී.

**වසරේ කාර්යසාධන සාරාංශය**

57. වාර්ෂික සමීක්ෂණ මණ්ඩල ක්‍රියාවලිය.

අ. 2017 වර්ෂය සඳහා පත්කරන ලද වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පිළිබඳ සාරාංශ වාර්තාව පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | සමීක්ෂණ මණ්ඩලය | මණ්ඩල පත්කර ඇති ස්ථාන ගණන | මණ්ඩල වාර්තා ලැබී ඇති ස්ථාන ගණන | ලැබිය යුතු මණ්ඩල වාර්තා ගණන |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | වාර්ෂික හරිවැරදි බැලීමේ මණ්ඩල | 701 | 701 | - |
| 2. | වාර්ෂික අයෝග්‍ය කිරීමේ මණ්ඩල | 701 | 701 | - |
| 3. | වාර්ෂික බඩුභාහිරාදිය විනාශ කිරීමේ මණ්ඩලය | 701 | 658 | 43 |

වගුව 4:20. වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පිළිබඳ සාරාංශ වාර්තාව

58. වර්ෂ අවසානයේ ස්ථාවර වත්කම්වල පැවැත්ම හරිවැරදි බැලීම (මුදල් රෙගුලාසි 507/2).

අ. 2017 වර්ෂය සඳහා පත්කරන ලද මණ්ඩල 502 ක මණ්ඩල වාර්තා 2018 වර්ෂයේදී අනුමත කර යවා ඇත.

ආ. මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද රාජ්‍ය ආයතනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේ පරිගණක වැඩසටහන (CIGAS) යටතේ යුද්ධ හමුදාවේ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

59. නැතිවීම් හා අලාභහානිවීම් වටිනාකම් කපාහැරීම.

අ. 2018.12.31 දිනට අදාළව නැතිවීම් හා අලාභහානි සිදුවීම්වල සාරාංශගත වාර්තාව පහත පරිදි වේ:

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | 2018.01.01 දිනට ක්‍රියාකිරීමට පැවති ලිපිගොණු | 220 |
| 2. | කාලපරිච්ඡේදය තුළ විවෘත කරන ලද නවලිපිගොණු | 104 |
| 3. | කාලපරිච්ඡේදය තුළ පොත්පත් වලින් කපාහරින ලද ලිපිගොණු | (155) |
| 4. | 2018.12.31 දිනට ක්‍රියාකිරීමට ඇති ලිපිගොණු | 169 |

වගුව 4:21. නැතිවීම් හා අලාභහානි සිදුවීම්වල සාරාංශගත වාර්තාව

ආ. 2018 වර්ෂය තුළ නැතිවීම් හා අලාභ හානිවීම් සම්බන්ධ සිදුවීම් 155 කට අදාල ලිපිගොණු නිරාකරණය කර ඇති අතර මුදල් රෙගුලාසි 109 අනුව රු 156,477,357.13 ක වටිනාකමක් පොත්පත් වලින් කපාහැර ඇත.

ඇ. 2018.12.31 දිනට ලිපිගොනු 169 ක ප්‍රමාණයක් පහත සඳහන් පරිදි විවිධ අදියර යටතේ ක්‍රියාකරමින් පවතියි.

| අනු අංකය | ලිපිගොණු විශ්ලේෂණය | සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | මුදල් රෙගුලාසි 104(3) යටතේ ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර ඇති ගොනු | 84 |
| 2. | මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණ මණ්ඩල/මූලික පරීක්ෂණ උසාවි වාර්තා ඉදිරිපත්කර ඇති ගොනු | 72 |
| 3. | මුදල් රෙගුලාසි 109 යටතේ කපාහැරීම සඳහා කටයුතු කෙරෙමින් පවතින ගොනු | 13 |
| | **එකතුව** | **169** |

වගුව 4:22. ලිපිගොනු විශ්ලේෂණය පිළිබඳ විස්තරය

60. අපහරණ ක්‍රියාපිළිවෙත

අ. 2017 II වන අඩවසර හා 2018 I වන අඩවසරට අදාළව 2018 දි පවත්වන ලද අපහරණ ක්‍රියාවලිය මඟින් ලද පහත සඳහන් ආදායම් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැරකර ඇති අතර 2018 II අඩවසර සඳහා පැවැත්වීමට නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තක්සේරු කිරීමේ කටයුතු මේවන විට සිදුකරමින් පවතියි.

| අනු අංකය | විස්තරය | ලොට් සංඛ්‍යාව | | | ආදායම (රු.) | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2017 / II අඩවසර | 2018 / I අඩවසර | එකතුව | 2017 / II අඩවසර | 2018 / I අඩවසර | එකතුව |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| 1 | අයෝග්‍ය වාහන | 163 | 183 | 346 | 38,579,696.94 | 40,362,746.99 | 78,942,443.93 |
| 2 | අයෝග්‍ය පොදුභාණ්ඩ | 105 | 53 | 158 | 20,204,448.46 | 13,211,709.00 | 33,416,157.46 |
| | **එකතුව** | **268** | **236** | **504** | **58,784,145.40** | **53,574,455.99** | **112,358,601.39** |

වගුව 4.23 ලිපිගොනු විශ්ලේෂණය පිළිබඳ විස්තරය

**වසරේ ජයග්‍රහණ**

61. 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු මූල්‍ය නොවන වත්කම් රුපියල් මිලියන 69,077.34 ක වටිනාකමින් යුත් 377,358 ක වත්කම් ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හඳුන්වාදුන් රාජ්‍ය ආයතන වල මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේ පරිගණක වැඩසටහන (CIGAS) වෙත ගිණුම්ගත කර ඇත.

62. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු ස්ථාවර වත්කම් දත්ත කළමනාකරණය සඳහා 2016 වසරේදී ජාලගත වත්කම් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය සමස්ථ යුද්ධ හමුදාව වෙත හඳුන්වාදුන් අතර මෙම වර්ෂය තුළ එම වැඩසටහන භාවිතා කරන්නන්ගේ පහසුව සඳහා සංවර්ධනය සහ යාවත්කාලීන කිරීම සිදුකරන ලදී. සියලු ස්වයං ගිණුම් තබන මධ්‍යස්ථාන විසින් මෙම වැඩසටහන වෙත දත්ත ඇතුළත්කර ඇති අතර, අවශ්‍ය සියලුම වාර්තා වඩා නිවැරදිව හා පහසුවෙන් ලබාගැනීමට පහසුකම් සලසාදී ඇත. එසේම මෙම පද්ධතිය මගින් ස්ථාවර වත්කම් දත්ත පවත්වාගෙන යාමේ ලිපිද්‍රව්‍ය පිරිවැය සහ වැයවන කාලය අවමකර ගැනීමට අවස්ථාව සැලසී ඇත.

**ගැටළු හා අභියෝග**

63. යුද්ධ හමුදාවේ ස්ථාවර වත්කම් කළමනාකරණය සඳහා පවත්වාගෙන යනු ලබන වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් හඳුන්වාදුන් ජාලගත පරිගණක පද්ධතිය හා රජය සතු මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේ පරිගණක වැඩසටහන (CIGAS) භාවිතය වඩාත් ක්‍රමවත්ව සිදුකිරීමේදි මුහුණ දෙන ගැටලුකාරී තත්වයන් පහත පරිදි වේ:

අ. සම්පත් ඌනතාවය.

ආ. වත්කම් කළමනාකරණය සඳහා සහභාගි වන යුද්ධ හමුදාවේ ආයතන ප්‍රමාණය අධික වීම.

**සාරාංශය**

64. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අනෙකුත් රාජ්‍ය ආයතනවලට සාපේක්ෂව ඉතා විශාල වත්කම් ප්‍රමාණයක් භාවිතා කරන දිවයින පුරා විසිරී පවතින ආයතන විශාල සංඛ්‍යාවකින් සමන්විත රාජ්‍ය ආයතනයකි. එම සියලු ආයතන සතු වත්කම් නිසි ලෙස කළමනාකරණය කරමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස පවත්වාගෙන යන අතර එමඟින් යුද්ධ හමුදාවෙහි මූල්‍ය කළමණාකරනයට උපරිම දායකත්වයක් ලබාදීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරගෙන යනු ලැබේ.

## කෘෂිකර්ම හා පශුසම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය

65. දශක තුනක් පුරා පැවති යුද්ධය නිමාකොට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ජාතික සංවර්ධනයට දායකවීම වෙනුවෙන් විවිධ ව්‍යාපෘති වල නියැළී සිටියි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ආරම්භයේ සිටම කෘෂිකර්ම යෝජනා හා ගොවිපලවල් පවත්වාගෙන ආ අතර, යුද වාතාවරණය මත එම කෘෂිකාර්මික කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ 2010 වර්ෂයේ කෘෂිකර්ම හා පශුසම්පත් අංශය ස්ථාපනය කිරීමට අවස්ථාව උදාවිය. මෙම කෘෂිකර්ම අංශය මගින් දිවයිනේ විවිධ ප්‍රදේශ වල විවිධ ක්ෂේත්‍රයන් යටතේ කෘෂිකර්ම ව්‍යාපෘතීන් ආරම්භ කර ඵලදායී මට්ටමක් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව මෙම කෘෂිකර්ම ව්‍යාපෘති වල කළමණාකාරීත්වය, කාර්යක්ෂමතාව හා උසස් තාක්ෂණික උපදෙස් ලබාදීම වැනි කරුණු අරඹයා 2011 වර්ෂයේදී යුද්ධ හමුදාව තුළ කෘෂිකර්ම හා පශුසම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය නවතමයෙන් ආරම්භ කරන ලදී. දිවයිනේ විවිධ ප්‍රදේශයන්හී මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ස්ථාපිත කොට ඇති ව්‍යාපෘතීන් නිසියාකාරව කළමනාකරණය, තාක්ෂණික උපදෙස් ලබාදීම හා සම්බන්ධීකරණය හේතුවෙන් යුද්ධ හමුදා ගොවිපළවල පසුගිය වසර 07ක කාලසීමාව තුළදී විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. මේ වන විට කෘෂිකර්ම හා පශුසම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉඳුරාම යුද්ධ හමුදා ගොවිපළ 06 ක් පාලනය කරන අතර, දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථානගතව පවතින රෙජිමේන්තු ගොවිපළ 07 ක් කෘෂිකාර්මික කටයුතු අධීක්ෂණයට ලක්කිරීම සිදුකරනු ලබයි.

66. මෙම ගොවිපළ වල සේවයේ නියුතු වෘත්තීය කෘෂිකාර්මික සෙනීන් වෙනුවෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම සඳහා සහ යුද්ධ හමුදාවෙන් විශ්‍රාම යාමට නියමිත කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් කැමැත්තක් දක්වන නිලධාරීන් හා සෙසුනිලයන්ගේ කෘෂිකාර්මික දැනුම වර්ධනය කිරීමේ අරමුණ සඳහා 2017 අප්‍රේල් මස සිට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ආදර්ශ ගොවිපළ අරලගංවිල ප්‍රදේශයෙහි ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී

**මූල්‍ය තොරතුරු**

67. 2018 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වල ප්‍රගතිය 2018.12.31 දිනට.

| අනු අංකය | වැය ශීර්ෂය | විස්තරය | ප්‍රතිපාදන (රු.) | මුළු වියදම (රු.) | මුළු බැඳීම (රු.) | මුළු බැඳීම හා වියදම එකතුව (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| **පුනරාවර්තන වියදම** | | | | | | | |
| 1. | 222-01-2-1205(xxvi) | කෘෂිකාර්මික පරිභෝජන ද්‍රව්‍ය | 3,800,000.00 | 3,760,223.50 | - | 3,760,223.50 | 39,776.50 |
| **ප්‍රාග්ධන වියදම** | | | | | | | |
| 2. | 222-01-1-1-2509 | ආදායම් උපදවන වාණිජ ව්‍යාපෘති | 4,000,000.00 | 1,397,000.00 | 2,073,250.00 | 3,470,250.00 | 529,750.00 |

වගුව 4:24. මූල්‍ය විස්තරය

**ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදාගත් ආකාරය**

68. කෘෂිකාර්මික කටයුතු ඉහළ නැංවීම වෙනුවෙන් පුනරාවර්තන වැය ශීර්ෂය මගින් රු. 3,760,233.50ක කෘෂිකාර්මික උපකරණ (උදළුතල, විල්බැරෝ, ආරක්ෂිත ගෘහ සඳහා උපකරණ ආදිය) මිලදී ගැනීම හා එම උපකරණ ගොවිපළ වෙත බෙදාදීම.

69. ගොවිපල නිෂ්පාදන මට්ටම ඉහළ නැංවීම වෙනුවෙන් මුලධන වැය ශීර්ෂය යටතේ රු.3,470,250.00ක කෘෂි යන්ත්‍රෝපකරණ (රෝද 02 ට්‍රැක්ටර්, රෝද 4 ට්‍රැක්ටර්, මිනිකල්ටිවේටර් ආදිය) මිලදී ගැනීම හා එම උපකරණ ගොවිපළ වෙත බෙදාදීම.

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

70. තිරසර ගොවිතැන ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ දේශීය වී අක්කර 100ක් වගාකිරීම.





71. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා යුද්ධ හමුදාව ඒකාබද්ධව කෙටිකාලීන හා දිගුකාලීන භෝග වගා ව්‍යාපෘති පවත්වාගෙන යාමට කටයුතු කිරීම.





72. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව බඩඉරිඟු සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල බීජ නිෂ්පාදන කටයුතු යුද්ධ හමුදා ගොවිපළවල ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.





73. යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩුහි ස්පිරුලිනා ඇල්ගී භාවිතයෙන් අධි ප්‍රෝටීනමය අගය එකතුකරන ලද ආහාර නිෂ්පාදනය කිරීම.





74. යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාව මගින් පවත්වාගෙන යනු ලබන යුද්ධ හමුදා සුබසාධක වෙළඳසැල් වෙත එළවළු සහ සත්ත්ව නිෂ්පාදන (මුදවන ලද කිරි, බිත්තර සහ කුකුළු මස්) සැපයීමට කටයුතු කිරීම.





75. යුද්ධ හමුදා ගොවිපල කන්දකාඩුහි කෘෂි පාරිසරික සංචාරක කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කිරීම.





76. යුද්ධ හමුදා ගොවිපල කන්දකාඩුහි කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.





77. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ටෙන්ඩර් කැඳවනු ලබන එළවළු, පළතුරු, බිත්තර සහ කුකුළු මස් යුද්ධ හමුදා ගොවිපලතුළ නිෂ්පාදනය කර යුද්ධ හමුදා සලාක අවශ්‍යතාව වෙනුවෙන් ලබාදීමට ක්‍රියා කිරීම.

78. සුභසාධක මිල ගණන් යටතේ ගොවිපල නිෂ්පාදන (මුදවන ලද කිරි, බිත්තර, එළවළු සහ පළතුරු) යුද්ධ හමුදා සාමාජිකයින් හට හා ගොවිපල අවට ජනතාවට ලබාදීමට කටයුතු කිරීම.

**වසරේ ජයග්‍රහණයන්**

79. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව බඩඉරිඟු සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල බීජ නිෂ්පාදන කටයුතු යුද්ධ හමුදා ගොවිපලවල ආරම්භ කර පවත්වාගෙන යාම තුළින් වැඩි ආදායමක් යුද්ධ හමුදාව වෙත ලබාගැනීම සහ ගුණාත්මක බවින් උසස් බීජ ගොවීන් වෙත ලබාදීම සඳහා යුද්ධ හමුදා දායකත්වය ලබාදීමට කටයුතු කිරීම.

80. අධි ප්‍රෝටීන ස්පිරුලිනා ඇල්ගී නිෂ්පාදනය කිරීම තුළින් ඉහළ පෝෂණ අගයකින් යුත් ආහාර නිෂ්පාදනයක් වෙළඳපොලට හඳුන්වාදීමට කටයුතු කිරීම.

81. යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාව මගින් පවත්වාගෙන යනු ලබන සුභසාධක වෙළඳසැල් වෙත එළවළු සහ සත්ත්ව නිෂ්පාදන (මුදවන ලද කිරි, බිත්තර සහ කුකුළු මස්) සැපයීමට කටයුතු කිරීම.

82. සුබසාධක මිල ගණන් යටතේ ඉහළ ගුණාත්මයෙන් යුතු ගොවිපල නිෂ්පාදන (කිරි, බිත්තර, එළවළු සහ පළතුරු) යුද්ධ හමුදා සාමාජිකයින් හට හා ගොවිපළ අවට ජනතාවට ලබාදීමට ක්‍රියා කිරීම.

83. යුද්ධ හමුදාව වෙත අවශ්‍ය කැළෑ සලාක මළු නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩුහි නවතයෙන් ආරම්භ කිරීමට කටයුතු කිරීම.

**ගැටළු සහ අභියෝග**

84. යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩුහි උසස් ආරයෙන් යුතු දෙමුහුන් කිරි ගවයින් 3000ක ගෙන් සමන්විත කිරිගව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ව්‍යාපෘති යෝජනාවක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, එය ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම පිණිස ඉදිරිපත් කරන ලද අතර, මේ දක්වා ඒ සඳහා අනුමැතියක් ලබාදී නොමැති බවත්, එයට අදාළ මූල්‍යමය ප්‍රතිපාදනවල හිඟයක් පවතින බැවින් මේ වනවිට යෝජනා මට්ටමේ පවතියි.

85. තිරසර ගොවිතැන ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩුහි දේශීය වී වගා කිරීමේ ව්‍යාපෘතිය අක්කර 100 සිට අක්කර 200ක ප්‍රමාණයක් දක්වා වැඩි කිරීමට අවශ්‍ය ජල අවශ්‍යතාව මහවැලි අධිකාරිය වෙතින් ලබාගැනීමට අපහසු බැවින් එය ක්‍රියාත්මක කිරීම අභියෝගයක්ව පවතියි.

86. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව බඩඉරිගු හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග වල බීජ නිෂ්පාදන කටයුතු යුද්ධ හමුදා ගොවිපල වල ආරම්භකර පවත්වාගෙන යාම සඳහා ජලය ප්‍රමාණවත් පරිදි යොදා ගැනීමට අපහසු වීම සහ කෘමි වසන්ගත තත්ත්වයන් හේතුවෙන් වගාව නිසියාකාරව පවත්වාගෙන යාම අභියෝගයක්ව පැවතීම.

87. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ටෙන්ඩර් කැඳවනු ලබන ආදේශක මසකට එක් වරක් පමණක් මිලදී ගැනීම, කෘෂි නිෂ්පාදන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය වෙත සැපයීම වැඩිකිරීමේදී මුහුණ දෙන ගැටළුවකි. දෛනික සලාක වට්ටෝරුවෙන් එක් වර්ගයක් යුද්ධ හමුදා ගොවිපලයන් වෙතින් පමණක් ලබාගැනීම සහ කෘෂි නිෂ්පාදන සැපයීමේදී ප්‍රායෝගිකව මුහුණදෙන ගැටළුවක් ලෙස පෙන්වා දිය හැක.

88. 'පරිසර නියමු හරිත සෙබල වැඩසටහන' යටතේ ආධුනික පුහුණු පාඨමාලා හදාරා විසිර යන සෙබළුන් හට ආර්ථිකමය වටිනාකමකින් යුත් පැළ 10 ක ප්‍රමාණයක් ලබාදීමේ වැඩසටහන යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය දැව සංස්ථාවේ සහයෝගීතාවය මත සහ යුද්ධ හමුදා ගොවිපළ වෙතින් පැළ ලබාදීම සිදුකරනු ලබන අතර, ඉහත රාජ්‍ය ආයතනයන් (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව රාජ්‍ය දැව සංස්ථාව) වෙතින් මේ වනවිට සීමිත පැළ ප්‍රමාණයක් ලබාදීම තුළින් එම පැළ නියමිත වේලාවන් තුළදී නිකුත් කිරීමේ අභියෝගයන්ට මුහුණ පෑමට සිදුවී ඇත.

**සාරාංශය**

89. යුද්ධ හමුදාවට අවශ්‍ය විදෙස් රටවලින් ආනයනය කරන ලද පිසූ ආහාර (MRE Packet) වෙනුවට මෙරටදීම පිසූනිමි ආහාර පැකට් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩුහි ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

90. යුද්ධ හමුදාව වෙත දෛනිකව අවශ්‍ය කිරිපිටි සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් එයට පිළියමක් ලෙස යුද්ධ හමුදාවේ දෛනික අවශ්‍යතාව සඳහා දියරකිරි නිෂ්පාදනය කිරීමේ අරමුණින් දෙමුහුන් කිරි ගවයින් 3,000ක ප්‍රමාණයක කිරිගව ගොවිපළක් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩුහි ස්ථාපිත කිරීමට සැලසුම් කිරීම.

91. පරිසරය සංරක්ෂණය කිරීමේ අරමුණ ඇතිව ජල විදුලි බලාගාර ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශවල හා රටේ විවිධ ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් 2017 හා 2018 වර්ෂ තුළදී සිදුකරන ලද රුක් රෝපණ වැඩසටහන් ඉදිරි වර්ෂය තුළදී සිදුකිරීම.

92. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ මූලික කෘෂිකාර්මික දැනුම වැඩිදියුණු කිරීම හා පරිසර හිතකාමී කෘෂිකාර්මික ක්‍රමවේද සමාජය තුළ ප්‍රචලිත කිරීම සඳහා අධ්‍යාත්මික ජෛවගතික හෙළ ගොවිතැන් කෘෂිකාර්මික සහතිකපත් පාඨමාලාව කෘෂිකර්ම හා පශුසම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධීක්ෂණය යටතේ තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

## යුහ යහසාධක අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩලය

93. යුද්ධ හමුදාවේ සාමාජිකයින් හට ඉතිරි කිරීමේ පලපුරුද්ද හා සකසුරුවම් බව ඇති කිරීම අරමුණු කරගෙන යුද්ධ හමුදා සුබසාධක අරමුදල 1981 වසරේදී ආරම්භ කරන ලද අතර, එම අරමුදල 1996 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා යහසාධක අරමුදල වශයෙන් නම් කරන ලදි. එහි කාර්යයන් තවදුරටත් විකාශනය වීම හේතුවෙන් සහසාධක අරමුදල 2009 අගෝස්තු මස 30 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයක් බවට පත් කරන ලදී.

94. සාමාජිකයින් වෙතින් දායක මුදල් ලබා ගැනීම හා එම දායක මුදල් ලාභදායික ලෙස හා ආරක්ෂාකාරී ලෙස ආයෝජනය කිරීම තුළින් ඉහල ප්‍රතිලාභ ලබා ගැනීම.

95. මූලික කාර්යයන් පහත පරිදි වේ:

අ. යුද්ධ හමුදා සාමාජිකයින් හට මෙම අරමුදලේ සාමාජිකත්වය ලබාදීම.

ආ. සාමාජිකයින්ගෙන් දායක මුදල් ලබා ගැනීම හා ලෙජර්පත් නඩත්තු කිරීම.

ඇ. දායක මුදල් රාජ්‍ය බැංකු භාණ්ඩාගාර බිල්පත් වල කෙටි හා දිගු කාලීනව ආයෝජනය කිරීම.

ඈ. තැන්පතු සඳහා ලැබෙන පොලියෙන් සාමාජිකයින් හට වැඩි පොලි අනුපාතයක් ලබාදීම.

ඉ. තැන්පතු මුදලින් 85% ණය මුදලක් ලබාදීම.

ඊ. සාමාජිකයින් හට සාමාජික මුදලින් 80% ක මුදලක් ලබාදීම.

උ. විශ්‍රාම යාමේදී ප්‍රතිලාභ මුදල් ගෙවීම.

ඌ. ප්‍රතිලාභීන් හට ප්‍රතිලාභ මුදල් ගෙවීම. (සාමාජිකයා මිය ගිය විට).

එ. සුවසහන ආපදා ණය පහසුකම් සැපයීම හා දේපල ණය සඳහා මුදල් ලබාදීම.

ඒ. ක්‍රියාන්විත හේතුන් මත මිය ගිය අයවලුන්ගේ (KIA) යැපෙන්නන් සහ ක්‍රියාන්විත හේතුන් මත තුවාල සිදු වු අයවළුන් (WIA) සඳහා රණවිරු සහන නම් වු ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

**වසරේ කාර්යසාධන සාරාංශය**

96. 2018 වර්ෂය තුළදී පහත සඳහන් පරිදි අරමුදල තුළින් සාමාජිකයින් සඳහා ගෙවීම් සිදුකර ඇත.

| අනු අංකය | විස්තරය | ගෙවීම් සිදුකර ඇති සාමාජිකයින් ගණන | වටිනාකම (රු. මිලියන) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | 85% ණය | 14,935 | 4,147.64 |
| 2. | 80% ආපසු ගෙවීම් | 5,022 | 3,035.64 |
| 3. | අවසන් ගෙවීම් | 12,789 | 5,589.24 |
| 4. | අත්තිකාරම් 'බී' ගිණුම් | 294 | 3.14 |
| 5. | රණවිරු සහන | 752 | 630.5 |
| 6. | සුවසහන ණය | 1,790 | 1,806.77 |

වගුව 4.25. අරමුදල තුළින් සාමාජිකයින් සඳහා ගෙවීම් සිදුකිරීම් පිළිබඳ විස්තරය

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

97. යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයින් 2,948 ක් සඳහා 2018 වර්ෂයේදී මෙම අරමුදලේ නව සාමාජිකත්වය ලබා දී ඇති අතර 2018.12.31 දින වනවිට සම්පූර්ණ ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාව 156,587 ක් වේ.

**<u>ගැටළු හා අභියෝග</u>**

98. යහසාධක අරමුදල තුළ දැනට ක්‍රියාත්මක (FMS) පද්ධතිය වෙනුවට අරමුදල් කළමනාකරණය හා සාමාජික ගෙවීම් වඩා වේගවත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා නව ජාලගත පරිගණක පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු සූදානම් කරමින් පවතියි.

**<u>සාරාංශය</u>**

99. යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම දීර්ඝකාලීන හා කෙටිකාලීන සැලසුම් සකස් කිරීමේදී යුහ යහසාධක අරමුදලේ සාමාජිකයින්ගේ සුභසාධනය උපරිම කිරීමේ අරමුණ පෙරදැරිව අරමුදලේ ශුද්ධ වත්කම් උපරිම කර ගැනීම පිණිස කටයුතු කර ඇත.

100. එමෙන්ම සියලු කළමණාකාරිත්ව තීරණ ගැනීමේදී යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයන්ට අනුව ආයතනය සතු මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝගී කර ගනිමින් ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීමට හා යුද්ධ හමුදාවේ වෘත්තිමය හැකියාවන් ඔප්නැංවෙන අයුරින් කටයුතු කිරීමටද වගබලාගනු ලැබේ.

**<u>මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

101. මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි රාජ්‍ය මුදල් සබැඳි විශේෂ කාර්යයක් සිදු කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වේ. තවද, රජයේ මුදල් රෙගුලාසි වලට අනුව සහ රාජ්‍ය මුදල් සබැඳි අණපනත්, චක්‍රලේඛණ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මඟින් නිකුත්කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ඊට අදාල යාවත්කාලීන කිරීම් හා මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන මාර්ගෝපදේශනයන්ට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ මහජන මුදල් විදයම් කිරීම, ගිණුම්ගත කිරීම හා අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වේ.

102. වාර්ෂික අයවැය මත පදනම්ව මහා භාණ්ඩාගාරය වෙතින් දෙපාර්තමේන්තුව වෙත නිදහස් කරනු ලබන ද්‍රවශීල මුදල් කළමනාකරණය කිරීම සහ ඊට අදාළ කටයුතු අධීක්ෂණය කිරීමද, මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදු කරනු ලබයි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**<u>මූල්‍ය තොරතුරු</u>**

103. 2018 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා රු.බි. 158,172 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර දී ඇති අතර, 2018 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සහ 2018.12.31 දිනට එම ප්‍රතිපාදනයන්ගෙන් සිදුකරන ලද පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් අගයන් පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | මුළු ප්‍රතිපාදන වටිනාකම 2018 වර්ෂය (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) | 2018.12.31 දිනට ප්‍රතිපාදන ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| **<u>පුනරාවර්තන වියදම්</u>** | | | | |
| 1. | පුද්ගල වැටුප්/වේතන (1001-1003) | 119,985,095,000.00 | 117,622,963,511.02 | 2,362,131,488.98 |
| 2. | වෙනත් පුනරාවර්තන (1101-1508) | 29,150,077,975.00 | 24,434,966,694.45 | 4,715,111,280.55 |
| 3. | අලාභ (1701) | 22,750.00 | 22,750.00 | - |
| | **එකතුව** | **149,135,195,725.00** | **142,057,952,955.47** | **7,077,242,769.53** |
| **<u>ප්‍රාග්ධන වියදම්</u>** | | | | |
| **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම්** | | | | |
| 4. | ගොඩනැගිලි හා ඉදිකිරීම් (2001) | 250,000,000.00 | 199,592,063.33 | 50,407,936.67 |
| 5. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (2002) | 220,000,000.00 | 141,462,327.82 | 78,537,672.18 |
| 6. | වාහන (2003) | 300,000,000.00 | 263,135,151.54 | 36,864,848.46 |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 7. | වාහන (2101) | 63,549,275.00 | 21,939,665.00 | 41,609,610.00 |
| 8. | ගෘහ කාර්යාලීය උපකරණ (2102) | 125,000,000.00 | 129,214,163.99 | (4,214,163.99) |
| 9. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (2103) | 878,650,000.00 | 524,625,436.80 | 354,024,563.20 |
| 10. | ගොඩනැගිලි හා ඉදිකිරීම් (2104) | 2,132,328,000.00 | 1,638,235,826.69 | 494,092,173.31 |
| 11. | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් (2105) | 1,000,000.00 | 202,555.50 | 797,444.50 |
| 12. | පුහුණු කිරීම් සහ හැකියා වර්ධන (2401) | 1,400,000,000.00 | 1,166,075,312.46 | 233,924,687.54 |
| 13. | සාම සාධක මෙහෙයුම් (2509) | 1,624,000,000.00 | 1,589,794,805.05 | 34,205,194.95 |
| 14. | අනෙකුත් ආයෝජන (250912) | 1,844,172,000.00 | 199,127.52 | 1,843,972,872.48 |
| 15. | අනෙකුත් ආයෝජන (250917) | 199,000,000.00 | 135,893,363.15 | 63,106,636.85 |
| | **එකතුව** | **9,037,699,275.00** | **5,810,369,798.85** | **3,227,329,476.15** |
| | **මුළු එකතුව** | **158,172,895,000.00** | **147,868,322,754.32** | **10,304,572,245.68** |

වගුව 4.26. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් අගයන් පිළිබඳ විස්තරය

104. අත්තිකාරම් ගිණුම

| අනු අංකය | අත්තිකාරම් ගිණුම | වටිනාකම (රු.) |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | උපරිම සීමාව | 3,815,000,000.00 |
| 2. | 2018.12.31 දිනට වියදම | 3,722,004,371.39 |
| 3. | 2018.12.31 දිනට ලැබීම් | 2,577,218,835.66 |

වගුව 4.27. අත්තිකාරම් ගිණුම පිළිබඳ විස්තරය

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

105. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත 2018 වර්ෂය සඳහා වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදනයන්ට අදාළ බිල්පත් නිරවුල් කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගන්නා ලද සියලුම ද්‍රවශීල මුදල් ඉතා ඵලදායී ලෙස උපයෝජනය කර ඇත. තවද, කාර්යක්ෂමව වැඩ පරිසරයකට ගැලපෙන අයුරින් කාර්යාල පරිශ්‍රය පවත්වාගෙන යාම අරමුණු කර ගනිමින් භූමි නඩත්තු සඳහා වෙන්කළ සියලුම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය තුල සේවය කරනු ලබන යුද්ධ හමුදා කාර්යය මණ්ඩලයේ සහ සිවිල් කාර්යය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම අරමුණින් දිනපතා පුවත්පත් සහ ඉංග්‍රීසි සහ සිංහල භාෂා මාධ්‍යයෙන් යුත් සතිඅන්ත පුවත්පත් දෙකක් මිලදී ගන්නා ලදී.

**වසරේ කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

106. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත 2018 වර්ෂය සඳහා වෙන්වූ මූල්‍ය ප්‍රතිපාදනයන්ගෙන් රු.147,868,322,754.32ක විටිනාකමකට අදාළ බිල්පත් නිරවුල් කිරීම සඳහා වන ද්‍රවශීල මුදල් මහා භාණ්ඩාගාරය සමග සම්බන්ධතාවයෙන් යුතුව ලබා ගෙන ඒ අනුව බිල්පත් නිරවුල් කිරීමේ කටයුතු සිදුකරන ලදී. තවද, 2018 වර්ෂය සඳහා වෙන්වූ මුළු ප්‍රතිපාදන වටිනාකම සමග මෙම ද්‍රවශීල මුදල් වටිනාකම සංසන්ධනය කිරීමේ දී එය 93.48% ක ප්‍රතිශතාත්මක අගයක් ගනු ලබයි. මේ අනුව 2018 වර්ෂය තුළ කාර්යක්ෂම හා ඵලදායී මුදල් කළමනාකරණයක් පවත්වා ගැනීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි වී ඇත. දෙපාර්තමේන්තුවෙහි ද්‍රවශීල මුදල් කළමනාකරණයට අදාළ සාරාංශගත තොරතුරු පහත පරිදි වේ:

| අනු අංකය | විස්තරය | මුළු ප්‍රතිපාදන වටිනාකම 2018 වර්ෂය (රු.) | සත්‍ය වියදම (2018 වර්ෂයට ලද ද්‍රවශීල මුදල් වටිනාකම) (රු.) | සත්‍ය වියදම මුළු ප්‍රතිපාදන වටිනාකමෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂ විස්තරය | 9,037,699,275.00 | 5,810,369,798.85 | 64.29% |
| 2. | පුනරාවර්තන වියදම් වැය ශීර්ෂ විස්තරය | 149,135,195,725.00 | 142,057,952,955.47 | 95.25% |
| 3. | මුළු වැය ශීර්ෂ එකතුව පිළිබඳ විස්තරය | **158,172,895,000.00** | **147,868,322,754.32** | **93.48%** |

වගුව 4.28. ද්‍රවශීල මුදල් කළමනාකරණයට අදාල සාරාංශය

107. තවද, මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි 2017 වර්ෂයට අදාළ පහත සඳහන් ගිණුම්, ඒ ඒ ගිණුම් ඉදිරිපත් කලයුතු නියමිත දිනයට පෙර විගණකාධිපති වෙත සහ අනෙකුත් අදාල බළධාරීන් වෙත ඉදිරිපත් කිරීමට සමත් වී ඇත:

අ. විසර්ජන ගිණුම.
ආ. අත්තිකාරම් 'බී' ගිණුම.
ඇ. දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන (උපචිත පදනම මත).

**වසරේ ජයග්‍රහණයන්**

108. මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව කඩිනමින් ද්‍රවශීල මුදල් ලබා ගැනීම මගින් දෙපාර්තමේන්තුවෙහි බිල්පත් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සමත් වූ අතර, එමගින් බිල්පත් නිරවුල් කිරීමට අදාල ප්‍රමාද කාලය අවම කර ගැනීම මගින් 2019 වර්ෂයට ඉදිරියට ගෙන යනු ලබන බැරකම් වටිනාකම අවම කිරීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සමත් විය.

**ගැටළු සහ අභියෝග**

109. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් හඳුන්වා දී ඇති පරිගණක ගත "CIGAS" ගිණුම්කරණ පද්ධතිය භාවිතා කරනු ලබන අතර, මෙම පරිගණක පද්ධතියට අමතරව විධිමත් සහ ඵලදායී ලෙස රාජ්‍ය ආදායම් කළමනාකරණය සහතික කිරීම සඳහා සහ ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරය මගින් "ITMIS" නමින් නව පරිගණක පද්ධතියක්ද හඳුන්වා දීමට කටයුතු කරමින් පවතියි. මෙම තත්වය තුළ දැනට පවතින "CIGAS" පරිගණක පද්ධතිය සහ නවතමයෙන් හඳුන්වාදීමට නියමිත "ITMIS" පරිගණක පද්ධතිය තුළ කාර්යයන් ඉටු කිරීම සඳහා පවතින තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ එම පද්ධති හසුරුවාලීම සඳහා වන පුහුණු කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට අභියෝගයක්ව පවතියි.

**සාරාංශය**

110. වර්තමානයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අභ්‍යන්තරිකව මෙන්ම බාහිරින් ඇතිවන ගැටළු රැසකට මුහුණ දෙමින් පශ්චාත් යුධ වාතාවරණයක් තුළ කටයුතු කරනු ලබයි. තවද, මීට පෙර පැවති තත්ත්වයන්ට වඩා වර්තමානයේදී රාජ්‍ය ආයතන වල මූල්‍ය කටුයතු සැබැඳි දැඩි මූල්‍ය විනයක් රජය විසින් පවත්වාගෙන යනු ලබන අතර, මෙම තත්ත්වය තුළ දෙපාර්තමේන්තුවෙහි මූල්‍යමය ගනුදෙනු සබැඳිව පෙර පැවතියාටත් වඩා විනිවිදභාවයක් සහ වගවීමක් පවත්වාගෙන යා යුතුවේ.

111. එසේම, දෙපාර්තමේන්තුවෙහි සියලුම මුදල් ගනුදෙනු සබැඳි විනිවිදභාවය හා වගවීම පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය මුදල් රෙගුලාසි හා ඒ සම්බන්ධ අණපනත්, චක්‍රලේඛණ හා මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙනු ලබන අණපනත් සහ කාලීනව අදාල රෙගුලාසීන් හි සිදුවන යාවත්කාලීන වීම් අනුව ඉතා උසස් සහ වෘත්තීය මට්ටමින් යුතුව දෙපාර්තමේන්තුවෙහි සියළු මූල්‍ය ගනුදෙනු ගිණුම් ගත කිරීම, වාර්තා කිරීම සහ ඒ හා සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර, මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් රාජ්‍ය අංශයට මෙන්ම සමස්ථ වශයෙන් මුළු ශ්‍රී ලංකාවටම ඵලදායී සහ කාර්යක්ෂම මූල්‍ය සේවාවක් සැපයීමට හැකි වේ.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## විධායක ජෙනරාල් ශාඛාව

1. ප්‍රධාන මාණ්ඩලික නිලධාරි තනතුර හොබවනු ලබන මේජර් ජෙනරාල් නිලයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරින් අතුරින් යුද්ධ හමුදා මූලස්ථානයෙහි විධායක ජෙනරාල් ශාඛාවෙහි ආයතන ප්‍රධානී වන විධායක ජෙනරාල් විසින් විනය නියමයන්, සේවා රෙගුලාසි හා උත්සව වෙනුවෙන් යුද්ධ හමුදා නිතීයට යටත්ව වගකීම් දරනු ලබන අතර, පරිපාලනමය විෂය පථයට අදාළව සියලුම කරුණු සබැඳිව යුද්ධ හමුදාධිපති වෙත වගකීම් දරනු ලැබේ.




රූප සටහන 5:1 විධායක ජෙනරාල් ශාඛාව යටතේ ඇති ආයතන

**මූල්‍ය තොරතුරු**

2. මූල්‍ය තොරතුරු පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අභ්‍යාස දීමනා ගිණුම | 37,000.00 | 37,000.00 | - |
| 2. | ලිපි ද්‍රව්‍ය ප්‍රතිපාදන (222-01-2-1201) | 290,000.00 | 262,419.65 | 27,580.35 |
| 3. | පවිත්‍රතා ද්‍රව්‍ය ප්‍රතිපාදන (222-01-2-1205(xxiv) | 12,000.00 | 12,000.00 | - |

වගුව 5:1. මූල්‍ය විස්තරය

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

3. මෙම ශාඛාවෙහි නිලධාරී/ සෙසුනිල හා සිවිල් සේවක මහතුන්ගේ පාලන කටයුතු වෙනුවෙන් ඇවැසි ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු සඳහා ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදා ගන්නා ලදී.

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

4. විශ්‍රාමික නිලධාරී/සෙසුනිලයින් වෙනුවෙන් නව මරණාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

5. සේවාමුක්ත භට සංගමය වෙත රුපියල් මිලියන 08 ක මුදලක් ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන වෙතින් සහ යුද්ධ හමුදාධිපති සුභසාධන ගිණුම වෙතින් නිරවුල් කිරීමේ කටයුතු සිදුකිරීම.

6. ජාතික නිදහස් දින උත්සවයෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම.

7. යුද්ධ හමුදා මූලස්ථාන බක්මහ උළෙලෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම.

8. වෙසක් හා පොසොන් උත්සවයෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම.

9. යුද්ධ හමුදා දින සැමරුම් උත්සවයෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම.

10. රණවිරු අනුස්මරණ උත්සවයෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

11. සෙසුනිලයින්ගේ විවිධ පරිපාලනමය ගැටලු නිරාකරණය කරගැනීම සඳහා වන උපදෙස් නිකුත් කිරීම තුළින් නිල උසස්වීම, වැහැදී සකස්වීම් ආදී ඔවුන්ගේ යුද්ධ හමුදා දිවිය සාර්ථක කර ගැනීමට අවැසි සුභසාධන කටයුතු බොහොමයක් ක්‍රියාත්මක කරවීම.

12. සේවාමුක්ත භට සංගම් වෙත මූල්‍යාධාර ලබාදීමට අවැසි ඉදිරි කටයුතු සිදුකර අදාල සංගමයෙහි සංවර්ධනයට යුද්ධ හමුදාව වෙතින් වක්‍රාකාරව දායකත්වයක් සැපයීමට හැකිවීම.

13. විශ්‍රාමික නිලධාරී/සෙසුනිලයින් වෙනුවෙන් නව මරණාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

14. රණවිරු අනුස්මරණ උත්සවය සාර්ථකව පැවැත්වීමට හැකිවීම.

15. ජාතික නිදහස් දින උත්සවය සාර්ථකව පැවැත්වීමට හැකිවීම.

16. වෙසක් හා පොසොන් උත්සවයෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම තුළින් එම උත්සවයන් උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට හැකිවීම.

17. යුද්ධ හමුදා දින සැමරුම් උත්සවයෙහි සංවිධාන කටයුතු සබැඳිව අධීක්ෂණය කිරීම තුළින් එම උත්සවය සාර්ථකව පැවැත්වීමට හැකිවීම.

**<u>ගැටළු සහ අභියෝග</u>**

18. අතිරේක රෙජිමේන්තු සේවා කාලසීමාව අවසන් වූ පැරණි ලිපිකරුවන් බොහොමයක් නැවත තම රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත රපෝර්තු කරවා ඇති අතර, එම ලිපිකරුවන් වෙනුවෙන් පැමිණි අනුප්‍රාප්තික ලිපිකරුවන්ගේ විෂය දැනුම අවම වීම.

**<u>සාරාංශය</u>**

19. යුද්ධ හමුදා සෙසුනිල සාමාජිකයින්ගේ සුභසාධන කටයුතු සහ පරිපාලන කටයුතු, යුද්ධ හමුදා තූර්ය වාදක කණ්ඩායම් ලබාදීම, රාජ්‍ය/යුද්ධ හමුදාමය උත්සව කටයුතු සංවිධානය කිරීම හා අධීක්ෂණය කිරීම, කෙඩෙට් නිලධාරීන්/ සෙසුනිල බඳවාගැනීම් ආදී කටයුතු සබැඳිව වන මෙම ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල වෙත උපදෙස්/නියෝග නිකුත් කර සක්‍රීය සේවයෙහි යෙදී සිටින සෙසුනිලයින්ගේ මෙන්ම මියගිය අයවලුන්ගේ ඥාතීන්ට හා අබාධිත රණවිරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අවැසි පියවර ගනිමින් විනයගරුක යුද්ධ හමුදාවක් බිහිකිරීමට මෙම ශාඛාව වෙතින් කටයුතු කරනු ලබයි.

20. එමෙන්ම, මෙම ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩලයන්හි පාලනමය ගැටලු නිරාකරණය කරදීමෙන් හා ආයතනික අවශ්‍යතා ඉටුකරදීමට අවැසි ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් එම ආයතනයන්හි අභිවෘද්ධිය උදෙසාද මෙම ශාඛාව වෙතින් කටයුතු කරනු ලබයි.

## පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය

21. 1981 ජනවාරි මස 01 දින දරන යුද්ධ හමුදා නියෝග 01/81 මඟින් සංස්ථාපිත යුද්ධ හමුදා මූලස්ථානයෙහි සංස්ථාව අනුව විධායක ජෙනරාල් ශාඛාව යටතේ පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය ස්ථාපනය කර ඇත. මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සෙසුනිලයින් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගන්වන අවස්ථාව දක්වා සියලු පරිපාලනමය කටයුතු, නිලධාරී හා සෙසුනිලයින්ගේ ඇඳුම් ආයිත්තම්, සේවය ඇගයීම වෙනුවෙන් හිමිගන්වන ප්‍රසාදනා, පළඳනා හා පදක්කම්, හමුදා නියෝග හා ප්‍රතිපත්ති සකස් කිරීම, රාජ්‍ය සහ හමුදා උත්සව සංවිධානය කිරීම සහ සෙසුනිලයින්ගේ පරිපාලන කටයුතු සිදුකිරීම වැනි කාර්යන් රාශියක් ඉටු කරනු ලබයි

### මූල්‍ය තොරතුරු

22. වැය ශීර්ෂය

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | කැටයම් හා සැරසිලි (222-01-1-1409 (i)) | 1,100,000.00 | 1,093,304.10 | 6,695.90 |
| 2. | ප්‍රසිද්ධ කිරීම් හා ප්‍රචාරණ කටයුතු (222-01-1-1409 (vi)) | 19,986,530.00 | 19,983,409.36 | 3,120.64 |
| 3. | ප්‍රසිද්ධ කිරීම් හා ප්‍රචාරණ කටයුතු (222-01-3-1409 (vi)) | 1,500,000.00 | 1,430,386.30 | 69,613.70 |
| 4. | ප්‍රසිද්ධ කිරීම් හා ප්‍රචාරණ කටයුතු (222-01-2-1409 (vi)) | 1,950,000.00 | 1,900,855.00 | 49,145.00 |
| 5. | සම්මුඛ පරීක්ෂණ - නිත්‍ය (වැටුප් හා ලේඛන අධ්‍යක්‍ෂ මණ්ඩලය) (222-01-1-1409 (xviii)) | 1,200,000.00 | 1,571,345.00 | (371,345.00) |
| 6. | සම්මුඛ පරීක්ෂණ - නිත්‍ය (මුදල් අධ්‍යක්‍ෂ මණ්ඩලය) (222-01-1-1409 (xviii)) | 500,000.00 | 338,929.80 | 161,070.20 |
| 7. | සම්මුඛ පරීක්ෂණ - ස්වේච්ඡා (වැටුප් හා ලේඛන අධ්‍යක්‍ෂ මණ්ඩලය) (222-01-4-1409 (xviii)) | 500,000.00 | 142,530.00 | 357,470.00 |
| 8. | ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අලාභ හානිවීම් (222-01-1-1508 (iii)) | 100,000.00 | - | 100,000.00 |
| 9. | භාෂා පරිවර්ථක ගාස්තු (222-01-1-1409 (xxiv)) | 350,000.00 | 228,358.00 | 121,642.00 |

වගුව 5:2. මූල්‍ය විස්තරය

23. විදේශ දීමනා සාරාංශය.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන් කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | විදේශ සංචාර (222-01-1-1102(i)) | 1,211,000,000.00 | 158,077,554.00 | 1,052,922,446.00 |
| 2. | විදේශ පාඨමාලා (222-01-1-2401(iii)) | 105,000,000.00 | 609,038,773.40 | -504,038,773.40 |

වගුව 5:3. විදේශ දීමනා සාරාංශය

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

24. ජාතික නිදහස් දින සැමරුම් උත්සවය පැවැත්වීම, වෙසක් කලාප හා පොසොන් උත්සව සංවිධානය කිරීම, කෙඩෙට් හා වෘත්තීය නිලධාරීන් බඳවාගැනීම හා සෙසුනිලයින් අධිකාරියට පත්කිරීම, මෙරටට පැමිණෙන රාජ්‍ය නායකයින් පිළිගැනීම සඳහා උත්සව කටයුතු සංවිධානය, යුද්ධ හමුදා පිරික්සුම් පහන් සංදර්ශන පැවැත්වීම හා ප්‍රදර්ශනය කිරීම, රණවිරු උපහාර උත්සව කටයුතු වැනි කාර්යයන් සඳහා ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදා ගන්නා ලදී.

**වසරේ කාර්ය සාධන සාරාංශය**

25. පදක්කම් ප්‍රදානය කිරීම.

| අනු අංකය | පදක්කම් | පදක්කම්ලාභීන් | | එකතුව |
|---|---|---|---|---|
| | | නිලධාරී | සෙසුනිල | |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | විශිෂ්ඨ සේවා විභූෂණය | 25 | - | 25 |
| 2. | උත්තම සේවා පදක්කම | 381 | 4,213 | 4,594 |
| 3. | දේශපුත්‍ර පදක්කම | 463 | 9,870 | 10,333 |
| 4. | දේශපුත්‍ර සන්ධාරය | 24 | 189 | 213 |
| 5. | දීර්ඝ සේවා පදක්කම | 437 | 3,524 | 3,961 |
| 6. | දීර්ඝ සේවා සන්ධාරය | 170 | 410 | 580 |
| 7. | කාර්යක්ෂම සේවා පදක්කම | - | 16 | 16 |
| 8. | විදේශ සේවා පදක්කම | 322 | 1,903 | 2,225 |
| 9. | විදේශ සේවා සන්ධාරය | 30 | 08 | 38 |
| 10. | පූර්ණභූමි පදක්කම | 368 | 12,592 | 12,960 |
| 11. | උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම | 341 | 6,851 | 7,192 |
| 12. | උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම සන්ධාරය 1 සහ 2 | 226 | 2,500 | 2,726 |

වගුව 5:4. පදක්කම් ප්‍රධානය කිරීම් පිළිබඳ විස්තරය

26. අදාළ වර්ෂය තුළ සෙසුනිල නිල උසස් කිරීම් හා විදෙස් නිවාඩු අනුමැතීන් පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ:

අ. <u>නිල උසස් කිරීම් සඳහා අනුමැතිය ලබාදීම</u>.

(1) විශ්‍රාම පූර්ව නිල උසස් කිරීම් - 1,556
(2) ක්‍රීඩා දක්ෂතා මත උසස් කිරීම් - 90
(3) වෙනත් උසස් කිරීම් - 2,600

ආ. <u>පරිපාලන කටයුතු සහ එතෙර නිවාඩු සඳහා අනුමැතිය ලබාදීම</u>.

(1) වැටුප් සහිත එතෙර නිවාඩු - 80
(2) වැටුප් රහිත එතෙර නිවාඩු - 02
(3) වැටුප් රහිත දේශීය නිවාඩු - 01

27. අතිරේක රෙජිමේන්තු සේවා රාජකාරී සඳහා සෙසුනිලයින් පත්කිරීම/ඇතුලත් කිරීම.

| අනු අංකය | වැය ශීර්ෂය | සම්පූර්ණ තනතුරු සංඛ්‍යාව | සම්පූර්ණ කර ඇති සංඛ්‍යාව | තවදුරටත් සම්පූර්ණ කිරීමට ඇති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අතිරේක රෙජිමේන්තු සේවය | 24,818 | 17,351 | 7,467 |
| 2. | යා කිරීම් | 2,917 | 951 | 1,966 |
| 3. | රණවිරු නිවාස ඉදිකිරීම් සඳහා සෙනීන් යාකිරීම | 2,365 | | |
| 4. | සානුකම්පිත හේතූන් මත යා කිරීම් | 172 | | |

වගුව 5:5. අතිරේක රෙජිමේන්තු සේවා රාජකාරී සඳහා සෙසුනිලයින් පත්කිරීම/ඇතුළත් කිරීම පිළිබඳ විස්තරය

28. අස්කිරීම්, නැවත බඳවා ගැනීම්, විශ්‍රාම ගැන්වීම්, සේවය දීර්ඝ කිරීම්, පොදු සමාවන් ක්‍රියාත්මක කිරීම සහ නිවාඩු නොගෙන නොපැමිණි අයවලුන්ගේ පාලන කටයුතු පහත සඳහන් පරිදි වේ:

අ. <u>යුද්ධ හමුදාවෙන් අස්කිරීම් සඳහා අනුමැතිය ලබාදීම</u>.

(1) සේවය මිලදී ගැනීමේ පදනම මත - 130
(2) සේවය තවදුරටත් අනවශ්‍ය හේතූන් මත - 545

ආ. <u>ස්වේච්ඡා සේවය නිත්‍ය සේවයට ගණනය කර යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබාදීම</u>.

(1) පාබල ඒකක - 18
(2) ආධාරක ඒකක - 50

ඇ. <u>සේවය දීර්ඝ කිරීම</u>. වසර 22 ක සේවා කාලයකින් පසු සේවය දීර්ඝකර ඇති සංඛ්‍යාව 123 ක් වේ.

ඈ. <u>සේවය දීර්ඝ කිරීම් හා නැවත බඳවා ගැනීම් අනුමැතිය ලබාදීම.</u>

| අනු අංකය | සේවය දීර්ඝ කිරීම් | නැවත බඳවා ගැනීම් | විශේෂ නැවත බඳවා ගැනීම් | නැවත සේවයෙහි පිහිටුවීම/වැටුප් රහිත අනියම් නිවාඩු අනුමත කිරීම් | එකතුව |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | 324 | 2,893 | 98 | 56 | 3,371 |

වගුව 5:6. සේවය දීර්ඝ කිරීම් හා නැවත බඳවා ගැනීම් අනුමැතිය ලබාදීම

ඉ. සෙසුනිල අන්තර් ඒකක මාරුකිරීම් - 23

29. මෙම අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා උත්සව/රාජ්‍ය උත්සව - 03, යුද්ධ හමුදා උත්සව - 25, වෙනත් උත්සව - 44 හා ජ්‍යෙෂ්ඨ නිලධාරි අවමංගල්‍ය උත්සව - 05 සිදුකර ඇත.

30. ක්‍රියාන්විතයේදී මියගිය/ආබාධිත අයවලුන් වෙනුවෙන් ලබාදෙන මරණ පාරිතෝෂික හා වන්දි මුදල් සබැඳිව ක්‍රියාකිරීම පහත පරිදි වේ:

| අනු අංකය | විස්තර | හමුදා චර්යා නියෝග 12/86 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 මියගිය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 ආබාධිත | මරණාධාර ගෙවීම | සුව සහන අරමුදල් ගෙවීම |
|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |
| 1. | නිලධාරි | 73 | 16 | 15 | 1 | 1 |
| 2. | සෙසුනිල | 1,120 | 580 | 286 | 57 | 84 |

වගුව 5:7 ක්‍රියාන්විතයේදී මියගිය/ආබාධිත අයවලුන් වෙනුවෙන් ලබාදෙන මරණ පාරිතෝෂිත හා වන්දි මුදල් සබැඳිව ක්‍රියාකිරීම පිළිබඳ විස්තරය

31. බඳවාගැනීම් විස්තරය.

| අනු අංකය | විස්තරය | බඳවාගත් දිනය | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 88 උපාධි | 28.03.2018 | 70 |
| 2. | ගණක නිලධාරී | 19.06.2018 | 04 |
| 3. | ඉංජිනේරු සේවා රෙජිමේන්තු නිලධාරී | 19.06.2018 | 11 |
| 4. | කාන්තා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 16 | 02.01.2018 | 21 |
| 5. | සෙසුනිල අධිකාරියට පත් කිරීම් | 19.06.2018 | 02 |
| 6. | තූර්ය වාදක කණ්ඩායම් නිලධාරීන් | 19.06.2018 | 02 |
| 7. | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු නිලධාරීන් | 19.06.2018 | 04 |
| 8. | බළලත් නිලධාරීන් ලුතිනන් (උපකරණ පාලන) නිලයේ අධිකාරියට පත් කිරීම | 06.04.2018- 26.10.2018 | 130 |
| 9. | වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත සේවය දීර්ඝ කිරීම් | 01.01.2018 - 31.12.2018 | 39 |
| 10. | වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත බඳවා ගැනීම | 01.01.2018 - 31.12.2018 | 07 |
| 11. | කොන්ත්‍රාත් පදනම මත සේවය දීර්ඝ කිරීම් | 01.01.2018 - 31.12.2018 | 69 |
| 12. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම | 01.01.2018 - 31.12.2018 | 08 |

වගුව 5:8. බඳවාගැනීම් විස්තරය

32. **<u>හමුදා නියෝග පළකිරීම</u>**. හමුදා නියෝග - 20, හමුදා චර්යා නියෝග - 25, විශේෂ හමුදා නියෝග - 8 පළකිරීම.

33. යුද්ධ හමුදාවෙහි වර්තමාන හා අනාගත ප්‍රයෝජනය හා පරිහරණය සඳහා 2018.10.10 දින සරඹ අත්පොත පළකිරීම.

34. යුද්ධ හමුදාවෙහි සියලු නිලයින් සඳහා 2018.10.01 දින යුද්ධ හමුදා ඇඳුම් රෙගුලාසි අත්පොත පළකිරීම.

35. යුද්ධ හමුදාවේ ස්ථාපිත සියලුම කාර්යාල, ශාඛා, මූලස්ථාන, සේනාංක, අධ්‍යක්ෂ මණ්ඩල සහ වෙනත් ආයතනවල පවතින අතිරේක රෙජිමේන්තු සේවා තනතුරු සඳහා සියලුම රෙජිමේන්තු වෙත තනතුරු බෙදා වෙන්කරන ලද උපදෙස් ඇතුලත් පොතක් මුද්‍රණය කර 2019.01.01 වන දින එළිදැක්වීමට හැකිවීම.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

36. හමුදා නියෝග 20 ක්, හමුදා චර්යා නියෝග - 25 ක් හා විශේෂ හමුදා නියෝග - 08ක් ප්‍රකාශයට පත්කිරීමට හැකිවීම.

37. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ වත්මන් සහ අනාගත පරිශීලනය උදෙසා සියලු සරඹ පිළිවෙත් අන්තර්ගත වන පරිදි සරඹ පොතක් මුද්‍රණය කර 2018.10.10 වන දින එළිදැක්වීම.

38. සියලු නිලයින්ගේ පරිශීලනය උදෙසා යුද්ධ හමුදා නිල ඇඳුම් රෙගුලාසි සංග්‍රහය 2019.01.01 දින එළිදැක්වීමට හැකිවීම.

39. අතිරේක රෙජිමේන්තු සේවා තනතුරු සඳහා සියලුම රෙජිමේන්තු වෙත තනතුරු බෙදා වෙන්කරන ලද උපදෙස් ඇතුලත් පොතක් මුද්‍රණය කිරීම.

40. විශිෂ්ඨ සේවා විභූෂණය, උත්තම සේවා පදක්කම, දීර්ඝසේවා පදක්කම, විදේශසේවා පදක්කම ප්‍රදානය.

41. 2010.01.01 දින සිට වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන අයවලුන් වෙනුවෙන් සේවා පදක්කමක් සහ වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන අයවලුන් වෙනුවෙන් පැසසුම් සේවා පදක්කමක් ප්‍රදානය කිරීම.

**<u>ගැටළු සහ අභියෝග</u>**

42. විෂයභාර ලිපිකරුවන්ගේ දැනුම සැලකිය යුතු මට්ටමක නොතිබීම.

43. යුද්ධ හමුදාවෙහි ලේඛන කළමණාකරණය නිසි පරිදි සිදු නොකිරීම.

**<u>සාරාංශය</u>**

44. යුද්ධ හමුදා සෙසුනිලයින් බඳවාගැනීමේ සිට විශ්‍රාම යන අවස්ථාව දක්වා වන පරිපාලනමය කටයුතු, සෙසුනිලයින්ගේ ඇඳුම් ආයිත්තම්, සේවය ඇගයීම වෙනුවෙන් හිමිගන්වන ප්‍රසාදනා, පළඳනා හා පදක්කම්, ආදී සියලුම පාලනමය කටයුතු සබැඳිව වන උපදෙස්/හමුදා නියෝග නිකුත් කිරීම තුළින් විනයගරුක හමුදාවක් බිහිකිරීමෙහිලා වන මූලික කටයුතු සිදුකරනු ලබන මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් රාජ්‍ය සහ යුද්ධ හමුදා උත්සව සංවිධානය කිරීමෙහිලා වන සියලුම වගකීම්/කාර්ය භාර්යයන්ද ඉතා වගකීමෙන් සහ ක්‍රමවත්ව සිදුකරනු ලබයි.

**<u>යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

45. ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්යවාදක කණ්ඩායම වශයෙන් පැවති මෙම අධ්‍යක්ෂ මණ්ඩලය 2014.07.29 දින නවතමයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්යවාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස නොː 92, තෙලවල පාර, රත්මලාන යන ලිපිනයෙහි ස්ථාපිත කරන ලදි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යුද්ධ හමුදාව තුළ සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් මගින් විවිධ වූ උත්සව අවශ්‍යතාවයන් සඳහා ඉල්ලුම් කරනු ලබන තූර්යවාදක/නර්තන රාජකාරින් මනා කළමණාකාරිත්වයකින් යුතුව ලබාදීම පූර්ණ වගකීම වේ.

**<u>මූල්‍ය තොරතුරු</u>**

46. මූල්‍ය විස්තරය පහත පරිදි වේ:

අ. **<u>පුනරාවර්තන වියදම්</u>.**

| අනු අංකය | වැය ශීර්ෂයේ නම | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | සංගීත භාණ්ඩ අලුත්වැඩියා කිරීම (222-01-2-1302(ix) a) | 1,500,000.00 | 1,422,404.00 |
| 2. | රූපලාවන්‍ය ද්‍රව්‍ය (222-01-1-1409(XIII)) | 2,000,000.00 | 1,992,905.00 |
| 3. | සංගීත භාණ්ඩ අමතර කොටස් (222-01-2-1205(iii) a) | 5,700,000.00 | 5,069,358.15 |

වගුව 5:9. පුනරාවර්තන වියදම්

ආ. <u>ප්‍රාග්ධන වියදම්</u>.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | සංගීත භාණ්ඩ මිලදී ගැනීම (222-01-3-2103(v)) | 30,200,000.00 | 29,659,480.90 | 12,758,682.50 |

වගුව 5:10. ප්‍රාග්ධන වියදම්

**<u>ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදාගත් ආකාරය</u>**

47. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ඇති යුද්ධ හමුදා තූර්යවාදක/අධිරිද්ම (අංක 1,2,3) කණ්ඩායම්, හේවිසි/සමූහ වාදක කණ්ඩායම්, පෙරදිග තූර්යවාදක කණ්ඩායම 1 සහ 2, සංස්කෘතික නැටුම් කණ්ඩායම්, බටහිර නර්තන කණ්ඩායම් ආදී සංගීත කණ්ඩායම් වෙතින් ඉහත දක්වා ඇති සේවාවන් සැපයීමේදී එම සංගීත භාණ්ඩ නිරන්තරයෙන් විවිධ අබාධ තත්වයන්ට භාජනය වන අතර, එහිදී අදාල සංගීත භාණ්ඩ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 222-01-2-1302(ix) a දරන සංගීත භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මඟින් රුපියල් 14,422,404,00 ක මුදලක් වැය කිරීම් සිදුකර ඇත.

48. යුද්ධ හමුදාමය, රාජ්‍ය සහ රාජ්‍ය නොවන උත්සව අවස්ථාවන්හිදී සංගීත/නර්තන කණ්ඩායම් වෙතින් ඉදිරිපත් කරනු ලබන අංගයන් ඉතාමත් විචිත්‍රවත් අන්දමින් ඉටුකිරීම උදෙසා එම කණ්ඩායම්හි ශිල්පීන්ගේ බාහිර පෙනුම ඉමහත් පිටුවහලක් වන අතර, ඒ වෙනුවෙන් රූපලාවන්‍ය අවශ්‍යතා ලබාගැනීම උදෙසා 222-01-1-1409(XIII) රූපලාවන්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ වැයශීර්ෂය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් රුපියල් 1,992,905,00 ප්‍රමාණයක් වැයකර ඇත.

49. දිනෙන් දින යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ඉදිරිපත් කරනු ලබන නියුතුවීම් සඳහා නවතමයෙන් කලාත්මක නිර්මාණයන් එක් කරමින් වඩාත් පුළුල් විචිත්‍රවත් අන්දමේ නිර්මාණයන් ඉදිරිපත් කිරීම උදෙසා සංගීත හා නර්තන කණ්ඩායම්හි සංගීත භාණ්ඩ අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් 222-01-3-2103(v) දරන සංගීත භාණ්ඩ අමතර කොටස් මිලදී ගැනීමේ වැය ශීර්ෂය වෙතින් වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් රුපියල් 3,583,150,00 ක මුදලක් වැය කර ඇත.

50. දීර්ඝ කාලයක් පරිහරණය කිරීම හේතුවෙන් යථා තත්වයට පත්කිරිමට නොහැකි වන සේ විවිධ ආබාධ තත්ත්වයන්ට පත්වන සංගීත භාණ්ඩ භාවිතයෙන් ඉවත් කර නවතමයෙන් සංගීත භාණ්ඩ/උපකරණ මිලදී ගැනීමටත්, නවීන කාලයට සරිලන සංගීත කණ්ඩායම් නවතමයෙන් ස්ථාපනය කර වඩාත් උසස් අන්දමින් නිර්මාණයන් ඉදිරිපත් කිරීම උදෙසා 222-01-3-2103(v) දරන සංගීත භාණ්ඩ මිලදී ගැනීමේ වැය ශීර්ෂයෙහි ප්‍රතිපාදන යටතේ රුපියල් 23,552,151.60 ක මුදලක් වැය කර ඇත.

51. නව අවුරුදු උදාවට සමගාමීව පැවැත්වෙන ජාතික සූර්ය මංගල්‍ය, ජාතික ක්‍රීඩා උත්සවය, යුද්ධ හමුදා මූලස්ථාන අවුරුදු උත්සවය, යුද්ධ හමුදා ක්‍රීඩා උත්සව, ජාතික නිදහස් දින පෙළපාලිය, යුද්ධ හමුදා වර්ණ රාත්‍රිය, රණවිරු සැමරුම් උත්සව, සේවා වනිතා ඒකක අවශ්‍යතාවයන්, රාජ්‍ය උත්සව අවශ්‍යතාවයන්, ආරක්ෂක සමුළුව - 2018, විදේශීය දූත පිරිස් පැමිණීම, නත්තල් කැරොල් උත්සවය, 2018 වෙසක් උත්සවය, පොසොන් උත්සවය ආදී රාජ්‍ය/රාජ්‍ය නොවන උත්සව අවස්ථාවන් සඳහා තූර්යවාදක/නර්තන සේවාවන් සැපයීම හා තූර්යවාදක සේවාවන් සැපයීම.

52. 2018.01.01 සිට 2018.12.31 දින දක්වා බ්‍රාස් බෑන්ඩ් අපරදිග තූර්ය වාදක කණ්ඩායම් පෙරදිග වාදක කණ්ඩායම්, ඒක පුද්ගල සංගීත කණ්ඩායම්, කැලිප්සෝ, පැදුර සංගීත කණ්ඩායම, හේවිසි වාදක, බටහිර නර්තන සංස්කෘතික නර්තන, පිළිගැනීමේ නර්තන, බැග්පයිප්, ෆෑන් පෙයාර්, යන වාදක කණ්ඩායම් රාජකාරීන් සඳහා නර්තන/වාදක කණ්ඩායම් වාර 2,371 ක් වරක් විවිධ අවස්ථා සඳහා සහභාගි කරවීම.

53. ආදායම් උපයන ව්‍යාපෘති/කාර්යයන් වෙතින් 2018 වර්ෂයේදී රුපියල් 10,662,491.50 ක ලාභයක් උපයාගත් අතර, වියදම වශයෙන් රුපියල් 8,429,348.72 ක් වැය වී ඇත. ඉන් රුපියල්. 2,233,142.78 ක ලාභයක් ලබාගත හැකි විය.

**<u>වසරෙහි කාර්යසාධන සාරාංශය</u>**

54. වසරෙහි කාර්යසාධන සාරාංශය පහත පරිදි වේ:

අ. අඩි 100 x 20 ප්‍රමාණයේ නව පෙරනිම් ගොඩනැගිල්ලක්, නව ජන අවන්හලක් හා නව කායවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම.





ආ. නව ජන අවන්හලක් පිහිටුවීම.




ඇ. නව කායවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම.




**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

55. රුසියාවේ මොස්කව් අගනුවරදී රටවල් 40 ක සහභාගීත්වයෙන් 2018.08.19 දින සිට 2018.09.03 දින දක්වා පැවැත්වූ අන්තර් ජාතික තූර්යවාදක සංදර්ශනයක් වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නිලධාරී 02 ක් හා සෙසුනිලයින් 16 කින් සමන්විත තූර්යවාදක කණ්ඩායමක් සහභාගි කරවීමට හැකි වන ලදි.






**ගැටළු සහ අභියෝග**

56. සෙසුනිල භය නිවාස පහසුකම් සපයාගැනීම.

57. පැවරෙන තූර්යවාදක/නර්තන රාජකාරින් ආවරණය කිරිම සඳහා දැනට සිටින භයපිරිස් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම.

**සාරාංශය**

58. වාර්ෂික වැය ශීර්ෂයන් යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් යුහ තුවාක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහ රෙජිමේන්තු තූර්යවාදක කණ්ඩායම් සඳහා අවැසි සංගීත භාණ්ඩ/උපකරණ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් රාජ්‍ය, රාජ්‍ය නොවන යුද්ධ හමුදාමය සහ සිවිල් උත්සව අවස්ථාවන් සඳහා නව නිර්මාණයන්ගෙන් යුත් විචිත්‍රවත් නිර්මාණයන් ඉදිරිපත් කර යුද්ධ හමුදාව වෙත කීර්තිනාමයක් අත්කරදීමේ සුවිශේෂී කාර්යයක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබයි.

**නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**

59. යුද්ධ හමුදා නීතිසේවා අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාවට අදාළ සියලු නීති කාරණා සම්බන්ධයෙන් මූලික වශයෙන් කටයුතු කරනු ලබන අතර, මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව වන්නේ සියලුම නීතිමය කරුණු වලට අදාලව ඕනෑම අවස්ථාවකදී උපදෙස් සැපයීම සහ යුද්ධ හමුදාව තුළ නීතිමය ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමයි.

**මූල්‍ය තොරතුරු**

60. **පුනරාවර්ථන වියදම්.**

| අනු අංකය | වැය ශීර්ෂයේ නම | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | නීති වියදම් (222-01-1-1508(V)) | 2,500,000.00 | 13,500.00 | 1,986,500.00 |
| | | 500,000.00 | 513,500.00 | |

වගුව 5:11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

61. යාපනය මහාධිකරණ නඩු අංක 2295/ 17, 2286/17, 2287/17 නඩු වලට අදාළව දිවුරුම් ප්‍රකාශ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් මුදල් නිරවුල් කිරීම සඳහා.

62. කොළඹ දිසා අධිකරණ නඩු අංක 25252/MR දරන නඩු තීන්දුව ප්‍රකාරව කුලී පදනම මත යුද්ධ හමුදාවට පවරාගෙන තිබූ 1997.06.10 තාන්ඩිකුලම් ත්‍රස්ත ප්‍රහාරයේදි විනාශයට පත්වී ඇති අංක 45-5519 දරන ලොරි රථයේ ඉහත දින සිට 1999.03.23 දින දක්වා කුලී මුදල් 2018.10.15 වන දින අධිකරණය ඉදිරියේ රථය අයිතිකරු වෙත නිරවුල් කිරීම සඳහා ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගන්නා ලදී.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

63. 2018 වර්ෂයෙහි නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද විෂයන්හි ප්‍රගතිය පහත පරිදි වේ:

අ. <u>මූලික පරීක්ෂණ උසාවි / චෝදනාපත්/සිවිල් නඩු විස්තරය</u>.

<table>
<tr><th>අනු අංකය</th><th colspan="2">අංශය</th><th>ලැබුණු ප්‍රමාණය</th><th>නිමකල ප්‍රමාණය</th><th>නිරීක්ෂණ මත යවා ඇති ප්‍රමාණය</th><th>ක්‍රියා කිරීමට වෙනත් ආයතනයන් වෙත යවා ඇති ප්‍රමාණය</th><th>නිම කිරීමට ඇති ප්‍රමාණය</th></tr>
<tr><th>(අ)</th><th colspan="2">(ආ)</th><th>(ඇ)</th><th>(ඈ)</th><th>(ඉ)</th><th>(ඊ)</th><th>(උ)</th></tr>
<tr><td>1.</td><td colspan="2">චෝදනාපත්</td><td>5,405</td><td>5,212</td><td>-</td><td>-</td><td>193</td></tr>
<tr><td>2.</td><td colspan="2">රිය අනතුරු</td><td>101</td><td>77</td><td>09</td><td>02</td><td>13</td></tr>
<tr><td>3.</td><td colspan="2">මිය යෑම්</td><td>217</td><td>106</td><td>29</td><td>24</td><td>58</td></tr>
<tr><td>4.</td><td colspan="2">තුවාල සිදුවීම්</td><td>2,661</td><td>2,120</td><td>202</td><td>-</td><td>339</td></tr>
<tr><td>5.</td><td colspan="2">විශේෂ හමුදා නියෝග 3/75</td><td>46</td><td>37</td><td>-</td><td>04</td><td>05</td></tr>
<tr><td>6.</td><td colspan="2">විනය මූලික පරීක්ෂණ උසාවි අංශය</td><td>360</td><td>131</td><td>63</td><td>24</td><td>142</td></tr>
<tr><td>7.</td><td colspan="2">නැතිවීම්/ අලාභහානි</td><td>99</td><td>60</td><td>19</td><td>15</td><td>05</td></tr>
<tr><td>8.</td><td colspan="2">දුක්ගැනවිලි අංශය</td><td>12</td><td>09</td><td>-</td><td>-</td><td>03</td></tr>
<tr><td>9.</td><td colspan="2">මානව හිමිකම් අංශය</td><td>49</td><td>01</td><td>-</td><td>-</td><td>48</td></tr>
<tr><td>10.</td><td colspan="2">යුද්ධාධිකරණ/සාක්ෂි සම්පිණ්ඩන වාර්තා</td><td>06</td><td>02</td><td>02</td><td>-</td><td>02</td></tr>
<tr><td>11.</td><td colspan="2">විමර්ශන රපෝර්තු අංශ</td><td>881</td><td>854</td><td>-</td><td>-</td><td>27</td></tr>
<tr><td rowspan="2">12.</td><td rowspan="2">ගිවිසුම් ඇපබැඳුම්කර අංශ</td><td>ඇප බැඳුම්කරන ගොනු</td><td>505</td><td>155</td><td>-</td><td>-</td><td>350</td></tr>
<tr><td>ඉඩම් ගොඩනැගිලි / සේවා ගිවිසුම්</td><td>30</td><td>30</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td rowspan="5">13.</td><td rowspan="5">සිවිල් අධිකරණ</td><td>ශ්‍රේෂ්ඨාධිකරණ නඩු</td><td>05</td><td>02</td><td>-</td><td>-</td><td>03</td></tr>
<tr><td>අභියාචනාධිකරණ රිට් නඩු</td><td>11</td><td>04</td><td>-</td><td>-</td><td>07</td></tr>
<tr><td>මහෙස්ත්‍රාත් අධිකරණ නඩු</td><td>01</td><td>-</td><td>-</td><td>-</td><td>01</td></tr>
<tr><td>මහාධිකරණ නඩු</td><td>01</td><td>-</td><td>-</td><td>-</td><td>01</td></tr>
<tr><td>දිසා අධිකරණ නඩු</td><td>48</td><td>-</td><td>-</td><td>-</td><td>48</td></tr>
</table>

වගුව 5:12. මූලික පරීක්ෂණ උසාවි / චෝදනාපත්/සිවිල් නඩු විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**ගැටළු සහ අභියෝග**

64. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබන ඉහත 4 වන ඡේදයේ සඳහන් කරුණු සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය/ඡායා පිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර සඳහා අවැසි ටෝනර් සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

65. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ලිපිකරුවන් 86 දෙනෙකු සංස්ථාවට අනුව අනුමත වන අතර, මේ වන විට ලිපිකරුවන් 55 පමණක් රාජකාරී කරනු ලබන බැවින්, ඉතිරි ලිපිකරු පුරප්පාඩු 31 ක ප්‍රමාණය සපුරාගත යුතුව ඇත.

**සාරාංශය**

66. සිවිල් නීතිය සහ යුද්ධ හමුදා නීතිය සබැඳිව මනා දැනීමක් ඇති නිලධාරී/සෙසුනිල කාර්ය මණ්ඩලයකින් සැදුම්ලත් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාවෙහි පරිපාලනමය කටයුතු සිදුකිරීමේදී අවැසි සියලුම නීති උපදෙස් සපයමින් සුවිශේෂී කාර්යයක් ඉටුකරනු ලබන අතර, ඉදිරි වර්ෂයන්හිදී ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් පවත්වනු ලබන වැඩසටහන්/සම්මන්ත්‍රණ සඳහා නීති නිලධාරීන් හැකිතාක් සහභාගි කරවා එම නිලධාරීන්ගේ නීති දැනුම වර්ධනය කර ඉතා ඵලදායී සේවාවක් ලබාදීමට සහ විෂයන්ට අදාළ ලිපිකරුවන් සඳහා වැඩමුළු පවත්වා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම අපේක්ෂා කර ඇත.

## විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය

67. විධායක ජෙනරාල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩලයක් වන අතර, මෙමගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකා රාජකාරී සඳහා අණදීම හා පාලනය සිදුකරයි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විනයාරක්ෂක රාජකාරී සංවිධානය, තාක්ෂණික ප්‍රමිතීන්, පුහුණුව සහ අවැසි සම්පත් ලබාදීම පිළිබඳ වගකීම දරයි.

**මූල්‍ය තොරතුරු**

68. මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වැය කිරීම් පිළිබඳ විස්තරය.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අභ්‍යාස දීමනා ගිණුම | 30,000.00 | 30,000.00 | - |
| 2. | ලිපි ද්‍රව්‍ය ප්‍රතිපාදන | 405,000.00 | 290,985.36 | 114,014.64 |
| 3. | සුභසාධන පුවත්පත් ප්‍රතිපාදන | 45,500.00 | 45,500.00 | - |
| 4. | පවිත්‍රතා ද්‍රව්‍ය ප්‍රතිපාදන | 14,000.00 | 11,480.00 | 2,520.00 |
| 5. | භූමි නඩත්තු ප්‍රතිපාදන | 15,000.00 | 15,000.00 | - |
| 6. | බස් ගමන් බලපත් ප්‍රතිපාදන | 35,000.00 | 32,004.00 | 2996.00 |
| 7. | වාර සඟරා ප්‍රතිපාදන | 5000.00 | 5000.00 | - |

වගුව 5:13. මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වැය කිරීම් පිළිබඳ විස්තරය.

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

69. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි රාජකාරී කරනු ලබන නිලධාරී/සෙසුනිලයින්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සුභසාධන කටයුතු වෙනුවෙන් ප්‍රතිඵලදායක ලෙස යොදාගෙන ඇත.

**වසරේ කාර්ය සාධන සාරාංශය**

70. 2018 වර්ෂයෙහි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය වෙතින් රාජ්‍ය උත්සව, හදිසි ආපදා තත්ත්වයන් සහ යුද්ධ හමුදා උත්සව සඳහා රාජකාරි සහාය ලබා දෙන ලදී.

71. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය වෙත රපෝර්තු වූ අපරාධ විමර්ශණ කිරිම් තුළින් අපරාධකරුවන් හඳුනා ගැනීමට හා අනාවරණය කර ගැනීමට හැකි විය.

72. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකා ඒකක වෙතින් සිදුකරන ලද විමර්ශන මගින් අවභාවිත කරන ලද යුද්ධ හමුදා වත්කම් හා සැපයුම් අත්අඩංගුවට ගැනීමට හැකි වූ අතර එමගින් වරදකරුවන් හඳුනා ගන්නා ලදී. තවද නීති විරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම තුළින් යුද්ධ හමුදා සෙබලුන් නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය/ලඟ තබා ගැනීම අවමකර යුද්ධ හමුදා විනය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

73. රිය අනතුරු විමර්ශනය තුළින් රිය අනතුරු සඳහා වගකිව යුතු අයවලුන් හා රිය අනතුරු වලට හේතු අනාවරණය කර ගැනීමට හැකි විය.

74. දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් යුද්ධ හමුදා සාමාජිකයින් සම්බන්ධ අනතුරු/රිය අනතුරු/ අපරාධ අවම කිරීම සඳහා කටයුතු කරන ලදී.

75. නිවාඩු නොලබා නොපැමිණි/ පැනගිය සෙබලුන් අත්අඩංගුවට ගැනීම තුළින් ඔවුන් විසින් සමාජයට සිදුකල හැකි අපරාධ අවම කිරීමට කටයුතු කරන ලදී.

**වසරේ ජයග්‍රහණයන්**

76. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය වෙත රපෝර්තු වූ අපරාධ විමර්ශනය කිරීම තුළින් අපරාධකරුවන් හඳුනාගැනීමට හා අනාවරණය කරගැනීමට හැකිවීම තුළින් රට තුළ ඇතිවීමට හැකි සාපරාධී ක්‍රියා සැලකිය යුතු මට්ටමකින් අවම කිරීමට හැකි විය.

77. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය ඒකක වෙතින් සිදුකරන ලද විමර්ශනයන් මගින්, අවභාවිත කරන ලද යුද්ධ හමුදා වත්කම් හා සැපයුම් අත්අඩංගුවට ගැනීමට හැකි වූ අතර, එමගින් වරදකරුවන් හඳුනාගන්නා ලදී. තවද, නීති විරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම තුළින් යුද්ධ හමුදා සෙබලුන් නිති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය/ලඟ තබා ගැනීම අවම කිරීමට හැකි විය.

78. දැනුවත් කිරිමේ වැඩසටහන් තුළින් යුද්ධ හමුදා සාමාජිකයින් සම්බන්ධ අනතුරු/රිය අනතුරු/අපරාධ අවම කිරිමට හැකි විය.

79. නිවාඩු නොලබා නොපැමිණි/පැනගිය සෙබලුන් අත්අඩංගුවට ගැනීම තුළින් ඔවුන් විසින් සමාජයට සිදුකල හැකි අපරාධ අවම කිරීමට හැකි විය.

**ගැටළු සහ අභියෝග**

80. සාක්ෂි තාර්කිකව ඔප්පු කිරීම සඳහා ක්ෂේත්‍රයේ සහ අපරාධ පරීක්ෂණාගාර වල භාවිතා කිරීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ හිගකම.

81. අපරාධ දත්ත ගබඩා කිරීම, ආරක්ෂා කිරීම සහ එම දත්ත ගබඩා නඩත්තු සඳහා මෙන්ම සයිබර් අපරාධ පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා අදාල උපකරණ හා තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැතිකම.

82. සෑම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකා ඒකකයක් තුළ ව්‍යවහාරික විද්‍යාගාරයක් නොතිබීම හා එම විද්‍යාගාරය සඳහා ක්ෂේත්‍රයේ නියැදි රැස්කිරීම සඳහා අපරාධ ස්ථාන පරීක්ෂණ උපකරණ නොතිබීම.

**සාරාංශය**

83. විනයගරුක යුද්ධ හමුදාවක් බිහිකිරීම උදෙසා නිකුත් කරනු ලබන විනය රෙගුලාසි සුරැකීමේ කාර්යභාරව ඇති මෙම අධ්‍යක්ෂ මණ්ඩලය රාජ්‍ය, යුද්ධ හමුදාමය උත්සව අවස්ථාවන් සඳහා විවිධ විනයාරක්ෂක රාජකාරීන් ඉටු කරමින් මහගු සේවාවක් ඉටුකරනු ලබන අතර, එම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන ඒකකයන් හට නිසි පරිදි නියෝග/උපදෙස් ලබාදී එම රාජකාරීන් ඉතා ක්‍රමවත්ව වගකීමෙන් යුතුව ඉටුකරනු ලබයි.

## සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය

84. රාජකාරියෙහි නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයවලුන්ගේ සුභසාධනය තුලින් ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ පරමාර්ථය පෙරදැරි කොට ගෙන යුද්ධ හමුදා චරියා නියෝග 33/89 අනුකුලව 1989 මැයි මස 23 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුභසාධක සංගමය පිහිටුවා ඇති අතර, යුද්ධ හමුදාවෙහි ව්‍යාප්තියත් සමඟ මෙය සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය නමින් ස්ථාපනය කර ඇත. එමඟින් යුද්ධ හමුදාව තුළ දැනට ක්‍රියාත්මක වන සුභසාධන ක්‍රියාවලිය නිසි අයුරු පවත්වාගෙන යැමත් නිලධාරි/සෙසුනිල සුභසාධනය වෙනුවෙන් නව වැඩපිළිවෙලවල් හඳුන්වාදීමත් ප්‍රධාන වගකීම වේ.

### මූල්‍ය තොරතුරු

85. 2018 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල මුදල් පිළිබඳ වූ විස්තරය

අ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කළමනාකරණය කරන ලද රාජ්‍ය මුදල් ප්‍රතිපාදන සබැඳි විස්තරයන් පහත සඳහන් පරිදි වේ.:

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන්කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | භයිපිරිස් සඳහා පහසුකම් (222-01-02-1205(xvii)) | 4,000,000.00 | 4,000,000.00 | - |
| 2. | පුවත්පත් (222-01-02-1205(xviii)) | 18,000,000.00 | 15,907,630.00 | 2,092,370.00 |
| 3. | රක්ෂණය සඳහා ගෙවීම් (222-01-01-1508(ii)) | 25,000,000.00 | 2,110,986.36 | 22,889,013.64 |

වගුව 5:14. රාජ්‍ය මුදල් ප්‍රතිපාදනයන් සබැඳි විස්තරය

ආ. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලය තුළ සුභසාධක සංගම් ගිණුමෙහි විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | කාලසීමාව | පිරිවැය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | 2018 I වන කාර්තුව | 37,756,348.82 |
| 2. | 2018 II වන කාර්තුව | 27,262,819.86 |
| 3. | 2018 III වන කාර්තුව | 35,684,915.68 |
| | එකතුව | 100,704,084.36 |

වගුව 5:15. සුභසාධක සංගම් ගිණුම් විස්තරය

### ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය

86. සේවයේ නියුතු නිලධාරී/සෙසුනිලයන් සඳහා ණය පහසුකම් ලබාදීම.

87. පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ ලබාදීම.

88. රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ යුද්ධ හමුදා සාමාජිකයන් හට ප්‍රතිලාභ හිමිගැන්වීම හා විශේෂ රක්ෂණාවරණ ලබාදීම.

89. සුවසහන අරමුදල නිසි අයුරු පවත්වාගෙන යෑම සහ එහි ප්‍රතිලාභ සාමාජිකයින් වෙත පිරිනැමීම.

90. සුවසහන බස් රථ සේවාව ලබාදීම.

91. යුද්ධ හමුදා සියලු ආයතන වෙත පුවත්පත් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම.

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

92. රාජකාරියෙහි නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයන්ගේ සුභසාධනය උදෙසා ණය පහසුකම්, පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ, රක්ෂණ යෝජනා ක්‍රම, නීති ආධාර, මරණාධාර මුදල්, සුවසහන බස් රථ සේවාව ලබාදීම වැනි සුභසාධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අවැසි කටයුතු සිදුකරන ලදී.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

93. සිංහල අළුත් අවුරුද්ද සඳහා සතොස ආයතනය සමග සම්බන්ධ වී සහනදායි මිලගණන් යටතේ භාණ්ඩ ලබාගැනීම සඳහා සහ CIB ආයතනය වෙතින් රෙදිපිළි මිලදී ගැනීම සඳහා පහසු ගෙවීමේ පදනම මත වව්චර් ලබාදීමට හැකිවීම.

94. නව පාසල් වාරය සඳහා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් හට අවශ්‍ය පාසල් උපකරණ සහනදායි මිලගණන් යටතේ පහසු ගෙවීමේ පදනම මත DSI ආයතනය සමග සම්බන්ධ වී වව්චර් ලබාදීමට හැකිවීම.

95. රන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා පහසු ගෙවීමේ පදනම මත 100,000.00 ක ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදීමට හැකිවීම.

96. ටයිල් මිලදී ගැනීම සඳහා පහසු ගෙවීමේ පදනම මත 100,000.00 ක ණය මුදලක් ලබාදීම.

97. විදුලි උපකරණ/ගෘහ භාණ්ඩ ලබාගැනීම සඳහා 100,000.00 ක ණය මුදලක් පහසු ගෙවීමේ පදනම මත ලබාදීමට කටයුතු කිරීමට හැකිවීම.

**<u>ගැටලු සහ අභියෝග</u>**

98. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ස්ථාපිත රණවිරු සුභ සාධන අංශයන් වෙත සංස්ථාවට අනුව ලිපිකරුවන්ගේ හිඟතාවය මත රාජකාරී කටයුතු සිදුකිරීමේදී විවිධ රාජකාරිමය අපහසුතාවයන්ට මුහුණු පෑමට සිදුවීම ගැටළුවක්ව පවතියි.

**<u>සාරාංශය</u>**

99. රාජකාරියෙහි නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයවලුන්ගේ සුභසාධනය තුළින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා යුද්ධ හමුදාව තුළ දැනට ක්‍රියාත්මක සුභසාධන ක්‍රියාවලිය නිසි අයුරු පවත්වාගෙන යාම මෙන්ම නිලධාරී/සෙසුනිල සුභසාධනය වෙනුවෙන් නව වැඩපිළිවෙලවල් ඇති කිරීම හා සියලුම යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයන් හට හිමිවිය යුතු සුභසාධන පහසුකම් ලබාදීමේ කටයුතු විධිමත්ම සහ ක්‍රමවත්ව මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබයි.

## <u>රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය</u>

100. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදී සිටියදී මියගිය රණවිරුවන්ගේ ලඟම ඥාතීන්ගේ හා රණඝාතයට පත් රණවිරුවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා සහ සේවයෙහි නියුතු/විශ්‍රාම යාමට නියමිත රණවිරුවන් හට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධ වෙමින් වෘත්තීය පාඨමාලා ලබාදීම මෙන්ම විශ්‍රාමික රණවිරුවන් හට රැකියා අවස්ථා ලබාදීම වැනි පුළුල් විෂයන් ක්‍රියාත්මක කරනු ලබයි.

**<u>මූල්‍ය තොරතුරු</u>**

101. මූල්‍ය විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | ගිණුම | වෙන් කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | රණවිරු නිවාස අරමුදල | 131,571,937.40 | 126,235,097.43 | 5,199,796.85 |
| 2. | රණවිරු සේවා උපසංගම් ගිණුම | 68,856.64 | 36,613.48 | 32,252.16 |

වගුව 5:16. මූල්‍ය විස්තරය

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

102. යුද්ධ හමුදාව වෙතින් පවත්වාගෙන යනු ලබන රණවිරු ගම්මානයන්හි පරිපාලන කටයුතු සිදුකිරීම, මියගිය/රණක්ෂිතයට පත් වූ රණවිරුවන්ගේ අවශ්‍යතාවයන් පරිදි නිවාස ඉදිකර ගැනීම සඳහා මුල්‍යමය ආධාර ලබාදීම, මියගිය / රණක්ෂිත රණවිරුවන්ගේ දරුවන් හට ශිෂ්‍යත්ව ලබාදීම, යුද්ධ හමුදාධිපති තුමාගේ සංකල්පය මත ක්‍රියාත්මක විශේෂ නිවාස ව්‍යාපෘතිය සඳහා වැයකිරීම් වැනි කරුණු සඳහා ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදා ගන්නා ලදී.

**වසරේ කාර්ය සාධන සාරාංශය**

103. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මියගිය රණවිරුවන්ගේ ලඟම ඥාතීන් වෙනුවෙන් හා රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම, නිදහස් දුම්රිය ගමන් බලපත්, මුල්‍ය ආධාර ලබාදීම, රජයේ ඉඩම් කොටස් ලබාදීම, විරුසර වරප්‍රසාද කාඩ්පත ලබාදීම, වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමුකිරීම ආදී වූ සුභසාධන සේවාවන් ඉටුකරන ලදී.

**වසරේ ජයග්‍රහණයන්**

104. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලය තුළ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පහත සඳහන් සුභසාධක පහසුකම් ලබාදී ඇත:

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | මියගිය | ආබාධිත | සේවයේ නියුතු | එකතුව |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | නිවාස ඉදිකිරීම සඳහා රුපියල් 500,000.00 ක මුල්‍යමය ආධාර ලබාදීම (මෙම ව්‍යාපෘතිය මගින් නිවාස ඉදිකිරීම සඳහා රුපියල් 100,000.00 බැගින් වාරික මුදල් ලබාදීම සිදු කරයි) | - | 16 | - | 16 |
| 2. | රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා නිදහස් දුම්රිය ගමන් බලපත් ලබාදීම | - | 16 | - | 16 |
| 3. | රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා නිදහස් බස් ගමන් බලපත්‍ර ලබාදීම | - | 88 | - | 88 |
| 4. | රණවිරු ශිෂ්‍යත්ව අරමුදල මගින් දැනට මියගිය සහ රණක්ෂිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ දු දරුවන් සඳහා මසකට රුපියල් 500.00 බැගින් ශිෂ්‍යත්ව ආධාර අදාල දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු නිමවන තෙක් ලබාදීම | 17 | 20 | - | 37 |
| 5. | අපි වෙනුවෙන් අපි සම්පූර්ණ නිවාස ව්‍යාපෘතිය (ආරක්ෂක අමාත්‍යාංශය) මෙම නිවාස ව්‍යාපෘතිය මගින් නිවසක් නොමැති රණවිරුවන් සඳහා රුපියල් 1,500,000.00 ක උපරිමයකට යටත්ව මුල්‍ය ආධාර ලබාදීම | 11 | 33 | 4 | 48 |
| 6. | අපි වෙනුවෙන් අපි අර්ධ නිවාස ව්‍යාපෘතිය (ආරක්ෂක අමාත්‍යාංශය) මෙම නිවාස ව්‍යාපෘතිය මගින් අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාසයන්හි වැඩ අවසන් කිරීම සඳහා රුපියල් 750,000.00 ක උපරිමයකට යටත්ව මුල්‍ය ආධාර ලබාදීම | 19 | 40 | 181 | 240 |
| 7. | විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය (රණවිරු සේවා අධිකාරිය) තුළින් සම්පූර්ණ නිවාස ඉදිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | 21 | 11 | - | 32 |
| 8. | විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය (රණවිරු සේවා අධිකාරිය) තුළින් අර්ධ නිවාස ඉදිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | 45 | 30 | - | 75 |
| 9. | මෙත්සෙවන අර්ධ නිවාස ව්‍යාපෘතිය (ආරක්ෂක අමාත්‍යාංශය) මෙම නිවාස ව්‍යාපෘතිය මගින් අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාසයන්හි වැඩ අවසන් කිරීම සඳහා රුපියල් 750,000.00 ක උපරිමයකට යටත්ව මුල්‍ය ආධාර ලබාදීම | 37 | 161 | - | 191 |
| 10. | රණවිරුවන් හට රජයේ ඉඩම් කොටස් ලබාදීමේ ව්‍යාපෘතිය | - | - | 58 | 58 |
| 11. | විරුසර වරප්‍රසාද කාඩ්පත 1 වන අධියර සඳහා නිර්දේශ ලබාදීම | 316 | 830 | - | 1146 |
| 12 | විරුසර වරප්‍රසාද කාඩ්පත 11 වන අධියර සඳහා නිර්දේශ ලබාදීම | - | - | 844 | 844 |

වගුව 5:17. අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදෙන ලද සුභසාධක පහසුකම් පිළිබඳ විස්තරය

105. නිලධාරීන්ගෙන් රු 50.00 ක මුදලක් හා සෙසුනිලයින්ගෙන් රු 10.00 ක මුදලක් මාසිකව අය කිරීම මගින් පවත්වාගෙන යන රණවිරු නිවාස අරමුදලෙන් ලැබෙන ආදායම් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කර ඇත. යුද්ධය නිසා මියගිය, තුවාල ලැබූවන්ගේ ළඟම ඥාතීන්ට නිවාස ගොඩනැංවීම සඳහා රු 500,000.00 ක මුලාධාර සැපයීම හා යුද්ධ හමුදාධිපතිගේ විශේෂ නිවාස ව්‍යාපෘති මින් සිදුකරනු ලැබේ.

<u>වර්ෂය තුළ විශේෂ සිදුවීම්</u>

106. නිවාස ආධාර හා සහතික පත් ප්‍රධානය කරන ලද ඡායාරූප පහත සඳහන් පරිදි වේ:





**<u>සාරාංශය</u>**

107. යුධමය වාතාවරණය නිමාකරලීම උදෙසා සුවිශේෂී මෙහෙවරක් ඉටුකල මියගිය රණවිරුවන්ගේ මෙහෙවර අගයමින් ඔවුන්ගේ ඥාතීන් වෙනුවෙන් විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් හා ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන්ගේ සුභසාධන කටයුතු මෙන්ම විශ්‍රාම යාමට නියමිත යුද්ධ හමුදා සාමාජිකයින් වෙත පාඨමාලා ලබාදීම ආදී කටයුතු ඉතා වගකීමෙන් සහ විධිමත්ව මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදු කරනු ලබයි.



## <u>පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

108. යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත්වූ සියලුම යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හා ස්වාභාවික අනතුරු වලට භාජනය වී ආබාධිත තත්ත්වයට පත්ව සිටින සියලුම සෙබළුන් පුනරුත්ථාපනය කිරීම, ආබාධිත සෙබළුන්ගේ ආබාධිත තත්ත්වයට අනුව ඔවුන්ව වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා යොමුකරවීම, ඒ සඳහා රජයේ දෙපාර්තමේන්තු සහ සිවිල් සංවිධාන සහ වෙනත් ආයතන සමඟ සම්බන්ධතාවයෙන් කටයුතු කිරීම, රෙජිමේන්තු මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතාවයෙන් යුතුව යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාමලත් ආබාධිත සෙබළුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය වර්ධනය පිළිබඳව සොයාබැලීම වැඩමුළු පැවැත්වීම පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කාර්ය වේ.

**<u>මුල්‍ය තොරතුරු</u>**

109. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි පුනරාවර්ථන වියදම් සඳහා පහත දක්වා ඇති මුදල් වෙන් කර ඇත.

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන් කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1 | පුනරුත්ථාපන සුභසාධක වැය ශීර්ෂය (222-01-2-1204 (VII)) | 200, 000,000.00 | 188,573,339.00 | 11,426,661.00 (2017 වසරෙහි වැය ශීර්ෂයෙහි අධික වියදම් නිසා හර කරන ලදී) |

වගුව 5:18. වැය ශීර්ෂ විස්තරය

## ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය

110. කෘතිම පාද, කෘතිම පාද නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපාංග, අමතර කොටස්, අමු ද්‍රව්‍ය සහ භෞත චිකිත්සක, වෘත්තිය චිකිත්සක හා ආධාර උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදා ගන්නා ලදී.

## වසරේ කාර්ය සාධන සාරාංශය

111. ආබාධිත නිලධාරියෙක් හා සෙසුනිලයින් 65 දෙනෙකු සඳහා වෘත්තිය පුහුණු පාඨමාලා ලබාදී ඇත.

112. රණවිරු සම්පත් කේන්ද්‍රය තුළ ආබාධිත රණවිරුවන් 249ක් වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ඇත.




## වසරේ ජයග්‍රහණයන්

113. වසරේ ජයග්‍රහණයන් පහත පරිදි වේ:

අ. රණවිරු සෙවන රාගමහි නව දෙමහල් සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය ඉදිකිරීම (ව්‍යාපෘතිය සඳහා අනුමත මුදල රුපියල් මිලියන 81.43 කි).




ආ. අභිමංසල 3 සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන ගජබා රෙජිමේන්තුවට අයත් සෙ/480582 කොප්‍රල් කරුණාරත්න පීකේජ්ජී යන කොනොනි හට යුද්ධ හමුදාධිපතිතුමාගේ පරිත්‍යාගය මත උසස් තත්ත්වයේ රෝදපුටු දෙකක් හා මූල්‍යමය ආධාර ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලද අතර, එම කොමිෂන් නොලත් නිලධාරී විසින් ලෝක ආබාධිත දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා රෝදපුටුව මතින් ගමන් කර එම කාර්යය සාර්ථකව නිම කරන ලදී.



**සාරාංශය**

114. ආබාධිත පුද්ගලයින්ගේ මානසික කායික හා සාමාජීය ක්‍රියාකාරී මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් හා ඔවුන්හට අවශ්‍ය ආධාර සපයාදීම තුළින් ඔවුන්ගේ ස්වාධීනත්වය සහ ආත්ම අධිෂ්ඨානය ඉහළ නැංවීමට පුනරුත්ථාපන ක්‍රියාවලිය මනාව ඉවහල් වන අතර, රණවිරු සෙවන, අභිමංසල 1,2,3 හා මිහිඳු සෙත් මැදුර යන සුවසහන නිකේතනයන්හි නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන හා වෛද්‍ය හේතූන් මත යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගිය/සේවයේ නියුතු සියලුම රණඝිතයට පත් රණවිරුවන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලින් සිදුකිරීම සහ ඔවුන්ට අවශ්‍ය උපකරණ/සේවාවන් ඉටුකරදීමේ කටයුතු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසියාකාරව හා වගකීමකින් යුතුව ඉටුකරනු ලබයි.

## මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය

115. මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීම සහ යුද්ධ හමුදාවට අයත් අංශ, ආයතනයන්හි රාජකාරී කරනු ලබන සියලුම නිලයින්ගේ මානව හිමිකම් කඩවීම් සබැඳිව සොයාබලා කටයුතු කිරීම මානව හිමිකම් හා මානුෂවාදී අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වේ.

**මූල්‍ය තොරතුරු**

116. 2018 වසරෙහි මුල්‍යමය වැය ශිර්ෂ හා වියදම් පහත පරිදි වේ.

| අනු අංකය | ගිණුමේ විෂය | වෙන් කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අභ්‍යාස දීමනා ගිණුම | 30,000.00 | 30,000.00 | - |
| 2. | සුභ සාධක ද්‍රව්‍ය මිලදී ගැනීම | 50,000.00 | 43,967.74 | 6,032.26 |
| 3. | භූමි නඩත්තු ද්‍රව්‍ය මිලදීගැනීම | 10,000.00 | 10,000.00 | - |
| 4. | පවිත්‍රතා ද්‍රව්‍ය මිලදී ගැනීම | 10,000.00 | 8,258.14 | 1,741.86 |
| 5. | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 225,000.00 | 97,925.45 | 127,074.55 |

වගුව 5:19. මූල්‍ය විස්තරය

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

117. 2018 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 04 ක් සාර්ථකව පැවැත්වූ අතර ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදන එම වැඩසටහන් සඳහා අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා යොදවන ලදී.

118. අභ්‍යාස දීමනා ගිණුම සඳහා ලබා දෙන ලද මුදලින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන මානව හිමිකම් පිළිබඳ පාඨමාලා සඳහා අවැසි පුහුණු උපකරණ හා එයට අයත් අවශ්‍යතා මිලදී ගන්නා ලදී.

119. භූමි නඩත්තු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වෙන්කර ඇති මුදලින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලත හා පිටත අලංකාරය වෙනුවෙන් මල් පැල, මල් පෝච්චි හා පොහොර ආදිය මිලදී ගන්නා ලදී.

120. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නිලධාරී/ සෙසුනිල හා සිවිල් සේවක මහතුන්ගේ පාලන කටයුතු වෙනුවෙන් ඇවැසි ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු සඳහා ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදා ගන්නා ලදී.

**වසරේ කාර්ය සාධන සාරාංශය**

121. යුද්ධ හමුදා චර්යා නියෝග ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරක්ෂක සේනා මුලස්ථාන, සේනාංක, බලසේනා මුලස්ථාන, බලඇණි යටතේ අදාල ප්‍රදේශයන්හි මානව හිමිකම් කමිටු 373 ස්ථාපනය කර ඇත.

අ. මානව හිමිකම් කමිටු විස්තරය පහත පරිදි වේ.

| අනු අංකය | ආසේමු | සේමු | බසේමු | රෙම | නිත්‍ය ඒකක | සෙව් ඒකක | අනෙකුත් මුලස්ථාන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) | (එ) |
| 1. | 07 | 22 | 72 | 23 | 158 | 80 | 10 | 373 |

වගුව 5:20. මානව හිමිකම් කමිටු විස්තරය

ආ. යුද්ධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, විශේෂ කාර්ය බළකාය, ශ්‍රී ලංකා පොලීසියට අයත් නිලධාරී 114 ක් සහ සෙසුනිලයින් 60 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වර්ෂය තුළ මූලික පුහුණු පාඨමාලා දෙකක් සහ උසස් සංස්කරණ පාඨමාලා දෙකක් පැවැත්වීමට කටයුතු සිදුකරන ලදී.

ඇ. සියලු රෙජිමේන්තු හා ඒ යටතේ ඇති ඒකක ආවරණය වන පරිදි පවත්වන ලද තෙදින වැඩමුළු තුළින් අපේක්ෂිත කාලය තුළ නිලධාරීන් 129 හා සෙසුනිලයින් 4,887 ක් පමණ මානව හිමිකම් හා මානුෂවාදී නීතිය පිළිබඳ දැනුවත් කරවීමට කටයුතු කරන ලදි.

ඈ. මානව හිමිකම් කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ආරක්ෂක සේනා මූලස්ථාන පුහුණු පාසල්, රෙජිමේන්තු හා ඒකක තුළ නිලධාරින් සහ සෙසුනිලයින් සඳහා මානව හිමිකම් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 16 ක් නිලධාරීන් 160 දෙනෙකු සහ සෙසුනිලයින් 3,381 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ඉ. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය සමග සම්බන්ධතාවයෙන් යුතුව ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ නිලධාරින් 25 ක් සහභාගී කරවමින් වැඩමුළුවක් ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර), ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සහ රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය යන ස්ථානයන්හිදි පවත්වන ලදි.

<u>වසරේ ජයග්‍රහණයන්</u>

122. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය, මානව හිමිකම් කොමිෂන් සභාව, ආරක්ෂක සේනා මූලස්ථාන, පුහුණු පාසල්, රෙජිමේන්තු හා ඒකක සමග ඒකාබද්ධව නිලධාරින් සහ සෙසුනිලයින් සඳහා මානව හිමිකම් විෂය පිළිබඳ මූලික පුහුණු පාඨමාලා, උසස් සංස්කරණ පාඨමාලා, මානව හිමිකම් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් පවත්වා එමගින් මානව හිමිකම් සබැඳිව වන උපදේශකයින් විශාල සංඛ්‍යාවක් යුද්ධ හමුදාවට දායාද කිරීමට හැකිවිම.

<u>ගැටළු සහ අභියෝග</u>

123. පාඨමාලාවන් සඳහා උපදේශක නිලධාරීන් යුධ සේවා ලේකම් කර්යාලය වෙතින් නම් කරනු ලබන අතර, මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සෙසුනිලයින් නම් කලද ඔවුන් අයත් ස්ථාන වෙතින් ඒ සඳහා සහභාගි නොකිරීම.

124. සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය (කුකුළේගඟ) පාසලෙහි පුහුණු ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා අන්තර්ජාල සහිත පරිගණක පහසුකම් නොමැති වීම.

125. පාඨමාලාවන් සඳහා නිලධාරීන්ගේ සහභාගිත්වය අවම මට්ටමක පැවතීම.

<u>සාරාංශය</u>

126. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මානුෂ්‍යවාදී නීතිය පිළිබඳ මූලික උපදේශක පුහුණු පාඨමාලාවන් හා උසස් සංස්කරණ උපදේශක පාඨමාලාවන් වැනි මානව හිමිකම් පාඨමාලාවන් සහ විවිධ මානව හිමිකම් සබැඳිව වන වැඩමුළු පවත්වා යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීම තුළින් යුද්ධ හමුදාවට අයත් ආයතන, අංශයන් හි රාජකාරී කරනු ලබනු සියලුම යුද්ධ හමුදා සාමාජිකයින්ගේ මානව හිමිකම් සුරැකීම කෙරෙහි විශාල මෙහෙවරක් සිදුවන අතර, යුද්ධ හමුදාව වෙත අත්‍යාවශ්‍යව පවතින මානව හිමිකම් විෂය පථය සබැඳිව වන උපදේශකයින් බිහිකිරීමෙහි ලා සුවිශේෂී කර්තව්‍යයක් ඉටුකරනු ලබයි.

## <u>ආධුනිකයින් බඳවාගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය</u>

127. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බළසේනාව වෙත සෙසුනිලයින් ලෙස තරුණ/තරුණියන් බඳවාගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීම් හා ප්‍රචාරණය සිදුකිරීම, වෘත්තීය නිලධාරීන් සහ කෙඩෙට් නිලධාරීන් බඳවාගැනීම, බඳවාගන්නා ලද අයවලුන් පුහුණු පාසල් වෙත රපෝර්තු කරවීම, බඳවාගන්නා ලද අයවලුන්ගේ වෙනස්වීම් විස්තරයන් (යුආපා 09) පළ කිරීම හා වැටුප් හා දීමනා ඉල්ලුම් කිරීමේ නාම ලේඛන වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, ස්වේච්ඡා බළසේනාව වෙත බඳවාගන්නා ලද සෙසුනිලයින් නිත්‍ය හමුදාගත කිරීම ආදී සියලුම බඳවා ගැනීම් සබැඳි කටයුතු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබයි.

<u>මූල්‍ය තොරතුරු</u>

128. 2018 වසරෙහි මුල්‍යාමය වැය ශීර්ෂ හා වියදම් පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | වෙන් කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ප්‍රචාරක කටයුතු හා ප්‍රසිද්ධ කිරීම් | 4,046,100.00 | 4,038,897.51 | 7,202.49 |
| 2. | රාජකාරී බස් ගමන් බලපත්‍ර | 11,500.00 | 379.00 | 11,121.00 |
| 3. | දුම්රිය ගමන් බලපත්‍ර | 125,000.00 | 4,800.00 | 120,200.00 |
| 4. | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් | 225,000.00 | 144,431.93 | 80,568.07 |
| 5. | පවිත්‍රතා ද්‍රව්‍ය මිලදී ගැනීම | 10,000.00 | 10,000.00 | - |
| 6. | භූමි නඩත්තු වියදම් | 5,000.00 | 5,000.00 | - |
| 7. | අභ්‍යාස දීමනා | 35,000.00 | 35,000.00 | - |
| 8. | සුභසාධක අරමුදල් (යුද්ධ හමුදාධිපති සුභසාධක ගිණුම වෙතින්) | 50,000.00 | 49,855.41 | 144.59 |

වගුව 5:21. මූල්‍ය විස්තරය

<u>ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය</u>

129. රුපියල් 564,197.01 ක මුදලක් වැය කර මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වාහන ගාල් කර තැබීම සඳහා රථ ගාලක් ඉදිකිරීම හා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ක්‍රමවත් විදුලි සැපයුම් පද්ධතියක් නොතිබූ බැවින්, රුපියල් 37,780.00 ක මුදලක් වැය කර විදුලි මීටරයක් සවිකිරීම.

130. ප්‍රචාරක කටයුතු හා ප්‍රසිද්ධ කිරීම් වෙනුවෙන් වෙන්කරන ලද මුදලින් වැය දරා පුවත්පත් දැන්වීම්, රූපවාහිණි දැන්වීම් ප්‍රචාරක කටයුතු සිදුකිරීම.

131. පාලන හා නඩත්තු අවශ්‍යතාවයන් වෙනුවෙන් වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන තුළින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය කාර්යාල ලිපි ද්‍රව්‍ය හා නඩත්තු උපකරණ මිලට ගෙන වැයවීම් අවම කරමින් වෙන්කරන ලද ප්‍රතිපාදන මුදල නොයික්මවා අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම.

<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>

132. විධිමත්ව හා සංවිධානාත්මක ලෙස ප්‍රචාරක කටයුතු දියත්කර වෘත්තීය නිලධාරීන් සහ කෙඩෙට් නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කරන ලදී.

<u>වසරේ ජයග්‍රහණයන්</u>

133. සාර්ථක ප්‍රචාරන ව්‍යාපාරයෙහි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරට වඩා වැඩි සොල්දාදුවන් ප්‍රමාණයක් බඳවා ගැනීමට හැකිව තිබේ.

134. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට වසර තුළදී පහත ජයග්‍රහණයන් ළඟා කර ගැනීමට හැකිවිය.

අ. උපකරණ නඩත්තු ලිපිද්‍රව්‍ය හා සෙසුද්‍රව්‍ය සඳහා වන වැය ශිර්ෂය නොඉක්මවමින් භාවිතා කිරීමට හැකි වීම.

ආ. ආරක්ෂිත විදුලි සම්බන්ධතාවයන් ලබාගැනීමට හැකිවීම.

ඇ. වාහන නිසිපරිදි බලා ගැනීමට හැකිවීම.

ඈ. පෙර වසරට වඩා වැඩි සොල්දාදුවන් ප්‍රමාණයක් බඳවාගැනීමට හැකිවීම.

<u>ගැටලු සහ අභියෝග</u>

135. යුද්ධය අවසන් වීමෙන් පසු වර්තමානයේ තරුණ තරුණියන් ආධුනිකයින් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත බැඳීමේ ප්‍රවණතාවය ඉතාමත් පහළ මට්ටමක පවතින අතර, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කෙරෙහි ආකර්ශණය කරලීම අභියෝගයක්ව පවතියි.

<u>සාරාංශය</u>

136. සුදුසුකම්ලත් පුරවැසියන් කෙඩෙට් නිලධාරීන් හා ආධුනික සෙබලුන් ලෙස යුද්ධ හමුදාවට බඳවාගැනීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම වන බැවින්, ඒ සඳහා වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන යොදා ගනිමින් වඩාත් විධිමත්ව හා සංවිධානාත්මකව රෙජිමේන්තු වෙතින් ලැබෙන අනගි සහයෝගය මත මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ හැකියාවන් උපරිම අයුරින් මෙහෙයවමින් එම අරමුණු සාර්ථකව හා ඵලදායි ලෙස ඉටුකර ගැනීමට කටයුතු කිරීම.

137. ඉදිරි වර්ෂයන් තුළ යුද්ධ හමුදාධිපති තුමාගේ හා විධායක ජෙනරාල් තුමාගේ මගපෙන්වීම යටතේ තරුණ තරුණියන්ගේ ආකර්ෂණය දිනාගැනීම සඳහා යුද්ධ හමුදාවෙහි අභිමාණය පිළිඹිබු කෙරෙන ජාතික මට්ටමේ වැඩ පිළිවෙලක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සැලසුම්කර ඇති අතර, ඊට යුද්ධ හමුදාධිපති තුමාගේ අනුමැතිය ලැබීමෙන් පසුව ක්‍රියාවට නැංවීමට කටයුතු සම්පාදනය කර ඇත.

<u>සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

138. යුද්ධ හමුදාවෙහි වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් හා යුද්ධ හමුදා සිවිල් කාර්ය මණ්ඩලයෙහි කාර්ය සාධනය ඉහළ නැංවීමේ අරමුණින් සිවිල් කාර්ය මණ්ඩල බඳවාගැනීම්, උසස් කිරීම්, පුහුණු කිරීම්, විශ්‍රාම ගැන්වීම්, වැටුප් හා දීමනා ගෙවීම් අනුමත කිරීම හා සුභසාධන කටයුතු වඩාත් විධිමත්ව හා කාර්යක්ෂම ලෙස සංවිධානය කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යභාරය වී ඇත.

<u>මූල්‍ය තොරතුරු</u>

139. මූල්‍ය තොරතුරු විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂයේ නම | වෙන් කරන ලද මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | වැටුප් | 3,232,944,700.00 | 2,479,898,055.56 | 753,046,644.44 |
| 2. | අතිකාල දීමනා | 1,007,607,500.00 | 1,007,582,634.01 | 24,865.99 |
| 3. | වෙනත් දීමනා | 1,722,155,000.00 | 1,705,709,168.81 | 16,345,831.19 |
| 4. | සංයුක්ත දීමනා | 51,300,000.00 | 42,434,892.26 | 8,865,107.74 |
| 5. | දේපල ණය, පොලි | 3,700,000.00 | 2,777,011.74 | 922,988.26 |
| 6. | පාඨමාලා | 3,000,000.00 | 2,834,500.00 | 165,500.00 |

වගුව 5:22. මූල්‍ය විස්තරය - සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය**

140. නව සිවිල් පරිපාලනය පිළිබඳ උපදෙස් සංග්‍රහය නිකුත් කිරීමෙන් අනතුරුව ආරක්ෂක සේනා මූලස්ථාන මට්ටමින් යුද්ධ හමුදා කඳවුරු වල උපකරණ පාලන නිලධාරීන්, සිවිල් විෂය භාර ලිපිකරුවන් හා සිවිල් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ පහත දක්වා ඇති වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගන්නා ලදී:

අ. පුහුණු පාඨමාලා පැවැත්වීම.

| අනු අංකය | පුහුණු පාඨමාලා පැවැත්වූ ස්ථානය | වැඩසටහනට සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | භට කාර්ය සම්පාදන විද්‍යාලය - ත්‍රිකුණාමලය | 95 |
| 2. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරන බළකා පුහුණු පාසල - දොඹගොඩ | 430 |
| 4. | ස්වෙච්ජා බලසේනා පුහුණු පාසල - දියතලාව | 165 |

වගුව 5:23. පුහුණු පාඨමාලා පැවැත්වීම පිළිබඳ විස්තරය

ආ. රාජකාරී වගකීම් සහ කාර්යන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| අනු අංකය | පුහුණු පාඨමාලා පැවැත්වූ ස්ථානය | පැවැත්වූ දිනය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) - පනාගොඩ | 2018.07.17 |
| 2. | ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) - දියතලාව | 2018.07.19 |
| 3. | ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) - වැලිකන්ද | 2018.08.16 |
| 4. | ආරක්ෂක සේනා මූලස්ථානයූ (වන්නි) - වව්නියාව | 2018.08.17 |

වගුව 5:24. රාජකාරී වගකීම් සහ කාර්යන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් විස්තරය

ඇ. ණය ලබාදීම.

| අනු අංකය | ණය වර්ගය | සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |
| 1. | ආපදා ණය | 551 | 161,226,478.89 |
| 2. | උත්සව අත්තිකාරම් ණය | 4,759 | |
| 3. | විශේෂ අත්තිකාරම් ණය | 1,359 | |

වගුව 5:25. සිවිල් සේවකයින් වෙත ණය ලබාදීම් පිළිබඳ විස්තරය

ඈ. පුහුණු පාඨමාලා.

(1) මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය හා මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය හි සාමාජිකයන් 260 ක් සඳහා රු 2,564,500.00 ක් වැය කරමින් විදෙස් පුහුණු පාඨමාලා, ගිණුම්කරන හා පරිගණක පාඨමාලා පවත්වන ලදී.

(2) සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා රු 270,000.00 ක් වැය කරමින් කාර්යාල කළමනාකරණ හා පරිපාලන ක්‍රියාපටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

141. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිවිල් කාර්ය මණ්ඩලයෙහි සුභ සාධනය සඳහා පිහිටුවා ඇති සිවිල් සේවක යහසාධක සංගමයෙහි සාමාජිකත්වයට පහත සඳහන් පරිදි ප්‍රතිලාභ ගෙවා ඇත:

| අනු අංකය | වැය ශීර්ෂයේ නම | ප්‍රතිලාභ මුදල (රු.) | සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | උත්සව අත්තිකාරම් | 10,465,000.00 | 1,019 |
| 2. | විශේෂ අත්තිකාරම් | 1,640,000.00 | 328 |
| 3. | නිවාස ණය ගෙවීම | 51,550,000.00 | 647 |
| 4. | 90% ණය ගෙවීම | 50,593,882.00 | 865 |
| 5. | මරණ පාරිතෝෂිතය ගෙවීම | 13,230,000.00 | 410 |
| 6. | විශ්‍රාම පාරිතෝෂිතය ගෙවීම | 5,078,300.00 | 147 |
| 7. | 5 වසර ශිෂ්‍යාධාර | 570,000.00 | 38 |
| 8. | විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර | 325,000.00 | 13 |
| | **එකතුව** | **133,452,182.00** | **3,467** |

වගුව 5:26. ප්‍රතිලාභ ලබාදීම් විස්තරය

<u>**වසරේ කාර්ය සාධන සාරාංශය**</u>

142. සිවිල් විෂයභාර ලිපිකරුවන් හා සිවිල් කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ණය ලබාදීම, පුහුණු පාඨමාලා පැවැත්වීම ඵලදායී ලෙස සිදුකරන ලදී.

**වසරේ ජයග්‍රහණයන්**

143. සිවිල් විෂයභාර ලිපිකරුවන් හා සිවිල් කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලා, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය පැවැත්වීම තුළින් ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට හැකිවීම හා ප්‍රතිඵලදායී සේවාවක් ලබාගැනීමට හැකිවීම.

144. සිවිල් සේවකයින් වෙත ණය ලබාදීම සහ ඔවුන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් මූල්‍යමය ආධාර ලබාදී ඔවුන්ගේ ජීවන මට්ටම නගා සිටුවීමට හැකිවීම.

**සාරාංශය**

145. නිලධාරීන් සහ විෂය ලිපිකරුවන් සඳහා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ඇති සිවිල් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කිරීම, ප්‍රාථමික, ද්වීතීය, තෘතීය කාර්ය මණ්ඩලය සඳහා පුහුණු කිරීම් ආදී වැඩසටහන් මගින් මනා දැනුමකින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් බිහිකිරීමට අපේක්ෂා කර ඇති මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සිවිල් සේවක පුරප්පාඩු සඳහා බඳවාගැනීමේ කටයුතු, සිවිල් කාර්ය මණ්ඩලයට උසස් වීම් ලබාදීම, වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම, සිවිල් සේවක යහසාධක සංගමයෙහි සාමාජිකත්වය ලබානොගත් ස්ථිර සිවිල් සේවක කාර්ය මණ්ඩලය සඳහා සාමාජිකත්වය ලබාදීම ආදි සිවිල් සේවක මහත්ම/මහත්මීන් සම්බන්ධයෙන් වන සියලුම පරිපාලන කටයුතු වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් වඩාත් විධිමත්ව හා කාර්යක්ෂම සිදුකිරීම.

**ලායා සමූහ හෝටල් ප්‍රධාන කාර්යාලය**

146. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් ලායා හෝටල් සමූහයෙහි ලායා බීච් (වාද්දුව), ලායා ලෙෂර් (කුකුලේගඟ), ලායා සෆාරි (යාල) සහ ලායා වේව්ස් (කල්කුඩා) නමින් සංචාරක හෝටල් හතරක් පවත්වාගෙන යනු ලබන අතර, එම හෝටල් හි පාලන කටයුතු ලායා හෝටල් සමූහ ප්‍රධාන කාර්යාලය විසින් ඉටුකරනු ලබයි.

**මූල්‍ය තොරතුරු**

147. ලායා සමූහ හෝටල් හි මුළු ආදායම රුපියල් මිලියන 362.37 ක් හා මුළු පිරිවැය රුපියල් මිලියන 271.11ක් වන අතර ශුද්ධ ලාභය රුපියල් මිලියන 91.26 ක් වේ. මෙම කාලය තුළ ප්‍රාග්ධන වියදම් නොමැත.

**<u>ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය</u>**

148. ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය පහත පරිදි වේ:

අ. ලායා බීච් (වාද්දුව), ලායා ලෙෂර් (කුකුලේගඟ), ලායා සෆාරි (යාල) සහ ලායා වේව්ස් (කල්කුඩා) යන හෝටල්හි පහත දක්වා ඇති කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගන්නා ලදී.

(1) කාර්ය මණ්ඩලයෙහි සේවා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(2) සමාජ වෙබ් අඩවි හා පුවත්පත් මගින් ලායා හෝටල් පිළිබඳ ප්‍රචාරණය ලාබාදිම.

(3) විශ්වාසවන්ත පාරිභෝගිකයන් හට දිරි දීමනා කාඩ්පත (Loyalty Card) 15% ක වට්ටමක් සහිතව ලබාදිම.

ආ. **<u>ලායා බීච්.</u>**

(1) සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරනය වැඩිදියුණුකිරීම.

(2) යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සූපවේදි හැකියාව වර්ධනය සඳහා මුලික සූපසහායක පාඨමාලා පැවැත්වීම.

(3) 2018 වසර සඳහා සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි සහතිකය ලබාගැනීම.
ඊ

(4) ප්‍රජා සත්කාරක සේවාවන් සිදුකිරීම.

(5) "Sea Food Fiesta" 2018 සංවිධානය කිරීම.

ඇ. **<u>ලායා ලෙෂර්.</u>**

(1) Booking.com වෙබ් අඩවියෙහි ලායා ලෙෂර්හි තොරතුරු යාවත්කාලීන කිරීම.

(2) යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සූපවේදි හැකියාව වර්ධනය සඳහා වැඩිදුර පුහුණු සූපසහායක පාඨමාලා පැවැත්වීම.

(3) යුද්ධ හමුදා නිවාඩු බංගලාවන්හි කාර්ය මණ්ඩලය සඳහා ගෘහ පාලන/භෝජන ශාලා වැඩමුලු පැවැත්විම.

(4) හෝටලය අවට පරිසරය සංවර්ධනය කිරීම.

(5) ආහාර වට්ටෝරු වෙනස් කිරීම හා විවිධ වර්ගයේ ආහාර බුෆෙ සඳහා එකතු කිරීම.

ඈ. **<u>ලායා සෆාරි.</u>**

(1) වෙරළාසන්නව පිහිටි පරිසර හිතකාමී හෝටලයක් බවට පත්කිරිම.

(2) ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න බවින් අනර්ඝ සේවාවක් සැපයීම.

(3) සියලුම අමුත්තන් සඳහා අද මෙන්ම හෙටත් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරිමට නිරතුරුවම සහයෝගය ලබාදිම.

(4) Trip Advisor විසින් මෙහෙයවන ලද හරිත නායකත්ව වැඩ සටහන සඳහා ක්‍රියාකාරි තරඟකරුවෙකු බවට පත්වීම.

(5) අමුත්තන් සඳහා සම්බාහන (Spa) පහසුකම් වැඩි දියුණු කිරිම.

(6) ඇතුලත අලුත්වැඩියා කිරිම හා රෙදිපිළි ආදේශ කිරිම.

(7) Online Booking ක්‍රමයෙහි අන්තර්ගතය වැඩි දියුණු කිරිම.

(8) හෝටලයෙහි අවට ප්‍රදේශය හා ආසන්න පරිසරය වඩාත් ආකර්ෂණීය කිරිම.

(9) එළිමහන් භෝජනාගාර පහසුකම් වැඩිදියුණු කිරිම.

(10) තිරසාර සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරිම.

ඉ. **<u>ලායා වේව්ස්.</u>**

(1) කාමර වෙන් කිරිමේ පහසුකම් අන්තර්ජාලය හරහා (booking.lk, booking.com, Expedia.com) සිදුකිරිම හඳුන්වා දීම.

(2) මත්පැන් බලපත්‍රය ලබාගැනිම.

(3) Online Booking ක්‍රමවත්ව අන්තර්ගතය වැඩි දියුණු කිරිම.

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

149. පුහුණු වැඩසටහන්, සූපසහායක පාඨමලා, ප්‍රජා සත්කාරක සේවාවන් පැවැත්වීම.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

150. Trip Advisory ලායා හෝටල් ව්‍යාපාරය ලැයිස්තුගත වීම.

151. කාමර වෙන්කිරිමේ පහසුකම අන්තර්ජාලය හරහා (booking.lk, booking.com, Expedia.com) සිදුකිරිමට හැකියාව ලබාදිම.

152. ලායා හෝටල් වෙබ් පිටුව යාවත්කාලින කිරීමට හැකිවිම.

153. 'සංචාරක උදාව - 2018' හෝටල් ප්‍රදර්ශණයන් සඳහා සහභාගී වීමට හැකිවීම.

154. කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලැබු සංචාරක නායකත්ව සමුළුව සඳහා ලායා හෝටල් සමූහයේ විධායක නිලධාරින් සහභාගී කරවීමට හැකිවීම.

155. සියලුම දේපලවල මෙහෙයුම් කටයුතු අධීක්‍ෂණය හා ඇගයීමට ලක්වීම.

156. පුහුණු වැඩසටහන්, වට්ටම්, සූපසහායක පාඨමාලා, ප්‍රජා සත්කාරක සේවාවන් ආදිය ලබාදී තිරසාර සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරිම සඳහා දායක වීමට හැකිවීම.

**<u>ගැටලු හා අභියෝග</u>**

157. කාමර පහසුකම් හා එළිමහන් ත්‍රාසජනක ක්‍රියාකාරකම් වර්ධනය කිරීම මඟින් අදායම මිලියන 15 කින් ඉහළ නැංවීම.

158. වෙරළාශ්‍රිත හෝටල් සඳහා වන "Green Leader" සම්මානය ලබා ගැනීම.

159. ලායා සෆාරි හා ලයා වේව්ස් යන හෝටල් සඳහා "Travels Choice" සන්නාමය ලබා ගැනීම.

160. ලයා හෝටල් සමූහය වැඩිදියුණු කිරීමට 2020 දක්වා උපායමාර්ගික සැලසුම් සැකසීම.

**<u>සාරාංශය</u>**

161. මෙම ආයතනය වෙතින් පාලනය වන හෝටල් මඟින් යුද්ධ හමුදා සාමාජිකයින් හට හෝටල් ක්ෂේත්‍රය මඟින් ලබාදිය හැකි සේවාවන් ඉතා සහනදායී වට්ටම් සහිත මිලට ලබාදීම තුළින් යුද්ධ හමුදා සියලුම නිලයින් හට ඉතාමත් සුවිශේෂී සුහසාධනයක් සිදුවන අතර, ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක් සහිත හෝටල් සමූහයක් යුද්ධ හමුදාව සතුවීම හේතුවෙන් යුද්ධ හමුදාව වෙත කීර්තිනාමයක් අත්පත් කර දීමට මෙම ආයතනයට හැකියාව ලැබී ඇත.

## උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව

1. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ප්‍රධාන මාණ්ඩලික ශාඛාවන් අතුරින් ඒකක් වේ. යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් ප්‍රකාශිත හමුදා චර්යා නියෝග 18/94 අනුව ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත දුම්රිය, ගොඩබිම මාර්ග, ගුවන් සහ මුහුදු මාර්ග මගින් භටපිරිස් සහ භාණ්ඩ ප්‍රවාහනය මෙම ශාඛාව මගින් පාලනය කරනු ලබයි. යුධ හමුදා ජනපද, භට නිවාස පරිපාලනය, නවාතැන් පහසුකම් ලබාදීම, සලාක සැපයීම, සියළුම ප්‍රවාහන අවශ්‍යතා, වාහන හා යුද්ධ හමුදාවෙහි සියළුම ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා ක්‍රියාත්මක කිරීම උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව සතු වගකීම් වේ.

2. පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයන් මෙම ශාඛාව වෙතින් පාලනය කරනු ලබයි:




රූප සටහන 6:1. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති ආයතන

**<u>මූල්‍ය තොරතුරු</u>**

3. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩල හතර මගින් පවත්වා ගෙන යනු ලබන සියළුම ගිණුම් හි ප්‍රතිපත්ති පාලක උපකරණ මාස්ටර් ජෙනරාල් වන අතර, 2018 වර්ෂයට අදාල සුලු ප්‍රසම්පාදන කමිටුවල මූල්‍ය විස්තරය පහත සඳහන් වේ:

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩලය | ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | වටිනාකම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ඉඩම්, දේපල සහ භට නිවාස අධ්‍යක්ෂ මණ්ඩලය | 26 | 13,784,465.39 |
| 2. | ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 58 | 36,569,806.30 |
| 3. | සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය | 49 | 29,088,671.51 |
| 4. | ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 310 | 310,379,617.55 |
| | **එකතුව** | **443** | **389,822,560.75** |

වගුව 6:1. මූල්‍ය විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ඉඩම්, දේපළ සහ හය නිවාස අධ්‍යක්ෂ මණ්ඩලය

4. යුද්ධ හමුදා චර්යා නියෝග 14/2018 ට අනුව ඉඩම්, දේපළ සහ හය නිවාස අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඉඩම්/ගොඩනැගිලි පවරා ගැනීම, කුලී ගෙවීමේ පදනම මත ගොඩනැගිලි ලබාගැනීම, යුද්ධ හමුදා ගොඩනැගිලි සඳහා වන වාර්ෂික වරිපනම් බදු මුදල් ගෙවීම් සිදුකිරීම, යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයන් සඳහා විවාහක නිවාස හා නිවාඩු බංගලා වෙන් කිරිම සහ යුද්ධ හමුදාව විසින් සංවිධානය කරනු ලබන උත්සව සහ සංදර්ශන වැනි කටයුතු වලදී සියළු නිලයන් හට අවශ්‍ය නවාතැන් පහසුකම් සැලසීම සිදුකරනු ලබයි.

### ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

| (33) | 222-01-3-2103 (I) c | යන්ත්‍රෝපකරණ (ප්‍රධාන මාණ්ඩලික ශාඛාව) | 20,000,000.00 | 18,816,575.00 | 702,937.50 | 19,519,512.50 |
| (34) | 222-01-3-2103 (II) | ආයුධ හා ආම්පන්න | 204,366,583.18 | 87,197,876.69 | 53,878,418.73 | 141,076,295.42 |
| (35) | 222-01-3-2103 (III) | සංඥා උපකරණ | 150,000,000.00 | 118,881,624.63 | 15,498,779.40 | 134,380,404.03 |
| (36) | 222-01-3-2103 (IV) | සුනඛයින් මිලදී ගැනීම | 6,242,414.50 | 5,450,892.50 | 791,522.00 | 6,242,414.50 |
| (37) | 222-01-3-2103 (V) | සංගීත උපකරණ | 30,000,000.00 | 23,718,907.50 | 6,647,848.40 | 30,366,755.90 |
| (38) | 222-01-3-2103 (VI) | උපකරණ | 22,295,425.00 | 2,945,562.62 | | 2,945,562.62 |
| (39) | 222-01-3-2103 (VII) | යුධ කණ්ඩායම්වල පහසුකම් | 43,910,000.00 | 38,093,380.08 | 3,430,356.00 | 41,523,736.08 |
| (40) | 222-01-3-2-2509-17 | ඉන්දියානු ණය යෝජනා ක්‍රමය | 199,000,000.00 | 195,236,699.00 | | 195,236,699.00 |
| (41) | 222-01-3-3-2509-17 | පකිස්ථානු ණය යෝජනා ක්‍රමය | 15,000,000.00 | | | |
| (42) | 222-01-3-2-2509-12 | ඉන්දියානු ණය යෝජනා ක්‍රමය | 1,755,000,000.00 | | | |
| (43) | 222-01-3-3-2509-12 | පකිස්ථානු ණය යෝජනා ක්‍රමය | 89,172,000.00 | | | |
| (44) | 222-01-1-3-2509 (i) | ලෙබනන් | 11,282,050.69 | 16,438,655.65 | 1,543,950.00 | 17,982,605.65 |
| (45) | 222-01-1-3-2509 (ii) | සූඩාන් | 55,242,227.16 | 32,827,712.23 | 13,754,819.25 | 46,582,531.48 |
| (46) | 222-01-1-3-2509 (iii) | මාලි රාජ්‍යය | 1,529,709,313.51 | 1,432,877,885.67 | 22,188,217.12 | 1,455,066,102.79 |
| (47) | 222-01-1-3-2509 (iii) a | මාලි රාජ්‍යය | 2,702,845.00 | 2,751,245.00 | | 2,751,245.00 |
| (48) | 222-01-1-3-2509 (iv) | මාලි රාජ්‍යය | 50,649,435.25 | 25,449,435.45 | | 25,449,435.45 |
| (49) | 222-01-1-3-2509 (iii) b | මාලි රාජ්‍යය | 38,783,077.69 | 2,173,549.35 | 7,146,954.60 | 9,320,503.95 |
| (50) | 222-01-1-3-2509 (iii) c | මාලි රාජ්‍යය | 38,783,077.69 | 2,173,549.35 | 6,293,196.12 | 8,466,745.47 |
| (51) | 222-01-1-1-2509 | පාංශු සම්පත් | 4,000,000.00 | 1,397,000.00 | 2,073,250.00 | 3,470,250.00 |
| (52) | 145-02-03-18-2509-0-11 | බිම්වෙඩි | 2,471,050.00 | 2,447,947.50 | | 2,447,947.50 |
| | **එකතුව** | | **5,058,880,985.67** | **2,707,254,041.81** | **261,406,060.77** | **2,968,660,102.58** |
| | **මුලු එකතුව** | | **9,628,943,465.55** | **6,356,772,737.03** | **1,150,385,154.53** | **7,507,157,891.56** |

වගුව 7:2. මූල්‍ය විස්තරය - යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

ඇ. <u>විදුලි යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය</u>.

| අනු අංකය | විස්තරය | වැඩි කල මුදල (රු.මි) | ඉදිරියට ගෙනා බැර ශේෂය (රු.මි) | වැය කිරීම් (රු.මි) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| | **<u>වැය ශීර්ෂය</u>** | | | |
| 1. | ප්‍රවාහන අමතර කොටස් (222-01-2-1205(i)) | 235.00 | 21.82 | 232.60 |
| 2. | වැය ද්‍රව්‍ය (222-01-2-1205(viii)a) | 106.28 | 15.66 | 90.57 |
| 3. | කාර්යාලිය උපකරණ හා විදුලි උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව (222-01-2-1302(i)) | 44.40 | 7.27 | 40.40 |
| 4. | 'ඒ' වාහන අලුත්වැඩියාව (222-01-2 -1302(i)) | 9.00 | 0.10 | 8.90 |
| 5. | කාලතුවක්කු හා ජිටිව් අලුත්වැඩියාව (222-01-2-1302(viii)) | 3.78 | 0.78 | 3.00 |
| 6. | ජීව වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව (222-01-2-1302(xiâ | 21.50 | 1.38 | 20.06 |
| 7. | වැඩපල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව (222-01-2-1302(xiii)) | 6.10 | 0.34 | 5.76 |
| | **<u>ප්‍රාග්ධන වැය ශීර්ෂය</u>** | | | |
| 8. | යන්ත්‍ර සූත්‍ර පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම (222-01-3-2002(iii)) | 23.00 | 0.73 | 22.26 |
| 9. | වාහන පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම (222-01-3-2003(ii)) | 287.00 | 13.32 | 273.29 |
| | **<u>සාම සාධක මෙහෙයුම් රාජකාරී වියදම් වැය ශීර්ෂය</u>** | | | |
| 10. | ලෙබනන් රාජ්‍යයෙහි සාම සාධක මෙහෙයුම් රාජකාරී වියදම් (222-01-1-3-2509(i)) | 7.59 | 1.02 | 6.46 |
| 11. | සූඩාන් රාජ්‍යයෙහි සාම සාධක මෙහෙයුම් රාජකාරී වියදම් (222-01-1-3-2509(ii)) | 0.47 | 0.17 | 0.22 |
| 12. | මාලි රාජ්‍යයේ සාම සාධක මෙහෙයුම් රාජකාරී වියදම් (222-01-3-2509(iii)) | 2.35 | 1.32 | - |
| 13. | ත්‍රිවිධ හමුදා කාන්තා විනයාරක්ෂක භට කණ්ඩායමෙහි අවශ්‍යතා වියදම් (222-01-1-3-2509(iii)c) | 3.33 | - | 3.33 |
| 14. | හයිටි රාජ්‍යයෙහි සාම සාධක මෙහෙයුම් රාජකාරී වියදම් (222-01-1-3-2509(iv)) | 44.80 | 0.01 | 44.24 |

වගුව 7:3. මූල්‍ය විස්තරය - විදුලි හා යාන්ත්‍රක ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය

**<u>වසරේ කාර්ය සාධන සාරාංශය</u>**

4. මෙම ශාඛාව සහ ඒ යටතේ පාලනය වන අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල වල වසරේ කාර්ය සාධන සාරාංශය පහත සඳහන් පරිදි වේ:

අ. **<u>යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව.</u>** බැරැක්ක නඩත්තු, පවිත්‍රතා හා සනීපාරක්ෂක, තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා, ගෙවීම් යන්ත්‍රෝපකරණ වැය ශීර්ෂය සහ යුද්ධ කණ්ඩායම් වලට පහසුකම් සැපයීමේ වැය ශීර්ෂ යටතේ බැරැක්ක නඩත්තු කටයුතු සඳහා මෙන්ම නිලධාරී/සෙනින් හට අවශ්‍ය සනීපාරක්ෂක අවශ්‍යතා සඳහා ද මුදල් ප්‍රතිපාදන වෙන්කරදීම, කාර්මික ඇගයීම් කමිටුව සඳහා භාණ්ඩ මිලදීගනු ලබන මුදලට සාපේක්ෂව ගෙවීම් කටයුතු කිරීම සිදුකර ඇත. තවද, 2018 වසරේ යන්ත්‍රෝපකරණ වැය ශීර්ෂය යටතේ ජල පිරිපහදු යන්ත්‍ර 42 ක් ආරක්ෂක සේනා මූලස්ථාන/ සේනාංක මූලස්ථාන/ බළසේනා මූලස්ථාන වෙත බෙදාදී ඇති අතර, මෙමගින් වකුගඩු ආශ්‍රිත රෝග නිවාරණය කරගත හැකිවීම.

ආ. **<u>යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය.</u>** යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයුම් පාලනය/මිලදී ගැනීම් සිදුකරන වැයශීර්ෂය සඳහා වෙන්කල වාර්ෂික ප්‍රතිපාදන හා ඊට අදාල වියදම් පිරික්සුම්දායි ලෙස මිලදී ගැනීම් සිදුකර ඇති අතර, මෙමගින් යුද්ධ හමුදාව වෙත භාණ්ඩ මිලදී ගැනීම, නිකුත් කිරීම, තොගගත කිරීම හා ගබඩාකරණය කිරීම, භාණ්ඩ නඩත්තු කිරීම හා නිසි පරිදි බෙදාහැරීම, භාණ්ඩ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, වාර්ෂික තොග සමීක්ෂණය සහ භාණ්ඩ නිකුත් කිරීම සිදුකර ඇත.

ඇ. **<u>විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය.</u>** මූල්‍ය කළමණාකරන ක්‍රමවේදයට අනුව ලබාදී ඇති මූල්‍ය ප්‍රතිශතයන්ගෙන් 99% ක් තරම් වූ බිල්පත් නිරවුල් කර ගැනීමට ක්‍රියාකර ඇති අතර ප්‍රධාන වශයෙන් මාලි රාජ්‍යයෙහි සාම සාධක රාජකාරි සඳහා ව්‍යාපෘතියක් වශයෙන් සන්නද්ධ රථ 20 ක ප්‍රමාණයක් නවීකරණය කර අලුත්වැඩියා කිරීම. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළඇණි හා වැඩපලයන්හී වාහන සහ උපකරණ අලුත්වැඩියා සිදුකිරීම සහ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා ස්ථාන වෙතින් වාහන සේවා කිරීම් ආදිය සිදුකර ඇත.

ඈ. **<u>තත්ත්ව ආරක්ෂක පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලය.</u>** ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මිලදී ගැනීමට කටයුතු කරනු ලබන භාණ්ඩ/යන්ත්‍රෝපකරණ සඳහා පිරිවිතරයන් පරීක්ෂාකරදීම, යාවත්කාලින කර නිර්දේශ ලබාදීම හා එම පිරිවිතර නඩත්තු කිරීම සිදුකිරීම, ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත භාණ්ඩ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද පිරිවිතරයන් පරීක්ෂා කර යාවත්කාලින කර නිර්දේශ ලබාදීම, සැපයුම්කරුවන් විසින් සැපයුම් කරන ලද රෙදිපිළි/භාණ්ඩ/යන්ත්‍රෝපකරණ පිරිවිතරයන් හා අනුමත නියැදි අනුව පරීක්ෂාකර බලා තොගගත කිරීමට අවශ්‍ය නිර්දේශ ලබාදීම, සංග්‍රාමික උපකරණ වැය ශීර්ෂය යටතේ මිලදී ගැනීමට සියළුම සංග්‍රාමික උපකරණ පිරිවිතරයන් පරීක්ෂාකර යාවත්කාලීන කර නිර්දේශ ලබාදීම සහ ඊට අදාල සියළුම නියැදි හා සියළුම වර්ගයේ පරීක්ෂණ වාර්තා අධ්‍යනය කර ඉහළ ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් වැඩි ඉතා හොඳ තත්ත්වයේ භාණ්ඩ මිලදී ගැනීමට අවැසි උපදෙස් හා සහාය ලබාදීම සිදුකර ඇත.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

5. මෙම ශාඛාව සහ ඒ යටතේ පාලනය වන අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල වල වසරේ වසරේ ජයග්‍රහණයන් පහත සඳහන් පරිදි වේ:

අ. **<u>යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව.</u>**

(1) 2015 වසරේ සිට 2018 වසර දක්වා රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී නොගැනීම සම්බන්ධව රජය විසින් ගෙන තිබූ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් මුදල් වෙන්කර නොතිබූ අවස්ථාවක මෙම ශාඛාව වෙතින් වාහන (යතුරු පැදි හා බස්) මිලදී ගැනීම් සිදුකරන ලදි. මුදල් අමාත්‍යාංශය වෙතින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිපි ඉදිරිපත් කිරීම තුළින් පහත සඳහන් පරිදි වාහන මිලදී ගැනීම් සිදුකරන ලදි.

(අ) 250 සීසී යතුරු පැදි 25 ක් විශේෂ කාර්ය බළකා යතුරුපැදි බළසෘණය සඳහා.
(ආ) 125 - 200 සීසී යතුරු පැදි 52 ක් යුද්ධ හමුදා සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා.
(ඇ) 175 - 200 සීසී යතුරු පැදි 20 ක් යුද්ධ හමුදා විද්‍යා පීඨය දියතලාවේ උපදේශක රාජකාරි සඳහා.

(2) ලෝ ෆ්ලෝර් බස් රථය රාගම රණවිරු සෙවනෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් යුද්ධ හමුදා රෝහල වෙත සහ රජයේ රෝහල් වෙත ප්‍රවාහනය සඳහා මිලදී ගැනීම.

(3) 2018 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්ථමේන්තුව වෙතින් ධාවන පැදි 300 ක් සහ ගිනි නිවීමේ රථ 13 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදුන් අතර, 2019 වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 1,234 ක් වෙන්කර දෙනු ලබයි. මෙම ධාවන පැදි ක්ෂණික විහිදුම් රාජකාරි සඳහා යොදාගැනීමට නියමිතව ඇති අතර, ගිනි නිවීමේ රථ 13 යුද්ධ හමුදා වෙඩිද්‍රව්‍ය ගබඩා ප්‍රයෝජනය සඳහා වෙන්කිරීමට නියමිතයි.

ආ. **<u>විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය.</u>**

(1) විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළඇණි වෙතින් මෙම වසර තුළදී පසුගිය වසරට වඩා වැඩි ප්‍රමාණයක ක්ෂේත්‍ර අලුත්වැඩියාවන් හා මධ්‍යම අලුත්වැඩියාවන් සිදුකරන ලදී. එමෙන්ම මූලික අලුත්වැඩියාවන් වැඩි වශයෙන් සිදුකර ධාවනයට එක් කිරීමට හැකි විය. එමගින් ඉතාමත් කාර්යක්ෂම හා සාර්ථක සේවාවක් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මඟින් යුධ හමුදාව වෙත සිදුකරන ලදී.

(2) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා ස්ථානයන් වෙතින් ඉතාම සාර්ථක සහ ක්‍රමානුකූලව වාහන සේවා කිරීම තුළින් වාහන නඩත්තු කිරීම හා අලුත්වැඩියාවන් අවම කර ගැනීමට හැකි වීම. එමගින් වාහනයන්හි ආයු කාලය වැඩි කර ගත හැකි වනවා මෙන්ම විශාල අලුත්වැඩියාවන් සඳහා වැය කල යුතු මුදල් ප්‍රමාණයන්ද අවම කර ගැනීමට හැකි විය.

(3) විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්මික වැඩපල තුළින් විශාල ප්‍රමාණයෙහි ලෝහ ආශ්‍රිත නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීම තුළින් යුධ හමුදාවෙහි අවශ්‍යතාවය සපුරාලීම මෙන්ම විශාල මුදල් ප්‍රමාණයක්ද ඉතිරි කර ගැනිමට දායකත්වයක් ලබාදෙන ලදී.

ඇ. **<u>තත්ත්ව ආරක්ෂක පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලය.</u>** නවතමයෙන් ස්ථාපනය කරන ලද මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි භූමිකාව හා කාර්ය භාරය පිළිබඳව විශයභාර නිලධාරීන් හා විෂයභාර ලිපිකරුවන් ලබාගත් දැනුම හා අත්දැකිම් තුළින් ඵලදායි සේවයක් ඉටුකිරීමට හැකිවීම.

<u>ගැටළු සහ අභියෝග</u>

6. මෙම ශාඛාව සහ ඒ යටතේ පාලනය වන අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල වල ගැටළු සහ අභියෝග පහත සඳහන් පරිදි වේ:

අ. **<u>යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව.</u>** නියමිත දිනට කාර්මික ඇගයීම් කමිටු වාර්තා නොලැබීම හේතුවෙන් හා මිල කැඳවීම් නිවේදනයන්හි බැංකු ඇපකරයන්හි දින කල් ඉකුත්වීමෙන් හා භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් නිතර නිතර වෙනස්වීම් ආදිය හේතුවෙන් වර්ෂය තුළදී මිලදී ගැනීමට අපේක්ෂිත මිලදීගැනීම් සිදුකර ගැනීමට නොහැකිවීම.

ආ. **<u>යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය.</u>**

(1) වරින් වර සිදුවන විදුලි සැපයුම ඇණහිටීම තුළින් අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට නොහැකිවීම.

(2) පින්තාරු අංශයේ හා අනෙකුත් නිෂ්පාදන අංශ සඳහා යොදවා ඇති කාර්මික සෙනින්ගේ ඇතිවිය හැකි අයහපත් සෞඛ්‍ය තත්ත්වය අවමකර ගැනීම සඳහා වාතය ඉවත් කිරීමේ විදුලි පංකා අවශ්‍යවී ඇත. (විදුලි පංකා 16 ක් ඉල්ලුම් කර ඇති අතර, ඉන් 08 ක් ලැබී ඇත).

(3) වෘත්තීය නිපුණත්වයක් ඇති සෙනින්ගේ ඌණතාවයක් පැවතීම.

ඇ. **<u>විදුලි යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය.</u>**

(1) අමතර කොටස් මිල ඉහත යාමත් වැට් බදු අගය වැඩිවිමක් හේතුවෙන් සැලසුම් කරන ලද අලුත්වැඩියාවන් සඳහා පහතින් දක්වා ඇති ප්‍රතිපාදන වෙන් කිරීම් ප්‍රමාණවත් නොවන බව නිරික්ෂණය විය.

| | |
|---|---|
| 222-01-2-1302 (i) | - කාර්යාල හා විදුලි උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව |
| 222-01-2-1205 (viii)a | - වැය ද්‍රව්‍ය මිලදි ගැනිම් |
| 222-01-2-1301 | - වාහන අලුත්වැඩියාවන් |

(2) දීර්ඝකාලීන ප්‍රමාදය හා අධික මිල ගණන් හේතුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය වෙතින් වාහන අමතර කොටස් ලබාගැනීම පහත් මට්ටමක පැවතීම.

(3) කාර්යක්ෂම හා ආරක්ෂාකාරී අලුත්වැඩියාවන් සිදුකිරීම සඳහා වැඩපළ වල ඇති යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.

(4) අලුත්වැඩියාවන් හා සේවා අනුව බලයලත් නියෝජිතයන් විසින් පනවනු ලබන කාල සීමාවන් හා මුල්‍ය සීමාවන් ඉවත්කල යුතුය.

(5) වර්තමානය වන විට යුද හමුදාව විසින් භාවිතා කරනු ලබන බොහොමයක් වාහනයන් බෙහෙවින් පැරණි වාහන බැවින් එම වාහනයන් වත්මන් තාක්ෂණය අනුව සසඳා බැලීමේදී යුධ හමුදා පරිහරණයට නුසුදුසු තත්ත්වයේ පැවතීම හේතුවෙන් සුලු අලුත්වැඩියා හා නඩත්තු සිදු කිරීම සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවීම.

(6) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මඟින් වාහන අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකරන විට පහත සඳහන් අත්‍යවශ්‍ය සේවාවන් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වගකීම් හා කාර්යභාරයන් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වෙත පවරා ගැනීමට ඉදිරි කටයුතු සිදුකල යුතුය.

(අ) සියලුම වාහන සේවා ස්ථානයන්.
(ආ) සියලුම වාහන අමතර කොටස් මිලදී ගැනීම.
(ඇ) ආවුද/උපකරණ මිලදී ගැනීම්.
(ඈ) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අලුත්වැඩියා අවශ්‍යතා සඳහා ඔක්සිජන් සහ ඇසිටිලින් වායුව මිලදී ගැනීම.

ඈ. <u>තත්ත්ව ආරක්ෂක පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලය.</u>

(1) අධ්‍යක්ෂ මණ්ඩල සංස්ථාවට අනුව භටපිරිස් සංඛ්‍යාව සම්පූර්ණ කර ගැනීම සහ ඒ අනුව ආරක්ෂක සේනා මුලස්ථාන වල ක්ෂේත්‍ර පරීක්ෂණ අංශ ස්ථාපනය කිරීම.

(2) යුද්ධ හමුදාවට මිලදී ගනු ලබන සියළුම වර්ගයේ වියළි/අමු සළාක සඳහා පරීක්ෂණාගාරයන් ස්ථාපනය කිරීම සඳහා ක්‍රියාකිරීම.

(3) විද්‍යාගාරය හා මිනුම් අංශය, පිරිවිතර සකස් කිරීම, භාණ්ඩ පරීක්ෂා කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම සඳහා විශේෂඥ දැනුමක් ඇති සිවිල් උපදේශකයින් 04 දෙනෙකු බඳවා ගැනීම සිදුකර ගැනීම.

<u>සාරාංශය</u>

7. යුද්ධ හමුදාව වෙත භාණ්ඩ මිලදී ගැනීම, නිකුත් කිරීම, තොගගත කිරීම හා ගබඩාකරණය කිරීම, භාණ්ඩ නඩත්තු කිරීම හා නිසි පරිදි බෙදාහැරීම, භාණ්ඩ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, වාර්ෂික තොග සමීක්ෂණය සහ භාණ්ඩ නිකුත් කිරීම, යුද්ධ හමුදාවෙහි පවතින යන්ත්‍රෝපකරණ, විද්‍යුත් උපකරණ සහ දෘෂ්‍ය උපකරණ නඩත්තුව, අලුත්වැඩියාව, අධීක්ෂණය සහ අවැසි නිර්දේශයන් ලබාදීම මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලැබෙන සියළුම උපකරණ වල තත්ත්ව ආරක්ෂක සහ පිරික්සුම් සඳහා කාර්යක්ෂම සහ ඵලදායි යාන්ත්‍රණයක් තහවුරු මෙම ශාඛාවේ ප්‍රධාන වගකීම වේ. මෙම කර්තව්‍යය සඳහා යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය /විදුලි යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය/ තත්ත්ව ආරක්ෂක පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලය දායකත්වය ඉඳුරාම ලබා දෙනු ලබයි. මෙම ශාඛාව වෙතින් ලබාදෙනු ලබන ප්‍රතිපාදන සමස්ථ යුද්ධ හමුදාවෙහිම ඉදිරි නඩත්තු කටයුතු සඳහා නිසියාකාරව යෙදවීම ප්‍රධාන පරමාර්ථයන්ගෙන් එකකි. භාණ්ඩ මිලදී ගැනීම, නිකුත් කිරීම, අළුත්වැඩියා හා නඩත්තු කිරීම්, සියළුම උපකරණ වල තත්ත්ව ආරක්ෂක සහ පිරික්සුම් සඳහා කාර්යක්ෂම සහ ඵලදායි යාන්ත්‍රණයක් තහවුරු කිරීම මඟින් මෙම වසර තුළ සමස්ථ කාර්ය සාධන මට්ටම ඉහළ අගයක පවත්වාගෙන ඇත.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා ශාඛාව

1. මෙම ශාඛාව පාබල රෙජිමේන්තු වල විශේෂිත වූ කාර්යයන් අධීක්ෂණය කරනු ලබයි. පාබල රෙජිමේන්තු සඳහා වූ ප්‍රතිපත්තිමය කරුණු බළඇණි පුහුණුවීම් හා විශේෂ පාබල ක්‍රියාන්විත අධීක්ෂණය / අවශ්‍යතා නිර්දේශ කිරීම මෙම ශාඛාවෙහි ප්‍රධාන කාර්යයන් වේ. තවද, පාබල බළඇණි වල මූලික අවශ්‍යතා වන යුධ / පාලන උපකරණ, සංඛ්‍යා ලේඛණ නඩත්තුව හා ඒ පිළිබඳව වන නිරීක්ෂණයන් හා ගතයුතු ක්‍රියාමාර්ගයන් යුද්ධ හමුදා මූලස්ථානය වෙත දැනුම්දීම හා පාබල මධ්‍යස්ථාන සේනාවිධායකවරුන් සමග පාබල හමුදාවට අදාල කරුණු සාකච්ඡා කර පොදු තීරණ ප්‍රකාශයට පත්කරනු ලබයි. බළඇණි පුහුණු පාසැල් හා වෙනත් යුධ හමුදා පුහුණු ආයතන වල පාබල පුහුණු කටයුතු නිරීක්ෂණය කිරීම හා පාබල ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම ද මෙම ශාඛාවෙහි සෙසු කාර්යයන් වේ.

### වගකීම්

2. පාබල බළඇණි මූලධර්ම වලට අනුකූල වන පරිදි රට තුළ හදිසි අවශ්‍යතාවයකදී ඇතිවිය හැකි ඕනෑම හදිසි යුධමය තත්ත්වයන් සමනය කිරීම පිණිස සන්නද්ධ සේනාවක් හෝ ඒකාබද්ධ සේනාවක කොටසක් වශයෙන් පවත්වාගෙන යාම පිණිස උපකරණ සැපයීම, සංවිධානගත කිරීම, පිරිස් බලය ලබාදීම, පරිපාලනය සහ පුහුණු කිරීම ශාඛාවෙහි වගකීම වේ.

### මූල්‍ය විස්තරයන්

3. අධ්‍යක්ෂ ජෙනරාල් පාබල ශාඛාවෙහි මූල්‍ය වියදම් පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | විස්තරය | ලැබුණු මුදල (රු.) | වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ලිපිද්‍රව්‍ය වැය ශීර්ෂය | 250,000.00 | 123,625.45 |
| 2. | පුහුණු ගිණුම | 52,000.00 | 52,000.00 |
| 3. | සනීපාරක්ෂක වැය ශීර්ෂය | 38,000.00 | 38,000.00 |
| 4. | සුභසාධන වැය ශීර්ෂය | 25,000.00 | 24,900.00 |

වගුව 8:1. මූල්‍ය විස්තරය

### කාර්ය පිරිවිතරයන්

4. අධ්‍යක්ෂ ජෙනරාල් පාබල ශාඛාවෙහි අවශ්‍යතාවයන් සපුරාලීමට වෙන්කර ඇති මුදල් ලිපිද්‍රව්‍ය වියදම් සහ පුහුණු වැය ශීර්ෂයන් සඳහා මෙන්ම කාර්යාලීය අවශ්‍යතාවයන් සඳහා ද වෙන්කර ඇත. සනීපාරක්ෂක ප්‍රතිපාදන භාවිතයට ගනු ලබන්නේ අධ්‍යක්ෂ ජෙනරාල් පාබල ශාඛාවෙහි සනීපාරක්ෂක කටයුතු ඉහළ තත්ත්වයකට ගෙන ඒමටයි. තවද, නිලධාරි හා සෙසුනිල දැනුම වර්ධනය කරගැනීමට දිනපතා පුවත්පත් දෙක බැගින් හා සති අන්තයේදී පුවත්පත් දෙක බැගින් සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් ගනු ලබයි.

### වාර්ෂික කාර්ය සාධන විස්තරය

5. 2018 වර්ෂය තුළ බළඇණි පුහුණු පාඨමාලා 35 ක් පැවැත්වූ අතර එහිදී නිලධාරීන් 311 ක් හා සෙසුනිලයින් 9,411 ක් පුහුණු විය.

6. 2018 වර්ෂයේදී විශේෂ පාබල ක්‍රියාන්විත (SIO) පුහුණු පාඨමාලා 04 ක් පැවැත්වූ අතර එයට නිලධාරීන් 73 ක් හා සෙසුනිලයින් 1,139 ක් සහභාගී විය.

7. බළඇණි පුහුණුවීම් හි වැදගත්කම සලකා බැලීමේදී සියළුම බළඇණි පුහුණුවීම් 2019 ජනවාරි මස සිට අධියර 02 කින් සිදුකිරීමට නියමිතය.

8. මෙම ශාඛාව යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය මත පවත්වන ලද ටෙක්නෝ - 2018 ප්‍රදර්ශනයේ විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | සිදුවීම | පැවැත්වූ ස්ථානය හා දිනය | ප්‍රදර්ශන කුටි විස්තර / ප්‍රදර්ශන කුටි භාරදූන් රෙජිමේන්තුව |
|---|---|---|---|
| (අ) | (අ) | (අ) | (අ) |
| 1. | ටෙක්නෝ - 2018 | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (2018.10.12 - 2018.12.14) | ඡායා රූප / බැනර් / අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් (පාබල පුහුණු මධ්‍යස්ථානය - මින්නේරි) |

වගුව 8:2. ටෙක්නෝ - 2018 ප්‍රදර්ශනයෙහි විස්තරය

**<u>සාරාංශය</u>**

9. සමස්ථ යුද්ධ හමුදා භටපිරිස් අතුරින් 59.33% ප්‍රමාණයක් නියෝජනය වනු ලබන්නේ පාබල ඒකක භටපිරිස් මත පදනම්ව වන අතර පාබල නිලධාරී/ සෙසුනිල අවශ්‍යතාවයන් හා පාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා කවුන්සිලයක් ඇති කිරීමට නිර්දේශ කරයි. පාබල පුහුණු පාසල් වල තත්ත්වය විශේෂයෙන්ම යටිතල පහසුකම් ඉහළ නැංවීමට මෙම ශාඛාව නිර්දේශ කරයි.

10. පසුගිය දශක තුනෙන් පසු ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීමේදී ආරක්ෂාව සහ නිදහස පිළිබඳ විවිධ වු අභියෝගයන්ට මුහුණු පෑමට සිදුවිය. එහිදී ජාතිය ගොඩනැගීමට විවිධ වු ව්‍යාපෘති සිදුකෙරිණි.

11. තවද, පසුගිය වසර වලදී නීතිය හා සාමය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා හමුදාවන්ගේ උත්සහයන් ඉහළ මට්ටමක පැවතුණි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි


ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලද
අන්තර්ජාතික ජයග්‍රහණ
COMMUNITY
LIBRARY
Tree Library
TRANSLATION
4 වන වරටත් පැවැත්වූ ජාත්‍යාන්තර පරිසර හිතකාමී ගොඩනැගීම් තරඟගේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිංහ රෙජිමේන්තු පරිසර හිතකාමී පුස්තකාලයට රටවල් 152 ක තරඟකරුවන් 6000 ක් අතුරින් රිදී සම්මානය හිමි විය.

## ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය)

1. ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) යාපනය දිස්ත්‍රික්කය තුළ ස්ථානගතව ඇති ප්‍රධාන යුද්ධ හමුදා මූලස්ථානය වන අතර, පලාලි ගුවන් හමුදා කඳවුර ආසන්නයෙහි පිහිටා ඇත. මෙම මූලස්ථානය ආරක්ෂක සේනා මූලස්ථානය කිළිනොච්චියට දකුණින් මායිම්ව ඇති අතර ඉතිරි ප්‍රදේශයන් ඉන්දියන් සාගරයෙන් වටවී ඇත. මෙම මූලස්ථානය යටතේ අණ හා පාලන වශයෙන් 51, 52 සහ 55 වශයෙන් සේනාංකයන් 03 ක් ස්ථානගතව ඇත. මෙම මූලස්ථානය වෙතින් යාපනය දිස්ත්‍රික්කය තුළ සහ කිළිනොච්චිය දිස්ත්‍රික්කයෙහි කොටසක් ආවරණය වන පරිදි රාජකාරී කරනු ලබයි. තවද, ප්‍රදේශයෙහි ජීවත්වන සිවිල් පුද්ගලයින් හට සහන සැලසීම, සිවිල් පුද්ගලයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා විවිධ සුභසාධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම වැනි කටයුතු ද සිදුකරනු ලබයි. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය විසින් සාමය සහ සංහිඳියා ක්‍රියාදාමය පවත්වාගෙන යාම මූලික කාර්යභාරය හා කර්තව්‍ය වන අතර, හදිසි අවස්ථාවක පොලීසිය විසින් ඉල්ලීමක් කල පසු නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා පොලීසියට සහාය වීම, සහ මෙම ප්‍රදේශයෙහි ඇතිවන හදිසි අපදා තත්ත්වයකදී එය පාලනය කිරීම සහ ජන ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා පළාත් පාලන ආයතන බලධාරීන් සමඟ සහ සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කිරීම සහ අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට සහය වීම මෙම මූලස්ථානයෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

### මූල්‍යමය තොරතුරු

2. ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රෙජිමේන්තු ආයතන සහභාපති (රෙආස) ගිණුමට බැර කරන ලද මූල්‍යමය ප්‍රතිපාදන පහත වගුවේ පරිදි වේ:

| අනු අංකය | විස්තරය | ලද මුදල (රු.) | වැයකල මුදල (රු.) | ඉතිරි මුදල (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | රෝහල් ව්‍යාපෘති යටතේ පහත සඳහන් රෝහල ඉදිකරන ලදී<br><br>අ. වඩුක්කොඩෙයි<br>ආ. කයිට්ස්<br>ඇ. මුරුත්තන්කේනි<br>ඈ. කොඩිකාමන්<br>ඉ. වේලනෙයි<br>ඊ. චන්කානෙයඩ් | 111,672,136.95 | 82,343,337.54 | 29,328,799.41 | ඉතිරි මුදල යුද්ධ හමුදා ගිණුමට බැරකරන ලදී |

වගුව 9:1. 2017/2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය

3. අභ්‍යාස දීමනා ගිණුමෙහි මුදල් ලැබීම් හා වියදම් විස්තරය.

| අනු අංකය | මුදල් වෙන් කරන ලද අවශ්‍යතා | ලද මුදල (රු.) | වැයකල මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් | 39,000.00 | 39,000.00 | - |

වගුව 9:2. පුහුණු වැය ශීර්ෂ යටතේ 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය

4. යුධෝපකරණ බළකා විෂයන් යටතේ වෙන් කරන වාර්ෂික ප්‍රතිපාදන විස්තරය පහත වගුවේ සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | ප්‍රතිපාදන මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරිව ඇති මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ලිපි ද්‍රව්‍ය (222-01-2-1201) | 775,000.00 | 775,000.00 | - |
| 2. | බැරැක්ක භාණ්ඩ (222-01-2-1302 (III)) | 110,000.00 | 109,000.00 | 500.00 |
| 3. | පවිත්‍රතා ද්‍රව්‍ය (222-01-2-1205 (XXIV)) | 58,000.00 | 58,000.00 | - |
| 4. | රාජකාරි බස් ගමන් බළපත්‍ර (222-01-1-1101(II)) | 250,000.00 | 140,585.00 | 109,415.00 |
| 5. | රාජකාරි/නිවාඩු දුම්රිය බළපත්‍ර (222-01-1-1401(V)/ 2201-1-1401(IV)) | 2,278,560.00 | 1,876,960.00 | 401,600.00 |
| 6. | පුවත් පත් (222-01-2-1205 (XVIII)2018) | 1,250,000.00 | 1,154,768.00 | 95,232.00 |
| | **එකතුව** | **4,721,560.00** | **4,114,813.00** | **606,747.00** |

වගුව 9:3. යුධෝපකරණ බළකා විෂයන් යටතේ වෙන් කරන වාර්ෂික ප්‍රතිපාදන විස්තරය යටතේ 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය

5. ඉංජිනේරු කාර්යන් සඳහා වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන විස්තරය පහත වගුවේ සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශිර්ෂය | ප්‍රතිපාදන මුදල (රු.) | වැය කරන ලද මුදල (රු.) | ඉතිරිව ඇති මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | එකතු කිරීම් සහ නඩත්තු සේවාව (222-01-120520(XX)) | 20,046,135.96 | 19,826,347.49 | 219,788.47 |
| 2. | මූලධන සේවාව | 76,830,171.36 | 76,819,616.72 | 10,554.64 |
| 3. | භූමි නඩත්තු (222-01-2-1303 (II)) | 658,140.00 | 658,140.00 | - |

වගුව 9:4. ඉංජිනේරු කාර්යන් සඳහා වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන යටතේ 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

6. රජයෙහි සංහිඳියා ව්‍යපෘති සඳහා ලැබුණු මුල්‍ය ප්‍රතිපාදන (වැය ශිර්ෂය 002-1-4-1-1409) පහත පරිදි වේ:

| අනු අංකය | ව්‍යාපෘතිය | අනුමත මුදල (රු.) | වියදම් (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | නිවාස 04 ක් සෑදිම සඳහා | 3,243,505.69 | 3,067,937.26 | 175,568.43 |
| 2. | තෝරාගත් පවුල් 20ක් සඳහා වැසිකිලි සෑදිම සඳහා | 1,078,898.10 | 895,337.35 | 183,560.75 |
| 3. | මානිප්පායි කෝවිලට පැමිණෙන අය සඳහා වැසිකිලි සෑදිම සඳහා | 122,725.68 | 106,574,05 | 16,151.63 |
| 4. | බැතිමතුන්ගේ සනිපාරක්ෂාව උදෙසා වැසිකිලි පද්ධතිය සෑදිම සඳහා | 53,944.91 | 46,589.81 | 7,355.10 |
| 5. | තිත්රුමුල්ලුවර් ප්‍රජාශාලාවෙහි විදුලි කාර්මික කටයුතු සිදුකිරිම සඳහා | 9,152.61 | 9,061.15 | 91.46 |
| 6. | තාවලයිහි දුර්ගාමලෙ පෙර පාසල සඳහා ළමා උද්‍යානයක් ඉදිකිරීම | 36,319.07 | 67,955.33 | -31,636.26 |
| 7. | පෙර පාසල් සඳහා ප්ලාස්ටික් පුටු පරිත්‍යාග කිරීම හා එම පෙර පාසල් සඳහා පුටු හා මේස සෑදීම | 455,453.94 | 430,649.60 | 24,804.34 |
| | **එකතුව** | **5,000,000.00** | **4,624,104.55** | **375,895.45** |

වගුව 9:5. උතුරු නැගෙනහිර ප්‍රදේශයෙහි සංහිඳියාව වර්ධනය කිරිම සඳහා රජයෙන් ගෙන ඇති ව්‍යාපෘති සඳහා 2018 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන හා ගෙවීම් පිළිබඳ විස්තරය

**ප්‍රතිපාදන ඵලදායී ලෙස යෙදවීම**

7. මෙම මුලස්ථානය වෙත ලද ප්‍රථිපාදනයන් තුළින් යාපනය අර්ධද්වීපය තුළ රාජකාරියෙහි නියුතු යුද්ධ හමුදා සෙබලුන්ගේ සුභ සාධන පහසුකම් වැඩි දියුණු කිරිමට සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඵලදායි ලෙස යොදවා ඇත. තවද යුද්ධ හමුදා සෙබලුන් සඳහා නව ගොඩනැඟිලි ඉදිකිරිම්, නවීකරණය කිරිම් නියමිත ප්‍රතිපත්තීන්ට අනුකූලව සිදුකර ඇති අතර, ඒ අතරින් කිහිපයක් පහත දැක්වේ.



බළලත් නිලධාරී / සැරයන් නිවස්නය වෙත නව නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම



සේවා බළකාය වෙත නව කාර්යාල ගොනැඟිල්ලක් ඉදිකිරීම

<u>**වසර තුළ සිදුකල කාර්යන් පිලිබද විමර්ෂණය**</u>

8. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2009 වර්ෂයේ යුද්ධය අවසන් වීමේන් පසු නැවත ගොඩනැංවීම, නැවත පදිංචි කිරීම සහ සංහිඳියාව වර්ධනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත. ආරක්‍ෂක හමුදාවන් විසින් උතුරේ යුද්ධයට ගොදුරු වූ ජනතාව වෙනුවෙන් වැඩසටහන් රාශියක් දියත් කර ඇති අතර, රජය විසින් ක්‍රියාත්මක සේවා ව්‍යාපෘති සඳහා සහාය ලබා දී ඇත.

9. <u>**යුධ හමුදාව සහ සිවිල් ජනතාව අතර සහයෝගිතා වර්ධනය.**</u> යුද්ධ හමුදාව සහ සිවිල් ජනතාව අතර සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා මෙම ආරක්‍ෂක සේනා මූලස්ථානය වෙතින් විවිධ සමාජයීය ව්‍යාපෘති කටයුතු සඳහා සම්බන්ධ වී ඇති අතර, එම ජනතාවගේ ජන ජීවිතය නගා සිටුවීම සහ එම අයවලුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා පහත සඳහන් විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

අ. අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සඳහා නිවාස ඉදිකිරීම.

ආ. පොල් සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව පොල් වගා කිරීම දියුණු කිරීම.

ඇ. තල් සංවර්ධන මණ්ඩලය සමග එක්ව තල් වගා කිරීම දියුණු කිරීම.

ඈ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ප්‍රතිවනරෝපණය ව්‍යාපෘති සිදුකිරීම.

ඉ. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් වෙරළ සංරක්ෂණ වැඩසටහන් සිදුකිරීම.

ඊ. යාපනය අර්ධද්වීපයේ දුෂ්කර පළාත්වල වෛද්‍ය සායන පැවැත්වීම.

උ. යාපනය ශික්ෂණ රෝහලෙහි දෛනික රුධිර අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ලේ දන්දීමේ වැඩසටහන් පැවැත්වීම.



අඩු ආදායම්ලාභී පවුල් වෙත සෙබලුන් විසින් නිවාස සකස් කරදීම



අඩු ආදායම්ලාභී පවුල් සඳහා පොල් සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව පොල් පැල බෙදා දීම



පිරිසිදු රටක් සංකල්පය යටතේ වෙරළ සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් වෙරළ පිරිසිදු කිරීම



නිරොගිමත් දැයක් සංකල්පයට සහය වීම සඳහා යාපනය අර්ධද්වීපයෙහි දුෂ්කර පළාත්වල වෛද්‍ය සායන පැවැත්වීම.



යාපනය ශික්ෂණ රෝහලෙහි දෛනික රුධිර අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ලේ දන්දීමේ වැඩසටහන් පැවැත්වීම



අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම




වැසිකිළි අවශ්‍යතා ඇති පවුල් සඳහා වැසිකිළි ඉදිකිරීම



ඇස් කණ්නාඩි අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා ඇස් කණ්නාඩි බෙදාදීම



වියළි කාලවලදී ගොවීන්ට පහසුකම් සැලසීම සඳහා යුද්ධ හමුදාවෙහි සහයෝගය සහිතව යාපනය දිස්ත්‍රික්කය තුළ වැව්/ අමුණු නවීකරණය කිරීම



පාසල් ළමුන් සඳහා බයිසිකල් බෙදාදීමේ වැඩසටහන් පැවැත්වීම



ආබාධිත පුද්ගලයන් හට රෝද පුටු බෙදාදීම



පාසල් සිසුන් සඳහා පාසල් උපකරණ බෙදාදීම



ජල පිරිපහදු පද්ධති ඉදිකිරීම



ගංවතුර කාලයේදී තන්නමරච්චිහි සිවිල් වැසියන්ට හමුදාව සහය වීම




පොසොන් බැති ගී පැවැත්වීම




නත්තල් බැති ගී පැවැත්වීම

**<u>වසර තුළ අත්කරගත් ප්‍රගතිය</u>**

10. යාපනය බලප්‍රදේශය තුළ සාමය සහ සංහිඳියාව පවත්වා ගෙන යමින් මෙම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථානගත සියලු සේනාංක බලසේනා මූලස්ථාන සහ ඒකකයන් සමඟ සම්බන්ධතාවයෙන් යුතුව මෙම ප්‍රදේශයෙහි වෙසෙන සිවිල් මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ සුභසාධනය වෙනුවෙන් විශාල සේවාවක් ඉටුකිරීමට හැකි වී තිබේ.

11. මෙම වසර තුළ සෙබලුන් හට ලබාදුන් සාමුහික සහ පුද්ගල පුහුණුව මඟින් ඕනෑම මොහොතක යුද්ධයකට සුදානම් වීමේ සුදානම සහ හැකියාව මනා ලෙස පවත්වා ගැනීමට මෙම ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) වෙත හැකියාව ලැබී ඇත.

**<u>ගැටළු සහ අභියෝග</u>**

12. 2018 වසර තුළ මුහුණ පෑමට සිදුවු ගැටළු හා අභියෝගයන් සළකා බැලීමේදි අනාගත අභියෝග ලෙස පහත කරුණු දැක්විය හැක:

අ. සිවිල් ජනතාව හා හමුදා සාමාජිකයින් අතර සහයෝගීතාවය ගොඩනැගීමේදී සන්නිවේදනය ප්‍රධාන බාධාවක් වී ඇත.

ආ. **<u>ඉඩම් නිදහස් කිරීම.</u>** 1996 වර්ෂයේදී පලාලි හමුදා පරිශ්‍රය අක්කර 11,629.72 ක ප්‍රදේශයක් ආවරණය කරනු ලැබු අතර, 2009 දී යුද්ධය අවසන් වීමෙන් පසු මෙම ඉඩම් බහුතරයක් පුද්ගලික හිමිකරුවන්ට අයත් බව නිරීක්ෂණය වී ඇත. මේ අනුව මෙම ගැටලුව විසඳීම සඳහා ඉඩම් 74.12% (අක්කර - 8620.42) ක් නිදහස් කර ඇති අතර යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය සහ රජය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව අදියර 26 ක් යටතේ එම ඉඩම් මහජනතාව වෙත පවරා ඇත. එබැවින් දැනට පලාලි හමුදා ජනපදය තුළ අක්කර 3,009.3 ක ප්‍රමාණයක් පමණක් ආවරණය කරයි (පලාලි ගුවන් පථය සහ ගුවන් හමුදා කඳවුරේ ඇති අක්කර 996 ද සමඟ). එබැවින් තවදුරටත් ඉඩම් නිදහස් කිරීම ජාතික ආරක්ෂාව කෙරෙහි බලපෑ හැක.

ඇ. යුද්ධ හමුදා කඳවුරු රජයේ ඉඩම් වල නැවත ඉදිකිරීම.

ඈ. යුද්ධ හමුදාව සඳහා ඉඩම් ලබාගැනීම.

**<u>සාරාංශය</u>**

13. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ඇති ආරක්ෂක සේනා මුලස්ථාන අතුරින් ජ්‍යෙෂ්ඨ හා වැදගත්ම ආරක්ෂක සේනා මුලස්ථානය වශයෙන් රජයෙන් ක්‍රියාත්මක සංහිදියාව වැඩි දියුණු කිරීමේ වැඩසටහන් වලට සහභාගී වීමේදී විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවී ඇත. ජාතිය ගොඩනැංවීමේ ක්‍රියාවලිය සඳහා සහයෝගය දැක්වීමට ආරක්ෂක සේනා මුලස්ථානය (යාපනය) වෙතින් යාපනය අර්ධද්වීපයෙහි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට හා සාමය පවත්වාගෙන යාමේ අරමුණින් සමාජ ආර්ථික සංවර්ධන සහ සංස්කෘතික සහජීවනය වැඩිදියුණු කිරීම උදෙසා කටයුතු කරනු ලබයි. තිරසාර සාමයක නව අරුණලු දැකීම සඳහා ප්‍රදේශයෙහි අනාගත පරපුර දැනුමෙන් සහ අධ්‍යාපනයෙන් පොහොසත් කිරීම අරමුණු කොට ගෙන පාසල් දරුවන් දිරිගැන්වීමේ වැඩසටහන් නොනොවත්වා ක්‍රියාත්මක කරන අතරතුර ප්‍රදේශයෙහි රැකියා විවෘත්තියට සාධාරණ පිලිසරණක් ලබාදීමට මෙම ආරක්ෂක සේනාවට හැකියාව ලැබී ඇත.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි)

1. ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ඇති අනෙකුත් ආරක්ෂක සේනා හා සන්සන්දනය කිරීමේදී විශාලතම මෙහෙයුම් කලාපය ආවරණය කරන ආරක්ෂක සේනා මූලස්ථානය මෙය වන අතර, මෙම මූලය තලෙයි මන්නාරම බටහිර වෙරළබඩ කලාපය දක්වා ඇති ප්‍රදේශයත්, නැගෙනහිර වෙරළබඩ කලාපය වන පුල්මුඩය දක්වාත් අයත් වන අතර, සම්පූර්ණ අනුරාධපුරය හා වව්නියාව දිස්ත්‍රිකයන්ද මන්නාරම දිස්ත්‍රිකයෙන් 90% ක් පමණ සහ මුලතිව්, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් වලින් කොටසකුත් ආවරණය වන පරිදි වන්නි අරක්ෂක සේනා මූලස්ථානය සේනාංක පහක්ද ඉදිරි නඩත්තු ප්‍රදේශයක් සහ ඉඳුරාම පාලනය වන ඒකක හතරකින් සමන්විතව ඇත.

2. ප්‍රදේශයෙහි පවතින සාමකාමී වාතාවරණය නිරන්තරයෙන් පවත්වා ගැනීම සහ ප්‍රදේශයෙහි රාජ්‍ය යාන්ත්‍රණය පහසුවෙන් පවත්වාගෙන යාම සඳහා අවැසි ආරක්ෂාව නිසි පරිදි බළප්‍රදේශය තුළ ස්ථාපනය කර පවත්වා ගැනීම තුළින් බළප්‍රදේශයෙහි ජීවත්වන ජනයාගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිරන්තර සහය ජාතීන් අතර සංහිඳියාව පවත්වා ගැනීම සඳහා පහත සඳහන් කාර්යන් නිරන්තරයෙන් බළප්‍රදේශය තුළ ඉටු කරනු ලබයි.

**<u>මූල්‍ය තොරතුරු</u>**

3. 2018 වර්ෂය සඳහා මෙම ආරක්ෂක සේනා මූලස්ථානය වෙත ලැබුණු සියලුම මූල්‍ය ප්‍රතිපාදනයන්, වියදම් විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශිර්ෂය | අනුමත මුදල (රු.) | වියදම් කල මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222-01-1-4-2104 | 261,303.00 | 259,720.58 | 1,582.42 |
| 2. | 222-01-3-2104 | 3,548,615.85 | 3,216,896.58 | 331,719.27 |
| 3. | 222-01-3-2104 | 3,719,372.95 | 3,324,724.85 | 394,648.10 |
| 4. | 222-01-2-1205(xx) | 1,000,000.00 | 999,827.74 | 172.26 |
| 5. | 222-01-2-1205(xx) | 2,500,000.00 | 2,476,381.64 | 23,618.36 |
| 6. | 222-01-1-4-2104 | 7,245,589.00 | 6,091,049.56 | 1,154,540.03 |
| 7. | 222-01-2-1303(ii) | 100,000.00 | 90,000.00 | 10,000.00 |

වගුව 10:1. මූල්‍ය ප්‍රතිපාදන විස්තරය

4. 2018 වර්ෂය සඳහා මෙම ආරක්ෂක සේනා මූලස්ථානයෙහි මූල්‍ය වියදම් විස්තරය.

| අනු අංකය | වැය ශිර්ෂය | අනුමත මුදල (රු.) | වියදම් කල මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | විදුලි බිල්පත් | 15,000,000.02 | 15,000,000.02 | - |
| 2. | ජල බිල්පත් | 18,086,402.80 | 18,086,402.80 | - |
| 3. | දුරකථන බිල්පත් | 854,760.00 | 854,760.00 | - |
| 4. | රාජකාරි බස් ගමන් බලපත්‍ර | 160,000.00 | 160,000.00 | - |
| 5. | රාජකාරි දුම්රිය බලපත්‍ර | 548,000.00 | 548,000.00 | - |
| 6. | අභ්‍යාස දීමනා | 93,000.00 | 93,000.00 | - |
| 7. | ලිපි ද්‍රව්‍ය | 750,000.00 | 713,282.49 | 36,717.51 |
| 8. | පුවත්පත් | 1,982,000.00 | 1,982,000.00 | - |
| 9. | පවිත්‍රතා ද්‍රව්‍ය | 60,000.00 | 60,000.00 | - |
| 10. | ක්‍රීඩා භාණ්ඩ | 100,000.00 | 100,000.00 | - |
| 11. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියා කිරීම | 110,000.00 | 110,000.00 | |

වගුව 10:2. මූල්‍ය වියදම් විස්තරය

**<u>ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය</u>**

5. බෞද්ධ පුනරුද අරමුදල මගින් විහාරස්ථාන 6 ක ඉදිකිරීම් සඳහා ආරක්ෂක සේනා මුලස්ථාන (වන්නි) රෙජිමේන්තු ආයතන සභාපති වෙත ලබා දෙන ලද මුදල් ප්‍රතිපාදන විස්තරය.

| අනු අංකය | අනුමත මුදල (රු) | වියදම් කල මුදල (රු.) | ඉතිරි මුදල (හලේකා වෙත භාර දී ඇත) (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | 2,855,813.90 | 2,230,594.02 | 625,219.88 |

වගුව 10:3. බෞද්ධ පුනරුද අරමුදල ප්‍රතිපාදන විස්තරය

6. මූලධන සහ නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ක්‍රමානුකූලව හා ඵලදායි අයුරින් සියලු නිලයින් වෙත කාර්යක්ෂමව, ඵලදායි නිරෝගීමත් සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යොදාගත් අතර, සියලුම ක්‍රියාකාරකම් හි ප්‍රගතිය මෙම මූලය වෙතින් නිරන්තර සමාලෝචනයට හා අධීක්ෂණයට ලක් කරන ලදී.

7. භූමි නඩත්තු යටතේ වෙන්කරන ලද මුදල් භූමි අලංකරණය සහ පරිසර හිතකාමී හරිත පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පැල වර්ග, පොහොර, කෘමිනාශක, දියර පොහොර, වල්නාශක මිලදී ගැනීම සඳහා ඵලදායී ලෙස යොදාගන්නා ලදී.

8. බැරැක්ක භාණ්ඩ සඳහා වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන මගින් අලුත්වැඩියා කටයුතු සිදුකල යුතු වූ බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියා කර නවීකරණය කරන ලදී.

9. සනීපාරක්ෂාව සඳහා වෙන්කල ප්‍රතිපාදන මගින් නිරෝගි හමුදාවක් යන තේමාව යටතේ නිවැරදි සනීපාරක්ෂක සේවාවන් රාජකාරි කරනු ලබන යුද්ධ හමුදා භට්පිරිස්, හමුදාගත භට්පිරිස් සහ සිවිල් සේවක මහතුන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ඵලදායී ලෙස සෞඛ්‍ය තත්ත්වයන් වර්ධන කිරීම සඳහා යොදවන ලදී.

**<u>2018 වර්ෂයෙහි මුදුන්පත් කර ගත් අපේක්ෂාවන්</u>**

10. ආරක්ෂක සේනා මුලස්ථානය (වන්නි) මගින් ගොඩනැගීම් ව්‍යාපෘති රැසක් සාර්ථකව නිමකර ඇති අතර වැය ශීර්ෂ වෙන්කර ඇති පරිදි පත් කරන ලද මණ්ඩල වල අධීක්ෂණය යටතේ නිසි පරිදි මිලදී ගැනීම් සිදුකොට ගිණුම් නිසියාකාරව පවත්වාගෙන යනු ලැබේ. ඒ අතරින් පහත ගොඩනැගීම් ව්‍යාපෘති 02 ක් සුවිශේෂී වේ.



56 සේනාංක මුලස්ථානයෙහි නවතමයෙන් ඉදිකිරීම් කටයුතු කරනු ලබන කාර්යාල ගොඩනැගිල්ල රු: 6,000,000.00 ක මුදල් ප්‍රතිපාදන මගින් 98% ක් පමණ ඉදිකිරීම



ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍ර - මෙම මූලයේ සහ 61 සේනාංක මූලස්ථානය ඉදිකිරීම

**<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එහි ප්‍රගතිය</u>**

11. ඉහත සඳහන් කල පරිදි අඩු ආදායම් ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම සඳහා ඇවැසි උපකාර ලබාදීමට විශාල වැඩසටහන් ප්‍රමාණයක් සිදුකිරීමට කටයුතු කල අතර, ශිෂ්‍ය ප්‍රජාව ඉලක්ක කරගනිමින් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අතුරින් උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන් හට විභාග ආසන්නයේදී සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. ඒ තුළින් ඔවුන්ගේ දැනුම සහ විභාගයට මුහුණදීමේ විශ්වාසය ඇතිකිරීම මෙන්ම එම විභාග වලින් සහ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන්ද උසස් ප්‍රතිඵල ලබාගත් සිසුන් උදෙසා, උසස් අධ්‍යාපනය සාර්ථක කරගන්නා තුරු ශිෂ්‍යත්ව ලබාදීමද සංවිධානය කිරීම තුලින් ඔවුන්ගේ අනාගත අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීමට සහයෝගය දැක්වීම ප්‍රමුඛතාවය ලා සැලකිය හැක. මෙම මූලස්ථානය විසින් සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් වලින් කිහිපයක් පහත සඳහන් කර ඇත.

අ. පසුගිය නියන් කාල සමය තුළදී මෙම ප්‍රදේශයෙහි වෙසෙන සිවිල් ජනතාව පානිය ජල දුෂ්කරතාවයෙන් මහත්සේ පීඩාවට ලක්වූ අතර, එම ගම්මානයන් සඳහා ජල බවුසර් මඟින් පානීය ජලය බෙදා දෙන ලදි.







ආ. විවිධ ධානපතින්ගේ ධන පරිත්‍යාගයෙන් සහ යුද්ධ හමුදා ශ්‍රම දායකත්වයෙන් සැළලිහිණිගම ශ්‍රී සුදර්මාරාම මෙහෙණි ආරාමයෙහි චෛත්‍ය ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම සහ එම චෛත්‍යයෙහි ඉදිකිරීම් සිදුකිරීම.





ඇ. 2018 ඔක්තෝබර් 20 වන දින හේමසාස් අවුට්රිච් මුල්‍ය අනුග්‍රාහය මත සහ යුද්ධ හමුදා ශ්‍රම දායකත්වයෙන් මහකච්චිකොඩිය ගම්මානයෙහි නවතමයෙන් ඉදිකරන ලද පෙරපාසල් ගොඩනැගිල්ල විවෘත කිරීම සහ මුවරන්කුලම් ප්‍රදේශයෙහි පෙරපාසල් ළමුන් සඳහා කියවීමේ පොත් හා ලිපිද්‍රව්‍ය බෙදාදීම.





ඈ. අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා මෙම ආරක්ෂක සේනා මුලස්ථානය වෙතින් පවත්වනු ලැබූ වැඩසටහන්.



කෘෂි උපකරණ බෙදාදීම



පොල්පැල 3,000 ක් බෙදාදීම



කිරිහරක් බෙදාදීම



කුකුල් පැටවුන් බෙදාදීම

ඉ. සමාජ සුභසාධන හා ජාතීන් අතර සංහිඳියා වර්ධන කිරීමේ වැඩසටහන්.



ලේ දන්දීමේ ව්‍යාපාර



රාමසාන් උත්සවය





බෙදාදීමේ වැඩසටහන්





වෙසක් උත්සවය

ඊ. කොළඹ සංචාරක ගුරුවරුන්ගේ සංසදයේ ධන පරිත්‍යාගයෙන් නැවත පදිංචි කිරීම් සිදුකරන ලද අඩු ආදායම් ලාභී පවුල් වල දක්ෂ ලෙස අධ්‍යාපනය හදාරන පාසල් ළමුන් සඳහා පොත් සහ පාපැදි ලබාදීම.





එ. 'සෙන්ටර් ෆෝ හැන්ඩිකැප්ඩ් ආයතනය' සහ 'ආසියා පදනම් ආයතනය' හා එක්ව කෘතිම අත් පා, පුස්තකාල පොත් හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්වීම.





ඒ. වෛරවමුන්ඩ්‍රිප්පු වැව සහ පයන්කුලම් වැව අධික වර්ෂාපතනය හේතුවෙන් වැව් බැමි තුළින් ජලය කාන්දුවීමෙන් සිදුවීමට ගිය විනාශයන් වැලැක්වීම.





12. ආරක්ෂක සේනා මූලස්ථානයෙහි ප්‍රතිඵලදායී ක්‍රියාකාරකම් හේතුවෙන් ආරක්ෂාවට තර්ජනයක් වියහැකි රාජ්‍ය විරෝධී කණ්ඩායම්හි අභිමතාර්ථයන් ඉටුකර ගැනීමට කිසිදු අවස්ථාවක් නොලැබුණ අතර කාර්යක්ෂමව භටපිරිස් යෙදවීම, කාලීන ස්ථානගත කිරීම, ප්‍රතිඵලදායී ක්‍රියාකාරකම් හේතුවෙන් රාජ්‍ය විරෝධී හා අන්තගාමී අදහස් දරණ කණ්ඩායම් වලට කිසිදු රාජ්‍ය විරෝධී කටයුත්තක් බලප්‍රදේශය තුළ සිදුකිරීමට අවස්ථාව නොලැබීය. එලෙසම නීති විරෝධී සහ සමාජ විරෝධී ක්‍රියාකාරකම්ද අවම කිරීමට හැකිවිය. පුහුණුව සහ මානව කුසලතා සංවර්ධනය හමුදාවකට ඉතා වැදගත් නිසා මෙම මූලය යටතේ ඇති සෑම මූලස්ථානයක්ම ඒ සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ක්‍රියාකරන ලද අතර, ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ඇති පාබල පුහුණු පාසල් මගින් බළඇණි පුහුණුවීම් සිදුකිරීම සහ මෙයට අමතරව නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීමට සැලකිය යුතු පුහුණු වැඩසටහන් ප්‍රමාණයක්ද පවත්වන ලදී. තවද මෙම මූලස්ථාන අධීක්ෂණය යටතේ නිලධාරී/සෙසුනිලයන්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සේනාංක මට්ටමින් විවිධ ක්‍රීඩා තරඟ සංවිධානය කරන ලදී.

අ. ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපතිගේ මඟපෙන්වීම යටතේ අන්තර් සේනාංක පැසිපන්දු තරගාවලිය සංවිධානය කල අතර, ඉන් 61 වන සේනාංකය නියෝජනය කල ක්‍රීඩා කණ්ඩායම තරඟ කණ්ඩායම් 06 ක් පරාජය කර ජයග්‍රාහී කණ්ඩායම බවට පත්විය.

ආ. තවද, සංහිඳියාව සඳහා සහය වීමේ අරමුණින් සහ පැවති යුධමය කාලසීමාවෙන් පසු මෙම ප්‍රදේශය තුළ අඩු පහසුකම් හා අඩු ආදායම් ලාභී ජනතාවට ප්‍රතිලාභ ලබාදීම සඳහා විශාල වැඩසටහන් ප්‍රමාණයක්ද දියත් කරන ලදී. එමඟින් ඉතා සාමකාමී වාතාවරණයක් මෙම ප්‍රදේශය තුළ පවත්වාගන්නට සමත්වීම.



ඇ. මූලස්ථාන බල ප්‍රදේශය තුළ ජාතීන් අතර සමගිය හා සහයෝගිතාවය වර්ධනය කිරීමේ අරමුණින් සහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන ලද අතර, ප්‍රදේශයෙහි ක්‍රීඩා සමාජ මෙම තරගාවලිය සඳහා සහභාගි විය.





13. දැනුම මෙන්ම හැකියාව වර්ධනය කර ගැනීම සඳහා වසර තුළ පහත සඳහන් පරිදි පාඨමාලාවන් පවත්වන ලදී.

| අනු අංකය | සිදුකරන ලද පාඨමාලාව | සිදුකර ඇති අධියර ප්‍රමාණය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාව | 4 |
| 2. | විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු සංස්කරණ පාඨමාලාව | 3 |
| 3. | බළඇණි පුහුණුවීම් | බළඇණි 6 |
| 4. | බළඇණි පුහුණු වෙඩිතැබීම් හැකියාව වර්ධනය කිරීමේ පාඨමාලාව | 6 |
| 5. | ජීවිතාරක්ෂක පිහිණුම් පාඨමාලාව | 4 |
| 6. | පරිගණක පාඨමාලාව | 8 |
| 7. | සංග්‍රාමික ජීවිතාරක්ෂක පාඨමාලාව | 8 |

වගුව 10:4. පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය

<u>ගැටලු සහ අභියෝග</u>

14. ශ්‍රී ලංකාවෙහි උතුර සහ උතුරු මැද පළාත් යනු නියඟයට හා ජල ගැලීම් වලට බෙහෙවින්ම බලපාන ප්‍රදේශ වන අතර, එම පළාත් දෙකටම මධ්‍යස්ථව මෙම මූලස්ථානය පිහිටා ඇත. මෙම ප්‍රදේශයෙහි ජීවිකාව ගෙනයන ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ ගොවිතැනය. නියඟය සහ ගංවතුර ඔවුන්ගේ ජන ජීවිත වලට විශාල හානියක් සිදුකරනු ලබන අතර මෙම හේතුවෙන් ඔවුන් රජයෙහි සහ ආරක්ෂක අංශවල සහය නිරන්තරයෙන් අපේක්ෂා කරයි. එහෙත් පහත දක්වා ඇති දුෂ්කරතා හේතුවෙන් ඔවුන් හට ක්‍රමවත්ව සහ නිසි කලමණාකාරීත්වයකින් සහන සැලසීම සඳහා ආරක්ෂක අංශයන් වෙත පහත සඳහන් අපහසුතාවයන් පවතියි.

අ. වියලි කාලගුණ තත්ත්වයක් උදාවුවහොත් ඒ සඳහා මුහුණදීමට (විශේෂයෙන්ම ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ජල අවශ්‍යතාවය සපුරාදීම) අවශ්‍ය කරන ජල බෙදාහැරීමේ ජල බවුසර්වල හිඟතාවය.

ආ. හදිසි අපදා තත්ත්වයකදී මුහුණදීම සඳහා හය්පිරිස් සිටියද ඒ සඳහා අවශ්‍ය බඩුභාහිරාදියෙහි අඩුපාඩුකම් පැවතීම.

ඇ. ගංවතුර තත්ත්වයක් උදාවුවහොත් ඒ සඳහා මුහුණදීමට සුදානම් කර ඇති සෙවීමේ හා ගලවා ගැනීමේ බණ්ඩවල ඇති උපකරණ හිඟතාවය.

ඈ. ඉහල සෞඛ්‍ය මට්ටමකින් යුත් පානීය ජලය ලබාදීම සඳහා ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍ර ප්‍රමාණවත් නොමැතිවීම.

ඉ. මෙම ප්‍රදේශයෙහි පානීය ජලය මඟින් වකුගඩු රෝගය ඇතිවීමේ අවධානම දැඩිව පවතින බැවින් එය මැඩපැවැත්වීම සඳහා ක්‍රමවත් සැලැස්මක් ක්‍රියාවට නැංවීමට කටයුතු කිරිම.

<u>සාරාංශය</u>

15. බලප්‍රදේශය තුළ සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන යාම උදෙසා සියලුම ආරක්ෂක උපාය මාර්ගයන් නිසි ලෙස සහ සැලසුම්සහගතව ක්‍රියාවට නංවන ලද අතර, ඒ යටතේ ඇති සේනාංක මූලස්ථාන නියාමනය මඟින් එම කාර්යයන් ඉතා උසස් අයුරින් ඉටුකර ගැනීමට හැකි වූ අතර, සිවිල් සමාජය හා ප්‍රදේශයෙහි ඇති විවිධ සංවිධානයන් වෙත ඔවුන්ට අවැසි පරිදි සංවිධාන කටයුතු සඳහා මිත්‍රත්වයේ දෑත් දිගු කරමින් යුධ හමුදාවෙහි අභිමානය ඉහළ නංවන පරිදි සංවිධාන කටයුතු කරන ලදී.

16. තවද, බලප්‍රදේශයෙහි සිටින ජනතාව සහ පූජකවරුන් අතර ගොඩනගා ගත් මිත්‍රශීලී යහපත් සම්බන්ධතාවයන් තුළින් ප්‍රදේශය තුළ සහජීවනය හා සංහිඳියාව වර්ධනය කිරීමට හැකි වූ අතර, මෙම තත්ත්වය නිරන්තරයෙන් පවත්වාගෙන යාම තුළින් ප්‍රදේශය තුළ සාමය, සහජීවනය, සංහිඳියාව ජාතීන් අතර පවත්වාගෙන යාමට හැකි වනු ඇත. තවද, ඉදිරි වර්ෂයේද සිවිල් ජනතාව හා යුද්ධ හමුදාව අතර සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා නොයෙකුත් වැඩසටහන් පැවැත්වීම තුළින් හා සිවිල් ජනතාව හට හැකි උපරිමයෙන් පහසුකම් සැපයීමට ක්‍රියාකිරීම හා අනුග්‍රහය දැක්වීම සුදුසු බව යෝජනා කරනු ලැබේ.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර)

1. ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර), 2003 ඔක්තෝම්බර් 31 දින ස්ථාපනය කරන ලද අතර, ආරම්භයේදී සේනාංක 02 ක් (22 සහ 23 සේනාංකය) සහ ඉදිරි නඩත්තු ප්‍රදේශයකින් සමන්විත විය. මීට අමතරව නාවික, ගුවන්, පොලිස් විශේෂ කාර්යය බළකාය, පොලිස් සහ සිවිල් ආරක්ෂක බළකායන්හි භටපිරිස් මෙම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ක්‍රියාන්විත අවශ්‍යතාවයන් මත මෙහෙයවීම් සිදුකරනු ලැබීය. වර්තමානයේදී මෙම නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය මේජර් ජෙනරාල් වරයෙකු යටතේ අණදෙනු ලබයි. ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන භූමිය දිස්ත්‍රික්ක හතරකින් සමන්විත වේ. එම දිස්ත්‍රික්ක නම් ත්‍රිකුණාමලය, අම්පාර, මඩකළපුව හා පොළොන්නරුව වේ. මෙම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පවතින ඉදිරි නඩත්තු ප්‍රදේශ මේජර් ජෙනරාල් වරයෙකු විසින් පාලනය කරනු ලබන අතර, සේවා සහාය සහ ප්‍රවාහන කටයුතු එමගින් සිදුකරනු ලැබේ. ආරක්ෂක සේනා මූලස්ථානය නැගෙනහිර යටතේ පාබල සේනාංක 03 ක් සහ ඉදුරාම අණදෙන ඒකකයන් 05 ක් පවතී. මීට අමතරව ආරක්ෂක සේනා මූලස්ථානය යුද්ධ හමුදාධිපති අතිරේක බළඇණි සංචිතයන් බළඇණි 04 ක්ද යුද්ධ හමුදා පුහුණු පාසැල් 07ක් ද පවතියි.

### මූල්‍ය තොරතුරු

2. 2018 වර්ෂය සඳහා ලද මූල්‍ය ප්‍රතිපාදන සහ වියදම් ශේෂය පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | විස්තරය | ලැබුන ප්‍රතිපාදන (රු.) | වියදම් ප්‍රමාණය (රු.) | ඉතිරි (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | රාජකාරි දුම්රිය බලපත් | 1,065,000.00 | 787,690.00 | 277,310.00 |
| 2. | රාජකාරි බස් ගමන් බලපත් | 1,220,000.00 | 1,072,134.00 | 147,866.00 |
| 3. | සුභසාධක පුවත්පත් | 2,051,000.00 | 1,375,000.00 | 676,000.00 |
| 4. | ඉන්ධන | 248,888,160.00 | 231,967,818.00 | 1,692,20342.00 |
| 5. | මූලධන සේවා | 92,315,862.44 | 87,537,131.73 | 4,778,730.71 |
| 6. | පුනරාවර්ථන වියදම් | 6,689,421.20 | 5,876,665.11 | 812,756.09 |
| 7. | නඩත්තු සේවා | 37,063,778.87 | 8,759,278.94 | 28,304,499.93 |
| 8. | භූමි නඩත්තු | 1,145,000.00 | 1,039,984.00 | 105,016.00 |
| 9. | පවිත්‍රතා ද්‍රව්‍ය මිලදී ගැනීම | 134,129,286.00 | 1,545,920.09 | 132,583,365.91 |
| 10. | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 3,934,577.00 | 2,059,536.29 | 1,875,040.71 |
| 11. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියා කිරීම | 1,185,455.00 | 982,000.00 | 203,455.00 |
| 12. | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම | 1,487,060.00 | 1,390,000.00 | 97,060.00 |
| 13. | විහාරස්ථාන 03 ක් අලුත්වැඩියා කිරීම | 492,228.81 | 368,449.20 | 123,779.61 |
| 14. | පුලතිසි වෙසක් කලාපය | 862,102.50 | 783,082.00 | 79,020.50 |
| 15. | පරිගණක මිලදී ගැනීම | 5,000,000.00 | 4,908,400.00 | 91,600.00 |
| 16. | නළ ළිං ව්‍යාපෘතිය | 500,000.00 | 420,000.00 | 80,000.00 |

වගුව 11:1. මුල්‍ය ප්‍රතිපාදන විස්තරය

**<u>ප්‍රතිපාදන ඵලදායී ලෙස යෙදවීම</u>**

3. 2018 වර්ෂයේදී වැය ශීර්ෂ භාවිතා කිරීමේදී පහත කරුණු ඉතා වැදගත් විය.

අ. රාජකාරී දුම්රිය බලපත්, රාජකාරී බස් ගමන් බලපත්, සුභසාධක පුවත්පත් මිලදී ගැනීම් යනාදිය සඳහා වෙන් කරන ලද සීමිත මුදල් ප්‍රතිපාදන මෙම මූලය සහ යටතේ පාලනය වන සේනාංක මුලස්ථාන, ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර), බලසේනා මුලස්ථාන, පුහුණු පාසැල් සහ ඒකකයන් අතර විධිමත්ව විමධ්‍යගත කිරීම තුළින් එම සීමිත ප්‍රතිපාදනයන් උපරිම ඵලදායි ලෙස භාවිතා කිරීමට හැකි විය.

ආ. මූලධන සේවාවන් යටතේ 132'.3" x 52'.9" ප්‍රමාණයෙන් යුත් දේශන ශාලාවක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 10 ක මුදලක් ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) වෙත අනුමතව තිබුනද, එම මුදල ඒ සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් කාලීන අවශ්‍යතාවය මත අංග සම්පූර්ණ පහසුකම් වලින් සමන්විත ගෘහස්ත ක්‍රීඩාගාරයක් මූලධන ප්‍රතිපාදන ලෙස වෙන් කරන ලද රුපියල් මිලියන 10 න් ඉදිකරන ලදී.

ඇ. ඓතිහාසික පොළොන්නරුව නගරයෙහි පුලතිසි පොසොන් කලාපය - 2018 වෙනුවෙන් බෞද්ධ බලමණ්ඩලය විසින් ලබාදුන් රුː 862,102.50 ක මුදලින් රුː 783,081.00 ක මුදලක් පමණක් වැයකර එම ආගමික උත්සවය සාර්ථක අන්දමින් අවසන් කිරීමට හැකි විය.



ආරක්ෂක සේනා මුලස්ථාන පරිශ්‍රයේ ඉදිකරන ලද නව ගෘහස්ත ක්‍රීඩාගාරය



2018 පුලතිසි පොසොන් කලාපය

**<u>2018 වර්ෂයේ මුදුන්පත් කර ගත් අපේක්ෂාවන්</u>**

4. ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) අධීක්ෂණය යටතේ මෙම බලප්‍රදේශයෙහි ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බලය පැවැත්වීමේ ක්‍රියාන්විත නිසැක කිරීමේ මුර සංචාර මෙම වර්ෂය තුලද ක්‍රියාත්මක කරන ලදි. තවදුරටත් ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්ක තුල යුද්ධ හමුදාව විසින් භාවිතා කල ඉඩම් (අක්කර 20 ක්) ඒවායෙහි නීත්‍යානුකූල හිමිකරුවන් වෙත පවරාදීමට හැකිවීම මෙම මූලය ලද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සැලකේ.



ඉඩම් නිදහස් කිරීම - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
2018.12.10



ඉඩම් නිදහස් කිරීම - මඩකලපුව දිස්ත්‍රික්කය
2018.12.27

5. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ වෘත්තීමය දැනුම වර්ධනය කිරීම සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් මෙම මූලය යටතේ ක්‍රියාක්මක කරන ලදි.

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | බළඇණි පුහුණු වැඩසටහන් | 4 බළඇණි |
| 2. | නිළ උසස් කිරීමේ සංස්කරණ පාඨමාලාව | 6 |
| 3. | මූලික බුද්ධි පාඨමාලාව | 2 |
| 4. | මූලික දෙමළ භාෂා පාඨමාලාව | 2 |
| 5. | මූලික ගිණුම්කරණ පාඨමාලාව | 1 |
| 6. | සිංහල භාෂා පාඨමාලාව | - |
| 7. | පරිගණක පාඨමාලාව | 4 |
| 8. | මූලික ඉංග්‍රීසි භාෂා පාඨමාලාව | 5 |
| 9. | මූලික ලිපිකරු පාඨමාලාව | 3 |
| 10. | සත්‍ය ආත්මාරක්ෂක සටන්ක්‍රම පාඨමාලාව | 2 |
| 11. | මූලික සූපවේදී පාඨමාලාව | 1 |
| 12. | මූලික ට්‍රැක්ටර් පාඨමාලාව | 1 |
| 13. | සංග්‍රාමික ජීවිත ආරක්ෂක පාඨමාලාව | 1 |
| 14. | රියදුරු පාඨමාලාව | 2 |

වගුව 11:2. පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය

6. දියකාවා යුද්ධ අභ්‍යාසය - 2018 සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) වෙතින් භට කාර්යය සම්පාදන සහ පාලන අවශ්‍යතාවයන් සැපයීම් සිදුකරන ලදි. එමෙන්ම විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා 04 ක් මෙම මූල අධීක්ෂණය යටතේ 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.

7. තවද, ජාතීන් සහ ආගම් අතර සහජීවනය වර්ධනය කිරීම උදෙසා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බලප්‍රදේශය තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි (නත්තල් බැති ගී, කෝවිල් පූජා සංවිධානය, දන්සැල්).

<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය</u>

8. <u>ඉදිකිරීම්</u>.



10 වන ගජබා රෙජිමේන්තුව විසින් ජයන්තිපුර විහාරස්ථානයෙහි සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීම



24 වන සේනාංක මූලස්ථානය විසින් බුද්ධංගල විහාරස්ථානයෙහි සංඝාවාසය ඉදිකිරීම

9. පුණ්‍ය කටයුතු.





22 වන සේනාංක මුලස්ථානය විසින් තඹලගමුව ප්‍රදේශයෙහි අසරණ පවුල් දෙකක් සඳහා නිවාස ඉදිකරදීම

23 වන සේනාංක මුලස්ථානය විසින් වැල්ලවාඩිය සිංහල මහාවිද්‍යාලයෙහි පාසැල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම





233 වන බළසේනා මුලස්ථානය විසින් සිවිල් ජනතාව උදෙසා වෛද්‍ය කඳවුරක් පැවැත්වීම

කදිරවේලී ටික්කාන ප්‍රදේශයෙහි ජනතාව වෙත කජුපැල 1,000 ක් බෙදාදීම

10. ඩෙංගු මර්දන වැඩසටහන් සහ පරිසර පිරිසිදු කිරීමේ වැඩසටහන්.





වෙන්කලඩි එරාවුර් ප්‍රදේශයේ ඩෙංගු මර්ධන වැඩසටහන - 2018.04.07

ලංකා අයිඕසී සමාගම විසින් සිදුකල ලේ දන්දීමේ වැඩසටහන 2018.09.29

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

11. **<u>මානුෂීය බිම් වෙඩි ඉවත්කිරීම.</u>** 2018 වර්ෂය තුළ 23,124 m2 ප්‍රදේශයක බිම් වෙඩි නිසැක කිරීම සිදුකරන ලද අතර, පුනානි බිම් වෙඩි කෙත නිසැක කරමින් පවතියි.

| අනු අංකය | මානුෂික බිම් වෙඩි කෙත | නිසැක කල ප්‍රමාණය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | උණුවතුර බුබුළ | 13530 m2 |
| 2. | සිංහපුර | 5440 m2 |
| 3. | පුනානි | 4154 m2 |

වගුව 11:3. බිම් වෙඩි නිසැක කිරීම් සාරාංශය



12. **<u>සංවර්ධන ව්‍යාපෘති.</u>** 7 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව විසින් සිරිසර පිවිසුම, යලි පිබිදෙමු පොළොන්නරුව, ගම් පෙරළිය යනාදී රජයෙහි සංවර්ධන ව්‍යාපෘති සහ ඇලහැර රණවිරු ගම්මානය සහ වාරන්කැඩගොඩ විද්‍යාලයෙහි ඉදිකිරීම් කටයුතු සඳහාද දායකත්වය සපයන ලදි.



පුනානි වෙඩි ද්‍රව්‍ය ගබඩාව වෙත පිවිසෙන මාර්ගය ඉදිකිරීම



ඉනාමලුව ප්‍රදේශයේ මාර්ග ඉදිකිරීම සඳහා දායකත්වය දැක්වීම



23 වන සේනාංක මුලස්ථානය කිරාන් ප්‍රදේශයෙහි ජනතාව වෙත ආපදා කලමනාකරණ සහාය සැපයීම

**ගැටලු සහ අභියෝග**

13. පවතින අවම සම්පත් උපයෝගී කරගනිමින් ප්‍රදේශයෙහි ජනවාර්ගික සහ ආගමික සහජීවනය වර්ධනය කිරීම / ආපදා කළමනාකරණය / ප්‍රදේශයෙහි ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා සිවිල් ආයතන වෙත සහාය දැක්වීම.

14. ඉඩම් පවරාගැනීමේ සහ නිදහස් කිරීමේ ක්‍රියාවලිය.

15. බහුවාර්ගික සහ බහු ආගමික පරිසරයක් තුළ ප්‍රදේශයෙහි ආරක්ෂාව පවත්වාගෙන යාම.

16. ආපදා අවස්ථාවන් වලදී පවතින තත්වයන් යටතේ වැඩි හයිපිරිස් ප්‍රමාණයක් යෙදීවීමට සිදුවීම.

17. ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ක්‍රියාකාරකම් සහ පුනරුත්ථාපනය වූ / නොවූ හිටපු එල්ටීටීඊ සාමාජිකයින්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම.

18. පවතින දේශපාලන වාතාවරණය මත ප්‍රදේශයේ ඇති විය හැකි දේශපාලනමය අර්බුද සහ ගැටුම්.

**සාරාංශය**

19. නැගෙනහිර පළාතෙහි භූගෝලීය සැකැස්ම හා එහි දැවැන්ත ආර්ථික විභවය හේතුවෙන් උපක්‍රමික හා ආර්ථික වශයෙන් වැදගත් ප්‍රදේශයක් ලෙස සලකනු ලැබේ. තවද, ත්‍රිකුණාමල වරාය ලෝකයේ තෙවැනි විශාලතම ස්වාභාවික වරාය වන අතර, එය ඇතුලු ආර්ථික මරමස්ථාන විශාල ප්‍රමාණයක් මෙම බලප්‍රදේශය තුල පිහිටා ඇත. ප්‍රාදේශීය ආර්ථික, දේශපාලනික හා භූගෝලීය වටිනාකම ශ්‍රී ලාංකීය ඓතිහාසික වැදගත්කමට වටිනාකමක් එක්කරයි. එසේම, පැවති වාර්ගික අර්බුධ සමය තුළ ත්‍රස්ථවාදී ක්‍රියාකරකම් හේතුවෙන් සමස්ත බලප්‍රදේශයට දැඩි බලපෑමක් එල්ල විය. එබැවින් ප්‍රදේශයෙහි සංකීර්ණ ආරක්ෂක වටපිටාව තුළ යුද්ධ හමුදා දායකත්වය වැදගත් සාධකයක් ලෙස දැක්විය හැකි අතර, බලප්‍රදේශය තුළ ඇතිවිය හැකි ඕනෑම අභියෝගාත්මක තත්ත්වයකට මුහුණදීමේ වගකීම මෙම මූලස්ථානය සතුවේ.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය)

1. ප්‍රදේශයෙහි ආරක්ෂාව තහවුරු කරමින් තිරසාර සාමයක් ඇතිකිරීම යන මූලික වගකීම පෙරටුකොට ගනිමින් කිලිනොච්චිය ආරක්ෂක සේනා මූලස්ථානය 2019 ජූනි මස 29 දින ස්ථාපනය කරන ලද අතර, බලප්‍රදේශය භූගෝලීය වශයෙන් කිලිනොච්චිය, මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්ක පුරා විහිදී පවතියි. අණ හා පාලනයෙහි පහසුව සඳහා 57 සේනාංකය, 65 සේනාංකය හා 66 සේනාංකය වශයෙන් පාබල සේනාංක 03 ක් හා භට්කාර්ය සම්පාදන කටයුතු මෙහෙයවීම වෙනුවෙන් ඉදිරි නඩත්තු පෙදෙස (කිලිනොච්චිය) ස්ථාපිතව ඇත. ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත අනෙකුත් මූලස්ථාන/ඒකකයන් වෙතින් පුනරුත්ථාපනය, නැවත සමාජ ගතකිරීම, ප්‍රතිසංස්කරණය හා නැවත පදිංචි කිරීම මෙන්ම සංහිඳියාව ආරක්ෂා කරගැනීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබන අතර, එකම ජාතියක් ලෙස සහජීවනයෙන් ජීවත්වන ප්‍රජාව අතර සමානාත්මතාවය, වාර්ගික සමගිය මෙන්ම සාමාජීය, සංස්කෘතික හා ආගමික සංවර්ධනය සහතික කරනු වස් ක්‍රියාත්මක සාමූහික ප්‍රයත්නයන් සඳහා සහාය වනු පිණිස විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් රැසක් ක්‍රියාවට නන්වන ලදී. තවද, ප්‍රදේශය පුරා හදිසියේ ඇති විය හැකි ස්වභාවික විපත් හා ආපදාවන්හිදී ක්‍රියාකාරීව මැදිහත්වීම ආරක්ෂක සේනා මූලස්ථානයෙහි ප්‍රධාන භූමිකාව බවට පත්ව ඇත. එමෙන්ම ප්‍රදේශයෙහි ආරක්ෂාව තහවුරු කරමින් නීතිය හා සාමය ආරක්ෂා කර ගැනීම සඳහා යුද්ධ හමුදා භට්පිරිස් වලට අමතර වගුවන් හමුදාව, නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය හා පොලිස් විශේෂ කාර්ය බලකාය ද බලප්‍රදේශය තුළ ස්ථානගතව ඇත.

### මූල්‍යමය තොරතුරු

2. ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රෙජිමේන්තු ආයතන සභාපති (රෙඅස) ගිණුමට බැර කරන ලද මූල්‍ය ප්‍රතිපාදන සබැඳි විස්තර පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | ව්‍යාපෘතිය | ලද මුදල (රු.) | වැයකල මුදල (රු.) | ඉතිරි මුදල (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | කිලිනොච්චි හා මාන්කුලම් විහාරස්ථාන අලුත්වැඩියා කිරීම | 1,993,929.33 | - | 1,993,929.33 | මූලික වැඩකටයුතු ආරම්භ කර ඇත |
| 2. | කිලිනොච්චි ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම | 20,000,000.00 | - | 20,000,000.00 | |
| 3. | ජල පිරිපහදු පද්ධතිය ඉදිකිරීම | 2,053,002.00 | - | 2,053,002.00 | |

වගුව 12:1. 2018 වසර සඳහා වෙන්කරන ලද මූල්‍ය ප්‍රතිපාදන විස්තරය

3. අභ්‍යාස දීමනා ගිණුමෙහි මුදල් ලැබීම් හා වියදම් විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | මුදල් වෙන් කරන ලද අවශ්‍යතාවය | ලද මුදල (රු.) | වැයකල මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම | 39,000.00 | 39,000.00 | - |
| 2. | වාරසඟරා සහ ප්‍රකාශන මිලදී ගැනීම සඳහා | 14,850.00 | 14,850.00 | - |
| 3. | දියකාවා ඒකාබද්ධ යුධ අභ්‍යාසය සඳහා | 2,500,000.00 | 2,206,009.83 | 293,990.17 ක ඉතිරි මුදල වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නැවත භාරදෙන ලදී. |

වගුව 12:2. අභ්‍යාස දීමනා ගිණුමේ විස්තරය - ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය)

**<u>ප්‍රතිපාදන ඵලදායී ලෙස යෙදවීම</u>**

4. ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ රාජකාරියෙහි නිරත සෙබළුන්ගේ සුභසාධනය වෙනුවෙන් ලැබෙන ප්‍රතිපාදන සහ කිළිනොච්චි ප්‍රදේශයෙහි පදිංචි සිවිල් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදවා ඇති අතර, රජය විසින් ක්‍රියාත්මක සංහිඳියාව ක්‍රියාවලියට සහාය දක්වනු වස් පහත ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී.

අ. කිළිනොච්චිය හා මාන්කුලම බෞද්ධ විහාරස්ථාන නවීකරණය කිරීම.
ආ. කිළිනොච්චි ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම.
ඇ. ජල පිරිපහදු පද්ධතිය ඉදිකිරීම.

**<u>වාර්ෂික කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණය</u>**

5. **<u>සිවිල් ජනතාව හා හමුදා සාමාජිකයින් අතර සහයෝගීතාව ගොඩනැංවීම.</u>** ප්‍රදේශයෙහි සිවිල් වැසියන්හට අහිමිව ගිය තම ජීවනෝපායන් හා සාමකාමී වටපිටාව නැවත බිහිකිරීම දශක තුනකට අධික කාලසීමාවක් ත්‍රස්තවාදයෙන් බැට කෑ ජනතාව අතර සංහිඳියාව ගොඩනැන්වීමට ඉවහල් වන ප්‍රධාන සාධකයන් බැව් හඳුනාගැනීම හේතුවෙන් යුද්ධ හමුදාව හා සිවිල් ජනතාව අතර සහජීවනය ශක්තිමත් කිරීම උදෙසාත්, ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළට ඔසවා තැබීම තුළින් සාමාජීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික වශයෙන් වටිනාකමක් ඇති කිරීම උදෙසාත් සුභසාධක ව්‍යාපෘති 14 ක් කිළිනොච්චිය සහයෝගිතා කේන්ද්‍රය මගින් ක්‍රියාවට නංවා ඇත. එම ව්‍යාපෘති 14 පහත රූප සටහන මගින් දක්වා ඇත.




රූප සටහන 12:1. සහයෝගිතා කේන්ද්‍රය මගින් ක්‍රියාවට නංවා ඇති ව්‍යාපෘති

6. සංස්කෘතික, සාමාජීය, ජනවාර්ගික හා ආගමික සහජීවනය තුළින් ප්‍රබල ශ්‍රී ලාංකික ජනසමාජයක් ගොඩනැගීම උදෙසා පහත විෂයන් යටතේ සහයෝගීතා කේන්ද්‍රය මගින් ක්‍රියාකාරකම් රැසක් සිදුකරන ලදී.

අ. සහයෝගීතාවය හා සංහිඳියාව ඇති කරලීම හා වැඩිදියුණු කිරීම.

ආ. දේශීය ප්‍රජාවගේ මැදිහත්වීමෙන් තම අද්විතීය උරුමයන්ගෙන් පොහොසත් ජාතික අනන්‍යතාවයක් ගොඩනැන්වීම.

ඇ. සෑම පුද්ගලයෙකු සඳහාම සාමාජීය, ආර්ථිකමය, සෞඛ්‍යමය හා ආධ්‍යාත්මික වශයෙන් වටිනාකමක් එකතු කිරීම.

ඈ. සහයෝගීතාවය වර්ධනය කිරීම වෙනුවෙන් වන සාධකයන් ප්‍රවර්ධනය කිරීම.

ඉ. අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම උදෙසා භාෂා දැනුම ප්‍රවර්ධනය කිරීම, ක්‍රීඩා හා ශාරීරික යෝග්‍යතාවය වැඩිදියුණු කිරීම.

ඊ. සුවපහසු වටපිටාවක් තුළ විවේකීව ගතකිරීමට හැකි පරිසරයක් ගොඩනැන්වීම.

උ. කිළිනොච්චි ප්‍රදේශය තුළ සියළු ජාතීන් හට සමගියෙන් සහ සහයෝගයෙන් ජීවත් විය හැකි පරිසරයක් ප්‍රතිනිර්මාණය හා පවත්වාගෙන යාම.

ඌ. ශ්‍රී ලාංකික හදවත් තුළට දැනෙන ප්‍රජාසත්කාරක වැඩසටහන් තුළින් ජාතීන් අතර සංහිඳියාව වැඩිදියුණු කිරීම.

එ. දේශීය ප්‍රජාවගේ අද්විතීය උරුමයන් සුරක්ෂිත කිරීම හා සහයෝගීත්වයෙන් සපිරි ජාතික අනන්‍යතාවයක් ගොඩනැන්වීම.

ඒ. තරුණ ප්‍රජාව හා කුඩා දරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඔවුන් සාමාජීය, සෞඛ්‍ය, හා ආධ්‍යාත්මික වශයෙන් පෝෂණය කිරීම.

ඔ. අන්තර් සංස්කෘතික, අන්තර් ජාතීන්, හා අන්තර් ආගමික සබඳතා ඔස්සේ සමාජ සහයෝගීතාවය වැඩිදියුණු කිරීම.

ඕ. ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට සංකීර්ණ හා හදිසි අවස්ථාවන්හිදී ඇති වන අභියෝග/ගැටළු නිරාකරණය කරගැනීම සඳහා සහාය දැක්වීම.

7. වාර්ගික, සංස්කෘතික, ආගමික, සාමාජීය හා භාෂාමය වශයෙන් එක්ව බැඳුණු උතුර දකුණ යාකරන සහයෝගීත්වයේ පාලමක් ගොඩනැන්වීම තුළින් සවිමත් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැන්වීමේ අරමුණින් කිළිනොච්චිය ආරක්ෂක සේනා මූලස්ථානය සියළු ජාතීන් හට සහයෝගය දක්වන අතර, රජයේ සංහිඳියාව ක්‍රියාවලිය සඳහා සහාය දැක්වීම වෙනුවෙන් පහත වැඩසටහන් ක්‍රියාවට නංවා ඇත.

අ. නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම.

ආ. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය, කෘතිම පාද, ඇස් කණ්ණාඩි, පාපැදි, පාසැල් බෑග් හා උපකරණ බෙදාදීම.

ඇ. අලුත් අවුරුදු, වෙසක්, පොසොන්, ඉෆ්තාර් හා නත්තල් වැනි විශේෂ උත්සව අවස්ථාවන් සංවිධානය කිරීම.

ඈ. බෝවන හා බෝනොවන රෝග සබැඳිව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඉ. සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ට සහාය දැක්වීම හා වෛද්‍ය සායනයන් ක්‍රියාත්මක කිරීම.

ඊ. ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම.

උ. ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



අලුත් අවුරුදු උත්සවය



වෙසක් උත්සවය



නත්තල් කැරොල්



ඉෆ්තාර් උත්සවය



පාපැදි බෙදාදීම



කෘතිම පාද බෙදාදීම



ලේ දන්දීම



ශ්‍රමදාන වැඩසටහන

8. **<u>ආපදා කළමනාකරණය හා කිළිනොච්චි ප්‍රදේශය තුළ ඇතිවූ හදිසි ගංවතුර අවස්ථාවේදී ක්ෂණික සහයෝගය ලබාදීම</u>**. අනාගතයේදී ඇතිවිය හැකි හදිසි ආපදාවන්ගෙන් සිදුවන හානිය අවම කර ගැනීම වෙනුවෙන් කිළිනොච්චිය ආරක්ෂක සේනා මූලස්ථානය පෙරමුණ ගෙන ඇති අතර, ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් හඳුනාගැනීම හා විශාල ව්‍යසනයන් සිදුවීමේ සම්භාවිතාවය අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. ස්වභාවික ආපදා තත්ත්වයකදී පුද්ගලයින්, දේපල හා යටිතල පහසුකම් සඳහා ඇති විය හැකි බලපෑම් අවම කරගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට රජය විසින් බලය පවරා ඇති අතර, ස්වභාවික විපත් සබැඳි පූර්ව තොරතුරු ලබාගැනීම සඳහා කිළිනොච්චිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග සමබන්ධතාවයෙන් කටයුතු කරනු ලබයි. මෙම මූලස්ථානය යටතේ පාලනය වන සෑම ඒකකයක් තුළම හදිසි ආපදාවකදී ප්‍රතිචාර දැක්වීම උදෙසා අවම වශයෙන් එක් ඛණ්ඩයක් බැගින් සූදානම් කර ඇති අතර, සෙවීමේ හා මුදවා ගැනීමේ ඛණ්ඩ 02 ක් කිළිනොච්චිය නගරයෙහි ස්ථාපිත 57 සේනාංකය යටතේ ස්ථාපිත කර ඇත. තවද, හදිසි ආපදාවකදී ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් තනි පුද්ගලයෙකු වශයෙන් හෝ සංවිධානාත්මකව කටයුතු කිරීම සඳහා අවැසි විශේෂ පුහුණුවක් යුද්ධ හමුදා සාමාජිකයින් වෙත ලබාදී ඇත.

9. **කිළිනොච්චි ප්‍රදේශය තුළ ඇතිවූ හදිසි ගංවතුරෙන් අවතැන් වූවන් මුදවා ගැනීමේ මෙහෙයුම.** හදිසි ගංවතුර හේතුවෙන් බලපෑමට ලක්වූ ජනතාවට ක්ෂණිකව ලබාදුන් සහාය/ආධාර පහත සඳහන් පරිදි වේ:

අ. ප්‍රවාහන පහසුකම්.
ආ. තාවකාලික නිවාස.
ඇ. ආහාර පාන.
ඈ. ආපදා සහන මධ්‍යස්ථාන වෙත යොමුකිරීම හා යථාතත්වයට පත්කිරීම.
ඉ. වෛද්‍ය පහසුකම්.
ඊ. හානියට පත් යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම හා තවදුරටත් සිදුවිය හැකි හානි අවම කරගැනීම සඳහා වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම.



හදිසි ගංවතුර අවස්ථාවේදී ලබාදුන් මානුෂීය ආධාර



**<u>වසරක් තුළ අත්කර ගත් ප්‍රගතිය</u>**

10. ආරක්ෂක සේනා මූලස්ථානය හා ඒ යටතේ පාලනය වන අනෙකුත් ආයතන/ඒකකයන්හි දායකත්වයෙන් රජය විසින් ක්‍රියාත්මක පශ්චාත් යුධ සමය තුළ බලප්‍රදේශයෙහි සාමය හා සංහිඳියාව ගොඩනැන්වීමේ ක්‍රියාවලියට සහයෝගය ලබාදීමට හැකියාව ලැබුණි. තවද බලප්‍රදේශයෙහි ජීවත් වන වැසියන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට හැකියාව ලැබී ඇත.

**<u>ගැටළු සහ අභියෝග</u>**

11. 2018 වසර තුළ මුහුණ දීමට සිදුවූ ගැටළු හා අභියෝගයන් අනුව සලකා බැලීමේදී අනාගත අභියෝග යන් පහත සඳහන් පරිදි බැව් හඳුනාගත හැක.

අ. කැරලි මර්ධන කණ්ඩායම් සහ සෙවීමේ හා මුදවා ගැනීමේ ඛණ්ඩයන් සඳහා අත්‍යාවශ්‍ය උපකරණයන්හි පවතින හිඟතාවය හේතුවෙන් කාර්යක්ෂම සේවයක් ලබාදීමේදී ගැටළුකාරී තත්ත්වයනට මුහුණදීම සඳහා පෙර සූදානමක් ලෙස පුහුණුවීම් කටයුතු සිදුකර ඇත.

ආ. සිවිල් ජනතාව හා හමුදා සාමාජිකයින් අතර සහයෝගීතාවය ගොඩනැගීමේදී සන්නිවේදනය ප්‍රධාන බාධකයක් වී ඇත.

**<u>සාරාංශය</u>**

12. වර්තමානයේදී ආරක්ෂාව යන සංකල්පය හමුදාව සහ පොදු ජනතාවගේ එකමුතුභාවය මත පදනම්ව ගොඩනැගීම සබැඳිව අවධානය යොමුවෙමින් පවතී. තවද මෙම සහයෝගීතාවය හේතුවෙන් ඕනෑම ගැටළුකාරී අවස්ථාවකදී හමුදාමය විසඳුම අවසාන අවස්ථාව දක්වා ප්‍රමාද කිරීමේ හැකියාව පවතියි. පශ්චාත් යුධ සමය තුළ ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යක් වශයෙන් සාමය ස්ථාපිත කරනු වස් ගනු ලබන සෑම ක්‍රියාමාර්යක් කෙරෙහිම ජාත්‍යන්තරය අවධානයෙන් පසුවේ. එහෙත් යුද්ධ හමුදාව මැදිහත්වීමෙන් සිදුකරනු ලබන සුභවාදී ක්‍රියාකාරකම් සබැඳි තොරතුරු සන්නිවේදනයේදී සිදුවන අඩුපාඩු හේතුවෙන් ශ්‍රී ලංකාව පිළිබඳව වැරදි චිත්‍රයක් ජාත්‍යන්තරය හමුවේ ප්‍රතිනිර්මාණය වන බැවින් එවැනි ක්‍රියාකාරකම් වැඩි පිරිසක් වෙත සන්නිවේදනය කිරීමට අවැසි ක්‍රියාමාර්ග ගැනීම තුළින් එවැනි තත්ත්වයක් වළක්වා ගත හැක. පොදුවේ ගත් කල ප්‍රදේශයෙහි ජනතාව කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානය කෙරෙහි විශේෂ ගෞරවයක් හා සැළකිල්ලක් දක්වන බැව් දැකගත හැකිය. කරුණු එසේ වුවද පශ්චාත් යුධ සමය තුළ සාමය හා සංහිඳියාව පවත්වා ගැනීම උදෙසා විවිධ සිවිල් සංවිධාන සමඟ කටයුතු කිරීමේදී නොයෙකුත් අභියෝග රැසකට මුහුණ දීමට සිදුවුවද, ආරක්ෂක සේනා මූලස්ථානය අභියෝග හමුවේ නොසැලෙමින් තම අරමුණ කරා විජයග්‍රාහී අන්දමින් පියනගමින් ඇත.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි


ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින්
සිදුකළ ආපදා සහන මෙහෙයුම් - 2018
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ජාතිය, ආගම යන
කිසිදු සාධකයක් නොතකමින්,
ආපදා සහන මෙහෙයුම් සඳහා
තම පූර්ණ දායකත්වය සපයන ලදී.

## <u>ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්)</u>

1. මානුෂීය මෙහෙයුම අවසන් වීමත් සමඟම ප්‍රදේශයෙහි ආරක්ෂාව තහවුරු කිරීම, යුද්ධයෙන් අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, හිටපු සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම, යුද්ධයෙන් විනාශ වූ යටිතල පහසුකම් සහ නිවාස නැවත ගොඩනැගීම සඳහා රජයට සහායදීම හා සිවිල් ජනතාව සහ හමුදා සාමාජිකයින් අතර සම්බන්ධතාව වැඩිදියුණු කිරීම යන මූලික අරමුණු පෙරදැරි කරගෙන 2009.06.05 දින ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) පිහිටුවන ලදී.

2. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බලප්‍රදේශයට අයත් මුලු බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර 1,221 කින් සමන්විත වන අතර 59, 64, 68 සේනාංක යන පාබල සේනාංක 3 කින් හා ඒ යටතේ ඇති බළසේනා 09 ක් හා බලඇණි 15 කින් ද ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) වලින්ද සමන්විත මෙම ආරක්ෂක සේනා මූලස්ථානය බලප්‍රදේශය තුළ ජීවත්වන සියලු ජන කොටස් වලට අයත් ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමටත්, තිරසාර සාමයක් ස්ථාපිත කිරීමටත්, සංහිඳියාව වර්ධනය කිරීමටත් මේ වන විට ඉදිරි කටයුතු සිදුකරමින් පවතියි.

### <u>මූල්‍යමය විස්තර</u>

3. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙත ලබාදුන් සියලු මුදල් ඉතාමත් ඵලදායි ලෙසින් සෙබලුන්ගේ සුභසාධක කටයුතු ඉහළ නැංවීමටත්, බලප්‍රදේශය තුළ වාසය කරන සිවිල් ජනයාගේ ජීවන මට්ටම ඉහළ නැංවීමටත් යෙදවූ අතර, එම විස්තර පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂ අංකය | වැය විෂය | ලද ප්‍රතිපාදන (රු.මි) | මුළු වියදම (රු.මි) | ඉතිරි ප්‍රතිපාදන (රු.මි) |
|---|---|---|---|---|---|
| **(අ)** | **(ආ)** | **(ඇ)** | **(ඈ)** | **(ඉ)** | **(ඊ)** |
| **<u>පුනරාවර්තන වැය ශීර්ෂය</u>** | | | | | |
| 1. | 002-1-4-1-1409 | සංහිඳියාව පදනම් කරගත් ව්‍යාපෘති | 2.52 | 2.51 | 0.01 |
| 2. | 222-1-1-0-1001 | පුද්ගල පඩිනඩි - වැටුප් හා වේතන | 196.57 | 149.56 | 47.00 |
| 3. | 222-1-1-0-1002 | පුද්ගල පඩිනඩි - අතිකාල හා නිවාඩු දින වැටුප් | 76.04 | 76.04 | 0.00 |
| 4. | 222-1-1-0-1003 | වෙනත් දීමනා | 110.16 | 106.43 | 3.73 |
| 5. | 222-1-1-0-1101 | ගමන් වියදම් - දේශීය/සංයුක්ත දීමනා | 3.10 | 2.01 | 1.09 |
| 6. | 222-1-1-0-1401 | සේවා - ප්‍රවාහන | 127.08 | 126.85 | 0.23 |
| 7. | 222-1-1-0-1409 | වෙනත් | 0.02 | - | 0.02 |
| 8. | 222-1-1-0-1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය | 0.40 | 0.08 | 0.32 |
| 9. | 222-1-4-0-1401 | සේවා - ප්‍රවාහන (ස්වෙච්ඡා) | 21.00 | 20.06 | 0.94 |
| 10. | 222-1-2-0-1201 | සැපයීම් - ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 4.03 | 2.24 | 1.80 |
| 11. | 222-1-2-0-1202 | සැපයීම් - ඉන්ධන | 145.24 | 141.66 | 3.58 |
| 12. | 222-1-2-0-1203 | සැපයීම් - ආහාර පාන හා නිල ඇඳුම් | 753.24 | 648.92 | 104.31 |
| 13. | 222-1-2-0-1205 | වෙනත් | 64.30 | 47.77 | 16.53 |
| 14. | 222-1-2-0-1301 | නඩත්තු වියදම් - වාහන | 18.00 | 16.46 | 1.54 |
| 15. | 222-1-2-0-1302 | නඩත්තු වියදම් - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 4.91 | 4.85 | 0.06 |
| 16. | 222-1-2-0-1303 | නඩත්තු වියදම් - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.15 | 0.62 | 0.53 |
| 17. | 222-1-2-0-1403 | සේවා - විදුලිය, ජලය, දුර හා ගෑස් | 89.31 | 87.37 | 1.93 |
| 18. | 222-1-2-0-1409 | වෙනත් | 2.10 | 1.98 | 0.12 |
| 19. | 222-1-3-0-1402 | සේවා - තැපැල් හා සන්නිවේදන | 5.48 | 5.36 | 0.12 |
| 20. | 222-1-3-0-1409 | වෙනත් | 0.15 | 0.13 | 0.02 |
| 21. | 222-1-4-0-1203 | සැපයීම් - ආහාරපාන (සෙව්) | 132.08 | 26.12 | 105.96 |
| | **එකතුව** | | **1,756.86** | **1,467.03** | **289.84** |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
|---|---|---|---|---|---|
| **ප්‍රාග්ධනය** | | | | | |
| 22. | 222-1-3-0-2001 | ප්‍රාග්ධනය | 0.42 | 0.04 | 0.38 |
| 23. | 222-1-3-0-2002 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 1.20 | 0.57 | 0.63 |
| 24. | 222-1-3-0-2003 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 22.00 | 21.33 | 0.67 |
| 25. | 222-1-3-0-2102 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 2.64 | 2.30 | 0.34 |
| 26. | 222-1-3-0-2103 | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ සඳහා | 7.33 | 6.54 | 0.79 |
| 27. | 222-1-3-0-2104 | ප්‍රාග්ධන වත්කම් ලබා ගැනීම | 2.57 | 1.94 | 0.64 |
| 28. | 222-1-1-0-2104 | ගොඩනැගිලි සඳහා ප්‍රාග්ධන වත්කම් ලබා ගැනීම | 30.75 | 30.59 | 0.16 |
| 29. | 222-1-1-4-2104 | ගොඩනැගිලි සඳහා ප්‍රාග්ධන වත්කම් ලබා ගැනීම | 32.10 | 31.64 | 0.46 |
| | **එකතුව** | | **99.00** | **94.95** | **4.06** |
| | **මුළු එකතුව** | | **1,855.86** | **1,561.98** | **293.90** |

වගුව 13:1. පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය ශීර්ෂය විස්තරය

**වැයශීර්ෂය උපයෝජනය කිරීම**

4. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙත ලැබුණු ප්‍රතිපාදන සියල්ල සෙබලුන්ගේ සුභසාධන කටයුතු සඳහා යොදාගත් අතර ඒ තුළින් සිදුකල ව්‍යාපෘති හා වැඩසටහන් අතුරින් කිහිපයක් පහත සඳහන් පරිදි වේ:

අ. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) තුළ නව පහසුකම් වලින් සමන්විත මුලුතැන්ගෙයක් හා සලාක ගබඩාවක් සෙබලුන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලදි.

ආ. ආරක්ෂක සේනා ජනපදය තුළ සුභ සාධක වෙලෙඳසැලක්, ජන අවන්හලක්, මැහුම් හලක්, කරණවෑම් හලක් හා රූපලාවන්‍යාගාරයකින් සමන්විත අංගසම්පූර්ණ වෙළඳ සංකීර්ණයක් සෙබලුන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලදී.

ඇ. නව අංගඋපාංග වලින් සමන්විත දේශණ ශාලාවක් 64 සේනාංක මූලස්ථානය තුළ ඉදිකරන ලදී.

ඈ. අංග සම්පූර්ණ නව කාර්යාල සංකීර්ණයක් ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) සඳහා ඉදිකිරීම.

ඉ. යුද්ධ හමුදා මූලික රෝහල (මුලතිව්) කාඩ්පත් අංශය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**<u>2018 වර්ෂය තුළ සිදුකල ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරය</u>**

5. **<u>පුහුණුවීම්.</u>** යුධ සූදානම හා වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙතින් පහත සඳහන් පාඨමාලාවන් සිදුකරන ලදී:

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | බළඇණි පුහුණුවීම් | 5 |
| 2. | මූලික දෙමළ පාඨමාලාව | 6 |
| 3. | ආපදා කළමණාකරන පාඨමාලාව | 2 |
| 4. | සංඥා මූලික පාඨමාලාව | 4 |
| 5. | බළඇණි පුහුණුවීම් උපදේශක පාඨමාලාව | 2 |
| 6. | මානව හිමිකම් වැඩමුලුව | 2 |
| 7. | ඒකක පරිපාලන පාඨමාලාව | 2 |
| 8. | ගබඩාකරු පාඨමාලාව | 4 |
| 9. | ජනක යන්ත්‍ර පාඨමාලාව | 5 |
| 10. | ප්‍රථමාධාර පාඨමාලාව | 3 |
| 11. | වාහන නඩත්තු කිරීමේ පාඨමාලාව | 2 |
| 12. | යෝග පාඨමාලාව | 4 |
| 13. | විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාව | 4 |
| 14. | කැරළි මර්ධන පාඨමාලාව | 5 |
| 15. | නිලධාරි නිල උසස් කිරීමේ පාඨමාලාව (සංස්කරණ) | 1 |

වගුව 13:2. පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය

6. **<u>රජයට සහ සිවිල් ජනතාවට අයත් යුද්ධ හමුදාව භාවිතා කරන ලද ඉඩම් නිදහස් කිරීම.</u>** මුලතිව් ප්‍රදේශයෙහි ජීවත් වන සිවිල් ජනතාව සමඟ සංහිදියාව වර්ධනය කිරීමේ අරමුණින් යුධ සමයේදී යුද්ධ හමුදාව විසින් පරිහරණය කරන ලද ඉඩම් අක්කර 54.34 ක රජයේ ඉඩම් අක්කර 85.05 ක පුද්ගලික ඉඩම් පසුගිය වසර තුළ රජයෙහි නියෝජිතයින් හා ඉඩම් අයිතිකරුවන් වෙත බෙදාදෙන ලදී.





නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

7. **<u>සිවිල් ජනතාව හා යුද්ධ හමුදාව අතර සහයෝගීතාවය.</u>** 2018 වර්ෂය තුළ ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බළප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ජනතාව සමඟ සුහදතාවය වර්ධනය කර ගැනීමේ අරමුණින් සමාජ සමගාමී ක්‍රියාකාරකම් විශාල සංඛ්‍යාවක් පවත්වන ලදී. ඉන් කොටසක් පහත සඳහන් පරිදි වේ.

අ. සහජීවනය හා සමානාත්මතාවය වර්ධනය කිරීමේ අරමුණෙන් ප්‍රදේශයෙහි සිවිල් ජනතාව සමඟ එක්ව සංවිධානය කරන ලද තෛයිපොංගල් උත්සවය.





ආ. සිවිල් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා එළදෙනුන් 100 දෙනෙකුත් අබාධිත අයවලුන් සඳහා රෝද පුටු 50 ක්, පාසල් පොත් සහ උපකරණ කට්ටල 150 ක් සහ කෘෂි කම්ටුව සඳහා උදළුතල 150 ක් බෙදාදෙන ලදී.






ඇ. ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමේ අරමුණින් මුලතිව් ප්‍රදේශයෙහි ක්‍රීඩා සමාජ අතර පැවැත්වූ අන්තර් සමාජ ක්‍රිකට් ක්‍රීඩා තරගාවලිය.





ඉ. උසස් අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණින් 2018 වර්ෂයෙහි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා පෙනී සිටින ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ මාලාව.




ඊ. මුලතිව් ප්‍රදේශයෙහි ජීවත්වන වැසියන්ගේ කෘෂි කර්මාන්තය දියුණු කිරීමේ අරමුණින් යුද්ධ හමුදාව විසින් පොල්පැල 5,000 බෙදාදෙන ලදී.




එ. පාසල් සිසුන්ගේ හා ප්‍රදේශයේ තරුණ තරුණියන් තුළ පාපන්දු ක්‍රීඩාව ප්‍රචලිත කිරීමේ අරමුණින් පාපන්දු පුහුණු සැසි පැවැත්වීම.




ඒ. පාසල් සිසුන්ගේ කලා කුසලතාවයන් ඔපනැංවීම පිණිස චිත්‍ර තරගාවලියක් පැවැත්වීම.




ඔ. ප්‍රදේශයෙහි කිතුණු ජනතාව හා එක්ව නත්තල් උත්සවය සැමරීම සඳහා නත්තල් කැරොල් සංදර්ශණයක් පැවැත්වීම.





8. **<u>ආපදා සහන හා හදිසි ආධාර ලබාදීම.</u>** ආරක්ෂක සේනා මුලස්ථානය යටතේ ඇති 64 හා 68 සේනාංක භට්පිරිස් වෙතින් වඩ්ඩුවාකල්, මනල්කණ්ඩාල්, කරුවලකණ්ඩාල්, කෝඩාඩිකල්ලු, කනගරත්නපුරම් හා වෛද්‍යපුරම් යන ප්‍රදේශවල අයහපත් කාලගුණික තත්ත්වය මත ඇතිවූ ගංවතුරින් අවතැන් වූ 1,000 කට අධික පිරිසක් බේරාගෙන ආරක්ෂිත ස්ථාන කරා යොමුකල අතර ඔවුන් වෙත පිසූ ආහාර, වෛද්‍ය ආධාර, සනිපාරක්ෂක පහසුකම් සපයන ලදී.




9. **<u>බිම් වෙඩි නිසැක කිරීමේ ක්‍රියාවලිය.</u>** පසුගිය වසර තුළ සිදුකල බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය පහත පරිදි වේ:

| අනු අංකය | ආයතන | නිසැක කිරීමට තිබූ මුලු බිම් ප්‍රමාණය (ව.මී) | නිසැක කල බිම් ප්‍රමාණය (ව.මී.) | තවදුරටත් නිසැක කිරීමට ඇති බිම් ප්‍රමාණය (ව.මී) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | යුද්ධ හමුදා මානුෂවාදී බිම් වෙඩි නිසැක කිරීමේ ඒකකය | 38,726,587 | 34,701,449 | 4,025,138 |
| 2. | ඩෑෂ් (DASH) | 4,760,715 | 3,039,632 | 1,721,083 |
| 3. | හැලො ට්‍රස්ට් (HALO trust) | 1,363,695 | 1,139,784 | 223,911 |
| 4. | එම්ජී බෝම්බ උපදේශක කණ්ඩායම (MAG) | 7,645,265 | 4,965,219 | 2,680,046 |
| 5. | එච්ඩීයූ බෝම්බ උපදේශක කණ්ඩායම (HDU) | 2,096,287 | 2,096,287 | - |
| 6. | එච්ඩීයූ/එම් (HDU/M) | 846,572 | 846,572 | - |
| 7. | සාවාට්‍ර (SARVATRA) | 2,213,565 | 2,213,565 | - |
| 8. | ෂාර්ප් (SHARP) | 77,040 | 77,040 | - |
| 9. | ස්විස් පදනම | 4,185,308 | 4,185,308 | - |
| | **එකතුව** | **61,915,034** | **53,264,856** | **8,650,178** |

වගුව 13:3. බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලි පිළිබඳ විස්තරය

**<u>ගැටලු හා අභියෝග</u>**

10. පසුගිය කාලය තුළදී රාජකාරී සිදුකිරීමේදී පහත ගැටලු හා අභියෝග වලට මුහුණදීමට ආරක්ෂක සේනා මූලස්ථානයට (මුලතිව්) සිදුවිය:

අ. යටිතල පහසුකම් හා හයිපිරිස් සංඛ්‍යාවල හිඟතාවය නිසා වාර්ගික හා ආගමික සංහිඳියාව ඇති කිරීම මෙන්ම ආපදා අවම කිරීම සහ සිවිල් පරිපාලනය අවහිරතා අවමකර ගැනීම සඳහා සිවිල් අධිකාරීන්ට දීමේදීත් යම් ගැටලු සහගත තත්ත්ව සඳහා මුහුණදීමට සිදුවීම.

ආ. පවතින නීතිමය බාධක.

ඇ. පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟතාවය මත මෙම ප්‍රදේශය සම්පූර්ණයෙන්ම බිම් බෝම්බ වලින් නිසැක කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීම.

ඈ. යුද්ධ හමුදාව වෙත අයත් ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලිය පළාත් සභා දක්වා ඉදිරිපත් කර ඇති අතර, එම ක්‍රියාවලිය මන්දගාමීව සිදුවීම.

ඉ. කැරළි මර්ධන කණ්ඩායම් හා සෙවීම් හා මුදවා ගැනීමේ කණ්ඩායම් සඳහා ඇති සීමිත උපකරණ හා භාණ්ඩ නිසා එම කාර්යය කිරීමට දැඩි වෙහෙසක් ගැනීමට සිදුවීම.

ඊ. යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් ජනතාව අතර සංනිවේදන දූර්වලතා නිසා සිවිල් සම්බන්ධීකරණ කටයුතු වලදී අපහසුතාවයන්ට පත්වීම.

11. **<u>අනාගත අභිමතාර්ත.</u>**

අ. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බලප්‍රදේශයෙහි සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම.

ආ. ජාතීන් අතර සාමකාමී සහජීවනය පවත්වා ගැනීම.

ඇ. සිවිල් සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් තුළින් සිවිල් ජනතාව හා යුද්ධ හමුදාව අතර අන්තර් සහයෝගිතාව වැඩිදියුණු කිරීම.

ඈ. ස්වාභාවික විපත්වලදී ආපදා කළමනාකරණය සඳහා සිවිල් ආයතන හා බලධාරීන්ට සහාය වීම.

ඉ. නව පුහුණු විධි ක්‍රම මඟින් නිලධාරීන් හා සෙසුනිලයින්ගේ වෘත්තිය නිපුණත්වය වැඩිදියුණු කිරීම.

**<u>සාරාංශය</u>**

12. ආරක්ෂක සේනා බලප්‍රදේශය තුළ බහු ආගමික සහ සංස්කෘතික සංයෝගයකින් සමන්විත ප්‍රදේශයක් වන අතර, දශක කිහිපයක් පැවති වාර්ගික අර්බුදයකින් පීඩා විඳි අනාරක්ෂිත හා සංවේදී තත්ත්වයට පත් ජනතාවක් සිටින ප්‍රදේශයකි. මේ වන විට සමාජ ආරක්ෂණය තහවුරු කර ගැනීම සඳහා ගැටුම් වළක්වා ගැනීමේ ක්‍රමවේදයන්, දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්, එකමුතුකම වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් සහ විවිධ ජනවර්ගයන්ට ඇති ගෞරවය වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් සිදුකරගෙන යනු ලබයි. එහිදී වෘත්තීමය යුධ හමුදාවක් ලෙස කටයුතු කිරීම වර්ථමානයේදී ඉතා වැදගත් වේ. යුද්ධ හමුදාවෙහි ප්‍රධාන අරමුණ වන්නේ සමාජයේ සෑම අංශයක් සමඟම සම්බන්ධව කටයුතු කර රටේ ආරක්ෂාව පවත්වාගැනීම වේ. එම නිසා සිවිල් ජනතාව සහ යුද්ධ හමුදාව අතර සහයෝගීතාව පවත්වා ගැනීම ඉතා තීරණාත්මක සාධකයක් වේ. 2018 වර්ෂය තුළදී ඉහත අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා විවිධ ක්‍රියාකාරම් සංවිධානය කරන ලදී.

13. ඒ අනුව සමාජීය දේශපාලන ක්‍රමවේදයට අනුකූලව ප්‍රදේශය සවිමත් තත්ත්වයකට ගෙනඒම සහ හදිසි තත්ත්වයන් පිළිබඳව සැලකිළිමත්ව කටයුතු කිරීම සඳහා නිසි ආකල්පයකින් කටයුතු කිරීමට මෙම ආරක්ෂක සේනා මූලස්ථානයෙහි උපරිම දායකත්වයක් ලබාදෙනු ලබයි. රටේ භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝමීටර 2500 කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කරමින් පවතින මෙම බලප්‍රදේශය තුළ හා කිලෝමීටර 57 ක දුරකින් යුත් චලෙයි සිට නයාරු දක්වා විහිදෙන වෙරළ තීරය තුළින් ඇති විය හැකි අනාරක්ෂිත තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා මෙම ආරක්ෂක සේනා මූලස්ථානය උපරිම දායකත්වයක් ලබාදෙනු ලබයි.

## ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර)

1. ආරක්ෂක සේනා මූලස්ථානය (දකුණ) 2009 සැප්තැම්බර් 23 දින පනාගොඩ යුද්ධ හමුදා ජනදපය තුළ පිහිටුවන ලදී. ඉන්පසු 2012 නොවැම්බර් මස 15 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (දකුණ) වෙනුවට ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ලෙස නම් කරන ලදී. යුද්ධ හමුදා ජනපදය අක්කර 554 කින් යුක්ත වන අතර එහි වටප්‍රමාණය කි.මී 7.5 ක් දක්වා විහිදී යන අතර අභ්‍යන්තර මාර්ගයන් කි.මී 17 ක් දක්වා පුළුල් වේ. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) පාරිපාලන පළාත් 04 ක් (බස්නාහිර පළාත, දකුණ පළාත, හම්බන්තොට දිස්ත්‍රික්කය දක්වාත් වයඹ පාළාත, සබරගමුව පළාත) වේ. ඊට දිස්ත්‍රික් 09 ක් (කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, කුරුණෑගල, පුත්තලම, රත්නපුර සහ කෑගල්ල වර්ග කි.මී 19.475 ක මුළු භූමි ප්‍රමාණයකින් ආවරණයවී ඇත. එය දිවයිනේ මුළු භූමියෙන් 29.73% ක් වේ. කි.මී 471.9 ක්වූ වෙරළබඩ ප්‍රදේශයද මෝදර ගම්මාරු සිට ආරම්භ වන (උතුර කුදිරමලේ සිට දික්වැල්ල දක්වා) ප්‍රදේශය මෙම බළප්‍රදේශයට අයත්වේ.

2. යුද්ධ හමුදා මූලස්ථානයෙහි මග පෙන්වීමට අනුව මෙම බළප්‍රදේශයෙහි වගකීම් කලාප ප්‍රධාන කොටස් 02 කට වෙන්කර ඇති අතර, ඒවා 14 සේනාංකය, 58 සේනාංකය ලෙස වේ. තවද බළසේනා මූලස්ථාන 07 ක් සහ බළඇණි 12 ක් ලෙසත් රාජකාරී කරනු ලැබේ.

### මූල්‍ය ප්‍රතිපාදන සැබෑදි විස්තරය

3. 2018 වර්ෂය සඳහා ලැබුණු ප්‍රතිපාදන සහ වියදම් කර ලද ප්‍රමාණය පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | විස්තරය | ලැබුණු ප්‍රතිපාදන (රු.) | වියදම් කරන ලද මුදල (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | රාජකාරී දුම්රිය බලපත් | 60,000.00 | 50,000.00 | - |
| 2. | රාජකාරී බස් ගමන් බලපත් | 100,000.00 | 1,072,134.00 | - |
| 3. | පුවත්පත් ප්‍රතිපාදන | 2,775,000.00 | 2,775,000.00 | - |
| 4. | භූමි නඩත්තු | 190,000.00 | 190,000.00 | - |
| 5. | සනීපාරක්ෂක ද්‍රව්‍ය | 84,000.00 | 84,000.00 | - |
| 6. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියාව | 110,000.00 | 98,500.00 | 11,500.00 |
| 7. | ක්‍රීඩා භාණ්ඩ | 100,000.00 | 97,290.00 | 2,710.00 |
| 8. | අභ්‍යාස දීමනා | 39,000.00 | 39,000.00 | - |
| 9. | පරිගණක මිලදී ගැනීම් | 5,000,000.00 | 4,773,562.50 | 226,437.50 |

වගුව 14:1. මූල්‍ය ප්‍රතිපාදන විස්තරය

### වාර්ෂික ප්‍රතිපාදන

4. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) රාජකාරී නියුතු සෙසුනිලයින්ගේ අභිවෘර්ධිය වෙනුවෙන් පහත සඳහන් පරිදි පහසුකම් වැඩිදියුණු කිරීම සිදුකරන ලදී:

අ. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) රාජකාරියෙහි නියුතු සෙනීන්ගේ ප්‍රයෝජනය සඳහා (40 x 20) ප්‍රමාණයේ හඨ නිවාසයක් රුඃ 291,676.36ක වියදමින් ඉදි කිරීම.




ආ. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) තිබූ පැරණි හා ඉතා අඩු මට්ටමක පැවති නාම පුවරුව වෙනුවට නව නාම පුවරුවක් රුː 121,381.25ක මුදලක් වියදම් කර ඉදිකිරීම සහ කඳවුරු සම්මාන මුර පීඨිකාව රුː 305,894.00ක මුදලක වියදමින් ඉදිකිරීම.






ඇ. යුද්ධ හමුදා ජනපදය වෙත දැඩි අවශ්‍යතාවයක්ව පැවති මළ අපද්‍රව්‍ය ප්‍රවාහන නළ මාර්ගයක් රුː 76,295,439.00 ක මුදලක් වියදම් කර ඉදි කිරීම.





**<u>2018 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්</u>**

5. **<u>යුද්ධ හමුදා සහ සිවිල් සම්බන්ධීකරණ කටයුතු</u>.** 2018 වර්ෂය තුළ යුද්ධ හමුදාව විසින් සිවිල් ජනතාව උදෙසා සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ:

අ. දෙනියාය ප්‍රදේශයෙහි සිදුවූ නායයෑම් අනතුරු හේතුවෙන් නිවාස අහිමිවූ පවුල් සඳහා නිවාස 08 ක් ඩයලොග් ආසියාටා සමාගමේ දායකත්වයෙන් ඉදිකිරීම් සිදුකිරීම.





ආ. මොරවක ප්‍රදේශයෙහි සිදුවූ නායයෑම් අනතුරු හේතුවෙන් නිවාස අහිමිවූ පවුල් සඳහා නිවාස 12 ක් ශ්‍රී ලංකා රතුකුරුස සංවිධානයෙහි දායකත්වයෙන් ඉදිකිරීම් සිදුකිරීම.




ඇ. ප්‍රදේශයෙහි පාසැල් විහාරස්ථාන සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි තත්ත්වය සහ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම




ඈ. කුරුණෑගල වැව රවුමෙහි ඇවිදීමේ මාර්ගය සංවර්ධන කටයුතු සඳහා 143 බළසේනා මූලස්ථානයෙහි පූර්ණ අධීක්ෂණය යටතේ ඇති 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුලුව වෙතින් 2013.11.28 වන දින සිට මේ දක්වා එක් නිලධාරියෙකු සහ සෙසුනිලයින් 50 ක හඨපිරිසකගේ දායකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් වෙන් කරන ලද ප්‍රතිපාදන මඟින් ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනු ලබයි.




නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

ඉ. 143 බළසේනා මුලස්ථානය වෙතින් සංවිධානයක කරන ලද නත්තල් කැරොල් ගී ප්‍රසංගය පුත්තලම ප්‍රදේශයෙහි වෙසෙන කාපිරි ජනතාව සමග සම්බන්ධතාවයෙන් යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් පුත්තලම ශාන්ත මේරි දේවස්ථානයේදී 2018.12.28 දින පැවැත්වීමට කටයුතු කරන ලදි.






<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය</u>

6. ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපතිගේ සංකල්පයකට අනුව දක්‍ෂිණ අධිවේගී මාර්ගය දෙපස කඩවත සිට මාතර දක්වා කිලෝමීටර් 154 ක දුරක් තුරු සිටවා රැක බලා ගැනීමේ ක්‍රියාන්විතය 'තුරුලිය වෙනුවෙන් අපි' නමින් 2018.08.23 දින යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් ආරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර) යටතේ රාජකාරී කරනු ලබන භට්පිරිස් වල දායකත්වයෙන් හා දෙරණ මාධ්‍ය ජාලයේ අනුග්‍රහයෙන් ආරම්භ කරන ලදී.






7. මෙම ආරක්‍ෂක සේනා බලප්‍රදේශයෙහි ස්ථානගත සේනාංක මුලස්ථාන/බලසේනා මුලස්ථාන සහ ඒකක වෙතින් මත්ද්‍රව්‍ය උවදුර වැළැක්වීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා උපදේශකයන් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කරන ලදි. 2018.10.25 දින 14 වන සේනාංක මුලස්ථානයෙහි භට්පිරිස් 40 ක ප්‍රමාණයක් අදාල පුහුණු වැඩසටහන සඳහා සහභාගී වු අතර, 2018.11.16 දින 58 වන සේනාංක මුලස්ථානයෙහි භට්පිරිස් 40 ක ප්‍රමාණයක් අදාල පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය. මෙම වැඩසටහන සඳහා උපදේශක දායකත්වය ජනාධිපති මත්ද්‍රව්‍ය නිවාරණ කාර්ය සාධක බළකාය මගින් ලබාදෙන ලදී.





8. 2018.04.29 දින වෙසක් උත්සවය වෙනුවෙන් වෙසක් පහන් කූඩු ප්‍රදර්ශණයක් සහ තරඟාවලියක් පැවැත්වීමට කටයුතු කල අතර, 2018.06.27 දින පොසොන් පොහොය නිමිතිකොට ගෙන පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුළ සහ පිටිපන, හබරකඩ සහ ගොඩගම ප්‍රදේශයන්හි ජංගම පොසොන් බැති ගී සරණිය නමින් පොසොන් බැතිගී ප්‍රසංගයක් සංවිධානය කරන ලදී.




9. 2018 වසර තුළ ඇතිවූ හදිසි ආපදා තත්ත්වයන් සඳහා නිලධාරී 37 ක් සහ සෙසුනිලයින් 882 ක භටපිරිසකගේ දායකත්වයෙන් මුදවාගැනීම් සහ සහන සැලසීමේ ක්‍රියාන්විත 2018.05.21 වන දින සිට 2018.05.30 වන දින දක්වා සිදුකිරීම.




10. ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා කොළඹ, ගම්පහ, කුරුණෑගල, පුත්තලම, ගාල්ල, මාතර, කෑගල්ල, රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි සේනාංක මූලස්ථාන, බළසේනා මූලස්ථාන, පුහුණු පාසැල්, රෙජිමේන්තු මධ්‍යස්ථාන සහ ඒකකයන්හි රාජකාරි නියුතු නිලධාරී 60 ක් සහ සෙසුනිල 7,386 ක භටපිරිසක් දායකත්වයෙන් සිදුකරන ලදී.




11. කොළඹ රාජකීය විද්‍යාල වෙතින් 2018.02.21 වන දින පවත්වනු ලැබූ ලේ දන්දීමේ වැඩසටහන සඳහා නිලධාරී 02 ක් සහ සෙසුනිල 110 ක හඨපිරිස් ප්‍රමාණයක් සහභාගි කිරීමට කටයුතු සංවිධානය කරන ලදී.





__ගැටළු සහ අභියෝග__

12. 14 සේනාංකය සහ 58 සේනාංක වඩාත් ස්වභාවික ව්‍යසනයන්ට ලක්ව තිබේ. එමගින් ගං වතුර තත්ත්වය, නායයෑම්, අකුණු ගැසීම් සහ අනෙකුත් කාළගුණය ආශ්‍රිත විපත් වලට මුහුණ දීමට සමහර ප්‍රදේශයන්ට සිදුවෙයි. මෙම තත්ත්වය තුළ ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සහය ඉල්ලා සිටියි.

13. උසස් මූලස්ථාන වෙතින් හඨපිරිස් අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ නොහැකියාව සහ කෙටි කාලයක් තුළදී ආපදා කළමණාකරණ කටයුතු සඳහා හඨපිරිස් යෙදවීමට සිදුවීම.

14. සීමිත හඨපිරිසක් තුළ බළප්‍රදේශයෙහි ආරක්ෂාව පවත්වාගෙන යාම.

15. හඨපිරිස්හි යටිතල පහසුකම් සපුරාලීම හා වැඩි දියුණු කිරීම කඩිනමින් සිදුකල යුතු වේ.

__සාරාංශය__

16. භූගෝලීය පිහිටීම සහ අති විශාල අර්ථික ව්‍යුහය හේතුකොට ගෙන විශාල ජනගහනයකින් යුත් බස්නාහිර පළාත උපයාමාර්ගිකව හා ආර්ථික වශයෙන් වැදගත් ස්ථානයක් ලෙස සලකනු ලැබේ. එමෙන්ම ගුවන් තොටුපලවල් 02 ක් ජාත්‍යන්තර ගුවන් තොටුපලක් සමගින් විදුලි බලාගාරයක්, විදුලි සංදේශ මධ්‍යස්ථානයන්, දකුණු ආසියාවේ කාර්යබහුලම වරායන් දෙකකින් යුතු රටේ මරමස්ථාව වලින් යුතු ප්‍රධාන නගරය වේ. එබැවින් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බලප්‍රදේශය කොතරම් වැදගත් ද යන්න රටේ ආර්ථික මධ්‍යස්ථානයන් සමාජ දේශපාලන හා භූගෝල වශයෙන් ශ්‍රී ලාංකික ජාතියට සම්බන්ධතාවයක් ගෙන ඒම සැළකිල්ලට ගත හැක.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)

1. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) පළාත් තුනක් ආවරණය වන පරිදි පිහිටා ඇති අතර මධ්‍යම, ඌව සහ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය මේ යටතට අයත් වේ. දිවයිනේ 25% පමණ ප්‍රදේශයක් පුරා විසිරී ඇති ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශයට වර්ග කිඃමී 16,780 ක භූමි ප්‍රමාණයක් අයත් වේ. තවද, කුඩා වැල්ල සිට මාදන්තොට දක්වා දිවෙන කිඃමී 151 ක පමණ මුහුදු තීරයක්ද ආරක්ෂක සේනාංක මූලස්ථානය (මධ්‍යම) ට අයත් වේ. තවද ආරක්ෂක සේනා මූලස්ථාන හමුදාපිරිස් බලප්‍රදේශයෙහි ආරක්ෂාව තහවුරු කරන අතරම සිවිල් ජන සමාජයෙහි නොයෙකුත් අවශ්‍යතාවයන් සාර්ථක කරගැනීම සඳහා අති විශාල දායකත්වයක් ලබා දෙන බව පෙන්වා දිය හැක. මෙහිදී ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩ පිලිවෙළ සඳහාද ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ට අයත් හමුදාපිරිස් විසින් නොමසුරු දායකත්වයක් ලබාදෙන බව පෙන්වා දිය හැක.

2. ආරක්ෂක සේනා මූලස්ථාන (මධ්‍යම) වෙත 2018 වර්ෂය සඳහා අදාල මූල්‍යමය තොරතුරු පහත සඳහන් පරිදි වේ:

අ. 2018 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සඳහා වෙන්වූ වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශිර්ෂය | වෙන්වූ මුදල (රු.) | වැය කල මුදල (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ගොඩනැගිලි සහ සැලසුම් (222-01-1-2001) | 30,003,613.65 | 29,539,575.38 | 464,038.27 |
| 2. | ගොඩනැගිලි සහ සැලසුම් (222-01-3-2001) | 4,648,931.22 | 4,648,158.40 | 772.82 |
| 3. | ගොඩනැගිලි සහ සැලසුම් භාණ්ඩ (222-01-1-2104) | 148,668,597.76 | 148,660,000.76 | 8,597.00 |
| 4. | ගොඩනැගිලි සහ සැලසුම් භාණ්ඩ (222-01-3-2104) | 13,424,917.43 | 9,719,319.28 | 3,705,598.15 |
| 5. | ගොඩනැගිලි සහ සැලසුම් භාණ්ඩ (222-01-2-1205(xx)) | 21,166,672.19 | 21,160,001.19 | 6,671.00 |
| 6. | ජල පොම්ප සහ ජෙනරේටර් (222-01-2-1302(ii)) | 1,256,595.34 | 1,236,874.61 | 19,720.73 |
| 7. | ජල පොම්ප සහ ජෙනරේටර් උපාංග (222-01-2-1205(xix)) | 1,149,695.00 | 955,390.33 | 194,304.67 |
| 8. | කසලශෝධක සේවා (222-01-2-1409(viii)) | 172,500.00 | 132,350.00 | 40,150.00 |
| 9. | විදුලිය (222-01-2-1403(i)) | 19,765.16 | 19,765.16 | - |
| 10. | ජලය (222-01-2-1403(iv)) | 27,000.15 | 27,000.15 | - |
| 11. | අනෙකුත් වැය ශිර්ෂයන් (001-2-6-7-2509) | 20,111,707.27 | 20,097,908.97 | 13,798.30 |
| 12. | අනෙකුත් වැය ශිර්ෂයන් (001-2-6-10-2509) | 8,685,325.12 | 8,685,116.32 | 208.80 |
| | **එකතුව** | **249,335,320.29** | **244,881,460.55** | **4,453,859.74** |

වගුව 15:1. වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ විස්තරය

ආ. 2018 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සඳහා වෙන්වූ යුධෝපකරණ වැය ශීර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

| අනු අංකය | ඉතිරිය | වෙන්වූ මුදල (රු.) | වැය කල මුදල (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | ලිපිද්‍රව්‍ය (222-01-2-1201) | 3,269,941.00 | 3,262,352.11 | 7,588.89 |
| 2. | නිල ඇඳුම් (222-01-2-1203(i)) | 4,715,615.00 | 4,644,955.00 | 70,660.00 |
| 3. | යාප්‍ර 1 වැය ශීර්ෂය (222-01-2-1205(i)) | 2,092,522.00 | 1,998,221.63 | 94,300.37 |
| 4. | යාප්‍ර 11 වැය ශීර්ෂය (222-01-2-1205(ii)) | 1,203,750.00 | 990,137.60 | 213,612.40 |
| 5. | බැරැක්ක (222-01-2-1205(x)) | 13,032,498.70 | 10,637,610.21 | 2,394,887.79 |
| 6. | පොදු (222-01-2-1205(xi)) | 3,429,915.00 | 3,365,983.17 | 63,931.83 |
| 7. | ක්‍රීඩා උපකරණ (222-01-2-1205(xvi)) | 1,365,000.00 | 1,677,403.00 | -312,403.00 |
| 8. | බැරැක්ක නඩත්තු (222-01-2-1302(iii)) | 1,052,724.00 | 989,254.00 | 63,470.00 |
| 9. | කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ (222-01-3-2102) | 2,354,711.00 | 2,354,710.67 | 0.33 |
| 10. | යන්ත්‍ර සූත්‍ර (222-01-3-2102(i)a) | 7,272,868.00 | 7,282,407.89 | -9,539.89 |
| 11. | යුධ කණ්ඩායම් සඳහා පහසුකම් සැපයීම (222-01-3-2103(vii)) | 1,834,083.00 | 1,294,517.86 | 539,565.14 |

වගුව 15:2. යුධෝපකරණ වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ විස්තරය

ඇ. 2018 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සඳහා වෙන්වූ විදුලි හා යාන්ත්‍රික වැය ශීර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

| අනු අංකය | ඉතිරිය | වෙන්වූ මුදල (රු.) | වැය කල මුදල (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | රථ වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව (222-01-2-1301) | 27,000,000.00 | 28,995,676.70 | (1,995,676.70) |
| 2. | කාර්යාල උපකරණ සහ විදුලි උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව (222-01-2-1302(i)) | 2,282,000.00 | 2,281,731.27 | (268.73) |
| 3. | වැඩපල උපකරණ (222-01-2-1302 (viii)) | 100,000.00 | 100,000.00 | - |
| 4. | ක්ෂය ද්‍රව්‍ය (222-01-2-1205(viii) a) | 380,620.00 | 380,620.00 | - |
| 5. | වාහන අලුත්වැඩියාව (222-01-3-2003 (ii)) | 19,000,000.00 | 18,990,254.75 | 9,745.25 |

වගුව 15:3. විදුලි හා යාන්ත්‍රික වැය ශිර්ෂයන් සහ බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ විස්තරය

<u>2018 වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්</u>

5. **<u>යුද්ධ හමුදා සහ සිවිල් සම්බන්ධීකරණ කටයුතු.</u>** යුද්ධ හමුදාව හා සිවිල් ජනතාව, රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) මගින් යුද්ධ හමුදා මුලස්ථානයෙහි උපදෙස් හා අනුමැතිය සහිතව ව්‍යාපෘති රැසක් සිදුකර ඇත. ගෙඩනැගීම් සඳහා සහාය ලබාදීම, පැළ සිටුවීම, ශ්‍රමදාන ව්‍යාපාර හා පාසල් ළමුන්ගේ හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉන් කිහිපයකි.

4. ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) මගින් මෙම වසරේදී හමුදා සිවිල් සහයෝගිතා කටයුතු රැසක් සිදුකළ අතර එය පහත පරිදි ලැයිස්තුගත කර ඇත.

| අනු අංකය | දිනය | වැඩසටහන | සහභාගීවූ හමුදා පිරිස් | වෙනත් |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 2018.07.09 | ආබාධිත අයෙකු සඳහා නව නිවසක් සාදා දීම සඳහා ශ්‍රමදායකත්වයක් ලබා දෙන ලදි | ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | නිමකර ඇත |
| 2. | 2018.07.29 | පාසල් ළමුන් සඳහා වැදගත් වන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම | ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | නිමකර ඇත |
| 3. | 2018.07.09 | කතරගම පාද යාත්‍රාව සඳහා ආරක්‍ෂක සේනා මුලස්ථාන හමුදා පිරිස් දායකත්වය ලබාදෙන ලදි | ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | නිමකර ඇත |
| 4. | 2018.06.27 | දියතලාව නගරයේ දන්සලක් පැවැත්වීම සඳහා දායකත්වය ලබාදීම | ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | නිමකර ඇත |
| 5. | 2018.10.28 | ආබාධිත අයෙකු සඳහා නව නිවසක් සාදා දීම සඳහා ශ්‍රම දායකත්වයක් ලබා දෙන ලදි | ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | නිමකර ඇත |
| 6. | 2018.06.08 | ජලාශයක් පිරිසිදු කිරිම සඳහා දායකත්වය ලබා දෙන ලදි | ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | 75% නිමකර ඇත |

වගුව 15:4. හමුදා හා සිවිල් සහයෝගිතා කටයුතු වල ප්‍රගතිය

5. එකමුතුබව හා සහජීවනය ප්‍රවර්ධනයට තම උපරිම දායකත්වය ලබාදෙමින් ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) විසින් පහත දක්වා ඇති අරමුණු සාක්සාත් කර ගෙන ඇත.

අ. එකමුතු බව හා සංහිඳියාවෙහි වැදගත්කම ප්‍රවර්ධනය හා දැනුවත් කිරීම.

ආ. විවිධ සංස්කෘතික හා ආගමික පසුබිම් වලින් පැවතෙන ජනතාව, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සුරැකීමටත් ඔවුනට අනන්‍ය උරුම ඇගයීමටත් දිරිගැන්වීම.

ඇ. පුද්ගලයාගේ සමාජ, ආර්ථික සෞඛ්‍ය හා අධ්‍යාත්මික අවශ්‍යතා සඳහා වටිනාකම් ලබාදීම.

ඈ. අනාගත අභියෝග ජය ගැනීමට හැකි පරිදි භාෂා හා ක්‍රීඩා කුසලතා, කායික යෝග්‍යතා වර්ධනය.

6. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) මඟින් තම බලප්‍රදේශය තුළ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමඟ සම්බන්ධ වී සිවිල් ජනතාවට අවශ්‍ය සහාය ලබාදෙන ලදී.

අ. ආපදා හා කාලගුණික හේතු මත විනාශ වූ නිවාස ගොඩනැගීම හා නවීකරණය කිරීම.

ආ. සිවිල් ආයතන හා එක්ව දුෂ්කර පාසැල් සඳහා ලිපිද්‍රව්‍ය හා අත්‍යඅවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඇ. ශ්‍රීපාද, කතරගම වන්දනා සමයේදී, නුවර ඇසල පෙරහැර සමයේදී මෙන්ම නුවරඑළිය උත්සම සමයේදීද අලුත් අවුරුදු, දීපවාලී, වෙසක්, පොසොන්, ඉන්කාර් හා නත්තල් සමයේදීද සිවිල් ජනතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සහයෝගය ලබාදීම.

7. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් 2018 වර්ෂයේදී සිදුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ:

අ. **<u>නිරෝගී හමුදාවක් නිරෝගී දැයක් වැඩසටහන.</u>** සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහි කිරීම අරමුණ කරගෙන ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් '**නිරෝගිමත් හමුදාවක් නිරෝගී දැයක්**' වැඩසටහන දෙවන ස්වේච්ඡා වෛද්‍ය බළකායෙහි සහභාගීත්වය ඇතිව සිදුකරන ලදි. තවද මෙහිදී ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) අයත් බළඇණි අතුරින් හොදම බළඇණිය තෝරා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති විසින් තිළිණ ප්‍රදානය කරන ලදී.




ආ. **<u>නව නිපැයුම් ප්‍රදර්ශණය.</u>** ශ්‍රී ලංකා යුද්ධ හමුදා පර්යේෂණ හා සංවර්ධන අංශයෙහි මගපෙන්වීම යටතේ නව නිපැයුම් ප්‍රදර්ශණයක් හා තරගාවලියක් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හි 2018 ජුලි මස 24 වන දින පැවැත් වුණි. ඒ සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පිහිටා ඇති සේනාංක මූලස්ථාන, බළසේනා මූලස්ථාන, ඒකක හා පුහුණු පාසල් සහභාගී වූ අතර, එහිදී ජයග්‍රහණය කරන ලද නව නිපැයුම් සඳහා ත්‍යාග ප්‍රධානය කිරීම ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති විසින් සිදු කරන ලදී.





ඇ. **<u>ශ්‍රී කල්පවෘක්ෂාරාමය - නල්ලතන්නිය ගොඩනැගීම සඳහා ශ්‍රම දායකත්වය.</u>** මෙම ආරක්ෂක සේනා මුලස්ථානය වෙතින් සෙබලුන් 25 දෙනෙකු සහභාගී කරන ලදි. 2018 වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් 80% ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලදී.





ඈ. **<u>මහනුවර රෝහලෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදීම.</u>** මහනුවර රෝහලෙහි සයමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා එක් නිලධාරියෙකුද ඇතුළුව සෙබලුන් 100 පමණ යෙදවීමට මෙම ආරක්ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) මගින් ක්‍රියා කරන ලදී. 2018 වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් 80% ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලදී.





ඉ. නාය යාම් හේතුවෙන් අවහිර වී තිබූ කීනිගම දුම්රිය මාර්ගය නැවත යථාතත්වයට පත් කිරීම.





ඊ. අයහපත් කාලගුණික තත්ත්වයන් වලදි සිදුකරන ලද සිවිල් ජනතාව මුදවා ගැනීමේ ක්‍රියාන්විත.





උ. කොටගල විද්‍යාලයට නව ගොඩනැගිල්ලක් ඉදිකර දීම.





**<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය</u>**

8. ආරක්ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) හා යටතේ පවතින ක්ෂේත්‍ර මුලස්ථාන හා ඒකක මගින් ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති, පශ්චාත් යුද්ධ සමයෙහි සාමය පවත්වාගෙන යාමට හා සංහිඳයා ක්‍රියාවලියට සක්‍රීය දායකත්වයක් ලබා දෙන ලදී.

9. මෙම මුලස්ථානය හා යටතේ පවතින සේනාංක මුලස්ථානයන්හි පලපුරුදු හා පලපුරුදු නොලද ශ්‍රමිකයන් නුවර හා හම්බන්තොට ප්‍රදේශ වල රජයෙහි සංවර්ධන ව්‍යාපෘති හා පොදු ඉදිකිරීම් සඳහා ලබාදෙමින් ශ්‍රමිකයින් සඳහා වැය වන වියදම අවම කර ගෙන ඇති අතර, එම මුදල් වෙනත් වැදගත් ව්‍යාපෘති සඳහා ලබාදීමට අවකාශය සකසා දී ඇත.

**<u>ගැටලු හා අභියෝග</u>**

10. වසර තුළ මුහුණදුන් ගැටලු හා අභියෝග පහත පරිදි වේ:

අ. ආපදා හා හදිසි තත්ත්ව වලදී ඉතා ඉක්මණින් අවශ්‍ය සේවා සැපයීමට අවශ්‍ය උපකරණ හා යන්ත්‍රෝපකරණ අවම වීම.

ආ. සිවිල් ජනතාව හා සොල්දාදුවන් අතර පවතින සන්නිවේදන ගැටලු.

ඇ. විශාල බළ ප්‍රදේශයක් පවතින බැවින් තොරතුරු කාර්යක්ෂමව නිසි ආයතන වලට ගලා නොයෑම.

**<u>සාරාංශය</u>**

11. **'රට රකින ජාතිය'** වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලෙස 2018 වර්ෂය තුළදී ආරක්ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) විසින් යුද්ධ හමුදාවෙහි අරමුණ ලාගාකර ගැනීම සඳහා එහි උපරිමයෙන් කටයුතු කරන ලදී. මෙම ආරක්ෂක සේනා මුලස්ථාන විසින් ප්‍රදේශයෙහි ඇති වු ආපදා අවස්ථාවන්හිදී සහ පොදු වැඩසටහන්හිදී මෙම ආරකක්ෂක සේනා මූලස්ථානය වෙතින් නොමසුරුව දක්වන ලද දායකත්වය ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ මහත් ප්‍රසාදය දිනා ගැනීමට හේතුවක් වු අතර, තවද ඊට අමතරව මෙම මූලස්ථානය විසින් අවට පරිසරය අලංකාරව තබා ගැනීමට විවිධ වැඩ සටහන් හඳුන්වා දෙනු ලැබුවේ ප්‍රදේශයෙහි පිහිටි අනෙකුත් ආයතනයන්ට ආදර්ශයක් වෙමින්ය. මෙම මුලස්ථානය යටතේ ඇති සේනාංක මුලස්ථාන, බළසේනා මුලස්ථාන හා ඒකක සතුව ප්‍රමාණවත් තරම්වු උපකරණ සහ සම්පත් නොතිබුනද ආපදා තත්ත්වයකදී හා නොයෙකුත් අභියෝග යන් වලදී සෙබලුන් විසින් දක්වන ලද ධනාත්මක ආකල්ප ඔවුන්ගේ උසස් බව මනාව පිළිබිඹු කරයි. මෙම ආරක්ෂක සේනා මුලස්ථානහි සේවය කරන නිලධාරීන්/සෙසුනිලයින් හට ලබාදිය හැකි සියළුම සුභසාධන කටයුතු ලබාදීම තුළින් වඩාත් ඵලදායි සේවයක් ඉදිරියේදීද ලබා ගැනීමට හැකියාව ඇත.

## ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු

1. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු 2012.01.29 වන දින දියතලාව ප්‍රදේශයෙහි අභිනවයෙන් පිහිටුවන ලදී. මෙම මූලය මේජර් ජෙනරල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් අණදීම සිදුකරනු ලබයි. මෙම මූලස්ථානය ආරම්භ කල දිනයේ පටන් මේ දක්වා මේජර් ජෙනරල් වරුන් 08 දෙනෙකු විසින් අණදීම සිදුකර ඇත. මෙම මූලස්ථානය වෙතින් දියුණු කරන ලද 'Doctrine' ග්‍රන්ථයන් එළිදැක්වීම යුද්ධ හමුදා පුහුණුවීම් සඳහා උපාය මාර්ගයන් වැඩිදියුණු කිරීම, පුහුණුවීම් පිළිබඳ පර්යේෂණයන් සිදුකිරීම හා අනාගතයට සුදුසු පරිදි පුහුණුවීම් සම්බන්ධ විෂය නිර්දේශ වැඩි දියුණු කිරීම සිදුකරනු ලබයි. තවද මෙම මූලස්ථානය මගින් ශ්‍රී ලංකා යුධ හමුදාවෙහි සියළුම පුහුණු පාසල් හා ආයතන සඳහා පුහුණුවීම් සබැඳි මාර්ගෝපදේශයන් හා ප්‍රතිපත්තීන් ලබාදීම සිදුකරනු ලබයි.




රූප සටහන 16:1. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු යටතේ ඇති ආයතන

### මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු

2. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු සඳහා ලබාදී ඇති මූල්‍යමය ප්‍රතිපාදන පහත වගුවට අනුව වේ:

| අනු අංකය | ප්‍රතිපාදන අංකය | ලැබුණු මුදල (රු.) | වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 222-01-1-1409 (XV) | 9,000.00 | 9,000.00 | - |
| 2. | 222-01-1-1409 (XV) | 15,000.00 | 15,000.00 | - |
| 3. | 222-01-1-1409 (XV) | 10,000.00 | 10,000.00 | - |
| 4. | 222-01-1-1409 (XV) | 110,300.00 | 110,300.00 | - |
| 5. | 222-01-1-1409 (XV) | 44,410.00 | 44,410.00 | - |
| 6. | 222-01-2-1205 (XVIII) | 120,000.00 | 120,000.00 | - |
| 7. | 222-01-2-1205 (XXIV) | 12,000.00 | 12,000.00 | - |
| 8. | 222-01-2-1201 | 175,000.00 | 165,734.03 | 9,265.97 |
| 9. | 222-01-2-1205 (XXIV) | 25,000.00 | 25,000.00 | - |
| 10. | 222-01-2-1303 (II) | 30,000.00 | 30,000.00 | - |

වගුව 16:1. මුල්‍ය ප්‍රතිපාදන විස්තරය

### මුදල් ප්‍රතිපාදන භාවිතා කල ආකාරය

3. යුද්ධ හමුදාව මගින් ලබාදී ඇති ප්‍රතිපත්තීන් හා ක්‍රියා පිළිවෙතයන් වලට යටත්ව ඉහත සඳහන් මූල්‍යමය ප්‍රතිපාදන කාර්යක්ෂමව භාවිතා කරන ලදී.

**<u>වර්ෂය තුළ සිදුකරන ලද කාර්යන්</u>**

4. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි පුහුණුවීම් සම්බන්ධව සංකල්පමය වෙනස්කම් සිදුකිරීම හා පුහුණුවීම් සම්බන්ධව ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීම සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා යුධ හමුදාවෙහි පුහුණුවීම් විධිමත්ව කරගෙන යාම සඳහා මෙම මූලස්ථානයට අයත් විවිධ අංශයන් මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදී:

අ. **<u>උපක්‍රමික හා මූලධර්ම අංශය.</u>** පහත සඳහන් කාර්යන් 2018 වර්ෂය තුළදී සිදුකරන ලදී:

(1) "Capstone Doctrine" ග්‍රන්ථය එළිදැක්වීම සිදුකරන ලදී.

(2) නිලධාරී අත්පොත එළිදැක්වීම.

(3) යුද්ධ හමුදාවෙහි භාවිතා වන කෙටි යෙදුම් ග්‍රන්ථය (Abbreviation Book) එළිදැක්වීම.

ආ. **<u>පුහුණු අංශය.</u>** පහත සඳහන් කාර්යන් 2018 වර්ෂය තුළදී සිදුකරන ලදී:

(1) කොමිෂන් නොලත් නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධනය සඳහා සැලැස්මක් ඉදිරිපත් කිරීම.




රූප සටහන 16:2. ප්‍රවර්ධන සැලැස්ම

(2) අම්පාර සටන් පුහුණු පාසල කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා ප්‍රගමන ප්‍රවර්ධනය මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

(3) ඒකක අණදෙන නිලධාරී පාඨමාලාව ආරම්භ කිරීම.

(4) ඒකකයන්ට ආවේනික වූ පාඨමාලාවන් කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාවන් හා සංසන්දන සලකා බැලීම.

(5) උපදේශකයන්ගේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ආකෘතිපත්‍රයක් නිර්මාණය කිරීම.

(6) දෙවන පෙළ නිලධාරීන්ගේ තර්කානුකූල දැනුම වැඩි දියුණු කිරීම සඳහා කාලීන සිදුවීම් පිළිබඳ විෂයන් අධ්‍යනය කිරීමට යොමු කිරීම.

(7) ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ සිදුකරනු ලබන සියලුම පාඨමාලා සඳහා පොදු පසුකථන ආකෘතියක් නිර්මාණය කිරීම.

(8) උපදේශකය සඳහා උපදේශක දීමනාව වැඩි කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීම.

**<u>ප්‍රගතිය</u>**

5. පහත සඳහන් කාර්යන් වර්ෂය තුළ ලඟාකර ගන්නා ලදී.

අ. "Capstone Doctrine" ග්‍රන්ථයක අවශ්‍යතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට දීර්ඝ කාලයක සිට අවශ්‍යව පැවතුනි. 2009 වර්ෂයෙහි එල්ටීටීඊ සංවිධානයට විරුද්ධව ලබාගත් ජයග්‍රහනයෙන් පසු මෙම අවශ්‍යතාවය තවත් උග්‍රව දැනෙන ලදී. මෙම වර්ෂය තුළදී ඉහත අවශ්‍යතාවය යුද්ධ හමුදාපතිගේ මාර්ගෝපදේශකත්වය මත යථාර්තයක් බවට පත්විය.

ආ. යුද්ධ හමුදා කෙටි යෙදුම් ග්‍රන්ථය (Abbreviation Book) හා "IPB" ග්‍රන්ථය එළිදැක්වීම.

**<u>ගැටලු හා අභියෝග</u>**

6. යුද්ධ හමුදාපති පුහුණු කටයුතු පිළිබඳ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී පහත සඳහන් ගැටලු හා අභියෝග වලට මුහුණපාන ලදී.

අ. "Capstone Doctrine" ග්‍රන්ථයට සමාන්තරව "Doctrine" ග්‍රන්ථයන් එළිදැක්වීම.

ආ. "Capstone Doctrine" ග්‍රන්ථයට සමාන්තරව යුධ හමුදාවෙහි පුහුණුවීම් සම්බන්ධව අනෙකුත් ග්‍රන්ථයන් යාවත්කාලීන කිරීම.

ඇ. ශ්‍රී ලංකා යුධ හමුදා රෙජිමේන්තු පුහුණු පාසල් වල පුහුණු සම්බන්ධව විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම.

ඉ. යුද්ධ හමුදාපති තුමාගේ අරමුණක් වන "Strategic Corporal" යන සංකල්පය යථාර්ථයක් බවට පත්කිරීම.

**<u>සාරාංශය</u>**

7. පුහුණුවීම් තුළින් සෑම සෙබළෙක්ම අනාගත අභියෝග සඳහා සූදානම් කිරීම සිදුකරනු ලබයි. ලෝකයේ වෙනස්වීම් වලට අනුකූලව අනාගත අභියෝග වලට මුහුණු දීමට හැකි ආකාරයට සෑම විටම පුහුණු වීම් වෙනස්වීම් සිදු කල යුතුය. අනාගත යුද්ධය වර්තමාන හා පසුගිය යුද්ධයෙන් සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයක් ගනී. ඉහත අභියෝගයන්ට මුහුණ දීම සඳහා ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු "Capstone Doctrine" ග්‍රන්ථයන් සකස් කිරීම, පුහුණුවීම් සබැඳි සංකල්පමය වෙනස්කිරීම් සිදුකිරීම, පුහුණු ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීම හා වැඩි දියුණු කිරීම, නව පුහුණු ක්‍රමවේදයන් හඳුන්වා දීම හා කාලානුරූපීව පුහුණු විෂය නිර්දේශ වෙනස් කිරීම සිදුකරනු ලබයි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## භකාස අණසක මුලස්ථානය

1. භකාස අණසක මුලස්ථානය, සාලාව, කොස්ගම හි ස්ථාපනය කර ඇති අතර, යුද්ධ හමුදා මූලස්ථානයට යටත්ව පවත්වාගෙන යන බවත්, යුද්ධ හමුදාධිපති තුමා වෙතින් දෙනු ලබන වගකීම් හා රාජකාරී ඉටු කිරීමට බැඳී සිටියි. මෙම මුලස්ථානය වෙත සියළුම ඉදිරි නඩත්තු ප්‍රදේශයන් හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සියළුම නිත්‍ය/ස්වේච්ඡා සේවා ඒකකයන්හි පාලනමය කටයුතු රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා පාලනය කිරීමට වගකිම පැවරී ඇත.

2. භකාස අණසක මුලස්ථානය යුද්ධ හමුදාවෙහි සියළුම සේවා ඒකකයන්හි වෘත්තිමය සෙබළුන් සඳහා පාලනමය කටයුතු/සියළුම වෘත්තිය පරික්ෂණ සිදුකිරීම සහ ඊට අදාල ප්‍රතිපත්ති සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි.

3. මීට අමතරව සියළුම සේවා ඒකකයන්හි වාර්ෂික හරි වැරදි බැලීම/ආයෝග්‍ය කිරීම/විනාශ කිරීම පිළිබඳ සොයා බැලීම සිදුකරයි. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සමග සම්බන්ධතාවයෙන් සලාක සහ ගබඩා යන ආදිය සැබැඳිව විටින් විට පරික්ෂා කිරීම් සහ උපදෙස් ලබාදීම සිදුකරන අතර සියළුම සේවා රෙජිමේන්තු වල අරමුදල් සහ ගිණුම් පිළිබඳ පරික්ෂා කිරීම සිදුකරනු ලබයි.

## මූල්‍ය තොරතුරු

4. **වෙන්වූ ප්‍රතිපාදන භාවිතය.** මෙම වසර තුළදී යුද්ධ හමුදා මුලස්ථානය මගින් ලබාදුන් ප්‍රතිපාදන සහ ඒවා වැය කිරීම් පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | විස්තරය | ප්‍රතිපාදන මුදල (රු.) | වියදම් මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | භූමි නඩත්තු | 60,000.00 | 60,000.00 | - |
| 2. | පවිත්‍රතා ද්‍රව්‍යන් | 27,000.00 | 27,000.00 | - |
| 3. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියාව | 125,000.00 | 125,000.00 | - |
| 4. | පුවත්පත් | 63,000.00 | 62,010.00 | 990.00 |
| 5. | ලිපි ද්‍රව්‍ය | 225,000.00 | 93,975.95 | 131,024.05 |
| 6. | අභ්‍යාස දීමනා | 39,500.00 | 39,500.00 | - |
| 7. | රාජකාරී දුම්රිය ගමන් බලපත්‍ර | 3,000.00 | - | 3,000.00 |
| 8. | බස් ගමන් බලපත්‍ර | 1,000.00 | - | 1,000.00 |

වගුව 17:1. මූල්‍ය ප්‍රතිපාදන විස්තරය

## ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය

5. **යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.** යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව සහ ඉංජිනේරුසේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදෙන ලද ප්‍රතිපාදන මගින් පහත සඳහන් ඉදිකිරීම්/ අලුත්වැඩියාවන් සිදුකරන ලදි:

| අනු අංකය | විස්තරය | ප්‍රතිපාදන මුදල (රු.) |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | කොමිෂන් නොලත් නිලධාරී භෝජනාගාරය අලුත්වැඩියා කිරීම | 4,800,000.00 |
| 2. | සෙසුනිල භෝජනාගාර අලුත්වැඩියා කිරීම | 3,200,000.00 |
| 3. | ප්‍රවාහන අංශ භට නිවාසය අළුත්වැඩියා කිරීම | 1,000,000.00 |
| 4. | බනි/සැරයන් නිවස්නය අලුත්වැඩියා කිරීම | 364,626.76 |
| 5. | මූලස්ථාන බේකරිය අළුත්වැඩියා කටයුතු සහ නව බේකරි උපාංග මිලදී ගැනීම | 2,144,838.92 |

වගුව 17:2. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් විස්තරය

## වසරේ කාර්යසාධනය

6. **සියළු සේනාංක වෘත්තිය පරීක්ෂණ.** සියළු සේනාංක වෘත්තීය පරීක්ෂණ 9 ක් ඇතුළුව වෘත්තීය පරීක්ෂණ 76 ක් සඳහා ප්‍රතිඵල නිකුත් කිරීම මෙම මූලස්ථානය මඟින් සිදුකරයි. පවත්වනු ලැබූ සේනාංක 9 යෙහි වෘත්තීන් සඳහා සහභාගි ප්‍රමාණය හා සමත්/අසමත් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වෘත්තිය | සහභාගිවූ සංඛ්‍යාව | සමත් | අසමත් | (%) |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | පරිපාලන සහායක (පොදු රාජකාරී) | 2397 | 1554 | 843 | 65 |
| 2. | සුපවේදි සහායක | 843 | 753 | 90 | 89.33 |
| 3. | රියදුරු (මෝටර් ප්‍රවාහන) | 1895 | 1545 | 350 | 81.05 |
| 4. | වඩුවැඩ හා පුරුද්දන්නා | 754 | 615 | 139 | 71 |
| 5. | පින්තාරුකරු (ගොඩනැගිලි) | 142 | 108 | 34 | 77 |
| 6. | ද්‍රව්‍ය කලමණාකරණ සහායක (කාර්මික) | 1102 | 399 | 613 | 44.04 |
| 7. | රෙජිමේන්තු තූර්ය වාදක | 236 | 210 | 26 | 89 |
| 8. | සංස්කෘතික නර්තන | 62 | 41 | 21 | 66.02 |
| 9. | පින්තාරුකරු (වාහන) | 57 | 34 | 23 | 59.07 |

වගුව 17:3. වෘත්තිය පරීක්ෂණ විස්තරය




ප්‍රස්ථාරය 17:1. වෘත්තිය පරීක්ෂණ

7. **සුභසාධක පහසුකම්.** කොස්ගම රණවිරුගමහි පදිංචිකරුවන්ගේ දුවා දරුවන් වෙනුවෙන් මෙම මූලය මඟින් පාලනය වනු ලබන විරු කැකුළු පෙර පාසල ඉතා සහනදායි මුදලකට පවත්වාගෙන යනු ලබන අතර, වාර්ෂිකව අවුරුදු උත්සවය, වාර්ෂික විනෝද චාරිකාව සහ වාර්ෂික විවිධ ප්‍රසංගය පැවැත්වීම මෙම මූලස්ථානය මඟින් සංවිධානය කරනු ලබයි.

## වසරේ ලබාගත් ප්‍රගතිය

8. පළමු හා දෙවන අඩවසර තුළ සියළු සේනාංක වෘත්තීය පරීක්ෂණ මණ්ඩල නියමිත කාලසීමාව තුළදී අවසන් කර ප්‍රථිපල නිකුත් කිරීම සිදුකරන ලදී.

9. සියළුම සේවා රෙජිමේන්තු වලින් මෙම මූලස්ථානය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද සියළුම පාලන කටයුතු වර්ෂය තුළදී අවසන් කර ඉදිරි කටයුතු සිදුකරන ලදී.

## සාරාංශය

10. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සියළු නිත්‍ය හා ස්වේච්ඡා සේවා ඒකකයන්හි අණදීම හා පාලනය යුද්ධ හමුදා මූලස්ථානයෙහි උපදෙස් මත භටාස අණසක මූලස්ථානය විසින් ඉටු කරනු ලබයි. පසුගිය 2018 වසර තුළ පාලනමය, යටිතල පහසුකම් හා පුහුණු අංශයන් ගෙන් අපේක්ෂිත තත්වය උදාකර ගැනීමට මෙම මූලස්ථානය සමත් විය. එමෙන්ම, මානව සම්පත් හා ද්‍රව්‍ය කළමනාකරණය තුළින් ඵලදායි හා කාර්යක්ෂම සේවයක් යුද්ධ හමුදාව වෙත ලබාදීමට හැකිවිය. සපුරා ගත් ඉලක්ක හා සපුරා ගැනීමට ඉතිරිව ඇති ඉලක්ක තුළින් මෙම මූලස්ථානය වෘත්තීමය හමුදාවක් සඳහා වූ අඩිතාලම යොදා ඇත.

## ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය

1. යුධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි යුධ හමුදා අවශ්‍යතාවය මත ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරීන් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය 2007 මාර්තු මස 12 වන දින ආරම්භ කරන ලදී. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානයෙහි වගකීම වනුයේ ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරී සහ ව්‍යාපෘති රාජකාරී බළකාය වෙත පැවරීම හා අධීක්ෂණය කිරීමයි. යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා මූලස්ථානය ක්ෂේත්‍ර ඉංජිනේරු සහ යන්ත්‍ර රාජකාරී සබැඳිව උපදෙස් ලබාදීම ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු විසින් සිදුකරනු ලබයි. තවද රජය විසින් ඉටුකරනු ලබන සිග්‍ර සංවර්ධන ක්‍රියාදාමය සඳහා ඉංජිනේරු බළකාය විසින් ක්ෂේත්‍ර ඉංජිනේරු/යන්ත්‍ර රාජකාරීන්/මානුෂිය බිම්වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් මෙන්ම රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලි න්‍යෂ්ටික ආපදා ප්‍රතිචාර දැක්වීමේ රාජකාරීන් සඳහාද විශාල දායකත්වයක් ලබාදෙනු ලැබේ.

### මූල්‍යමය විස්තර

2. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය වෙත 2018 වර්ෂයේදී ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන පහත පරිදි වේ:

| අනු අංකය | වැය ශීර්ෂය | 2018 වර්ෂය සඳහා ලද ප්‍රතිපාදන | 2017 වර්ෂයේදී භාණ්ඩ හා සේවා නොසැපයුම නිසා සිදුකල වියදම් | 2017 වර්ෂය සඳහා වූ වගකීම් | 2018 වර්ෂය සඳහා පවතින අරමුදල් | 2018 වර්ෂයේදී භාවිතා කල ප්‍රතිපාදන | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | අනුමත ටෙන්ඩර් ඔට්ටකෂම | භාවිතය % |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| | **ප්‍රාග්ධන වැය ශීර්ෂ** | | | | | | |
| 1. | 222-01-3-2002(I) | 144,100,000.00 | 39,129,853.03 | 12,181,497.00 | 92,788,649.97 | 91,333,829.38 | 98.43% |
| | **පුනරාවර්ථන වැය ශීර්ෂ** | | | | | | |
| 2. | 222-01-2-1205(VIII) | 4,000,000.00 | 106,371.78 | 1,602,427.83 | 2,291,200.39 | 2,282,026.66 | 99.60% |
| 3. | 222-01-2-1205(XXII) | 82,000,000.00 | 60,765,476.26 | 11,394,851.38 | 9,839,672.36 | 9,505,752.08 | 96.61% |
| 4. | 222-01-2-1302(V) | 40,000,000.00 | 12,375,567.84 | 17,683,509.50 | 9,940,922.66 | 9,934,923.25 | 99.94% |
| 5. | 222-01-2-1401(IV) | 1,000,000.00 | - | - | 1,000,000.00 | - | 0.00% |
| 6. | 222-01-2-1205(XXIII) | 15,000,000.00 | 1,683,000.16 | 1,039,071.00 | 12,277,928.84 | 12,131,615.71 | 98.81% |
| | **එකතුව** | **286,100,000.00** | **114,060,269.07** | **43,901,356.71** | **128,138,374.22** | **125,188,147.08** | |

වගුව 18:1. මූල්‍ය ප්‍රතිපාදන විස්තරය

### වසරේ කාර්යසාධනය

3. මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘති වල ප්‍රගතිය

| කාර්මික නොවන සමීක්ෂණ (M2) | පුද්ගලයින් මගින් බිම් බෝම්බ නිෂ්කාශන කල ප්‍රදේශ (M2) | යන්ත්‍ර මගින් බිම් බෝම්බ නිෂ්කාශන කල ප්‍රදේශ (M2) | සුනඛයින් මගින් බිම් බෝම්බ නිෂ්කාශන කල ප්‍රදේශ (M2) | එකතුව (M2) | පුද්ගල නාශක බිම් බෝම්බ | පුපුරා නොගිය වෙඩි ද්‍රව්‍ය |
|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |
| 1,095,654 | 216,913 | 6,553 | 75,327 | 1,394,447 | 6,104 | 461 |

වගුව 18:2. මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘති වල ප්‍රගතිය

4. පහත බිම් ප්‍රදේශය SLA-HDU මගින් 2018 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලසීමාව තුළදී බිම් බොම්බ ඉවත් කරන ලදී.

| අනු අංකය | වැඩබිම් අංකය | දිස්ත්‍රික්කය | ආරම්භක දිනය | අවසන් දිනය | නිසැක කර ඇති ප්‍රමාණය (ව:මී) |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | MF-KI-759 | කිළිනොච්චි | 30/09/2017 | 16/01/2018 | 21,635 |
| 2. | MF-KI-759 | කිළිනොච්චි | 17/01/2018 | 09/05/2018 | 41,312 |
| 3. | MF-KI-759 | කිළිනොච්චි | 10/05/2018 | 24/06/2018 | 27,437 |
| 4. | N-DA-VA-1243 | පුත්තලම් | 11/11/2017 | 30/06/2018 | 18,233 |
| 5. | N-DA-TR-194 | අම්පාර | 06/11/2017 | 10/04/2018 | 13,530 |
| 6. | N-DA-TR-198 | පොලොන්නරුව | 23/04/2018 | 31/05/2018 | 5,825 |
| 7. | N-DA-VA-1145 | කිළිනොච්චි | 01/08/2016 | 05/04/2018 | 71,062 |
| 8. | N-DA-KI-1069 | කිළිනොච්චි | 27/02/2018 | 27/02/2018 | 10,446 |
| 9. | N-DA-KI-1070 | කිළිනොච්චි | 12/03/2018 | 17/03/2018 | 186,354 |
| 10. | N-DA-KI-1071 | කිළිනොච්චි | 12/06/2018 | 19/12/2018 | 169,766 |
| 11. | N-DA-KI-1095 | මුලතිව් | 12/06/2018 | 19/12/2018 | 2,601 |
| 12. | N-DA-VA-1253 | මුලතිව් | 02/01/2018 | 07/04/2018 | 72,223 |
| 13. | N-DA-VA-1253 | යාපනය | 09/04/2018 | 06/06/2018 | 71,771 |
| 14. | N-DA-JA-325 | යාපනය | 20/02/2017 | 30/03/2018 | 45,558 |
| 15. | N-DA-JA-329 | මුලතිව් | 02/05/2018 | 09/05/2018 | 381,302 |
| 16. | DA-VA-587 | ත්‍රිකුණාමලය | 28/05/2014 | 16/06/2018 | 96,902 |
| 17. | N-DA-TR-1007 | මුලතිව් | 07/04/2017 | 15/07/2018 | 29,903 |
| 18. | N-DA-VA-1195 | මුලතිව් | 08/08/2017 | 19/03/2018 | 13,991 |
| 19. | N-DA-VA-1195 | මුලතිව් | 30/03/2017 | 14/06/2018 | 40,858 |
| | **එකතුව** | | | | **1,320,709** |

වගුව 18:3. SLA-HDU මගින් බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබඳ විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**වාර්ෂික කාර්ය සාධනය**

5. සංවර්ධන ව්‍යාපෘති විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම (රු.) | වෙනත් |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | කිළිනොච්චිය | යාපනය විශ්ව විද්‍යාලයෙහි කෘෂිවිද්‍යා පීඨයට අයත් පරිශ්‍රයෙහි පරණ ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීම | 744,966.05 | නිමකර ඇත |
| 2. | කොළඹ | ආනන්ද විද්‍යාලයෙහි රගර් පිටිය ඉදිකිරීම | 461,070.70 | නිමකර ඇත |
| 3. | අම්පාර | වැරැන්කැටගොඩ විද්‍යාලයෙහි ක්‍රීඩාපිටිය ඉදිකිරීම | 2,500,000.70 | නිමකර ඇත |
| 4. | කුරුණෑගල | ආරක්ෂක සේවා විද්‍යාල භූමියෙහි යන්ත්‍ර රාජකාරි | 1,564,609.52 | ක්‍රියාත්මකයි |
| 5. | මත්තල | මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල වටා වන වැස්ම ඉවත් කිරීම | 6,361,009.41 | ක්‍රියාත්මකයි |
| 6. | මීතොටමුල්ල | කසල දමා ඇති ප්‍රදේශය සංවර්ධනය කිරීම | 11,965,852.00 | ක්‍රියාත්මකයි |
| 7. | කැළණිය | එගොඩ කැළණිය විහාර පරිශ්‍රයෙහි පොකුණ ඉදිකිරීම | 1,675,432.65 | ක්‍රියාත්මකයි |
| 8. | පුත්තලම | තබ්බෝව ප්‍රදේශයෙහි කලපු අන්දර ඉවත් කිරීම | 5,392,114.82 | ක්‍රියාත්මකයි |
| 9. | මඩු | මඩු පූජා භූමියෙහි අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය | 6,012,577.75 | ක්‍රියාත්මකයි |
| 10. | කිළිනොච්චිය | යාපනය විශ්වවිද්‍යාලයෙහි කෘෂි විද්‍යා පීඨයට අයත් භූමි ප්‍රදේශයෙහි යන්ත්‍ර රාජකාරී | 4,056,348.00 | නිමකර ඇත |
| 11. | යාපනය | කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය (වඩමාරච්චි ප්‍රාදේශීය සභාව) | 4,056,348.00 | තාවකාලිකව අත්හිටුවන විට 12.51% සම්පූර්ණ කර ඇත |
| | **සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදල** | | **41,151,814.29** | |

වගුව 18:4. සංවර්ධන ව්‍යාපෘති විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

6. ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් **සිරිසර පිවිසුම** යටතේ මුදල් වෙන් කර ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | ඇස්තමේන්තුගත වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ගෝමරන්කඩවල | බක්මීගම වැව ප්‍රතිසංස්කරණය කිරීම | 21,566,634.43 |
| 2. | ගෝමරන්කඩවල | බක්මීගම කුඩා තිඹිරිවැව ප්‍රතිසංස්කරණය කිරීම | 2,616,758.29 |
| 3. | ගෝමරන්කඩවල | ඉහළ කාලි වැව ප්‍රතිසංස්කරණය කිරීම | 3,217,039.26 |
| 4. | කන්තලේ | දුටුවැව ප්‍රතිසංස්කරණය කිරීම | 22,566,162.01 |
| | **ඇස්තමේන්තුගත මුළු මුදල** | | **49,966,593.99** |

වගුව 18:5. සිරිසර පිවිසුම අරමුදල් පිළිබඳ විස්තරය

7. ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් **පිබිදෙමු පොලොන්නරුව** යටතේ මුදල් වෙන් කර ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | ඇස්තමේන්තුගත වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ඇලිකිඹුලාව | ඇලිකිඹුලාව ක්‍රීඩාපිටිය සකස් කිරීම | 986,528.35 |
| 2. | කදුරුවෙල | අල් - අමීනා විද්‍යාලයෙහි ක්‍රීඩාපිටිය සකස් කිරීම | 506,708.78 |
| 3. | අරුණවැව | අරුණවැව ප්‍රතිසංස්කරණය කිරීම | 2,609,763.73 |
| 4. | කිරිමැටිපිටිය | කිරිමැටියවැව ප්‍රතිසංස්කරණය කිරීම | 2,338,565.78 |
| 5. | චන්දන පොකුණ | චන්දන පොකුණ ප්‍රතිසංස්කරණය කිරීම | 2,665,521.97 |
| | **ඇස්තමේන්තුගත මුළු මුදල** | | **9,107,088.61** |

සටහන: 2018 වසර මැද සිට මෙම ව්‍යාපෘතිය යටතේ වන රාජකාරීන්හි වගකීම පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘති කාර්යාලය වෙත පවරා ඇත.

වගුව 18:6. පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය අරමුදල් පිළිබඳ විස්තරය

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

8. සංවර්ධන ව්‍යාපෘති සඳහා මිනිස් හා යාන්ත්‍රික ශ්‍රමය ලබාදීම.

| අනු අංකය | ස්ථානය | ව්‍යාපෘතිය පිළිබඳ විස්තර | යන්ත්‍ර කාර්ය සඳහා ඇස්තමේන්තුගත වියදම (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ත්‍රිකුණාමලය | සිරිසර පිවිසුම ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රිකයෙහි වාරි පද්ධතිය ප්‍රතිසංස්කරණය | යන්ත්‍ර සහය |
| 2. | පොළොන්නරුව | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ පොළොන්නරු දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබාදීම | යන්ත්‍ර සහය |
| 3. | මහනුවර | මහනුවර ශික්ෂණ රෝහල යටතේ ඉදිකරනු ලබන පිළිකා ප්‍රතිකාර ඒකක ඉදිකිරීම් භූමියෙහි යන්ත්‍ර රාජකාරි | යන්ත්‍ර සහය |
| 4. | බුත්තල | වසවිස නැති රටක් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහය ලබාදීම | යන්ත්‍ර සහය |
| 5. | කොළඹ | කැලණි රජමහා විහාරයේ ඉදිකිරීම් කටයුතු | යන්ත්‍ර සහය |
| 6. | අකුරේගොඩ | ආරක්ෂක සේවා මූලස්ථාන ඉදිකිරීම් සඳහා යාන්ත්‍රික හා විශේෂඥ සහය ලබාදීම | ශ්‍රම දායකත්වය හා යන්ත්‍ර සහය |
| 7. | වැලිවේරිය | විවිධ ආබාධ සහිත දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | ශ්‍රම දායකත්වය |
| 8. | කුරුණෑගල | වයඹ පළාත් සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සිදුකිරීම | ශ්‍රම දායකත්වය |
| 9. | කොළඹ | සිරිමාවෝ බණ්ඩාරණායක බාලිකා විද්‍යාලයෙහි ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම | ශ්‍රම දායකත්වය |
| 10. | ඇඹිලිපිටිය | බෝධිරාජාරාම විහාරස්ථානයෙහි සිව් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | ශ්‍රම දායකත්වය |
| 11. | තෙල්දෙණිය | රංගල භාවනා මධ්‍යස්ථානයෙහි කලුගල් මුවා බුද්ධ ප්‍රතිමා ස්ථාන ගත කිරීම | යන්ත්‍ර සහය |
| 12. | කඳාන | කඳාන මැසනෝද් විද්‍යාල ක්‍රීඩාපිටිය නවීකරණය කිරීම | යන්ත්‍ර සහය |
| 13. | පානදුර | පානදුර ගොරකාන විහාරයෙහි යන්ත්‍ර රාජකාරි | යන්ත්‍ර සහය |
| 14. | ඉබ්බාගමුව | තැඹිලි කුඹුර ගල් විහාර භූමියෙහි ඉදිකල වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය සඳහා බිම් සැකසීම | යන්ත්‍ර සහය |
| 15 | දැරනියගල | නක්කාවිට ප්‍රාථමික විදුහලේ ක්‍රීඩාපිටිය ඉදිකිරීම | යන්ත්‍ර සහය |

වගුව 18:7. සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ඉංජිනේරු දායකත්වය ලබාදීම පිළිබඳ විස්තරය

**<u>2018 වර්ෂය තුළ කාර්ය සාධනය</u>**

9. මෙම කාලසීමාව තුළ ඉංජිනේරු බළකාය ආරක්ෂක සහ ජාතික සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විශේෂ දායකත්වයක් ලබාදෙන ලදී. යුධ හමුදා ඉංජිනේරු බළකා සෙබලුන් ජාතික සංවර්ධන ව්‍යාපෘතීන් සහ පුනරුත්තාපන ව්‍යාපෘතීන් විශේෂයෙන්ම ත්‍රිකුණාමල දිස්ත්‍රික් සංවර්ධනය කිරිමේ වැඩසටහන යටතේ සිරිසර පිවිසුම සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි ක්‍රියාත්මක පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහන් වැව් අමුණු ප්‍රතිසංස්කරණ කිරීම ජනාධිපති ලේකම් කාර්යාලයෙහි උපදෙස් මත වසවිස නැති රටක් ව්‍යාපෘතිය යටතේ ගොවින් සඳහා අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදන කිරිම මෙම වසරේ ඉටුකරන ලදී.

**<u>හැකියාව වර්ධනය කිරීමේ වැඩසටහන්</u>**

10. සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ට පරිභාහිරව සංවිධානයෙහි ධාරිතාවය ඉහළ නංවා කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ලබාගැනීමට පහත සඳහන් පියවර ගෙන ඇත.

අ. ඉංජිනේරු බළකායෙහි කාලයක් සිට පැවති අවශ්‍යතාවයන් සම්පූර්ණ කරමින් වෙඩිද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ කටයුතු සඳහා මුගටියන් පුහුණු කිරීමේ අංශය ස්ථාපිත කිරීම තුළින් සෝදිසි මෙහෙයුම් සහ විශේෂ කාර්යයන් සඳහා ඉතා වැදගත් අංශයක් වශයෙන් හැඳින්විය හැක.

ආ. නවතමයෙන් ස්ථාපිත කරන ලද 14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ඨික ප්‍රතිචාර රෙජිමේන්තුව වෙතින් ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී ඒ සඳහා පුහුණු සෙනීන් යෙදවීම සඳහා පහත සඳහන් පාඨමාලා 2018 වසර තුළදී පවත්වන ලදි.

| අනු අංකය | පාඨමාලාව | සහභාගි වූ සංඛ්‍යාව | | කාලසීමාව |
|---|---|---|---|---|
| | | නිලධාරී | සෙසුනිල | |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලි න්‍යෂ්ඨික ආපදා ප්‍රතිචාර දැක්වීමේ මූලික පාඨමාලාව | 04 | 35 | 15/02/2018 - 28/02/2018 |
| | | 10 | 22 | 24/05/2018 - 08/06/2018 |
| | | - | 19 (නාවික) | 09/07/2018 - 20/07/2018 |
| | | 04 | 26 | 08/10/2018 - 17/10/2018 |

වගුව 18:8. පුහුණු පාඨමාලා පිළිබඳ විස්තරය

**<u>ගැටලු සහ අභියෝග</u>**

11. දැනට පවතින ප්‍රධාන ගැටලු සහ අභියෝග පහත පරිදි වේ:

අ. ඉංජිනේරු කාර්යයන් සඳහා ලබාදී ඇති උපකරණ එකම නිෂ්පාදන මාදලියක නොවීම හා ඒවා නොකඩවා කාර්යයන්හි යෙදවීම හේතුවෙන් නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේදී අසීරුතාවයන්ට ලක්වේ.

ආ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් නිර්දේශිත බෝම්බ නිශ්ක්‍රිය උපකරණ වල ඇති හිගකම එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා බෝම්බ කණ්ඩායම් යෙදවීමට අභියෝගයක්ව ඇති බැවින් බෝම්බ නිශ්ක්‍රීය බළසෘණය නවීන තාක්ෂණික උපකරණ වලින් සන්නද්ධ කර විශේෂිත වූ පුහුණුවීම් ලබාදීම සුදුසු වේ.

ඇ. ඇතිවිය හැකි විවිධ අණතුරුදායක තත්ත්ව වලට ප්‍රතිචාර දැක්විය හැකි පරිදි රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණ, න්‍යෂ්ඨික ප්‍රතිචාර බළසෘණයට ප්‍රමාණවත් උපකරණ MOPP (Mission Orientate Protective Posture) නොමැතිවීම අභියෝගයක් වේ.

**<u>සාරාංශය</u>**

12. වසර 30 ක දීර්ඝ කාලයක් පැවති යුද්ධයෙන් පසුව ඉංජිනේරු බළකාය විසින් රටෙහි සංවර්ධන කටයුතු සඳහා විවිධ ප්‍රදේශයන්හි ස්ථානගතව විශාල ව්‍යාපෘතීන් සඳහා දායකත්වය ලබාදෙනු ලබයි. එම ව්‍යාපෘතීන් අතරින් මේ වන විට බොහෝමයක් අවසන් කර ඇති අතර, තව සමහරක් ඉටුකරමින් පවති. එම රාජකාරීන් අතරින් ප්‍රධාන වශයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ සිරිසර පිවිසුම ව්‍යාපෘතිය මෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි බිම්බෝම්බ ඉවත්කර සිවිල් ජනතාව පදිංචි කරවීම හා මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යන්ත්‍ර උපකරණ යෙදවීම ප්‍රධාන තැනක් ගනි. එම සෑම කටයුත්තක්ම නියමිත කාලවකවානු වලදී උසස් තත්ත්වයෙන් ඉටුකිරීම සඳහා නිසි මගපෙන්වීම ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය වෙතින් ඉටුවන ප්‍රධානතම වගකීමක් වන අතර එම ව්‍යාපෘතීන්හි සියලු කාර්යයන් කාර්යක්ෂමව හා නොපිරිහෙලා සිදුවන බවටත් පවතින යන්ත්‍රෝපකරණ හා ඉංජිනේරු සෙබලුන් සුදුසු පරිදි සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක වීමත් ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය වෙතින් සිදුකරනු ලබයි. එමෙන්ම ඉහත සඳහන් සියලුම කාරයයන් කාර්යක්ෂමව හා මනා කළමනාකාරීත්වයෙන් යුතුව ඉටුකර ගැනීම සඳහා සියලුම රජයෙහි හා සිවිල් ආයතන සමග සම්බන්ධතාවය පවත්වා ගැනීමත් මෙම මූලස්ථානය වෙතින් කරනු ලබයි. තවද එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්හි නියැලීම හා විශාල පරිමාණයෙහි ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි නිරතවීම හේතුවෙන් ඉංජිනේරු බළකාය තුළ සිටින නිලධාරි/සෙනීන්ගේ වෘත්තිය නිපුණත්වය ඉහළ යාම සිදුවේ.

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දායකත්වය ලබාදුන් ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති



යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයට අනුව ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය සක්‍රියව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග 500 කට වැඩි ප්‍රමාණයක් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති ඇතුලත්ව ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදෙමින් සිටියි.

## ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය

1. යුද්ධ හමුදාවෙහි අණ, පාලනය සහ පරිපාලනය සඳහා අවශ්‍ය වන සන්නිවේදන, තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් සංග්‍රාමික කටයුතු පහසුකම් සැපයීම වෙනුවෙන් යුද්ධ හමුදාධිපති තුමාට ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය ඉඳුරාම වගකිව යුතුවේ.

2. ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ ප්‍රධාන වශයෙන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය හා සංඥා බළසේනා මූලස්ථානය ඇතුලත්ව සංඥා රෙජිමේන්තු 7 ක්, තොරතුරු තාක්ෂණ ඒකක 2 ක්, සන්නිවේදන තාක්ෂණ ඒකකයක්, සයිබර් ආරක්ෂන ඒකකයක්, සංඥා පුහුණු පාසල හා විද්‍යුත් සංග්‍රාමික බලසණයක් පාලනය වනු ලබයි.




රූප සටහන 19:1. ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ ඇති ආයතන

**මූල්‍ය තොරතුරු**

3. වර්ෂය තුළ වෙන්කල ප්‍රතිපාදන සහ වියදම් විස්තරය පහත දැක්වේ:

| අනු අංකය | වැය ශීර්ෂ | වෙන්කල ප්‍රතිපාදන | වියදම් විස්තරය (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | සංඥා උපකරණ මිලදී ගැනීමේ වැය ශීර්ෂය | 157,000,000.00 | 166,569,627.67 |
| 2. | සංඥා/පරිගණක උපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වැය ශීර්ෂය | 93,000,000.00 | 115,983,626.15 |
| 3. | සංඥා අමතර කොටස් මිලදී ගැනීමේ වැය ශීර්ෂය | 49,096,923.35 | 49,199,036.37 |
| 4. | පරිගණක අමතර කොටස් මිලදී ගැනීමේ වැය ශීර්ෂය | 55,524,766.62 | 51,876,930.60 |
| 5. | සංඥා උපකරණ අළුත්වැඩියා කිරීමේ වැය ශීර්ෂය | 9,000,000.00 | 8,235,298.92 |
| 6. | සංඥා සම්බන්ධතා පද්ධති අළුත්වැඩියා කිරීමේ වැය ශීර්ෂය | 11,000,000.00 | 10,708,845.25 |
| 7. | පරිගණක උපකරණ අළුත්වැඩියා කිරීමේ වැය ශීර්ෂය | 19,000,000.00 | 18,624,893.33 |
| 8. | උපකරණ කුලියට ගැනීමේ වැය ශීර්ෂය | 3,000,000.00 | 2,978,027.04 |
| 9. | තැපැල් | 2,200,000.00 | 2,192,800.00 |

වගුව 19:1. මූල්‍ය ප්‍රතිපාදන විස්තරය

<u>**වැය ශීර්ෂ වියදම් සාරාංශය**</u>

4. ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය වෙත වෙන් කරන ලද වැය ශිර්ෂයන්ට අදාල මුදල් සංඥා හා ජාලගත කිරීම් මෙන්ම පරිගණක උපාංග මිලදී ගැනීම, අලුත්වැඩියා කිරීම සහ කුලී පදනම මත ලබාගැනීමට කාර්යක්ෂම ලෙස යොදවා ගන්නා ලදී. ඉහත දක්වා ඇති වැය ශීර්ෂයන් 8 හි මුදල් භාවිතා කිරීමේදී අඩු වැඩි වශයෙන් මුදල් වියදම් සිදුකර ඇති නමුත් එවා 100% ක් යුද්ධ හමුදාවේ ආයතනයන්හි අවශ්‍යතාවයන් අනුව යොදවා ඇත. තැපැල් වැය ශීර්ෂය යුධ හමුදා ආයතනයන් හි අවශ්‍යතාවය අනුව බෙදා වෙන්කර දෙන ලදී.

<u>**වසර තුළ ඉටු කල කාර්යයන්**</u>

5. <u>**ගුවන් විදුලි සන්නිවේදනය**</u>. යුද්ධ හමුදා මූලස්ථානය මගින් ලබාදුන් උපදෙස් අනුව විවිධ පුහුණු අභ්‍යාස ඇතුළු/උත්සව හා වැදගත් අවස්ථාවන් විශාල සංඛ්‍යාවක් සඳහා සාර්ථකව සංඥා සම්බන්ධතාවය ලබාදුන් අතර, මාලි රාජ්‍යයෙහි එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා අවශ්‍යතාවය අනුව රේඩියෝ සන්නිවේදන උපකරණ මිලදී ගන්නා ලදී.

6. <u>**නව දුරකථන හුවමාරු හා ෆැක්ස් යන්ත්‍ර ලබාදීම.**</u> 36 දිගුවන් සහිත දුරකතන හුවමාරුවක්, ෆැක්ස් යන්ත්‍ර 06 ක් නවතමයෙන් නිකුත් කල අතර, දුරකතන හුවමාරු 44 ක් අලුත්වැඩියා කර අදාල ස්ථානයන් වෙත නැවත ස්ථාපිත කරන ලදී.

7. <u>**රැහැන් දුරකථන සන්නිවේදනය**</u>. නවතමයෙන් ආරම්භකරන ලද ස්ථානයන් හි ඇති දුරකතන හුවමාරු සඳහා රැහැන් සම්න්ධතාවයන් ලබාදුන් අතර, ස්ථාපනය කර තිබු හුවමාරුවන්හි නඩත්තු කටයුතු සතුටුදායක ලෙස ඉටුකරන ලදී.

8. <u>**යුද්ධ හමුදා ක්ෂුද්‍ර තරංග පද්ධතිය වැඩිදියුණු කිරිම (හඩ/දත්ත/දෘෂ්‍ය මාධ්‍ය)**</u>. යුද්ධ හමුදා මූලස්ථානයෙහි සියලුම ශාඛා සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ කිරීම සඳහා 2010 වර්ෂයේදී යුද්ධ හමුදා ක්ෂුද්‍ර තරංග ව්‍යපෘතිය ආරම්භ කරන ලද අතර, සියලුම සේනාංක මූලස්ථාන මේ වන විට මේ හා සම්බන්ධ වී ඇත.

අ. පහත සඳහන් පරිදි 2018 වසරේදී ක්ෂුද්‍ර තරංග පද්ධතිය වැඩිදියුණු කර ඇත:

(1) පනාගොඩ සිට පිදුරුතලාගල දක්වා පැවති 32 Mbps ධාරිතාව 70 Mbps දක්වා වැඩිදියුණු කර ඇත.

(2) කොකාවිල් සිට ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) දක්වා පැවති 32 Mbps ධාරිතාව 70 Mbps දක්වා වැඩිදුයුණු කර ඇත.

9. <u>**මෘදුකාංග සංවර්ධනය සහ නඩත්තු ව්‍යාපෘති/වෙබ් අඩවි සංවර්ධන ව්‍යාපෘති / විශේෂ ව්‍යාපෘති**</u>. මෙම මූල අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද තොරතුරු තාක්ෂණ ව්‍යපෘති පහත සඳහන් පරිදි වේ:

අ. <u>**මෘදුකාංග සංවර්ධනය සහ නඩත්තු ව්‍යාපෘති.**</u> ව්‍යාපෘතින් 14 ක් සම්පූර්ණ කරන ලද අතර ව්‍යාපෘතීන් 22 ක් සංවර්ධනය කරමින් පවතියි.

ආ. <u>**වෙබ් අඩවි සංවර්ධන ව්‍යාපෘති.**</u> වෙබ් අඩවින් 32 ක් නව මුහුණුවරකින් යුතුව ප්‍රථිසංස්කරණය කරන ලදී.

ඇ. <u>**විශේෂ ව්‍යාපෘති.**</u>

(1) ආරක්ෂක සමුළුවෙහි ඇතුල්වීම සහ ප්‍රශ්න විචාරාත්මක යන කටයුතු (RFID) සඳහා වූ ව්‍යාපෘතිය.

(2) සුළු අවි විඩම්භකය - අදියර 2.

(3) Key Seewper පද්ධතිය සහ මුරපද තබාගැනීමේ පද්ධතිය.

(4) මෘදුකාංග ජාලකරණ පද්ධතිය.

(5) මෘදුකාංග ගුවන් විදුලි පද්ධතිය (යුද්ධ හමුදා GSM පද්ධතිය).

(6) ගුවන් විදුලි යන්ත්‍ර නිවේශකය (Radio Set Locator).

(7) Raspberry PI ජංගම දුරකථන පද්ධතිය.

(8) RFID ලියාපදිංචිය හා තත්ත්ව සහතික පද්ධතිය.

(9) ගෝලීය ස්ථානීය හඳුනාගැනීමේ (GPS) පද්ධතිය.

10. **<u>සංඥා සම්බන්ධ පුහුණු වැඩසටහන්</u>.** සංඥා පුහුණු පාසැල වෙතින් සංඥා බළකා සාමාජිකයින් සඳහා සංඥා සම්බන්ධතාවයන් සහ නිල උසස් කිරීම් සඳහා අවශ්‍ය පාඨමාලාවන් නිලධාරීන් 28 ක් සහ සෙසුනිළයන් 836 දෙනෙකු සඳහා පවත්වන ලද අතර, සියලුම අනෙකුත් යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා පහත පරිදි පාඨමාලා පවත්වන ලදී.

| අනු අංකය | පාඨමාලාවේ නම | පාඨමාලා ගණන | සිසුන් ප්‍රමාණය |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | රෙජිමේන්තු සංඥා නිලධාරීන් සඳහා වන ක්ෂේත්‍ර සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාව | 01 | 16 |
| 2. | පරිගණක පාඨමාලාව - ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 04 | 119 |
| 3. | වෙනත් ඒකක සංඥා පාඨමාලාව - ක්ෂේත්‍ර සංනිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 03 | 72 |
| 4. | විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාව | 02 | 55 |
| 5. | විශේෂ බළකා සෙනීන් සඳහා වූ සංඥා පාඨමාලාව | 01 | 24 |
| | **එකතුව** | **10** | **263** |

වගුව 19:2. පුහුණු පාඨමාලා විස්තරය

11. **<u>තොරතුරු තාක්ෂණය සම්බන්ධ පුහුණු වැඩසටහන්</u>.** යුධ හමුදා මූලස්ථාන /ශාඛා/ආරක්ෂක සේනා මූලස්ථාන/සේනාංක මූලස්ථාන/අධ්‍යක්ෂ මණ්ඩල/ රෙජිමේන්තු මධ්‍යස්ථානයන්හි රාජකාරී කරනු ලබන සංඥා බළකා නිලධාරීන් සහ සෙසුනිලයන් හට සයිබර් ආරක්ෂනය, නිවැරදි සමාජ ජාල වෙබ් අඩවි භාවිතය පිළිබඳ පුහුණු වැඩ සටහන් සහ වැඩමුලු පවත්වන ලදී.

12. **<u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය</u>.** යුද්ධයේදී මියගිය හා ආබාධිත දැනට සේවයෙහි නියුතු රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල් වල දූදරුවන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරිම අරමුණු කොටගෙන හයවන රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය යුද්ධ හමුදා හකාස විද්‍යාලය ත්‍රිකුණාමලයහිදි ආරම්භ කරන ලදි. වසර තුළ සාමාජිකයන් 1,440 ක් සඳහා පුහුණු වීම් පාඨමාලා 6 ක් මඟින් ලබාදෙන ලදී.



රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය විවෘත කිරිමේ අවස්ථාව

**<u>ජයග්‍රහණයන්</u>**

13. උසස් තාක්ෂණ සන්නිවේදන විද්‍යාගාර සංකිර්ණය. ඉන්දියානු රජයෙහි මූල්‍ය අනුග්‍රහය යටතේ සංඥා පුහුණු පාසලෙහි ඉදිකරන ලද රැහැන් සම්බන්ධතා විද්‍යාගාරය, ගුවන් තරංග සංඥා විද්‍යාගාරක් සහ ෆයිබර් ඔප්ටික් සංඥා විද්‍යාගාරයක් වශයෙන් විද්‍යාගාර 3 කින් සමන්විත උසස් තාක්ෂණ සන්නිවේදන විද්‍යාගාර සංකීර්ණයක් 2018 මැයි මස 15 දින ඉන්දියානු යුද්ධ හමුදාධිපති ජෙනරාල් බිපින් රාවට් විසින් මෙම පුහුණු පාසලෙහි පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදි.



ඉන්දියානු යුද්ධ හමුදාධිපති තුමා විසින් උසස් තාක්ෂණ සංඥා විද්‍යාගාර සංකිර්ණය විවෘත කිරීම

14. **<u>පුහුණු කටයුතු.</u>** පසුගිය වසරට සාපේක්ෂව මෙම වසර තුළ පවත්වන ලද පාඨමාලාන්හි වර්ධනය සංඥා පුහුණු පාසල මගින් 16% වශයෙන්ද, රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය විසින් 109% ක සීඝ්‍ර වර්ධනයක් ලබා ඇත.

**<u>බාධක සහ අභියෝග</u>**

15. යුද්ධ හමුදා දත්ත ජාලය සීඝ්‍ර වර්ධනයත් සමග යුද්ධ හමුදාවට එල්ලවූ සයිබර් ප්‍රහාරයන් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවන ලදී. එම ප්‍රහාරයන්ට මුහුණ දෙමින් යුද්ධ හමුදාවෙහි තොරතුරු සහ සංඥා තාක්ෂණික යටිතල පහසුකම් වලට හානියක් නොවන අයුරින් ඒවා ආරක්ෂා කරගනිමින් කටයුතු කිරීම ගෙවූ වසර තුළ ලැබූ මහත්වූ අභියෝගයකි.

16. විශ්වය තුළ සිදුවන එකිනෙකට වෙනස් වූ සයිබර් ප්‍රහාරයන් හමුවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා දත්ත ජාලය ආරක්ෂිත ජාලයක් බවට පත් කිරීම සහ එම ප්‍රහාරයන් විශ්ලේෂණය කර ඒවාට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තක් වුවත් එම විශ්ලේෂණයන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීමට ඉතා විශාල මුදලක් වියදම් කිරීමට සිදුවීම අභියෝගයකි.

17. සීඝ්‍රයෙන් අලුත්වෙමින් පවතින නවීන සන්නිවේදන ක්‍රම හා තොරතුරු තාක්ෂණයට අදාල වෘත්තිමය පුහුණු වැඩසටහන් මගින් සංඥා බළකා නිලධාරී/සෙසුනිලයන්ගේ සහ යුද්ධ හමුදාවට අයත් අනෙකුත් රෙජිමේන්තු/බළකායන්ට අයත් නිලධාරී/සෙසුනිලයන්ගේ දැනුම වර්ධනය කරගැනීම විශාල අභියෝගයකි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

# ශ්‍රී ලංකා සංඥා බළකායේ සම්මන්ත්‍රනය හා ප්‍රදර්ශණය



ශ්‍රී ලංකා සංඥා බළකායේ 75 වන සංවත්සරය නිමිත්තෙන් 2018 ඔක්තෝබර් මස 19 දින සිට සම්මන්ත්‍රන මාලාවක් හා ප්‍රදර්ශණයක් පැවැත්වූ අතර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඇති නවීන උපකරණ හා සේවා පිළිබද මහජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීම එහි අරමුණ විය. මේ සඳහා තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති ප්‍රමුඛ පෙළේ දෙස් විදෙස් ආයතන වල අනුග්‍රහය හිමි විය.



## යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය

1. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය 2014 අප්‍රේල් මස 22 දින ස්ථාපනය කරන ලද අතර, යුද්ධ හමුදාවෙහි සියළු සෞඛ්‍ය අවශ්‍යතාවයන් සඳහා අණ දීම, රාජකාරී හා වගකීම් පිළිබඳව යුද්ධ හමුදාධිපතිට ඉඳුරාම වගකිව යුතු වේ.

2. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සක්‍රීය සේවයෙහි යෙදී සිටින හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් මෙන්ම යුද්ධ හමුදාවට අනුයුක්තව සේවය කරන සිවිල් සේවක සාමාජිකයින්ගේ යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිකාර සහ රෝග නිවාරණ පහසුකම් සැපයීමත්, ඒ සඳහා උපදෙස් ලබාදීම සහ අවශ්‍යතාවයන් අනුව එම සේවාවන් අනෙකුත් සන්නද්ධ හමුදාවන්ට සහ සිවිල් ප්‍රජාව වෙත ලබාදීමට කටයුතු කිරීම මෙම කාර්යාලයෙහි කාර්ය පටිපාටියට අයත්වේ.




රූප සටහන 20:1. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය යටතේ ඇති ආයතන

### වසරේ කාර්ය සාධන සාරාංශය

3. විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් හා විශේෂිත පුද්ගලයින් හට සහ ක්‍රීඩා උත්සව මෙන්ම අනෙකුත් යුද්ධ හමුදා උත්සව සඳහා වෛද්‍ය පහසුකම් ලබාදීම.

4. 2018.08.06 දින සිට 2018.09.06 දින දක්වා පාකිස්ථානු යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායමක් සඳහා ඩෙංගු රෝගය පිළිබඳ අධ්‍යයන වැඩසටහනක් පැවැත්වීම.

5. පොළොන්නරුව සහ කිළිනොච්චි දිස්ත්‍රික්කයන්හි ගංවතුර තත්ත්වය හේතුවෙන් අවතැන් වූ ජනතාවට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම.

6. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා යුද්ධ හමුදාවෙහි දායකත්වය ලබාදීම.

7. හමුදා සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින් ක්‍රියාවට නංවා ඇති "නීරෝගිමත් හමුදාවක් නීරෝගිමත් දැයක්" වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම.

8. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා බාහිර/නේවාසික ප්‍රතිකාර ලැබූ රෝගීන්ගේ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| අ. | බාහිර ප්‍රතිකාර ලැබූ සංඛ්‍යාව | - | 413,376 |
| ආ. | නේවාසික ප්‍රතිකාර ලැබූ සංඛ්‍යාව | - | 50,148 |

### වසරේ ජයග්‍රහණයන්

9. යුද්ධ හමුදා සේවයෙහි නියුතු සාමාජිකයින්, සේවා මුක්ත භටයින් සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයින් සහ සිවිල් කාර්ය මණ්ඩලයෙහි කායික, මානසික සහ බෝ නොවන රෝග තත්ත්වයන් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිකාරමය පහසුකම් සැපයීම.

## වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

10. යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් යටතේ පාලනය වේ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන සියළුම යුද්ධ හමුදා වෛද්‍ය මධ්‍යස්ථාන වෙතින් යුද්ධ හමුදා සාමාජිකයින් හට, ඔවුන්ගේ පවුල් සාමාජිකයින් හට, විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් හට, ඔවුන්ගේ පවුල් සාමාජිකයින් හට හා යුද්ධ හමුදා සිවිල් සේවකයින් හට වෛද්‍ය පහසුකම් සැපයීමට අවැසි නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි. තවද, එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා අවැසි වෛද්‍ය පහසුකම් සම්බන්ධීකරණය කිරීම, යුද්ධ හමුදා සෞඛ්‍ය සේවයෙහි අවශ්‍යතාවය අනුව පුරප්පාඩු සපුරා ගැනීමට වෛද්‍ය හා අතුරු වෛද්‍ය වෘත්තිකයින් බඳවා ගැනීමේ සියළු සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, වෛද්‍ය ක්ෂේත්‍රයෙහි ඇතිවන ඉදිරි අභියෝග වලට මුහුණ දීමට සුදුසු පරිදි සේවයෙහි නියුතු සියළුම වෛද්‍ය වෘත්තික සාමාජිකයින්ගේ වෘත්තීය හැකියාවන් වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම, සියළු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම සඳහා වෛද්‍ය ක්ෂේත්‍රයට අදාල ක්‍රම උපායන් සකස් කිරීම, අවශ්‍ය අවස්ථාවන්හිදී වෛද්‍ය සේවාවන් අනෙකුත් සන්නද්ධ හමුදා සහ සිවිල් ජනතාව වෙත සැපයීම යන කාර්යයන් ද ඉටුකරනු ලැබේ.

## වසරේ කාර්ය සාධන සාරාංශය

11. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව වෙත කායික රෝග විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු බඳවා ගන්නා ලදී.

12. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව වෙත විශේෂඥ වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා පහත සඳහන් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් තෝරාගෙන ඇති අතර, ඔවුන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් නිදහස් කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතියි.

| | | |
|---|---|---|
| අ. | උගුර, කන, නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍ය | - 01 |
| ආ. | නිර්වින්දන විශේෂඥ වෛද්‍ය | - 02 |
| ඇ. | විශේෂඥ ශල්‍ය වෛද්‍ය | - 02 |

13. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව වෙත 2019 වසර සඳහා පහත සඳහන් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම සඳහා අවැසි ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන ඇත.

| | | |
|---|---|---|
| අ. | ප්‍රසව හා නාරිවේදී විශේෂඥ වෛද්‍ය | - 01 |
| ආ. | මානසික රෝග විශේෂඥ වෛද්‍ය | - 01 |
| ඇ. | ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය | - 01 |

14. මෙම වසර තුළ හෙද ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සෙනින් 45 ක් යොමුකර ඇත.

15. මෙම වසර තුළ පහත සඳහන් සංඛ්‍යාවන් හෙද/අතුරු වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව වෙත වාර්තා කර ඇත.

| | | |
|---|---|---|
| අ. | හෙද පාඨමාලාව | - 35 |
| ආ. | ඖෂධවේදී | - 10 |
| ඇ. | විද්‍යුත් කන්තුක රේඛන (ECG) | - 15 |

16. යුද්ධ හමුදා වෛද්‍ය සේවාවෙහි පවතින හෙද/අතුරු වෛද්‍ය වෘත්තිකයින්ගේ පුරප්පාඩු සඳහා ආධුනික සෙනින් 28ක් ද අනෙකුත් වෘත්තිකයින්ගේ පුරප්පාඩු පිරවීම සඳහා ආධුනික සෙනින් 191 ක් ද 2018 වසර තුළ බඳවාගෙන ඇත.

17. හෙද වෘත්තිකයින්ගේ පවතින හිඟතාවයට පිළියමක් වශයෙන් කලා හා වාණිජ විෂය ධාරාවන්ගෙන් අ.පො.ස(උ/පෙළ) සමත් අයවළුන් යුද්ධ හමුදාවට බඳවා ගෙන හෙද ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා යොමු කිරීමට අවැසි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ඉල්ලීමක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

18. හෙද ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා හෙද පුහුණු පාසලට යුද්ධ හමුදා සාමාජිකයින් 45 දෙනෙකු හා පළමු ශ්‍රේණියේ හෙද සහායක පාඨමාලාව හැදෑරීම සඳහා හෙද සහායකයින් 32 දෙනෙකුද ඇතුලත් වන ලදී.

19. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා මාලි පළමු මට්ටමේ රෝහල වෙත යා කර සිටින වෛද්‍ය බළකායෙහි සෙබළුන් විසින් 2018 වර්ෂයේදී සිවිල් ජනතාව සඳහා වෛද්‍ය සායන පවත්වා ඇත. අදාල ඡායාරූප පහත සඳහන් පරිදි වේ.




20. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වෙතින් 2018.10.12 දින සිට 2018.10.14 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පවත්වනු ලැබූ TECHNO - 2018 ප්‍රදර්ශනය සඳහා යුද්ධ හමුදාවෙහි ප්‍රතිරූපය ඉතාම උසස් මට්ටමින් පිළිබිඹු වන ආකාරයට නිර්මාණය කරන ලද ප්‍රදර්ශන කුටිය තුළ සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. අදාළ ඡායාරූප පහත සඳහන් පරිදි වේ.





**<u>ගැටළු සහ අභියෝග</u>**

21. අවශ්‍යතාවයට ප්‍රමාණවත් ගිලන්රථ නොමැතිවීම.

| | | |
|---|---|---|
| අ. | යුද්ධ හමුදා වෛද්‍ය සේවාව සඳහා අවශ්‍ය මුළු ගිලන්රථ සංඛ්‍යාව | - 175 |
| ආ. | දැනට යුද්ධ හමුදා වෛද්‍ය සේවාව සතු ගිලන්රථ සංඛ්‍යාව | - 118 |
| | අඩු ගිලන්රථ සංඛ්‍යාව | - 57 |

(1) දැනට ධාවනය කරනු ලබන ගිලන්රථ 118ක ප්‍රමාණය අතුරින් ගිලන්රථ 39ක් වසර 15 කට වඩා පැරණි ගිලන්රථ වන බැවින් හා එම ගිලන්රථ ද ඉදිරියේදී අයෝග්‍ය විමට නියමිත බැවින්, මුළු ගිලන්රථ අවශ්‍යතාවය 96ක් (57+39) වේ. මෙයින් ගිලන්රථ 08ක් විශේෂ ප්‍රභූ වෛද්‍ය සේවාවන් සඳහා යොදා ගැනීමට සුදුසු විශේෂ වෛද්‍ය පහසුකම් සහිත ගිලන්රථ විය යුතුය.

22. **<u>හෙද/අතුරු වෛද්‍ය පාඨමාලා හැදෑරීම සඳහා ආධුනිකයින් යුද්ධ හමුදාවට බැඳීමට දක්වන අඩු ප්‍රවණතාවය</u>**. අධ්‍යාපන සුදුසුකම් ඇති අයවළුන් හෙද/අතුරු වෛද්‍ය පාඨමාලා හැදෑරීම සඳහා ආධුනිකයින් ලෙස යුද්ධ හමුදාවට බැඳීමට අඩු ප්‍රවණතාවයක් පවතියි.

**<u>සාරාංශය</u>**

23. යුද්ධ හමුදාවට බඳවා ගන්නා විශේෂඥ වෛද්‍යවරුන් ප්‍රමුඛත්වය මත සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් නිදහස් කර ගැනීම සඳහා විශේෂ ක්‍රමවේදයක් සකස් කළ යුතුව ඇත.

24. කලා හා වාණිජ විෂය ධාරාවන්ගෙන් අ:පොස:(උ/පෙළ) සමත් අයවළුන් යුද්ධ හමුදාවට බඳවාගෙන හෙද ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා යොමු කිරීමට අවැසි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම.

25. යුද්ධ හමුදා සෞඛ්‍ය සේවාව තුළ පවතින ගිලන්රථ 96 ක අවශ්‍යතාවය කඩිනමින් සපුරා ගැනීම සඳහා අවැසි කටයුතු සිදුකිරීම.

## දන්ත වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

26. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉඳුරාම යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් යටතේ පාලනය වන අතර, සියලුම යුද්ධ හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් හට වඩාත් කාර්යක්ෂම හා කඩිනමින් දන්ත වෛද්‍ය ප්‍රතිකාර සේවාවක් ලබාදීම මගින් ඔවුන්ගේ මුඛ සෞඛ්‍ය ඉතා උසස් අයුරින් පවත්වාගෙන යාම හරහා ඔවුන්ගෙන් වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අපේක්ෂාව වේ.

### වසරේ කාර්ය සාධන සාරාංශය

27. විරු කැකුළු පෙර පාසල (දියතලාව) සඳහා 2018.02.14 සහ 2018.07.11 දිනයන් හිදී දන්ත වෛද්‍ය නිලධාරි සහ කාර්ය මණ්ඩලයේ සේවය ලබාදීම.

28. විරු කැකුළු පෙර පාසල (පල්ලෙකැලේ) සඳහා 2018.04.05 සහ 2018.08.01 දිනයන් හිදී දන්ත වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයේ සේවය ලබාදීම.

29. වීරවිල හින්දු මහා විද්‍යාලය වෙතින් 2018.04.07 දින සංවිධානය කරන ලද වෛද්‍ය සායනය සඳහා දන්ත වෛද්‍ය නිලධාරියෙකුගේ සේවය ලබාදීම.

30. 2018.04.04 දින සිට 2018.04.07 දින දක්වා ඩුබායි හිදී පවත්වන ලද 'Dubai International Dentistry Congress' සඳහා දන්ත වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු සහභාගි කරවීම.

31. ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමය වෙතින් 2018.01.27/28 යන දිනයන්හි මහනුවරදී පවත්වන ලද සහ 2018.06.22/23 යන දිනයන්හි කොළඹ දී පවත්වන ලද වැඩමුළු සඳහා පිළිවෙලින් දන්ත වෛද්‍ය නිලධාරින් 04 දෙනෙකු සහ 08 දෙනෙකු සහභාගි කරවීම.

32. මුඛ හා හනුක විශේෂඥ දන්ත වෛද්‍ය පාඨමාලාව හැදෑරීම සඳහා අනුයුක්ත කරන ලද දන්ත වෛද්‍ය නිලධාරියෙකු එහි පළමු අධියර සාර්ථකව නිමකර දෙවන අධියර සඳහා සුදුසුකම් ලබා තිබීම.

33. 2018.08.20 දින සිට ආරම්භ කරන ලද ප්‍රජා දන්ත වෛද්‍ය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා දන්ත වෛද්‍ය නිලධාරියෙකු සුදුසුකම් ලබා තිබීම.

34. 2019.01.01 දින සිට ආරම්භ කිරීමට නියමිත 'Hospital Dental Practice' පශ්චාත් උපාධි ඩිප්ලොමා පාඨමාලාව හැදෑරීම සඳහා එක් දන්ත වෛද්‍ය නිලධාරියෙකු සුදුසුකම් ලබා තිබීම.

### වසරේ ජයග්‍රහණයන්

35. දන්ත ශල්‍යාගාර සහායකයින්ගේ හිඟතාවයට පිළියමක් වශයෙන් හෙද සහයක වෘත්තිකයින් 15 දෙනෙකු දන්ත වෛද්‍ය සේවාව වෙත දන්ත සහායක වෘත්තීය නාමය යටතේ ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇති අතර, වසර 03 ක ප්‍රායෝගික පුහුණුවක් අවසානයෙහි පේරාදෙණිය විශ්ව විද්‍යාලය වෙත වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා රපෝර්තු කර පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් පසු දන්ත ශල්‍යාගාර සහායකයින් වශයෙන් රාජකාරී යෙදවීමට කටයුතු කිරීම.

36. පේරාදෙණිය විශ්ව විද්‍යාලීය දන්ත සහයක පුහුණු පාසල වෙතින් 2018.09.03 දින ආරම්භ කරන ලද පාඨමාලාවන් සඳහා දක්වා ඇති පරිදි සෙනින් රපෝර්තු කරවීම.

අ. දන්ත සහායක ඩිප්ලෝමා පාඨමාලාව - සෙනීන් 01
ආ උසස් දන්ත තාක්ෂණවේදී ඩිප්ලෝමා පාඨමාලාව - සෙනීන් 04

### ගැටළු සහ අභියෝග

37. අනුමත සංස්ථාවට අනුව දන්ත වෛද්‍ය නිලධාරීන් 86 ක් සහ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධාරීන් 11ක් සිටිය යුතු වුවද එම ඉලක්කය මේ දක්වා සපුරා ගත නොහැකි වීම.

38. අනුමත සංස්ථාවට අනුව පහත දක්වා ඇති වෘත්තීන්හි පුහුණු වෘත්තීය සෙනීන්ගේ හිඟතාවයක් පැවතීම.

අ. දන්ත ශල්‍යාගාර සහායක.
ආ. දන්ත කාර්මික.
ඇ. දන්ත චිකිත්සක.

**සාරාංශය**

39. දන්ත වෛද්‍ය සේවාවෙහි පවතින දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා හැකි උපරිම දන්ත වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කිරීම.

40. 2019 වසරේදී දක්වා ඇති පරිදි විශේෂඥ දන්ත වෛද්‍ය නිලධාරීන් ප්‍රමාණයක් දන්ත වෛද්‍ය සේවාව වෙත බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

අ. විකලාංග විශේෂඥ දන්ත වෛද්‍ය - 02
ආ දන්ත වෛද්‍ය නිලධාරී - 14

41. අනුමත සංස්ථාවට අනුව දන්ත වෛද්‍ය සේවාවෙහි පවතින වෘත්තීය සෙසු නිලයින්ගේ පහත සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා හැකි උපරිම ආධුනික සෙනීන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

අ. දන්ත ශල්‍යාගාර සහයක - 199
ආ. දන්ත කාර්මික - 32
ආ. දන්ත චිකිත්සක - 15

42. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ මුඛ සෞඛ්‍ය උසස් අයුරින් පවත්වා ගැනීම සඳහා ජංගම දන්ත ශල්‍යාගාර රථයේ සේවය ලබාදීම.

43. දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයේ කාලානුරූපීව සිදුවන නවීන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳ විෂය දැනුම ලබාගැනීම සඳහා දන්ත වෛද්‍ය නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා, වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගි කරවීම මඟින් දන්ත වෛද්‍ය ප්‍රතිකාරයන් හි ගුණාත්මක තත්ත්වය ඉහළ නංවා ගත හැකිවීම.

**වෛද්‍ය උපර්ජන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**

44. යුද්ධ හමුදාව තුළ රාජකාරී කරනු ලබන සියලුම නිලධාරී/සෙසුනිලයින්, ඔවුන්ගේ පවුල් වලට අයත් ලගම ඥාතින්, විශ්‍රාමික අයවලුන්, සිවිල් කාර්ය මණ්ඩලය හා එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීන්හි නියැලී සිටින සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා සියලු වෛද්‍ය උපකරණ, ඖෂධ/සැරහුම් ද්‍රව්‍ය හා දන්ත ඖෂධ හා දන්ත වෛද්‍ය උපකරණ හා සනීපාරක්ෂක ද්‍රව්‍යයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව මිලදී ගැනීමට කටයුතු කිරීම, ගබඩා කිරීම හා නිසි පරිදි බෙදාහැරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා මෙම අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් කටයුතු සිදු කරනු ලබයි.

45. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් මිලදී ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කරන ලදී.

**මූල්‍ය තොරතුරු**

46. වර්ෂය තුළ වෙන්කල ප්‍රතිපාදන සහ වියදම් විස්තරය පහත දැක්වේ.

| අනු අංකය | වැය විස්තරය | විස්තරය | මුළු ප්‍රතිපාදන වටිනාකම (රු.) | මු: රෙ: 94(2)යටතේ ප්‍රතිපාදන ඉක්මවා වැය දැරීමට වෙන්වී ඇති ප්‍රතිපාදන වටිනාකම (රු.) | මුළු ප්‍රතිපාදන (රු.) | 2018.01.01 දින සිට 2018.12.31 දිනට බැදීම් සමඟ මුළු වියදම (රු.) |
|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |
| 1. | 222-01-2-1204 | i,ii,iii,v, vi,viii,ix, x,xii | 1,178,719,073.00 | 100,000,000.00 | 1,287,719,073.00 | 1,261,587,808.67 |
| 2. | 222-01-2-1409 | v | 8,000,000.00 | | 8,000,000.00 | 8,503,881.55 |
| 3. | 222-01-1-3-2509 | i (Lebanon) | 156,655.00 | - | 156,655.00 | 156,655.00 |
| 4. | 222-01-1-3-2509 | ii (Sudan) | 28,916,873.05 | - | 28,916,873.05 | 7,437,390.93 |
| 5. | 222-01-1-3-2509 | iii (Mali) | 155,500.00 | - | 155,500.00 | - |

වගුව 20:1. මූල්‍ය තොරතුරු

<u>**ප්‍රතිපාදන ඵලදායී ලෙස යෙදවීම**</u>

| අනු අංකය | වැය ශිර්ෂ | වෙන්කල ප්‍රතිපාදන (රු.) | වියදම් විස්තරය (රු.) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ඖෂධ හා සැරහුම් (222-01-2-1204 (i)) | 99,001,093.00 | 966,684,916.73 |
| 2. | ඖෂධ හා සැරහුම් (දන්ත) (222-01-2-1204 (ii)) | 5,600,000.00 | 5,234,341.21 |
| 3. | සටන් සුනඛ හා අශ්ව (222-01-2-1204 (iii)) | 1,260,000.00 | 1,263,921.08 |
| 4. | කඳවුරු සනීපාරක්ෂක (222-01-2-1204 (v)) | 72,633,500.00 | 69,845,292.29 |
| 5. | වෛද්‍ය පුනරුත්ථාපන (222-01-2-1204 (vi)) | 23,000,000.00 | 20,305,050.00 |
| 6. | එක්ස් කිරණ හා දල සේයා පට (222-01-2-1204 (viii)) | 13,000,000.00 | 10,952,774.56 |
| 7. | විකලාංග හා ශල්‍ය උපාංග (222-01-2-1204 (ix)) | 50,524,480.00 | 48,731,629.18 |
| 8. | ශල්‍ය උපාංග (දන්ත) (222-01-2-1204 (x)) | 3,700,000.00 | 3,204,439.77 |
| 9. | වෛද්‍ය පිළිවෙත් (222-01-2-1204 (xii)) | 30,000,000.00 | 29,749,832.73 |
| 10. | රජක සේවා (222-01-2-1409 (v)) | 8,000,000.00 | 8,503,881.55 |
| 11. | සාම සාධක රාජකාරී (ලෙබනන්) (222-01-1-3-2509 (i)) | 156,655.00 | 156,655.00 |
| 12. | සාම සාධක රාජකාරී (සුඩාන්) (222-01-1-3-2509 (ii)) | 28,916,873.05 | 7,437,390.93 |
| 13. | සාම සාධක රාජකාරී (මාලි) (222-01-1-3-2509 (iii) | 155,500.00 | - |

වගුව 20:2. ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදගත් ආකාරය

<u>**වසරේ ජයග්‍රහණයන්**</u>

47. ශ්‍රී ලංකා යුද්ධ හමුදා හයිපිරිස් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා මාලි රාජ්‍යයෙහි ස්ථානගත වීම හේතුවෙන් ස්ථාපනය කරනු ලබන දෙවන මට්ටමේ රෝහල සඳහා අවැසි වෛද්‍ය අයිතමයන්ගේ ප්‍රසම්පාදන කටයුතු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සාර්ථකව ඉටුකිරීම.

48. වෛද්‍ය උපර්ජන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය ආරම්භ කිරීමේදී ඉතා සුළු කාර්ය මණ්ඩලයකින් සමන්විත වු අතර, වර්ථමානයේදී එකී හයිපිරිස් ප්‍රමාණය වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත.

<u>**ගැටළු සහ අභියෝග**</u>

49. කාලය සහ සම්පත් පිළිබඳව සලකා බලන විට යුද්ධ හමුදා උසස් මූලස්ථාන හා ඒවාට සමාන්තර වෙනත් මූලස්ථාන මෙන්ම පහළ මට්ටම් වල මූලස්ථාන ස්ථාන ගතව විසිර පැතිරීම හා පවත්වාගෙන යාම මහත් අභියෝගයක්ව පවතියි.

<u>**සාරාංශය**</u>

50. අනුමත සංස්ථාවට අනුව කාර්යය මණ්ඩලය ප්‍රවර්ධනය කරගැනීම.
51. ඉතා කඩිනමින් උසස් තත්ත්වයෙහි මූලික බෙහෙත් ගබඩාව ස්ථාපිත කරගැනීම.
52. නිසි ගොඩනැගිල්ලක අංග සම්පූර්ණ කාර්යාලයක් ස්ථාපිත කරගැනීම.

## කලමණාකරණ හා නඩත්තු අධ්‍යක්‍ෂ මණ්ඩලය හා යුද්ධ හමුදා රෝහල (කොළඹ)

53. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ විශ්‍රාමික සාමාජිකයින් වෛද්‍ය පහසුකම් ලබාගැනීමට යුද්ධ හමුදා රෝහල වෙත පැමිණීමේදී වඩාත් ගුණාත්මක බවින් යුත් සේවාවක් යුද්ධ හමුදා රෝහල හා සබඳතාවයෙන් යුතුව ලබාදීම, යුද්ධ හමුදා රෝහල වෙත පාලන සහ භකාස සේවාවන් ලබාදීම සහ යුද්ධ හමුදා රෝහලෙහි නඩත්තු සේවාවන් ඉතා උසස් තත්ත්වයෙන් යුතුව පවත්වාගෙන යාම කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කාර්යභාරය වේ.

### මූල්‍ය තොරතුරු

54. මූල්‍ය තොරතුරු විස්තරය පහත පරිදි වේ:

| අනු අංකය | වැය විස්තරය | විස්තරය | 2018 වෙන් කරන ලද පුනරාවර්තන වටිනාකම (රු.) | 2018.12.31 දිනට ටෙන්ඩර් අනුමත වටිනාකම (රු.) | මුදල් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත භාර දී ඇති වවුචර් වල වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | 222-01-02-1204 (IV) | රෙදිපිළි හා විෂබීජ නාශක | 42,167,484.00 | 41,417,458.43 | 40,165,483.43 |

වගුව 20:3. මූල්‍ය තොරතුරු

### වසරේ කාර්ය සාධන සාරාංශය

55. ප්‍රධාන ක්‍රියාදාමයන් සහ වත්මන් තත්වය.

අ. පාලන අංශය.

(1) වෛද්‍ය පහසුකම් ලබාගැනීමට පැමිණෙන විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ පහසුව සඳහා මගපෙන්වීමේ අංශයක් යුද්ධ හමුදා රෝහලෙහි බාහිර රෝගී අංශයට යාබදව සකස් කිරීම.

ආ. භකාස අංශය.

(1) යුද්ධ හමුදා රෝහල තුළින් සේවාවන් ලබාගැනීමට පැමිණෙන සියළුම යුද්ධ හමුදා සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට සුභසාධන පහසුකම් ලබාදීම.

(2) රෝහලට ලබාදී ඇති ගිලන් රථ සහ පාලන කටයුතු සඳහා ලබාදී ඇති අනෙකුත් රථවාහන වලින් උපරිම සේවාවක් ලබා දීම.

(3) නවීන අංග උපාංග වලින් සමන්විත යන්ත්‍ර උපයෝගී කර ගනිමින් අඩු ශ්‍රම දායකත්වයක් මත යුධ හමුදා රෝහලෙහි පිරිසිදු කිරීම් කටයුතු ක්‍රමවත්ව හා කාර්යක්‍ෂමව ඉටු කිරීම.

(4) යුද්ධ හමුදා රෝහල් ජාලය තුළ රෝහල්හි සියලුම කළමනාකරණ හා නඩත්තු කටයුතු සඳහා දායක වීම.

(5) නවීන බේකරි පහසුකම් ඇතුලත්ව අංග සම්පූර්ණ ජන අවන්හලක් පවත්වාගෙන යන අතර, එමගින් රෝහල වෙත පැමිණෙන සියලුම අයවලුන් හට ඉතාම උසස් තත්ත්වයෙන් යුත් ප්‍රණීත ආහාරපාන ලබාදීම.

(6) යුහ රෝහලෙහි අවපැහැගැන්වී ඇති බිත්ති තෙතමනයට ඔරොත්තු දෙන තීන්ත අලේප කරන ලදී.

(7) සියලු පහසුකම් වලින් යුත් අංග සම්පූර්ණ 15 මහල් ගොඩනැගිල්ලෙහි වැඩ ආරම්භ කිරීම.

(8) කොමිෂන් නොලත් නිලධාරී සමාජ ශාලාවක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

(9) ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා යුද්ධ හමුදා රෝහලෙහි ප්‍රමාණවත් පහසුකම් නොමැති නිසා නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයෙන් ගබඩාවක් කුලී ගෙවීමේ පදනම මත ලබාගැනීම.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

56. <u>නඩත්තු සේවා</u>.

අ. පරිගණක අංශයේ PACS පරිගණක පද්ධතිය සඳහා විදුලි සැපයුම වෙනස් කිරීම.

ආ. යුද්ධ හමුදා රෝහල (කොළඹ) නිළධාරී නිවස්නයෙහි බිම් මහල අලුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම හා නානකාමර අලුත්වැඩියා කිරීම.

ඇ. රෝහලට පැමිණෙන රෝගීන්ගේ දැනගැනීම සඳහා සෞඛ්‍ය වැඩසටහන් රෝහලෙහි ස්ථාපනය කොට ඇති රූපවාහිනි යන්ත්‍ර මාර්ගයෙන් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.

**<u>ගැටළු සහ අභියෝග</u>**

57. යුද්ධ හමුදා රෝහල්හි රාජකාරී කරනු ලබන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් හය නිවාස හා පහසුකම් නොමැති වීම.

**<u>යුද්ධ හමුදා රෝහල (කොළඹ)</u>**

58. යුද්ධ හමුදා රෝහල වෙතින් යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයින් හට සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් හටත් විශ්‍රාමික යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් හටත්, යුද්ධ හමුදා සේවයෙහි යෙදී සිටින සිවිල් සේවක මහත්ම/ මහත්මීන් වෙත කාර්යක්‍ෂම වෛද්‍ය සේවාවක් ලබාදීම සඳහාද බැඳී ඇත.

**<u>වසරේ ජයග්‍රහණයන්</u>**

59. වඩා කාර්යක්‍ෂම වෛද්‍ය සේවාවක් ලබාදීම සඳහා පහත සඳහන් විශේෂඥ වෛද්‍යවරුන් රෝහල වෙත ලබාගෙන ඇත.

අ. කායික රෝග විශේෂඥ වෛද්‍ය - 01
ආ. ප්‍රසව හා නාරිවේදී විශේෂඥ වෛද්‍ය - 02

60. 2018/01/01 දින සිට 2018/12/31 දින දක්වා බාහිර/නේවාසික ප්‍රතිකාර ලැබූ රෝගී සංඛ්‍යාව හා වෛද්‍ය සායන වෙත පැමිණි සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| අ. | බාහිර ප්‍රතිකාර ලැබූ සංඛ්‍යාව | - | 257,200 |
| ආ. | නේවාසික ප්‍රතිකාර ලැබූ සංඛ්‍යාව | - | 30,354 |
| ඇ. | වෛද්‍ය සායන සඳහා පැමිණි සංඛ්‍යාව | - | 103,518 |

61. යුද්ධ හමුදා රෝහලෙහි තොරතුරු පද්ධතිය සඳහා නවතමයෙන් 'Server' යන්ත්‍ර සහ දත්ත ගබඩා යන්ත්‍ර සවිකිරීම.

62. ප්‍රථමාධාර රාජකාරී සඳහා සහභාගිවී ඇති නිලධාරී/සෙනීන් සංඛ්‍යාව.

| | | |
|---|---|---|
| අ. | වෛද්‍ය නිලධාරී | - 220 |
| ආ | හෙද | - 320 |
| ඇ. | හෙද සහායක | - 320 |

63. 2018.03.08 දින මහල් 15 කින් සමන්විත නව රෝහල් සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.



64. යුද්ධ හමුදා රෝහල වෙත 2018.08.02 වන දින ISO 9001-2015 ප්‍රමිති සහතිකය ලබාගැනීමට හැකිවීම.






**<u>ගැටළු සහ අභියෝග</u>**

65. අවශ්‍යතාවය අනුව වෛද්‍ය සේවාවන් සැපයීම සඳහා ප්‍රමාණවත් වෛද්‍යවරුන් හා හෙද/ අතුරු වෛද්‍ය වෘත්තිකයින්ගේ හිඟතාවයක් පවතියි.

66. දැනට තිබෙන සම්පත් හා කාර්යය මණ්ඩලය ප්‍රයෝජනයට ගනිමින් නිසි අයුරු වෛද්‍ය සේවාවන් සැපයීම සඳහා ප්‍රමාණවත් ගිලන්රථ සංඛ්‍යාවක් නොතිබීම.

**<u>සාරාංශය</u>**

67. දැනට සෞඛ්‍ය සේවාව වෙත පවතින වෘත්තිකයින්ගේ හිඟතාවයන් මෙන්ම ගිලන්රථ අවශ්‍යතාවයන් ප්‍රවර්ධනය කරගැනීමට කටයුතු සිදුකරමින් පවතින අතර, යුද්ධ හමුදා රෝහල වෙතින් ප්‍රතිකාර ලබාගන්නා අයවළුන් සඳහා වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම වෙනුවෙන් එහි ඉඩ පහසුකම් මෙන්ම අනෙකුත් පහසුකම් පුළුල්කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

68. යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය 2014 ජුනි මස 16 වන දින ස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යයන් වනුයේ දැනට සේවයෙහි යෙදී සිටින යුද්ධ හමුදා සාමාජිකයින්, විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්, සිවිල් සේවක මහත්ම මහත්මීන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් හට සහ අනෙකුත් හමුදාවන්හි සාමාජිකයින් මෙන්ම අවශ්‍ය අවස්ථාවන්හිදී සිවිල් ජනතාව වෙත රෝග නිවාරණය, රෝග පැතිරීම පාලනය කිරීම සහ මානසික සෞඛ්‍ය යහපත්ව පවත්වා ගැනීමට අවශ්‍ය සේවාවන් සැපයීමය.

## වසරේ කාර්ය සාධන සාරාංශය

69. යුද්ධ හමුදාව තුළ හේතුව නොදන්නා කාලීන වකුගඩු රෝගය හඳුනාගැනීමේ පූර්ව නිර්ණ පරීක්ෂණ සිදුකිරීම සහ අවදානම් සහිත ප්‍රදේශයන්හි ජලය තත්ව පරීක්ෂණයන්ට ලක් කිරීම.

70. යුද්ධ හමුදා කඳවුරු සඳහා ප්‍රතිආශ්‍රැත ජල පෙරන ලබා දීම.

71. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා සහභාගි වන යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා එන්නත් වැඩසටහන් සිදුකිරීම.

72. යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා පළකරනු ලබන සඟරා, මාසික වැටුප් පත්‍රිකා (පිටුපස දැන්වීම්) මඟින් සෞඛ්‍ය පණිවිඩ ලබාදීම හා සෑම මසකම සෞඛ්‍ය නිවේදන පත්‍රිකාවක් මුද්‍රණය කර සියළු යුද්ධ හමුදා කඳවුරු වෙත බෙදා හැරීම.

73. එච්අයිවී/ඒඩ්ස් ඇතුළු ලිංගාශ්‍රිත රෝග මර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පහත පරිදි සිදු කිරීම.

| අනු අංකය | දිනය | සහභාගි වූ ඒකකයන් | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | 06, 07, 08 මාර්තු 2018 | යුද්ධ හමුදා රෙම වෛබ/නාවික/ගුවන් | 30 |
| 2. | 04, 05, 06 අප්‍රේල් 2018 | යුද්ධ හමුදා රෙම කරෙ/නාවික/ගුවන් | 30 |
| 3. | 19,20, 21 ජූනි 2018 | යුද්ධ හමුදා රෙම විබ/නාවික/ගුවන් | 30 |

වගුව 20:4. පුහුණු පාඨමාලා විස්තරය

74. 2018.02/19/20/21 දිනයන්හි ආපදා අවස්ථාවකදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් වළක්වාගැනීම සඳහා යුද්ධ හමුදා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පුහුණු කිරීමේ වැඩමුළුව චින්තන පුහුණු මධ්‍යස්ථානය (වෙන්නප්පුව) හිදී පැවැත්වීම (සහභාගි වූ භට්පිරිස් සංඛ්‍යාව 30 යි).

75. 2018.09.19 දින ක්ෂය රෝගය, ඩෙංගු රෝගය හා ලිෂ්මානියා රෝගය පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු වෛද්‍ය වෘත්තිකයින් දැනුවත් කිරීම.

76. 2018.10.17 දින මැලේරියාව නැවත ශ්‍රී ලංකාවෙහි ඇතිවීම වැළැක්වීම සඳහා විදෙස් සංචාර සංවිධානය කරනු ලබන යුද්ධ හමුදා ආයතන/අංශ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීම.

77. 2018.11.05/06/07 දිනයන්හි මැලේරියාව නැවත ශ්‍රී ලංකාවෙහි ඇතිවීම වැළැක්වීම සඳහා යුද්ධ හමුදා රෝහල් වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පීන් දැනුවත් කිරීම හා රුධිර පටල පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික සැසිය පැවැත්වීම.

78. 2018.11.09 දින වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳ යුද්ධ හමුදා යුධෝපකරණ බලකා කර්මාන්ත ශාලා සෙනීන් දැනුවත් කිරීමේ පළමු වන අදියර පැවැත්වීම.

79. 2018.11.15 දින බරවා රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම පිළිබඳ වෛද්‍ය බලකා වෛද්‍ය වෘත්තිකයින් දැනුවත් කිරීම.

80. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 45ක් සඳහා වසංගත රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2018.08.16 හා 17 දින වසංගත රෝග විද්‍යා අංශය කොළඹ හිදී පවත්වන ලදී.

81. පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධීකරණය කිරීම ඔස්සේ ඒකාබද්ධ අධ්‍යක්ෂ මණ්ඩල සමගින් එක්ව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වැඩමුළුවක් 2018.02.18/19/20 යන තෙදින තුළ මීගමුව චින්තන මධ්‍යස්ථානයහිදී හයිපිරිස් 32ක් සඳහා පැවැත්වීම.

82. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම 2018.03.16 දින යුද්ධ හමුදා රෝහල (කොළඹ) ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

83. යුද්ධ හමුදා රෝහල නාරාහේන්පිටහිදී 2018.03.06, 07, 08, 2018.04.04, 05, 06 හා 2018.06.19, 20, 21 යන දිනයන්වලදී එච්අයිවී/ඒඩ්ස් පිළිබඳ වැඩමුළු පවත්වන ලදී. ඒ සඳහා යුද්ධ හමුදා 30 ක්, නාවික 10 ක්, ගුවන් 10 ක හයිපිරිස් ප්‍රමාණයක් සහභාගී වන ලදී.

84. දැනට රජයෙහි ආයතන/විශ්ව විද්‍යාල වල අධ්‍යපනය ලබන පරිස් සංඛ්‍යාව.

අ. <u>මානසික සෞඛ්‍යය ඒකකය වෙතින් පවත්වන ලද ක්‍රියාකාරකම් හා වැඩසටහන්</u>.

(1) මානසික සෞඛ්‍යය ඒකකය විසින් දිවයින පුරා ආරක්ෂක සේනා මුලස්ථාන, සේනාංක මුලස්ථාන, බලසේනා මුලස්ථාන, ඒකකයන්හි නිලධාරී/ සෙසුනිලයින් හට පහත සඳහන් විෂයන් සබැඳිව දේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(අ) මානසික සෞඛ්‍යය සංවර්ධනය.
(ආ) ආතතිය කළමනාකරණය.
(ඇ) පෞරුෂත්ව වර්ධනය.
(ඈ) මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා උපදේශනය.
(ඉ) විවාහ ජීවිතයෙහි තෘප්තිමත් බව.
(ඊ) සියදිවි හානිකර ගැනීම වළක්වා ගැනීම සබැඳිව දේශණ හා වැඩමුළු පැවැත්වීම.

(2) <u>මානසික තත්ත්ව පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u>.

(අ) කෙඩෙට් නිලධාරීන් බඳවා ගැනීමේදී මානසික තත්ත්ව පරීක්ෂණ සිදුකිරීම.

(ආ) සාම සාධක රාජකාරී සඳහා සහභාගී වන නිලධාරී හා සෙසුනිලයින්ගේ මානසික තත්ත්ව පරීක්ෂණ සිදුකිරීම.

(ඇ) පුනරුත්ථාපන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදුකරනු ලබන පුනරුත්ථාපන සහ සුහ සාධක වැඩමුළුවලට සහභාගී වීම.

(ඈ) ඉහත සඳහන් දේශණ හා වැඩමුළු වලට අමතරව යුද්ධ හමුදා රෝහලෙහි පවත්වනු ලබන සතියේ සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනයන්හි පැවැත්වෙන මානසික සෞඛ්‍ය සායනය සඳහා සහභාගී වීම.

<u>**ගැටළු සහ අභියෝග**</u>

85. දැනට පවතින මහජන සෞඛ්‍ය පරීක්ෂක වෘත්තිකයින්ගේ හිඟතාවය.

86. දැනට පවතින මානසික සෞඛ්‍ය වෘත්කයින්ගේ හිඟතාවය.

<u>**සාරාංශය**</u>

87. අප සතු මානව සම්පත් කාර්යක්ෂම ලෙස යොදවමින් ප්‍රතිකාර සේවා වලට මෙන්ම රෝග නිවාරණ හා සෞඛ්‍ය ප්‍රවර්ධනයට ප්‍රමුඛතාවය ලබාදෙමින් ආරක්ෂක සේනා මූලස්ථාන දැනුවත් කරමින් සියදිවි හානිකර ගැනීම වැලැක්වීම තුළින් කායික, මානසික, සමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් නීරෝගිමත් යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසක් බිහි කිරීම අපගේ අපේක්ෂාව වේ.

## විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය

1. සංග්‍රාමික නීතියට යටත් යම් තැනැත්තෙකු විසින් සිදුකරනු ලබන සංග්‍රාමික හෝ සිවිල් වරදක් විනිශ්චයට භාජනය කිරීම පිණිස යුද්ධ හමුදාධිපතිවරයා විසින් යුද්ධාධිකරණ කැඳවීම සිදුකරනු ලබයි. ස්වභාවික යුක්ති මූලධර්මයන්ට යටත්ව යුද්ධ හමුදා පනතේ ප්‍රතිපාදන සහ අනෙකුත් සාමාන්‍ය නීතීන්ට අනුගතව නෛතික ක්‍රියාපටිපාටියකට අනුව යුද්ධාධිකරණයන් මෙහෙයවීම විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, එකී නඩු කෘත්‍යයන්හිදී උද්ගත වන ඕනෑම නීතිමය කරුණක් හෝ ක්‍රියා පටිපාටියක ගැටළු සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබා දෙයි. තවද, යුද්ධ හමුදාධිපතිවරයා විසින් නෛතික උපදෙස් අපේක්ෂා කරන සියළුම අවස්ථාවන්හිදී ඒ සඳහා සහාය ලබාදීමද මෙම කාර්යාලයේ කාර්යභාරයකි.

### මූල්‍ය තොරතුරු

2. මෙම කාර්යාලය වෙත දේශීය පුහුණු වැය ශීර්ෂය වෙතින් 2018 වර්ෂය සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදන සහ එය ලබාගත් අකාරය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| 2018 වසර සඳහා දේශිය පුහුණු වැය ශීර්ෂය වෙතින් රු. 37,000.00 ක මුදලක් ලබා දී ඇත. | 2018 වසර සඳහා ලබා දුන් ප්‍රතිපාදන මුදලින් මිලදී ගන්නා ලද ලිපි ද්‍රව්‍යන්ට අදාල බිල්පත් 2018.12.31 දින වන විට මූලස්ථාන බළඇණිය - යුහමු වෙත ඉදිරිපත් කර ඇත. |

### ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදාගත් ආකාරය

3. යුද්ධ හමුදා දේශීය පුහුණු වැය ශීර්ෂය වෙතින් වර්ෂයකට සීමිත ප්‍රතිපාදන මුදලක් වෙන් කරනු ලබන අතර, එම මුදලින් කාර්යාල කටයුතු සඳහා යුසේඅම වෙතින් නිකුත් නොකරනු ලබන එහෙත් කාර්යාල කටයුතු පවත්වාගෙන යෑමේදී අත්‍යවශ්‍ය වන කාර්යාල ලිපි ද්‍රව්‍යයන් පමණක් මිලදී ගෙන මෙම කාර්යාලයේ රාජකාරී කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට සමත් වී ඇත.

### වසරේ කාර්ය සාධන සාරාංශය

4. 2018 වර්ෂය තුල යුද්ධ හමුදා පනත යටතේ විවිධ වූ චෝදනාවන් සබැඳිව යුද්ධාධිකරණ තුනත් පවත්නා ඇති අතර, ඒ සබැඳිව සවිස්තරාත්මක දත්තයන් පහත පරිදි වේ:

| අනු අංකය | කරන ලද වරද සහ ඊට අදාලව යුද්ධ හමුදා පනතේ සඳහන් වගන්තිය | යුද්ධාධිකරණ පවත්වන ලද තැනැත්තන් සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | 103(1)(a) - යුද්ධ හමුදාවෙන් පැන යාම | 01 |
| 2. | 103(1)(a) - යුද්ධ හමුදාවෙන් පැන යාම | 01 |
| 3. | **102(1)** - ආරක්ෂක සේනා ආඥා වලට හෝ සෙසු ආඥා වලට අකීකරු වීම පැහැර හැරීම | **01** |
| | **ගොනු සංඛ්‍යාව** | **03** |

වගුව 21:1. යුද්ධාධිකරණය සබැඳිව විස්තරය

### වසරේ ජයග්‍රහණයන්

5. 2018 වර්ෂයේදී මහා යුද්ධාධිකරණයන් තුනක් පවත්වා ඇති අතර, ඉන් යුද්ධාධිකරණ දෙකක කටයුතු සාර්ථකව අවසන් කිරීමට හැකි වී ඇත. අනෙක් යුද්ධාධිකරණය මේ වන විටත් විභාග කිරීම් ආරම්භ කර ඇත. තවද යුද්ධ හමුදාධිපතිවරයා විසින් විනිසුරු අධිනීතිඥ ජෙනරාල් වරයා වෙත යොමුකරන ලද නීතිමය ගැටළු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම් සිදුකර ඇත.

### ගැටළු සහ අභියෝග

6. විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා නීතිමය පර්යේෂණ සඳහා වෙන්වූ නීති පුස්තකාලයක් සහ පරිගණක බැංකුවකින්ද සමන්විත වූ පර්යේෂණ අංශයක අවශ්‍යතාවයක් පවතී. කෙසේ වෙතත් එකී අරමුණු ඉටුකරගැනීමෙහිලා මේ වන විට කාර්යාලය සතු සම්පත් ප්‍රමාණවත් නොවේ. සංග්‍රාමික නීතිය පිළිබඳව නීති නිලධාරීන්ගේ දැනුම හා අවබෝධය වර්ධනය කිරීමෙහිලා දේශීය හා විදේශීය කෙටි කාලීන පාඨමාලා හැදෑරීමේ අවස්ථාව ලබාදීම ප්‍රමුඛ කටයුත්තක් සේ පෙනී යයි.